## 2026 අප්‍රේල් මස 02 වන දින පෙරවරු 9.30 ට
## මොරටුව මහා නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද
## මොරටුව මහා නගර සභාවේ මාසික සභා රැස්වීමේ වාර්තාව

**සහභාගීත්වය:-**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී. තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී. සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී. මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ. ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්. සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එස්. සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සරෝජනී මැන්දිස් මහත්මිය |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. සමන්ත සිල්වා මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 30. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 31. | මහා නගර සභා මන්ත්‍රී | - | බී. සජිත් දුමින්ද පීරිස් මහතා |
| 32. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 33. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා |
| 34. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 35. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 36. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 37. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 38. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |

| | | | |
|---|---|---|---|
| 39. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. වදූන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 40. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 41. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා |
| 42. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා |
| 43. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 44. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටිල්කාන්ත මහතා |
| 45. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සුලක්ෂිකා තිලක්ෂණී ප්‍රනාන්දු මෙනවිය |
| 46. | මහා නගර සභා මන්ත්‍රී | - | හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා |
| 47. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය |
| 48. | මහා නගර සභා මන්ත්‍රී | - | ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය |

ගරු නගරාධිපතිතුමාගේ ආරාධනය මත නාගරික ලේකම් එම්. කේ. ඩී. තාරක මුණසිංහ මහතා විසින් 2026.04.02 වන දින මාසික සභා රැස්වීමේ නිවේදනය සභාවට ඉදිරිපත් කරන ලදි.

## 01. වාර්තාව පිළිගැනිම හා සළකා බැලීම.

2026.03.03 දින පැවති මාසික මහා සභා රැස්වීමේ වාර්තාව.

**මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, 2026.03.03 දිනැති මාසික සභා රැස්වීමේ වාර්තාව පිලිගත යුතුයැයි යෝජනා කර සිටිමි.

මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා විසින් යෝජනා ස්ථිර කරන ලදී.

2026.03.03 දිනැති මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත විය.

## 02. ගරු නගරාධිපතිතුමාගේ නිවේදන:-

02(1) **ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීවරුනි, මහා නගර සභා මන්ත්‍රී, එම්. ලිහිණි ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය 2026.03.06 දින පැවති මහජන උපයෝගීතා හා කාන්තා ප්‍රජා සංවර්ධන පිළිබඳ ස්ථාවර කමිටුවට සහභාගී වීමට නොහැකි බව දන්වා නිවාඩු ඉල්ලුම්කර ලිපියක් ලබා දී තිබෙනවා.

02(2) **ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

2026.03.09 වන දින ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුවට සම්බන්ධ වීමට නොහැකි බැවින් නිවාඩු ලබාදෙන ලෙස ඉල්ලා මහා නගර සභා මන්ත්‍රී, හරිෂ්චන්දන පිලානවිතාන මන්ත්‍රීතුමා 2026.03.09 දිනැති ලිපිය මගින් ඉදිරිපත් කර තිබෙනවා.

02 (3) **ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

2026.03.09 වන දින ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුවට සම්බන්ධ වීමට නොහැකි බැවින් නිවාඩු ලබාදෙන ලෙස ඉල්ලා මහා නගර සභා මන්ත්‍රී, ඩී. එම්. මනෝජ් මධුරංග මන්ත්‍රීතුමා 2026.03.09 දිනැති ලිපිය මගින් ඉල්ලීමක් කර තිබෙනවා.

02 (4) <u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

2026.03.11 දින එලදායිතා කමිටුවට සම්බන්ධව වීමට නොහැකි බව දන්වා මන්ත්‍රී, ඩබ්. ජීවන්ත සුදර්ශන ප්‍රනාන්දු මහතා 2026.03.11 දිනැති ලිපිය මගින් නිවාඩු ඉල්ලුම් කර තිබෙනවා. ඉතා ඕනකමින් නැවත ඉල්ලීමක් කරනවා. පොඩි නෛතික ගැටලුවකට අප මුහුණදීලා තියෙන්නේ ස්ථාවර කමිටුවට සම්බන්ධ නොවීම මත ඒ අදාළ මාසයට හිමි සභික දීමනාව ලබාදීමේ ගැටලුවක් මතුවෙලා තියෙනවා. ඒ නිසා ඉතා ඕනැකමින් ඉල්ලනවා ඔබ ස්ථාවර කමිටුවලට සම්බන්ධ වෙන්න. ඒ නිසා සියලු මන්ත්‍රීවරුන්. තමාට නියමිත ස්ථාවර කමිටු සඳහා අනිවාර්යෙන් සහභාගී වන ලෙස කාරුණිකව දන්වනවා.

02(5) <u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

නාගරික කොමසාරිස් එල්. පී. මනෝජා එස්. ප්‍රනාන්දු මෙනෙවියගේ මවගේ සහෝදරයා අභාවප්‍රාප්ත වී ඇති බැවින් අද දින සභාවට සහභාගී වීමට නොහැකි බැවින් නිවාඩු ලබාදෙන ලෙස ඉල්ලා සිටියා.

02(6) <u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

බදාදා දිනය රජයේ නිවාඩු දිනයක් ලෙස නම් කර තිබෙන නිසා 2026 අප්‍රේල් මාසයට නියමිත ආයතන නීතිය පිළිබඳ ස්ථාවර කමිටුව එදින නොපැවැත්වෙන බවත්, 2026 අප්‍රේල් 06 වන දින දහවල් 12.00 ට ආයතන කමිටුව පැවැත්වෙන බවත් දැනුම් දෙනවා.

02(7) <u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

මහා නගර සභා මන්ත්‍රී, එච්. කේ. ෂර්මන් පිලීෂියන් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා අසනීප තත්ත්වයකට ලක් වෙලා ඉන්නේ ඒ නිසා සභාවට වීමට  නොහැකි බව දැනුම් දී තිබෙනවා.

02(8) <u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

මහා නගර සභා මන්ත්‍රී, එච්. එල්. තිලිනි නෙත්සරණි මෙනෙවිය අසනීප වී පාන්දර රෝහල්ගත කල නිසා සභාවට සහභාගී වීමට නොහැකි බව දැනුම්දී තිබෙනවා.

## 03. <u>සභාව අමතා එවන ලද ආයාචනා හා පෙත්සම් පැමිණිලි හා සන්දේශ සභාව හමුවේ තැබීම.</u>

**03(1)** <u>**මහා නගර සභා මන්ත්‍රී - යූ. අනුරසිරි ජේ. ද සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, මාස ගානක් තිස්සේ මම මේ සභාවෙ කතා කරනවා. අපි දන්නව මොකක්ද හේතුව කියලා. කල්දෙමුල්ල පාර කැඩිලා තියෙන්නේ මම නැවතත් මතක් කරනවා කල්දෙමුල්ල පාර, ආතර් පෙදෙස මෙම කියන පාරවල් දෙක ඉතාමත් අබලන් තත්වයක තියෙන්නේ එම පාරවල් දෙක ඉතා කඩිනමින් පිළිසකර කර දෙන ලෙස ඉල්ලා සිටිනවා. ඒ වගේම නගරාධිපතිතුමනි, අඟුලාන කොට්ඨාසයේ පල්ලිය පාරෙ මට ලියුමක් ඉදිරිපත් කරලා තියෙනවා පී. චන්ද්‍රා ප්‍රනාන්දු මහත්මිය වහින කාලෙට මෙතුමියගෙ ගෙදරටත් වතුර දානවා කියලා. මේක සාදාදෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**03(2)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ආයතන හා පෙත්සම් යටතේ පැමිණිලි කීපයක් තිබෙනවා ගරු සභාවට ඉදිරිපත් කරන්න. ගරු නගරාධිපතිතුමනි, මොරටුව බල ප්‍රදේශය තුළ කැලි කසල එකතු කිරීම නියමිත පරිදි සිදු නොවන බවත් මීට පෙරත් ගිය සභාවේත් සෞඛ්‍ය කමිටුවෙත් අවධාරණය යොමු කළා. නමුත් ගරු නගරාධිපතිතුමනි, තවම ඒක නිවැරදි වෙලා නෑ මොකද ඉදිබැද්ද ප්‍රදේශයේ පවා මම ජීවත්වන සේවා පටුමගේ සති 3ට පස්සෙ තමයි ඉදුල් ගෙනියන්න

රථය කතා කරලා ගෙන්න ගත්තෙ. මේ වගේ හැම පාරකම සතියකට දවසක් තියා සති තුනකට හරි එන්නෙ නැති තත්ත්වයක් තමයි තියෙන්නේ. ප්‍රදේශය පුරාවටම තැනින් තැන කුණු ගොඩවල් තියනවා. ඔබතුමන්ලාගේ අවධානය යොමු කරලා අනිවාර්යයෙන්ම නගර සභාවේ කාර්යභාර්ය කැලි කසල ඉවත් කිරීම. මෙයට ප්‍රමුඛත්වය දීලා මෙම කාර්යභාරය නිවැරදි විදියට කරන්න කියලා ඉල්ලීමක් කරනවා. ගරු නගරාධිපතිතුමනි, මම කලින් සභාවෙත් කිව්වා ඔබතුමත් විශාල මැදිහත්වීමක් වුනා. ඉදිබැද්දෙ ධනසිරි මෝල පාරෙ තියෙන පොල් ගස කපන්න. හැබැයි ඔබතුමා මට දුරකථන ඇමතුම් කිහිපවතාවක් අරගෙන ඔබතුමා ගහ ඉවත් කරන්න කටයුතු කළාට නමුත් ඒක ක්‍රියාත්මක වුනේ නැහැ නගරාධිපතිතුමනි, හේතුව තමයි අවුරුදු දෙකහමාරක් කර්මාන්ත අංශය ලිපි ගණුදෙනු කරනවා පොල් ගසක් අයිති කෙනත් එක්ක හැබැයි මේ පොල් ගස කපන්න දවසක් දාගත්තට පස්සෙ ගස අයිති කෙනා ලියුමක් දෙනවලු මේ ගහ මට අයිති නැහැ කියලා. අපේ නගර සභාව අවුරුදු දෙකහමාරක් ලිපි ගණුදෙනු කරලා තියෙන්නේ ගස අයිති කෙනත් එක්ක නෙමෙයි. ඒ ගහ අයිති නැහැයි කියන කෙනා මෙතනට ඇවිල්ලා ලියුම් දීලා තියෙනවා මගේ වත්තට එන අප ජලය නවත්තනවානම් ගස කපා ඉවත් කරනවා කියලා. ගස කපන්න යනකොට කියනවාලු මේ ගහ මට අයිති නැහැ කියලා. මීට දින කිහිපයක් කරන්න තිබුණු අවස්ථාවත් අද මේ වෙනකොට අහිමිවෙලා තියනවා නගරාධිපතිතුමනි, මේක කාගෙ වරදද කියලා මටනම් හිතාගන්න බැහැ. ඔබතුමාගේ පාලනයට තමයි මේක එල්ල වෙන්නෙ මොකද ඔබතුමා දැන් මේ පාලන බලයට ඇවිල්ලා මාස නමයක් වෙනවා. මේ මාස නමයෙත් ලිපි ගණුදෙනු කරලා තියෙනවා. මේක ඉතා ඉක්මණින් නිවැරදි පුද්ගලයා සොයාගෙන එක්කො එතන අපිට බලයක් තියනවා නිවේදනයක් නිකුත් කරලා මේක ඉවත් කරන්න. අනතුරුදායක ගහක් කියලා හරි. ඒ වගේම මට ලිපි කීපයක් ලැබිලා තියෙනවා රාවතාවත්තෙ අවධානම් මායිම් තාප්පයෙ තිබෙන අලුකුටි සම්බන්ධව.ගරු නගරාධිපතිතුමනි,අලුකුටි ඉවත් කරගන්න කියලා තියෙනවා.හැබැයි ඒ මිනිසුන්ට ඒක ඉවත් කරගන්න තැනක් නැහැ. අපි ඔබතුමාලට කියන්නෙ මේකට මොකක් හරි වැඩපිළිවෙලක් දෙන්න. මේ මිනිස්සු යම් කිසි මුදලක් ගෙවලා තමයි අලුකුටි වෙන්කරගෙන තියෙන්නෙ. ඒ මිනිසුන්ට එකපාරටම මේක අරගෙන යන්න පුලුවන් කමක් නැහැ. ඔබතුමාලා මේකට මොකක් හරි ස්ථිර විසඳුමක් ලබාදෙන්න. මේ යවන ලිපියෙ ස්ථිර විසඳුමක් නැහැ.එහෙම නැත්තනම් වෙන වැඩ පිළිවෙලකට ගිහිල්ලා මෙම ස්ථානයේම වැඩපිළිවෙලවල් තියනවා ඕනතරම්.අපිත් එක්ක කතා කරන්න අපිත් ඒකට උදව් කරන්නම්.යම් යම් ස්ථාන වල ස්ථාපිත කරන්න පුලුවන්.ඒකට ඔබතුමාගේ අවධානය යොමු කරන්න.අනෙක් එක මම ඔබතුමාට කතා කරා.පදික වේදිකාවට දෙන ඉඩ ප්‍රමාණය බොහොම මදි කියලා.මම දිගින් දිගටම කියන කොට එතන හිටපු නිලධාරියෙක් කිව්වා අඩි හය ප්‍රශ්නයක් නැහැ.අඩි හය මදි නම් අඩි හයේ කැලි දෙකක් ගන්න කියලා .අද ඒක ප්‍රමාණවත් නැති තැනට ඇවිල්ලා තියනවා.ඒකටත් අවධානය යොමු කරලා ප්‍රමාණය වැඩි කරන්න.මුදල පොඩ්ඩක් වැඩි වුනාට කමක් නැහැ.ඒක සිදුවිය යුතු දෙයක්. රාවතාවත්ත පොදු සුසාන භූමියේ අක්‍රමිකතා සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරන්න.මේක හරිම සෝචනීයයි.මැරිච්ච මිනිසුන්ට හරිම අවමානයක් වෙන්නේ ඒක නිසා මම මේ ගැන වැඩිය කතා කරන්න යන්නේ නෑ ඔබතුමාගේ අවධානය යොමු කරලා මේවට විසඳුම් ලබා දෙන්න අනික තමයි ලුනාව කලපුවෙ ඇවිදින මන්තීරුවේ ඇවිදින්න ස්ත්‍රී පුරුෂ දෙපාර්ශයම එනවා.ව්‍යායාම කරන්න එනවා. නොයෙකුත් ලෙඩදුක් හින්දා වෛද්‍යවරුන්ගේ උපදෙස් පරිදි ඇවිදින්න එනවා. හැබැයි එතන අසෝභන තැනක් බවට පත්වෙලා තියනවා. මත්ද්‍රව්‍ය පාවිච්චි කරන පුද්ගලයන් මේක පාවිච්චි කරනවා. මම ඉන්න වෙලාවෙත් එතැන ඉන්න සිකුරුටි මහත්මයත් එක්ක යම්කිසි කෙනෙක් තමුන්ගේම ඇඳුමෙන් මූණ වහගෙන ඉදීම තුල පොඩි ගැටුමකුත් ඇතිවෙන්න ගියා. ගරු නගරාධිපතිතුමනි, ගොඩාක් අය මේකෙ ඇවිදින්න එන්නේ හවස හතරක් හයත් අතර තමයි මේ වෙලාවට තමයි ගොඩක් දුරට එන්නේ. ඒ වෙලාවට

පොලිස් මහත්තුරු ගෙන්නලා මොකක් හරි කරන්න. මේක හොඳ තැනක් බවට පත් කරගෙන යන්න ඔබතුමාගේ මැදිහත්වීම කරන්න. පොලිසියට දැනුම් දීලා සවස හතරේ ඉඳලා හය වෙනකම් පොඩි වටයක් රාලහාමි කෙනෙක් කවුරුහරි ගියානම් ඇති මොකද නැත්නම් විවිධ පුද්ගලයන් මෙතනට ඇවිල්ලා ප්‍රශ්න දානවා. මනස නිරවුල් කරගෙන කිසි දෙයක් කරන්න වෙන්නේ නැහැ. ඔබතුමාගේ අවධානය යොමු කරන්න. ගරු නගරාධිපතිතුමනි, මම ඉල්ලීමක් කරා. පාර මැදින් බටයක් දාලා තිබෙනවා මේ බටේ අපි ගලි කීපයක් දාලා තිබෙනවා. වැලි ගිහිල්ලා බටේ හිරවෙනවා. එතකොට කරේ ජෙට් බවුසරේ අරන් ගිහිල්ලා වතුර පාරක ඇල්ලුවාම මේ වැලි ටික සුද්ධ කරලා වැලි ටික ක්ලියර් වෙනවා. ජෙට් බවුසරේ මාස කීපයක් වෙනවා කැඩිලා. මේක කරගන්න විදියක් නැහැ පාර දිගටම වතුර ගලාගෙන යනවා.පාසල් ළමුන් මිනිස්සු මෙතනින් යනවා. පුදුම ගඳක් තියෙන්නේ ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරලා අද හරි කමක් නැහැ නගරාධිපතිතුමනි, පැය භාගයක් වැඩක් තියෙන්නේ එක බටයක් හරි දාලා තියෙන්නේ ගලි දෙක තියෙන්නේ අඩි තිහක පරතරයක් ඇතුව මැද්දෙන් අඩි පහලවක් පමණ බට දෙකක් දැම්මනම් ගල් හයක් හතක් ගලවලා පොඩි කූරක් දැම්මනම් සුද්ධ කරගන්න පුලුවන්. අද ඒ පැත්ත ලොකු දූර්ගන්ධයක් හමනවා. ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න ගරු නගරාධිපතිතුමනි, විදුලි අංශයෙ අපි සැරින් සැරේ කතා කරාම වාහන නැහැ කියනවා. දෙන තෙල් ප්‍රමාණය මදි කියනවා. තැන් තැන්වල විදුලිය අද අක්‍රිය වෙලා තියනවා. විශේෂයෙන්ම මම කියන්න හදන දේ තමයි ඌරගහ නාගිත ස්වාමීන් වහන්සේ උන්වහන්සේ අපවත් වෙන්නේ 2025 එකොළොස් වැනි මාසය අටවැනිදා ස්වාමීන් වහන්සේ නමක් මොරටුව විහාරස්ථානයක ස්වාමීන් වහන්සේ නමක් අපවත් වුණාම සභාවෙන් අපි ගෞරවයක් වශයෙන් යම්කිසි දීමනාවක් ලබා දෙනවා. අපි ඒක අපේ පාලන කාලය පුරාවටම දුන්නා. හැබැයි එකොළොස් වැනි මාසේ අටවෙනිදා අපවත් වෙනවා නායක හාමුදුරුවන් වහන්සේ අද වෙනකම් චෙක්පත ලබාදීලා නැහැ. මේක මම කොමසාරිස්තුමියට කතා කරලා අහනවා. දුරකථන අංකයක් ගන්න එතුමියට. ස්වාමීන් වහන්සේත් ඉන්න තැන පොඩි හාමුදුරුවන් වහන්සේ ඉන්න තැන මෙතුමිය ෆෝන් එක ආන්සර් කරන්නේ නෑ. එතුමියගෙ ලග ඉන්න කෙනෙක් තමයි දුරකථනය පාවිච්චි කරන්නෙ. කොමසාරිස්තුමිය වැඩක් කියනවා. මම කිව්වා පොඩි හාමුදුරුවොත් එක්ක ඉන්නෙ පොඩ්ඩක් දෙන්න කියලා.ඒත් එතුමිය දුරකථනයට එන්නෙ නැහැ. කාර්යාලයට ගිහිල්ලා එතුමියට ඇහුවාම එතුමිය කිව්වෙ පන්සලේ පොඩි හාමුදුරුවො දුන්න ලියුම අපේ අතින් නැතිවෙලා කියලා. මාස හතරාමාරක් යනකන් ලියුම අදටත් නැහැ. ගරු නගරාධිපතිතුමා බලයට ආවට පස්සෙ ගෞරවනිය ස්වාමීන් වහන්සේලා දෙනමයි අපවත් වුනේ. මේක තාම නැහැ. කලින් එකත් දුන්නෙ මාස ගානක් ප්‍රමාද වෙලා. ඔබතුමාගේ පාලනය බලයේ අකර්මන්‍යතාව තමයි මේකෙන් පෙන්නුම් කරන්නේ. ගරු නගරාධිපතිතුමනි, මේ වගේ දේවල් වෙන්න දෙන්න එපා. අපි සභාවේ කතා කරන දේවල් වලට නිලධාරීන්ව ගෙන්නලා නිලධාරින්ට උපදෙස් දීලා මේවා ඉතාමත්ම ඉක්මනින් ක්‍රියාත්මක කරන්න කියලා ඉල්ලා සිටිනවා.ගරු නගරාධිපතිතුමනි, ඩබ්. ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු වරිපනම් අංක 105/11, බෝධිරාජාරාම මාවත, විල්ලෝරාවත්ත, මොරටුව. 2026.04.02 ගරු නාගරික මන්ත්‍රී, තිලකසිරි ප්‍රනාන්දු මගින්, ගරු නගරාධිපති නිශාන්ත ප්‍රදිනාන්දු මහතා ගරු හිටපු නගරාධිපතිතුමා මට ලිපියක් භාරදීලා තියෙනවා. මොරටුව මහා නගර සභාව විසින් 2021 අප්‍රේල් මස 10 හෝ 12 වන දින සභාවේ ප්‍රයෝජනය සඳහා කැබ් රථ හතරක් ලබාගත්ත කියලා එතුමා කියනවා මේක මේ කැබ් රථ හතර ලබාගෙන තිබෙන්නේ ඝන අපද්‍රව්‍ය ව්‍යාපෘතියෙන් ගෙවීම් පදනම මත තමයි හැබැයි මේ වෙනකොට ගරු නගරාධිපතිතුමනි, කොවිඩ් කාලය තුලත් ආදායම ලබන මේ රථවල මුදල් අපි මාස පතා ගෙවාගෙන ගියා. එතුමා එවල තියෙන ලියුම කියෙව්වා මම දිගටම කියවන්න යන්නෙ නැහැ. මේ වෙනකොට මේ කැබ් රථයේ මුදල් ගෙවලා ඉවරයි කියලා තමයි එතුමා කියන්නෙ.

එතුමා ජනතාවට සේවය කිරීමට මුදල් උපයා ගැනීම සඳහා පරිසර හිතකාමී ව්‍යාපෘතිය මගින් කසල කළමනාකරණ ස්ථානය එතුමා කියන්නෙ එතුමා ඉන්න කාලය තුල කැබ් රථ හතරක් අරගෙන ඒකෙන් ගෙවාගෙන යන්න වැඩේ වුනා. නමුත් අදවන විට එතුමා ආරම්භ කරපු දේ හරියට කරන්නෙ නැහැ කියලා පණිවිඩය තමයි එතුමා මේකෙන් දෙන්න හදන්නෙ එන්න වැඩි වුණා නමුත් අද වෙනකොට එතුමා ආරම්භ කරපු දේ හරි විදියට වෙන්නේ නැහැ කියන පණිවිඩය තමයි එතුමා මේකෙන් දෙන්න හදන්නේ. ඒ නිසා ඔබතුමාගේ අවධානය යොමු කරලා ඔතනින් ප්‍රයෝජනයක් ගන්න පුලුවන් වැඩපිළිවෙලක්, ඔබතුමා, නියෝජ්‍ය නගරාධිපතිතුමා, කොමසාරිස්තුමි පාවිච්චි කරන වාහනය ඕකෙන් ගෙවන්න තමයි ගත්තෙ. හොඳ වැඩපිළිවෙළක්. ඔබතුමාට අපි පණිවිඩයක් දෙනවා ඒකත් මතක තබාගෙන මේ ව්‍යාපෘතියෙන් ප්‍රයෝජනයක් ගන්න කියලා ඉල්ලීමක් කරනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමනි,මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු බොහෝ කාරණා වලට පිළිතුරු දෙන්න යන්නේ නැහැ.එක කාරනාවකට පිළිතුරු දෙන්ඩ වෙනවා මොකද මේ කරුණාව අනවබෝධයෙන් මත ඉදිරිපත් වුණා කියලා තමයි මගේ අදහස. ඒක තමයි හාමුදුරුවන්ගෙ ඒ අපවත්වීමෙන් සභාව විසින් දෙන්න තිබෙන මුදල මේක සංවාදයට ගත යුතු එකකුත් නොවෙන බවයි මගේ අදහස. ඔබ සභාවේ මේක කිව්වට පස්සේ යම් උත්තරයක් දෙන්න ඕන නිසා ඒ කියන්නේ මම මුලින්ම හාමුදුරුවන්ට පොඩි හාමුදුරුවන්ට කතා කරලා මේක කිව්වා. හාමුදුරුවන්ගේ අවසන් කටයුතු ඉවර වෙලා සතියක් වගේ ඇතුලත තමයි මම කිව්වේ. මොකද මම එතන මූලික රැස්වීමේදිත් මේක කිව්වා මේ රුපියල් 50,000 වැඩේ ගන්න අවශ්‍ය කරන ලියුම එවන්න. එතන පන්සලේ තිබුණ යම් තත්ත්වයක් තිබුණා. ඒ කියන්නේ මෙහි නීතිමය තත්ත්වය තමයි එය ලබා දිය හැක්කේ ඊළඟ විහාරාධිපති හිමිනමට ඔන්න ඔය නීතිමය ගැටලුව නිසා පොඩ්ඩක් පමා කරන්න කියලා පන්සලෙන්මයි කිව්වෙ.පස්සේ ඔය ලිපිය ලැබුණා ඒ ලිපිය සාමාන්‍ය නිකං කොලයක ලියපු එකක්. අඩුම තරමේ හාමුදුරුවන්ගේ වගකීම සහිත මොකක් හරියට ලෙටර්හෙඩ් එකක් පාවිච්චි කරලා නෙවේ ලියලා තිබුණේ නිකන් කොළයක ලියපු එකක් විදියට තමයි එක ඉදිරිපත් කරලා තිබුණේ. ඔබ දන්නවා දැන් අපි අපේ කැමැත්ත අකමැත්ත මත නෙවෙයි මේ තියෙන නීතිමය තත්ත්වය සභාව මුදල් නේ. මහජන මුදල් නේ. ලබාදීමේදී අපි අනුගමනය කළ යුතු නීතිමය තත්ත්වයක් තියෙන නිසා ඔය යම් පමාවක් සිද්ධ වුණා. මං ඒත් කතාකරලා කිව්වා අපේ මුරවත්තේ පන්සලේ ඇතිවෙච්ච තත්ත්වයත් ඒ හා සමානයි හැබැයි අහපු පොඩි හාමුදුරුවෝ විහාරාධිපති හාමුදුරුවෝ ලෙස තමයි. මෙතන තාම එහෙම නෑ නමුත් මං අත්සන් කරලා ඉවරයි ඒක ගෙවන්න කමක් නෑ මම ලේකම්තුමාට කිව්වා.ඉක්මණින්ම ඒක ලබාදෙන්න කටයුතු කරන්න.මම ඒක අත්සන් කරලා දුන්නා.

**03 (3)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,ආයාචනා හා පෙත්සම් පැමිණිලි යටතේ කරුණු දෙකක් ඔබේ අවධානයට යොමු කරන්න මම සූදානම්. දැන් අපේ නගර සභාවේ කසල බැහැර කරන අවස්ථාවල එක එක අවස්ථාවල එක එක විදිහේ නීති අනුගමනය කරනවා. එක වෙලාවක කියනවා ගරු නගරාධිපතිතුමනි,වීදුරු ගෙනියන්නේ නෑ තව වෙලාවක කියනව පෝසිලයෙන් ගෙන යන්නේ නෑ තව වෙලාවක කියනව පැම්පස් ගෙනියන්නෙ නෑ. ඔහොම ගරු නගරාධිපතිතුමනි, මම ඉන්න නිවාස සංකීර්ණය කියන්නේ නිවාස තුන්සිය පනස්හයක් තියන තැනක්නෙ.එතකොට අපි කසළ බැහැර කරන ක්‍රම වේදයක් එතන තියනවා.ඒ ක්‍රම වේදය අනුව අපි එකතු කරලා තියනවා. ඒ එන ට්‍රැක්ටරයේ සේවකයන් කියනවා අද වීදුරු ගෙනියන්නෙ නැහැ.ඊට පස්සේ තව දවසක කියනවා පැම්පස් ගෙන යන්න එපා කියලා තියෙනවා. මමත් එතන මන්ත්‍රීවරයෙක් නිසා පදිංචි වී සිටින එතන කළමනාකරණ කමිටුවේ

සභාපතිත් නිසා උදේ පාන්දර ඇවිල්ලා බිල්ඩින් එකේ පරිපාලක මහත්මයා කියනවා බලන්නකො අයියේ මාර වැඩේ මේ ගෙනියන්න බෑ කියනවා මෙහෙමයි කියලා.එතකොට මම උදේම ඇවිල්ලා මම ගොඩක් වෙලාවට ඔබතුමාට කතා කරනවා අඩුයි.මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාට කතාර කරනවා.එතුමා ඒක විසඳනවා මම නෑ කියන්නෙ නැහැ.මම හොයලා බැලුවම අනෙක් තැන්වල මිනින්සුත් මේ කරදර විදිනවා.ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේක විධිමත් විදියට කරන්න කියලා.කසල වත්තෙ බාන්න බැරිවුනාම ඊට පස්සෙ දවසෙ කියනවා ගන්න බෑ කියලා.ඒ ක්‍රමයට යම් විසඳුමක් දෙන්න නැත්නම් ලොකු අපහසුතාවයකට පත්වෙනවා මහල් නිවාස සංකීර්ණය වල ඉන්න ජනතාව.ඔබතුමා මේකට මැදිහත්වෙලා මේ ප්‍රශ්නය විසඳන්න.

**03(4)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි,ලුනාව මහල් නිවාස සංකීර්ණය ඉදිරිපිට ලූනාව මංසන්ධියේ තියෙන ඒ කොන්ක්‍රීට් තට්ටු ලැල්ලේ සහ කාණු අතර ලොකු හිඩසක් තියනවා.ඒ නිසා ඒ තට්ටු ලැල්ල අයින් කරලා අලුතෙන් කොන්ක්‍රීට් ලැලි දෙකකින් මේක වහන්න කියලා මම ඉල්ලීමක් කරා.මේකට යම් යම් අනතුරු සිදුවුනා.දැන් දවස් හතරකට පහකට කලින් ගරු නගරාධිපතිතුමනි, පාසල් දරුවෙක් පාසල නිමවෙලා බස් එකෙන් බැහැලා ඉදිබැද්ද මොරටුව බස් එකෙන් බැහැලා දරුවා එනකොට ඒ දරුවගෙ එක කකුලක් කාණුවේ වැටුණා. වෙලාවට දරුවාට හානියක් නොවුනේ ඒ දරුවාගේ මව ඒ දරුවා අතින් අල්ලගෙන හිටපු නිසා.එක පාරක් විශාල රිය අනතුරක් සිද්ද වුනා,එතන පාර පටුයි ලොකු බසුත් හරවනවා. මේ පොඩි කැල්ල කරගන්න බැරි නම් අපේ ගරු නගරාධිපතිතුමනි,අපේ රටේ සීගිරියට වතුර උස්සපු රටක් ධාතුසේන රජ්ජුරුවෝ කලා වැවට කලාවැවේ ඉඳලා තිසාවැවට වතුර ගෙනියපු දියුණු තාක්ෂණයක් තියෙන රටක්. අවුකන බුදුපිළිමය හරියට ළඹේට හිටවල තියන රටක්. මහා විශ්ම කර්ම කරපු ඉංජිනේරු තාක්ෂණයක් තිබ්බ රටේ අපේ ඉංජිනේරුතුමාට අඩි දෙකේ දෙකේ කොන්ක්‍රීට් ස්ලැබ් දෙකක් දාගන්න බැහැ.මොකක්ද ගරු නගරාධිපතිතුමනි මේකෙ තේරුම.යම් කිසි අනතුරක් සිදුවුනාට පස්සෙ ඔබතුමා බැනුම් අහලා වැඩකුත් නැහැ.අපි බැනුම් අහලා වැඩකුත් නැහැ.මේ ගැන හැකි ඉක්මණින් අවධානයට ලක් කරන්න.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඕ.දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, ආයාචනා හා පෙත්සම් පැමිණිලි යටතේ මම මේක අවස්ථාවක් කරගන්නවා ඊයේ දිනයේදී මගේ ස්වාමියාගේ පියාණන්ගේ අභාවය වෙනුවෙන් නගර සභාව වෙනුවෙන් සහභාගි වෙච්ච ගරු නගරාධිපතිතුමා ඒ වගේම නගරාධිපතිතුමාගේ ලේකම් රොෂාන් ජයසුන්දර මහතා ඒ වගේම විපක්ෂය වෙනුවෙන් සහභාගී වෙච්ච විපක්ෂ නායකතුමා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ට සහ මන්ත්‍රීවරියන්ටත් ඒ වගේම අදහනාගාරය වෙන් කිරීමේ සිට සියලුම දේවල් සඳහා සහයෝගය දැක්වූ නගර සභාවේ සියලුම සේවක මහත්ම මහත්මීන්ටත් පිරිසිදු කිරීම් වෙනුවෙන් සහය දුන්නු නගර මැද කලාපය භාර සම්පත් මහතා ඇතුළු ඒ සියලුම දෙනාටත් මගේ පවුල වෙනුවෙන් කරනවා.

**03(5)** <u>**මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසද එච්.අබේකෝන් මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ආයෙ පාරක් ටවුන් එකේ දිගටම කුණු බෑග් ඒක නිසා මං දන්නෑ ඔබතුමා වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනවා නමුත් ඒක දිගටම ලුනාව පාර දිගටම තියනවා.රවිනාත් ගුණසේකර මහත්තයාගෙ කාලෙ බෝ ගහ යට තිබ්බ කුණු වගේ පාර දිගටම කුණු දාගෙන යනවා. මං හිතන්නේ මං හිතන්නේ මේක ආයෙ ව්‍යාප්ත වෙලා. පාන්දර ගෙනත් දානවද දන්නෙ නෑ. මිනිස්සු වාහනවල දාගෙන ඇවිල්ලා සීබීඑච් රොඩ් එකේ දාගෙන යනවා. කුණු අදින්නෙ නැද්ද දන්නෙත් නෑ. දිගටම කුණු බෑග් තියෙනවා එළියට ගත්තම ගඳයි. මොරටුව ස්ටේෂන් එකේ ලක්ෂ දෙකක් තුනක් ගමන් කරන තැනත. කුණු අදින

කට්ටියගෙන් ඇහුවාම එ අය කියනවා.කුණු අදින්න එපා කිව්වා කියලා. ඒක නිසා ඔබතුමාගේ පාලනයට හොඳ නෑ.මොනවා නැතත් අපි ටවුන් එක සහ ඒ යන මංමාවත් ටික ලස්සනට තියාගෙන හිටියා.පරිපාලකයන්ට ඕටී දීලා වැඩක් නැහැ. ඔවුන්ව ගෙන්නන්න.අපේ කාලෙ කුණු ඇද්දෙ නැත්නම් ඕටී කරන එක නැවැත්තුව ඕටී සල්ලි දෙන්නෙ නැහැ. බයිසිකලයෙ පස්සෙන් එන කට්ටිය වාහනයේ නැගලා යනවා. නැගලා යන්නෙ කලෙක්ෂන් එක ගන්න. grand bolgoda දැන් කලවම් තියෙන්නෙ. ඒ වගේ සල්ලි බදින ආයතන දැන් කලවම් තියෙන්නෙ.මම දන්නෙ නැහැ කොහොමද කලවම් ටික යථා තත්ත්වයට පත්කරන්නෙ කියලා.අද කථා කරලා කිව්වම අද ඉදන් අදින්න එපා කියලා සේවකයන් අපහසුතාවයට පත්වෙනවා.ගොඩක් වාහනවලට මාසයට අටදාහ තිස්දාහ දෙනවා.මිනිස්සු සතුටෙන් දෙන්නෙ. ඒ කලවම් අදින නිසා. දැන් කලවම් අදින්නෙත් නැහැ.සල්ලි දෙන්නෙත් නැහැ. මේ කුණු වලට මොකක්ද වෙන්නෙ කියලා ඔබතුමා බලන්න ඕනා.මම සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා මේක හරියට හොයලා බලන්න.

**03(6)** **<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසද එච්.අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අලුකුට් සම්බන්ධව තිලකසිරි මන්ත්‍රීතුමත් කතා කරා. ගොඩාක් අය අපේ කල පහක් තියනවා.අපිට අරගෙන යන්න බැහැ. අපි වගකීමක් ඇති ආයතනයකට දීලා තියෙන්නේ පුලුවන් කාලයක් මේකෙ තියෙන්න ඕනා.මේක කොහෙවත් දාන්නෙ නැතුව අලුතෙන් තැනක් හදලා දෙන්න ඕනා.ඒ මුට්ටි ටික කොහෙහරි දාලා ඒ අංක ටිකත් එක්ක ලබාදෙන්න.

**03(7)** **<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසද එච්.අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, පරන පාරෙ කාණුවෙ සැලැබ් එකක් කැඩිලා තියනවා.හරියටම සෙන්ට්‍රල් සැලුන් එක ඉස්සරහ. පෙරේදා ළමයෙක් වැටිලා තුවාල වුනා. ඒක බලලා ස්ලැබ් කෑල්ල දාලා දෙන්න.

**03(8)** **<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, විශේෂ ස්තූතියක් කරන්න තියනවා ශ්‍රී ලංකා පලාත් පාලන ආයතනයේ සංසදයට පහුගියදා කාන්තා දින නිමිත්තෙන් ලංකාව පුරා මන්ත්‍රීවරියන් සඳහා විශේෂි අවස්ථාවක් උදාවුනා.එම අභිමානී සම්මාන උළෙලේ මට සම්මානයක් ලබාගන්න වාසනාම ලැබුනා.පසුගිය අවුරුදු පහ තුල දේශපාලන ක්ෂේත්‍රය තුල නියැලීම සම්බන්ධව බස්නාහිර පලාතෙන් තුන්දෙනාටයි ඒ සම්මානය ලැබුනේ.ඒ තුන්දෙනාගෙන් එක්කෙනෙක් විදියට මට සම්මානය ලබාගන්න නගර සභාව නියෝජනය කරමින් ඒ සම්මානය ලබාගැනීම භාග්‍යක් කොට සලකනවා.විශේෂයෙන් මේ සම්මානය පුදකිරිම වෙනුවෙන් මම ශ්‍රී ලංකා පලාත් පාලන සංසදයට හා අධ්‍යක්ෂකතුමිය හේමන්ති ගුණසේකර මැතිණිය සිහිපත් කරමින් ස්තූතිය පුදකරනවා .කාන්තා දේශපාලනය කියනනේ අභියෝග රාශියක්.සියයට විසිපහේ කාන්තා කෝටාව හරහා දේශපාලනයට ප්‍රවිෂ්ය වෙච්ච කණ්ඩායමක්. ඒ කණ්ඩායමේ ප්‍රථම අදියරේ සම්මානයකට ප්‍රාප්තවීමට මට ලැබීම සම්බන්ධව මම නැවතත් ශ්‍රී ලංකා පලාත් පාලන ආයතනයේ සංසදයට ස්තූතිය පුදකරනවා. ඒ වගේම ගරු නගරාධිපතිතුමනි, මොරටුමුල්ල කොට්ඨාශයේ හිතවත් සහෝදරියක් වන චිත්‍රානි පීරිස් මහත්මිය මා වෙත වට්ස්අප් පණිවිඩයකින් එවන ලද පැමිණිල්ලක් තියනවා.අපි කොච්චර පාර සුද්ධ කරත් පාරට කුණු ගෙනත් දානවා.මාලු ඔලු ගෙනත් දානවා.ලස්සනට තියෙන ගෙවල් ඉස්සරහට කවුරුහරි කුණු ගෙනත් දාන එක සාමාන්‍ය දෙයක් වෙලා තියෙනවා.එතුමිය කුණු බෑග් ටික ගද නිසා වත්තට ගන්න බැරි නිසා ගිනි තියලා තියනවා.එතුමියට විරුද්ධව පැමිණිල්ලක් පොලිසියේ තියනවා.එතුමියව පොලිසියට කැදෙව්වා පැමිණිල්ල සඳහා එහිදී අපිට කොටසක් තියනවා පාරවල් පවිත්‍ර කිරීම.නමුත් අපි පුංචිකාලෙ දැක්කා සතියට දවස් කිහිපයක් පාරවල් අතුගාලා

සුද්ධ පවිත්‍ර කරන දේවල්.ඒ තත්ත්වය දැනට නැහැ.නමුත් මිනිස්සු අපහසුතාවයට පත්වෙන දේවල් යම් යම් ස්ථානවලට මිනිස්සු කොටු කරලා දඩයක් ගහන තත්ත්වයට පරිසර අධිකාරිය මම හිතන්නේ නීති මාලාවක් සම්පාදනය වෙලා තියනවා.ඒ නීති මාලාවට අනුකූලව ජනතාව කිසියම් අපහසුතාවයකට පත්වෙන අවස්ථා තියනවා.පාරෙ තියන මාලු ඔලු බෑග් එකක් වත්තට ගෙනල්ලා පුච්චගන්න කිසිම කෙනෙක් කැමති නැහැ.පැමිණිලි යන්නෙ නගර සභා මන්ත්‍රීවරු හා දේශපාලන අධිකාරියෙ අය සමහර අවස්ථාවල වෛර පිරිමහන්නෙ ඒවගේ දේවල් කරනවා.ඒ සම්බන්ධව නගර සභාවේ කථා කරන්න කියලා එතුමිය මාව දැනුවත් කරා.සමහර අවස්ථා නීතිය රාමුව තුල ක්‍රියාත්මක වීම කොතෙක් දුරට ජනතාවට සාධාරණයිද කියලා එතුමිය ජනතාවට කියන්නේ.ඔබතුමා පසුගිය මුදල් කමිටුවේ තීරණය කරලා තිබ්බා වමින්ද පීරිස් මහතාට මුදලින් කොටසක් ගෙවීමට කැමැත්ත පල කරලා තිබ්බා.ගරු විපක්ෂ නායක සේනක දමයන්ත සිල්වා මැතිතුමා සහ මම ගිය මහා සභාවේ අදාල කරුණු ඉදිරපත් කරා.බෙහෙවින් ස්තූති වන්ත වෙනවා ඔබතුමාට සේවකයෙකුගේ ප්‍රශ්නයක් සම්බන්දයෙන් මැදිහත්විම සහ ඒ සම්බන්ධයෙන් කටයුතු කරාට.

**03(9)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි,පළමුවෙන්ම මම ශිරෝමි මන්ත්‍රීතුමියට සුභාශිංසන ලබාදෙනවා මොරටුවට ගෞරවයක් ලබාදුන්න එක ගැන.මම එතුමියට මොරටු ජනතාවගේ සුභාශිංසන පිරිනමනවා.මම පසුගිය සභා වාරයක කරුණක් ඉදිරිපත් කරා.අපි සුසාන භූමියේ පාරෙ හදපු බෝක්කුවේ දාපු කම්බි පිළිබද විමසීමක් කරා.මිලි මීටර අටේ කම්බි දාන එක ප්‍රමාණවත් නැහැ. මේ පිළිබද පරික්ෂණයක් කරන්න මෙම කම්බිය බොක්කුවට දාන්න පුලුවන්ද කියන එක ගැන.ඉදිරියේදී මේවගේ වැඩසටහන් වෙනාවනම් පාලක පක්ෂය වශයෙන් අවලාද එන්නේ ඔබතුමන්ලාට.ඔසද මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කරුණ මම ගිය සභා වාරයෙත කිව්වා.තාම සැල්බ් කැල්ල දාගන්න බැරිවෙලා තියනවා.මම ඉල්ලීමක් කරනවා මේ ගැන පරීක්ෂණයක් කරන්න කියලා.මිලි මීටර අටේ කම්බිය තිබුනෙ නැත්නම් මම ඒක මගේ අතින් හදලා දෙනවා.

**03(10)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, කිහිප දෙනෙකුගෙන් ආපු පැමිණිල්ලක් තියනවා. ජුබිලි පාරටත්, බිෂොප් ටෙරස් පැත්තටත් යන කාණුවක් තියනවා. ඔබතුමා දැනුවත්ද දන්නෙ නැහැ. නිලධාරින් නොදැනුවත්ව මේක වෙන්නත් බැහැ.නගර සභාවෙ සේවකයන් ගිහිල්ලා එක් වරක් මේක වහනවා.මේක නැවත වතාවක් ඇරලා තියනවා. ඇත්තටම මේක පොදු කාණුවක් වහන එක ලොකු ප්‍රශ්නයක්. මේක වහන්න සභා සේවකයො යොදවනවා. සභා අරමුදල් වැයවෙනවා. අරින්නත් සභා සේවකයො යොදවනවා. අරින්නත් සභා මුදල් වැයවෙනවා. සභාවට සැහෙන පාඩුවක් සිද්ද වෙලා තියනවා.මම ලිඛිත ඉල්ලීමක් කරන්නෙ නැහැ.මේ සභාවේ බැරිනම් ඊලග සභා වාරියේදී අපිව දැනුවත් කරන්න මේක මොන ආකාරයෙන්ද සිද්ද වෙන්නෙ කියලා.

**03(11)** <u>**මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි,අපේ සුසානභූමිවල වලවල් හාරන සේවකයො හතර දෙනෙකු ඉන්නවා.ඒ අය අපේ සුසාන භූමි හතරෙම වලවල් හාරන්නෙ. මේ අය දවසෙම ලොකු මහන්සියක් වෙනවා.ඒ අය මගෙන් ඉල්ලීමක් කරා තව සේවකයන් දෙදෙනෙකු බදවා ගන්න කියලා.සේවකයන් බදවා ගන්නකන් ඉල්ලීමක් කරනවා ඕටී පැය විස්ස ගානෙ දෙන්න කියලා.මගෙන් ඉල්ලීමක් කරා. ඒ ගැන හිතලා බලලා පුලුවන්නම් ඕටී පැය විස්සක් ලබාදෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**03(12)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ලුනාව මංසන්ධිය අනතුරුදායක සමංසන්ධියක් වෙලා නගරාධිපතිතුමනි, එතන මෑතකදී උදේ පාන්දර ළමයෙක් අනතුරකට ලක්වෙලා මැරුනා. සයිඩ් එකේ ටකරන් වලින් වහල තියන නිසා පේන්නෙ නැහැ. පුලුවන් නම් වේගය අඩාල කරන්න බම්පර් යොදන්න පුලුවන් නම් වඩා හොදයි.ලොකු මුල්ලක් තියනවා.ඒ මුල්ලට දර්පන කණ්නාඩියක් යොදන්න.එලදායිතා හා මුදල් උත්පාදන කමිටුවේදී අපේ විශාල ප්‍රශ්නයක් වෙලා තියනවා මොරටුවේ ලී කුඩු වලට විසදුමක් වශයෙන් සාකච්ජා කර කර ඉන්න කොට කොහු බත් ආශ්‍රිත මල් පෝච්චි නිෂ්පාදන කරනවා. අයිච්බී එකෙනුත් ලී කුඩු වලින් මල් පෝච්චි නිෂ්පාදනය කරලා තියනවා.පුලුවන් නම් කමිටුවක් පත් කරලා මේ ගැන සොයා බලලා වැඩසටහනක් ආරම්භ කරන්න කියලා.තෙලවල මල් පෝච්චි හදන තැනටත් අදහසක් ඉදිරිපත් කරලා.ලී කුඩු වලින් මල් පෝච්චි හදන වැඩසටහනක් අපි ක්‍රියාත්ක කරමු කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**03(13)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ආයාචනා හා පෙත්සම් පැමිණිලි යටතේ සමින්ද ඉන්දික පීරිස් අංක 21/බී, උයන උපනන්ද මාවත, කටුකුරුන්ද, මොරටුව. කියල තියෙනවා. ටී. ඒල්. සී. පුස්තකාලය සම්බන්ධ තියෙන පැමිණිල්ලක්. මේ පුස්තකාලයේ ආසන්නයේ පුස්තකාලයේ ගොඩනැගිල්ලක් ආක්‍රමණය කරලා වඩුමඩුවක් පවත්වාගෙන යනවා කියලා තියනවා. එතන පෙර පාසලක් සහ මාතෘ සායනයක් තියනවා.ඒ එන පිරිස විශාල අපහසුතාවයකට පත්වෙනවා වඩු මඩුවෙන් එන කුඩු නිසා දරුවො, අම්මලා ඒවගේම පුස්තකාලයට එන පිරිස් විශාල අපහසුතාවයකට පත්වෙනවා කියලා කියන්නේ. ඒ වඩු මඩුව අනවසරයෙන් පවත්වාගෙන යන එකක්. අපේ නගර සභාව භූමියත් අල්ලලා තමයි වඩු මඩුව පවත්වාගෙන යන්නෙ. පෙත්සම් කිහිපයක්ම ලැබිලා තියෙනවා. මේගොල්ලෝ ඉල්ලන්නේ සවින් කියල එක්කෙනා පෙස්සමක් දීලා තියෙනවා මේගොල්ලෝ ඉල්ලන්නේ වහාම පරීක්ෂණයක් කර ඒ අවශ්‍ය කටයුතු කරලා මේ වැඩේ නවත්තල දෙන්න කියන එක. ඒක නිසා මම පෙත්සම් දෙක සභා ගත කරනවා. ඊට අමතරව තව පෙස්සමක් ඉදිරිපත් වෙලා තියෙනවා. ඩබ්. ඩබ්. සමන්ලාල් ප්‍රනාන්දු හිටපු නගරාධිපති, වරිපනම් අංක 105/11, බෝධිරාජ මාවත, විල්ලෝරාවත්ත, මොරටුව. නාගරික මන්ත්‍රී සුජිත් පුෂ්පකුමාර මැතිතුමා හරහා ගරු නගරාධිපති නිශාන්ත ප්‍රදිනාන්දු වෙත. කටුබැද්ද සුපර්සිටි වෙළද සංකීර්ණය සම්බන්ධවයි. රජය විසින් දැඩි මූල්‍ය කළමනාකරණයක් සිදුකිරීමට කටයුතු කරන පලාත් පාලන ආයතන වල සේවයේ නියතු අය වෙනුවෙන් වැටුප් ප්‍රතිපූරණය කරන මහා නගර සභා ආඥා පනතේ අංක 105 වගන්තිය ප්‍රකාරව සභාවට අයවුය යුතු මුදල් පිළිබදව මහා නගර සභා ආඥා පනතේ 254 ආ 1(2) යටතේ නාගරික කොමසාරිස්වරියට පැවරී ඇති බලතල අනුව කටයුතු නොකර සිටීමෙන් සභාවේ ආදායමට හානියක් සහ අගතියක් සිදුකිරීමේ අරමුණින් ප්‍රවේශ මුදල් කපා හැරීම කටයුතු කරමින් පවතී.මීට පෙර සභාවට අයත් දිගරොල්ල දිනපොල සහ අනෙකුත් කඩ ලබා දීමේදී ප්‍රවේශ මුදල් අයකරමින් සභා ආදායමට එම මුදල් එකතු කර ඇති බැවින් තවද සුපර්සිටි වෙළද සංකීර්ණයේ සමහර කඩ හිමියන් විසින් ගිවිසුම් ප්‍රකාරව අදාල වෙළද කටයුතු සිදු නොකරන බවත් ගිවිසුම් කඩකරමින් තුන්වන පාර්ශවයේ කඩ ලබාදෙමින් කටයුතු කරමින් සිටින අයගේද ඉල්ලීම් පිළිබද හා දේශපාලන අරමුණු කටයුතු සිදු කිරීම තුලින් වරපනම් බදු ගෙවන අපගේ අයිතිවාසිකම් උල්ලංගණය වන බැවින් වරිපනම් බදු ගෙවන ජනතාව දැනුවත් කිරිමට පියවර ගන්නා බව ඉතා සංවේගයෙන් දන්වන බව සභාවට ඉදිරිපත් කරල තියනවා ලිපියක් ඒ ලියුම මම සභා ගත කරනවා.ඒ වගේම මේක ආඥා පනත අනුව මේ තියෙන පෙත්සම් හා පැමිණිලි යටතේ කතා කරාම කතා කරන්න බැහැ. හැබැයි ඉතින් මේ කනත්තේ අලුකුටි සම්බන්ධයෙන් ප්‍රශ්නයක් පැන නැගිලා තියෙනවා. දිගින් දිගටම අපිව දැනුවත්

කරනවා.ඒ ලිපි එවන මිනිස්සු ඒ අලුකුටි වල තියෙන අලුටික කොහෙද ගෙනියන්නෙ කියලා. අලුටික අරගෙන ගිහිල්ලා ගෙවල් වල තියාගන්න බැහැනෙ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමනි,මම කියන්නේ මේ පිට්ටනිය සංවර්ධනය කිරීමේදී දැන් අපිට සිද්ධ වුණා අර අනතුරුදායක තාප්පය ඉවත් කරලා අලුතින් තාප්පය ඉදිකරන්න.මේ කටයුත්ත කරද්දි දැන් අළුකුටි තියෙනවා මේ තාප්පෙ. එතකොට අපිට අනිවාර්යයෙන් මේ අළු කුටිය හිමි අයට දැනුම් දීමක් සිදු කරන්න. ඒ දැනුම් දීමට අදාළ ලිපිය අදාළ නොවෙන වගන්ති වලින් ඇතුළත් කළා. මේක තමයි කළේ. එනිසා නිලධාරීන්ට වගකීමක් තියනවා එවැනි ලිපියක් දාන්න කලින් අපිට පෙන්නලා දාන්න.එතන වරදක් වුනා. ඒ වරද වහාම නිවැරදි කලා.අපි නැවත ලිපියක් හැම කෙනාටම යවනවා. අලුකුටි හැම එකක්ම අපි ආරක්ෂා කරනවා.වහාම ඊට අවශ්‍ය කරන පියවර ගන්නවා.කාටවත් ඒක ගෙනියන්න අවශ්‍ය නැහැ.එහෙම බැහැ.සුසාන භූමි පනතට යටත් වුනාම යම් මුදලක් ගෙවලා අරන් තියෙන්නේ ඒක ආරක්ෂා කරන්න.ආරක්ෂා කරන්න අපි බැදිලා ඉන්නවා.නැවත ලිපියක් යොමු කරන්න කියලා මම කිව්වා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,ඒක බොහොම හොඳයි.මොකද හේතුව ඒ ලියුම කියෙව්වහම අලුටික ගිහිල්ලා ගෙදර තියාගන්න වගේ වැඩක් තියෙන්නේ.ඒත් එක්කම මම ඕකටම පොඩි අදහසක් එකතු කරනවා. පුලුවන් නම් මීට පස්සෙ අලුකුටි දෙනකොට වසර ගණනාවකට දුන්න නම් හරි.ජීවිත කාලයටම අලුකුටි තියාගන්න ඉඩම් නැහැ.මේ අලුකුටිය වසර කිහිපයකට කොහොමත් ඉටි පන්දම් පත්තු කරන්න එන්නෙ නැහැනෙ.පරම්පරාවක් ඉටි පන්දම් පත්තු කරන්න එන්නෙ නැහැ.බුද්ධාගම අනුව නම් මැරුණා එතනින් ඉවරයි.අපිනෙ ඕක බදාගෙන ඉන්නෙ. සභාවේ හරි යෝජනාවක් සම්මත කරලා යම්කිසි කාලසීමාවක් කාල පරාසයකට අලුකුටි දෙන්න පුළුවන් නම් ඒක වඩා හොඳයි. ඊට පස්සේ අලු ටික වළලලා දානවා. ඒක කරන්න පුළුවන් නම් හොඳයි.

**03(14)** <u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි,තව ප්‍රශ්නයක් තියෙනවා කටුබැද්ද ෆුඩ් සිටි ආයතනයට පිටිපස්සෙ තියෙන පාරෙ බිග් සිටි එක අයිනෙ තියෙන පාරෙ මහා නගර සභාවට අයත් නොවන මාර්ගයක් තියනවා. තාම සංවර්ධනය කරලත් නැහැ.මේ පාරවල් දෙක ජර්මන් ටෙක් එක පාර සහ ෆැෂන් බග් ආයතනය තියන පාරෙ එකතු වෙන පාර. මේ පාරෙ කලින් ප්ලෑන් එක පාස් කරපු එක දෙකට බෙදලා ප්ලෑන් එක පාස් කරන්න යනකොට ඒ මිනිස්සු ඒ පාරේ ලොකු ඉඩම් නෑ. සාමාන්‍ය පර්චස් හයේ හතේ ඉඩම් තියෙන්නෙ.ඒ මිනිස්සුන්ට කියලා තියනවා අපේ ටීඕ මැද ඉඳලා අඩි විස්සක් තියෙන්න ඕනා කියලා.අඩි විස්සක් තිබ්බම පාරක් හදන්න ඉඩ නැහැ. එහෙම කියල තියෙනවා. නැවත වරක් ඉංජිනේරුතුමා හම්බවෙන්න ආවම ඔහු කියලා තියනවා.මම ඒක දන්නනෙ නැහැ ටීඕ එක්ක ප්‍රශ්නය බේරගන්න කිව්වහම ටීඕ නැවත වරක් කියලා තියෙන්නේ මේක.ඒක නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. කරුණාකරලා මේක නිවැරදි කරලා දෙන්න මොකද හේතුව පවරාගත්ත නැති පාරක්. 2010 මං මේකෙ නියෝජ්‍ය නගරාධිපති වෙලා හිටිය කාලෙ එතකොට තමයි පවරාගත්ත කියලා කියන්නෙ. එහෙම පවරා ගැනීමක් උනේ නෑ. ඒ නිසා කරුණාකරලා මේ සම්බන්ධයෙන් සාධාරණීය කරන්න කියලා ගෞරවනීය ඉල්ලීම කරනවා.

**04.** **ප්‍රශ්න -** නැත

## 05. <u>යෝජනා</u>

**05(01) නියෝජ්‍ය නගරාධිපති, ඩබ්. පී. ප්‍රභාෂිණී වික්‍රමසිංහ මහත්මිය විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී,**

බොරුපන 549 A දරණ ග්‍රාම නිලධාරි වසමට අයත් සමගිපුර, ලක්සිරිපුර යන ප්‍රදේශවල ජීවත් වන ජනතාව අවුරුදු 30 කට අධික කාලයක් මෙහි නිවාස තනාගෙන ජීවත් වෙයි. නමුත්, මෙම ජනතාවට තමන් ජීවත් වන ඉඩමට අදාළ ඔප්පු ලබාදීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කර නැත. කොටසකට ඔප්පු ලබා දී තිබුණත් බොහෝ පිරිසකට ඔප්පු ලබා දී නොමැත. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් එම ජනතාව දැනුවත් කර ඇත්තේ මෙම ඔප්පු ලබාදීමට නගර සභාවේ අනුමැතිය අවශ්‍ය බවයි. එබැවින්, මෙම ප්‍රදේශයේ ජනතාවට ඔප්පු ලබාදීමේ ක්‍රියාවලියට මොරටුව මහා නගර සභාවේ විරෝධයක් නොමැති බවට ප්‍රාදේශීය ලේකම්තුමාට දැනුවත් කරන ලෙස යෝජනා කරන්නීය .

මහා නගර සභා මන්ත්‍රී, එම්.බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ යෝජනාවෙ තියෙන අන්තර්ගතය තමයි. ඔප්පු ලබාදීමේ ක්‍රියාවලියට විරෝධයක් නොමැති බවට ප්‍රාදේශීය ලේකම්තුමා දැනුවත් කරන ලෙස යෝජනා කරන්න කියලා. ප්‍රාදේශීය ලේකම් මේ සභාවෙන් විමසලා තියනවාද ඉඩම කාගෙද කියලා. විමසීමක් කරල නෑ කවුරුහරි ඇවිල්ලා ගමේ ඉන්න කෙනෙක් කිව්වා කියලා මේකට ලියුමක් යවන්න කියලා එහෙම ලියුම් යවන්න බැහැ.ඒ නිසා මේක සභාවෙ ඉඩමක් කියලා කවුරුහරි කියනවානම් මේකට ඉඩම් නිලධාරියා හරහා විමසීමක් කරන්න ඕනා.මේ ඉඩම කාගෙද නැත්නම් ඔබ ඒ අනුමැතිය දෙන්නේ ඔප්පු දෙන්න කියලා . හැබැයි එහෙම අවශ්‍යතාවයකුත් නැහැ.අපි තමයි ඔප්පු දෙන්න ඕනා.මේ ඉඩම් ටිකට සීයට පනහක් ඔප්පු අරගෙන ඉවරයි. ජනාධිපතිවරයා සමහර ඉඩම් ඉල්ලීම් කරලා තියනවා.මිනිස්සු සල්ලා ගෙවලා ඉවරයි.ඒ මිනින්සුන්ගේ ඉඩම් ඔප්පු ඉල්ලීමක් කරලා තියනවා ඉඩම් දෙපාර්තමේන්තුවට ජනාධිපතිතුමා අත්සන් කරන්නට ඕනා මේ ඔප්පු වලට. ජනාධිපතිතුමා පහුගිය කාලසීමාව තුළ තීන්දුවක් අරගෙන තිබ්බා කිසිම ඔප්පුවකට අත්සන් කරන්නෙ නැහැ.පොඩි පොඩි ප්‍රශ්න වගයක් ඇතිවෙලා. දැන් ආපසු පටන් අරගෙන තියනවා.මේක නගර සභාවෙ ලියමු ඕනා නැහැ. ප්‍රාදේශීය ලේකම් පැහැදිලිව ඔප්පුව දෙනවා.ජනාධිපතිතුමා අත්සන් කරලා එව්වාට පස්සෙ ඔප්පුව දෙනවා. අවශ්‍ය කරන මුදල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඔප්පුව දෙන්න අවශ්‍ය කටයතු කරනවා.ඒ නිසා මේ යෝජනාව ඵල රහිත යෝජනාවක් කියලා කියන්න තියෙන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මං හිතන්නේ ඇත්තටම මේ යෝජනාව මෙතනට උචිත වෙන්නෑ මේ යෝජනා ඉදිරිපත් කරල තියෙන විදියට. ප්‍රාදේශීය ලේකම්තුමාට අපි යෝජනා කරන්න ඕනා නැහැ.සභාව සතු ඉඩමක් නම් අපිට දෙන්න හැකියාවක් තියනවා.රජය සතු ඉඩමක් නම් ප්‍රාදේශීය ලේකම්තුමාට බලය තියෙනවා. කෙසේ වෙතත් ප්‍රාදේශීය ලේකම් ඉඩම් ඇමතිවරයා ජනාධිපතිවරය හරහා ඒ බලතල තියෙනවා. නමුත් මේ යෝජනාවේ ප්‍රායෝගික භාවය මං දකින්න ඇත්තටම මේ වෙලාවේ මේ ප්‍රාදේශීය ලේකම්තුමාව දැනුවත් කරන යෝජනයක් හැටියට තමයි මේක යවන්නෙ. මම හිතන්නෙ නැහැ මේක සුදුසු යෝජනාවක් වශයෙන්.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දූමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, විශේෂයෙන් මේ යෝජනාවත් එක්කම ගනිද්දි මොරටුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ මේ වන කොට හඳුනාගත්ත ව්‍යාපෘති රාශියක් තියෙනවා. විශේෂයෙන් වේරැස් ගඟ ව්‍යාපෘතියට සමගාමීව යන ව්‍යාපෘතිත් ඒ එක්කම ඊළඟට ගත්තම අපි ඒකාලේ පටන්ගත්ත බැට්රිවත්ත නිවාස ක්‍රමයත් එතනදි යන ජල පාලන කළාපත් පොම්පාගාර හැදිමේදිත් ඔවුන් ඒ සඳහා අහිමි වුනු ඉඩම් සඳහා හඳුනාගෙන ඒවා ගැසට් පත්‍රිකාවේ පළ කරලා තියෙනවා. ඒනිසා ගරු නගරාධිපතිතුමනි, මේ තියෙන යෝජනාවලට සාපේක්ෂව මට මතක විදිහට සමහරක් ඒවා ගත්තම තෙලවල පැත්තෙන් එන සෝමානන්ද මාවතේ තියෙන ප්‍රදේශයේ ටික අත්පත් කරගන්න යෝජනා වෙලා තියෙනවා ඒ වෙනුවට නිවාස ලබාදෙන්න. ඒවගේම පැල්පත් ආසන්නයේ තියෙන නිවාස ලබාදෙන්න.ඒත් එක්කම දන්දෙනියවත්තේ ඒ වෙනුවට නිවාස ලබාදෙන්න. එතකොට මේ ව්‍යාපෘති සමහරක් වෙලාවට අපි අනුමත කරොත් එහෙම අර මෙතුමන්ලා කියපු විදිහට විශේෂයෙන් අපේ තියෙන සමගාමී ලැයිස්තුවත් 13 වන සංශෝධනය යටතේ තියෙන පළාත් සභාවල ඉඩම් බලතල අවසාන වශයෙන් ජනාධිපතිවරයට පැවරෙනවා. ඒවගේම ජනාධිපති ලේකම්වරයාගේ අවසාන පුරුක විදිහට ඉන්න ප්‍රාදේශීය ලේකම්වරයා හා පහළට එනවා. ඒ නිසා ගරු නගරාධිපතිතුමනි, මේ ව්‍යාපෘති ටික එකට එකක් සට්ටනය නොවන විදිහට අපි ඒ ව්‍යාපෘතිවලට යටත්වන ප්‍රදේශ ද කියලා හඳනා ගන්න ඕනා. සමහර වෙලාවට මේ පැල්පත් ආසන්නව ඉන්න එහෙම ඉඩම්වලට ඔප්පු නැති පිරිස්වලටත් මේ ව්‍යාපෘතියෙන් ඉඩම් දෙන්න යෝජනා වෙලා තිබුණා. ඒනිසා ඒක හරියටම හඳුනා ගත්තේ නැත්තම් මම හිතන්නේ ව්‍යාපෘතිත් අනාගත සංවර්ධනයත් අතර සට්ටනයක් ඇතිවෙනවා. ඒ නිසා ඒ පිළිබඳවත් අවබෝධයක් ඇතිකරගෙන මේ කටයුත්ත කරන්න කියන එක තමයි අදහස. ඒනිසා මගෙත් විශ්වාසය මෙවැනි කාරණාවක් සම්මත කරලා අනවශ්‍ය ප්‍රශ්ණයක් දාගන්න ඕනේ නෑ කියලා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ යෝජනාව සම්බන්ධයෙන් කෙටි අදහසක් පළකළ යුත්තේ, මේ සම්බන්ධයෙන් යම්කිසි දැනුවත් වීමක් මා හට තියෙන නිසා. නියෝජ්‍ය නගරාධිපතිතුමී මේ යෝජනාවේ මුඛ්‍ය පරමාර්ථය බලාපොරොත්තු වෙන බොරුපන ප්‍රදේශයේ ලක්සිරිපුර, සමගිපුර කියන ප්‍රදේශයේ ජනතාවගේ සැලකියයුතු පිරිසක් ඔප්පු ලබාගැනීමට නොහැකිව සිටිනවා. ඒ අයට ඔප්පු ලබාදෙන එක ගැන කිසි ගැටලුවක් නෑ. දැන් මෙතුමිය කියන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසුවාම නගර සභාවේ විරුද්ධත්වයක් නෑ කියලා ලිපියක් ඉල්ලනවා කියලා. එහෙම ලිපියක් මීට කලින් කවුරුත් ඉල්ලලත් නෑ එහෙම ලිපියක් අපි දෙන්න බැඳිලත් නෑ අපේ ඉඩමකුත් නෙමෙයි. මේක රජයේ ඉඩමක් මේක එල්.ආර්.සී.එක යටතේ තියෙන ඉඩමක් මේක සම්පූර්ණයෙන් තියෙන්නේ ජනාධිපතිතුමා යටතේ. මේ අයට ඔප්පු ලබාදෙන්න කලින් ඉදලා ඒ වැඩසටහන ක්‍රියාත්මක වුණා. මෙතුමියගේ යෝජනාවේ තියෙන ප්‍රතිවිරෝධයයි මම මේ මතුකරන්නේ. අපි දන්නවා දැනටත් ඔප්පු ලබාදීලා තියෙනවා කිහිපයක්. සැලකියයුතු පිරිසකට ඔප්පු ලබාදීලා තියෙනවා. මේකේ තියෙනවා මේ ඔප්පු ලබාදෙන්නේ ඒ තමන් භුක්ති විඳපු ඉඩමේ කාලසීමාවන් අනුව තක්සේරුවක් කරලා. කලින් අපි ඉන්න කාලේ තක්සේරුව , ඒ කියන්නේ ඒ කාලෙට ගැලපෙන තක්සේරුවක් කරගන්න ගියාම ලොකු ගාණක් එනවා. අපි ඒක වෙනස් කරමු. මොකද 30ක් නිකන් හිස් ඉඩමක් තියලා සංවර්ධනය නොකරපු ඉඩමක පදිංචිවෙලා ඊට පස්සේ නගර සභාව වෙන්න පුලුවන් විවිධ ආයතන වෙන්න පුලුවන් ඒ මිනිස්සු වෙන්න පුලුවන් ඒගොල්ලෝ සංවර්ධනය කළාට පස්සේ ඒ තක්සේරු මුදල ඒ මොහොතේ තක්සේරු කළොත් ලොකු ගාණක් එනවා. එතකොට ඒ ගාණේ ප්‍රශ්ණය අපි කලින් වෙන්කරගෙන අපි කථා කරා ඒකේ යම් ප්‍රමාණයක් විසඳෙමින් තිබුණා. හැබැයි දැන් මතුවෙන ප්‍රශ්ණේ තමයි ඔප්පු දීලා තියෙනවා යම් ප්‍රමාණයක්. ඒ

තක්සේරු මුදල ගෙවලා ඔප්පු ලබාගත්තු අය ඉන්නවා. එතකොට ඒ මොහොතේ ඔප්පු ලබාගන්න කොට නගර සභාවේ ලියුමක් අවශ්‍ය වුණේ නෑ. එතකොට ඒ මොහොතේ ඔප්පු ලබාගන්න කොට නගර සභාවේ ලියුමක් අවශ්‍ය නොවන තත්ත්වයක් ඇතුළේ දැන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඔප්පු ලබාදෙන්න නගර සභාවේ ලියුමක් ඉල්ලන්නේ ඇයි කියන එක ලොකු ගැටලුවක් තියෙනවා. ඉතින් ඒ නිසා නියෝජ්‍ය නගරාධිපතිතුමියගේ උවමනාව අරමුණු ගැන කිසි තර්කයක් නෑ. ඒ වෙනුවෙන් මමත් පෙනී ඉන්නවා. නමුත් මේක ඉතාමත් දුර්වල හා තාක්ෂණික වශයෙන් වරදක් මේ යෝජනාවේ තියෙනවා. ඒ නිසා මේ යෝජනාව සම්බන්ධයෙන් මම නැවත වතාවක් සලකා බලන්න කියලා අප නගරාධිපතිතුමියගෙන් ඉල්ලා සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමා, අපේ උප නගරාධිපතිතුමියගේ යෝජනාව හොඳ යෝජනාවක්. නමුත් නගරාධිපතිතුමනි, නිවසක් හදලා තියෙනවා නම් ඒ ජීවත්වෙලා ඉන්න මිනිස්සුන්ට නිවසක් ඒ ඔප්පුව අනිවර්යයෙන්ම ලබාදිය යුතුයි. මොකද ඒ ලබාදීම තුළින් එයාට වටිනාකමක් ඇතිවෙනවා සෑම වැඩකටයුත්තක්ම. නගරාධිපතිතුමනි මේ ඉඩම් ප්‍රාදේශීය ලේකම් සතුයි. මොකද ඉඩම් තියෙන්නේ ප්‍රාදේශීය ලේකම්තුමා පරිපාලනය විදිහට එතුමාගේ භාරව තමයි ඉඩම් තියෙන්නේ. එතකොට ජනාධිපතිතුමාට තමයි ඉඩම් ඔප්පුවක් ලබාදෙන්න පුලුවන් හැකියාව තියෙන්නේ. ඒවගේම නගරාධිපතිතුමනි, අපේ ගරු රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා ජනාධිපති වෙලා ඉන්න කාල සීමාවේදී උරුමය කියන වැඩසටහනෙන් මේ ඉඩම් ඔප්පු ලබාදුන්නා ජනාධිපතිතුමා නමින්. එතකොට මේ සභාවෙන් අනුමැතියක් ගත්තේ නෑ. මහා නගර සභාවෙන් අනුමැතියක් ගන්න අවශ්‍යතාවයක් තිබ්බෙ නෑ. ඒක නිසා මේක සභාවේ අපි කැමති ඔප්පු ලබාදෙනවට. මොකද අපි දන්නවා බොරුපන ලක්සිරිපුර කියන්නේ ඉතා දුප්පත් අහිංසක මිනිස්සු ජීවත්වන එදිනෙදා රැකියාවල් කරලා ජීවත්වන ප්‍රදේශයක්. එමනිසා අපි කියන්නේ මේ ඔප්පුව අනිවාර්යයෙන්ම ලබාදිය යුතුයි. නමුත් සභාවේ අනුමැතියක් අවශ්‍ය නෑ. මේකේ බලතල තියෙන්නේ ප්‍රාදේශීය ලේකම්තුමාටයි ජනාධිපතිතුමාටයි. අපි කැමතියි හෙට හරි මේ ඔප්පු ලබාදෙනවා නම් ඒ ජනතාවට.

<u>ගරු නගරාධිපති - කේ.ඞී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, කියපු කාරණා ඇතුළේ අප සැළකියයුතු බොහෝ දේ තිබේ. හැබැයි මේ යෝජනාවෙන් කිසිම හානියක් සභාවට සිද්ධ වෙන්නේ නෑ සහ කවුරුහරි ඔප්පු දෙනවානම් අපි ඇයි විරුද්ධ වෙන්නේ. අපි යෝජනාවක් වශයෙන් සම්මත කර ගන්නවා හැබැයි ප්‍රාදේශීය ලේකම් ඔප්පු දෙනවා නම් මහ නගර සභාව කිසිලෙසක විරුද්ධ වෙන්නේ නෑ. අපේ විරෝධයක් නෑ. දැන් ජනතාවගේ පැත්තෙන් මතු වෙච්ච එකක්, මම කියන්නේ උප නගරාධිපතිතුමියගේ අරමුණයි යෝජනාවක් අතර පුංචි වෙනසක් තියෙනවා. ලොකු කාලයක් එතුමියට යම් ඉල්ලීම් දිගටම එනවා, කොටසකට ඔප්පු ලැබුනා කොටසකට ලැබුනේ නෑ. එතකොට ඒ ලැබිච්ච නැති සමහර අය නගර සභාවේ මොකක් හරි විරෝධයක් ගැන කියනවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින් කිව්වා කියලා. එතකොට එතුමිය කල්පනා කළා මේ යෝජනාව, මේ යෝජනාවෙන් අපට මොකක්වත් හානියක් නරකක් වෙන්නේ නෑ. නමුත් නගර සභාව ලෙස අපි මේ වේලාවේ සාකච්ඡාව ඇතුලේ මේ සාකච්ඡාව ගත්තත් නැතත් යෝජනා ආවත් නැතත් නගර සභාව විරුද්ධ වෙන්නේ නෑ ප්‍රාදේශීය ලේකම් යමෙකුට කාටහරි ඔප්පු දෙනවනම්.මෙහෙම ගැටලුවක් තියෙයි. නිවාස ඉදිකරනකොට යම් ප්‍රශ්ණයක් එනවා. කැඩෙන ඉඩම් වල පර්චස් 03, 03 1/2 , ඔන්න ඔතන ප්‍රශ්ණයක් තියෙනවා. ඒත් මම කියන්නේ එතකොට ඕනේනම් අපි වෙනම යෝජනාවක් හැටියට දාලා, දැන් අපි ගත්තොත් සමරකෝන් වෙලේ ප්‍රශ්ණයක් තියෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මම කියන්නේ එතුමියගේ යෝජනාව සංශෝධනය කරන්න පුලුවන්නම් අපි නගර සභාව කිසිදු විරෝධයක් නෑ මේ ඉඩම් ලබාදීමේදි ඒ නිසා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් මේ ඉඩම් වලට ඔප්පු ලබාදීම කඩිනම් කරන්න කියලා සංශෝධනයක් දැම්මා නම් තාක්ෂණික ගැටලුව නැතිවෙයි නගරාධිපතිතුමා.

**<u>නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා, මෙම යෝජනාව මම ඇත්තටම ඉදිරිපත් කරන්නේ මෙතුමන්ලා කිව්වා වගේම මේ කොට්ඨාශයේ ඉඩම් කොටසකට ඔප්පු ලබාදීලා තියෙනවා. නමුත් දැන් ටික කාලයක ඉඳන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින් පවසනවා නගර සභාව අනුමැතිය දෙන්නේ පර්චස් 06ට නිසා මේ පදිංචි අයට ඊට අදාළව මෙම ඔප්පු දෙන්න බෑ ඒනිසා ඔප්පු දෙන එක නවත්තනවා කියලා.අපි නගර සභාව අනුමත කරනවා නම් ඔප්පු දෙනවා කියලා කියන්නේ. ඉෂංකා ප්‍රාදේශීය ලේකම්තුමිය ඉන්නකොට නගර සභාවට යොමු කරපු ලිපියක් තියෙනවා ඒක මා ළඟ දැන් තියෙනවා මගේ ඔෆිස් එකේ. මම දැන් ඒක ගෙන්න ගන්නම්. ඒ ලිපිය මට සභාවට ඉදිරිපත් කරන්න පුලුවන්. මේකේ ප්‍රශ්ණේ තියෙන්නේ නගරාධිපතිතුමනි, මේ ඉඩම්වල අවුරුදු 25 , 30 පදිංචි ජනතාවක් ඉන්නේ. මේකේ සමහර වෙලාවට පර්චස් 06ත් තියෙනවා සමහර වෙලාවට ඊට අඩු කොටසකුත් තියෙනවා. හැබැයි මේ ගොල්ලෝ වසර ගණනාවක් ඉඳන් දීර්ඝ කාලයක ඉඳන් මේවායේ පදිංචි වෙලා ඉන්නවා. මෙන්න මේ නගර සභාවේ අනුමැතිය නෑ කියන එක නිසා ඔප්පු දෙන එක නවත්තලා තියෙනවා. මම ඉඩම් සම්බන්ධ නිලධාරිණියවත් මුණගැහිලා තමයි  මේ යෝජනාව ඉදිරිපත් කළේ. ඒනිසා මම ඉල්ලීමක් කරන්නේ නගර සභාවෙන් නිවසක් හදාගන්න අනුමැතිය දෙන එක වෙන කතාවක් හැබැයි මේගොල්ලන්ට හිමිකම දෙන එක වෙන ප්‍රශ්ණයක්. දැන් අපි විරුද්ධයි කියලා හිමිකම දෙන එක නවත්වලා තියෙන එක, ඒකට තමයි මම ඉදිරිපත් කරන්නේ අපේ එහෙම විරෝධයක් නෑ කියන එක ඉදිරිපත් කරමු කියලා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එහෙම කියනවා නම් ඒකත් නීත්‍යානුකූල නෑ. ප්ලෑන් එක අනුමත කරන එකයි ඔප්පු දෙන එකයි පැහැදිලිවම දෙකක්.ප්ලෑන් එක අනුමත කරනවද නැද්ද කියන එක තීන්දු කරන්නේ නගර සභාව. ඔප්පුව කියන්නේ පර්චස් 01 හරි ඒ මනුෂ්‍යයට තියෙන අයිතිය ඒ. ඒනිසා ඒක කිසි ගැටලුවක් නෑ. ඔප්පුව ලබාදීමට කිසිදු ප්‍රශ්ණයක් නෑ. ඒ නිසා දැන් මෙතුමිය කිව්වා මෙතුමියගේ ඔෆිස් එකේ ලියුම තියෙනවා කියලා. ලියුම එවන්න බෑ මෙතුමියට, ලියුම එවන්න ඕනේ සාමාන්‍යයෙන් නාගරික කොමසාරිස්තුමියට, එක්කෝ නගරාධිපතිට. කවුරුහරි නිළධාරියෙක් එහෙම වුනානම් ඒ නිලධාරියා කවුද කියලා බලලා ඒකට අවශ්‍ය කටයුතු කරන්න ඕනා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, අපි ඉස්සරහට යමු, මේකේ අපිට ගැටලුවක් නෑ. කොහොමත් විරුද්ධත්වයක් නෑ. යෝජනාවට පක්ෂව විපක්ෂව ගන්න ඕනේ නැනේ. ගැටලුවක් නෑ ඔප්පු දෙනවානම් අපි එකඟයි.

05(01) යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05(2) මහා නගර සභා මන්ත්‍රී ඒ.එච්.සුරේෂ් ඉන්දික මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී.**

ගරු නගරාධිපතිතුමනි, 5(2) යෝජනාව මම ඉදිරිපත් කරනවා. මම මේ සභාවෙන් ඉල්ලා සිටිනවා පොඩි සංශෝධනයක් ඇතුළත් කළාට කමක් නැද්ද කියලා. මම කරන්න හදන සංශෝධනය තමයි ගරු නගරාධිපතිතුමනි, මේකේ තියෙන්නේ වඩු කාර්මිකයන්ට තෙල් සහනයක් ලබාදෙන්න කියලා.මගේ සංශෝධනය තමයි වඩු කාර්මිකයන්ට හා ධීවර කාර්මිකයන්ට මේ තෙල් සහනය ලබාදෙන්න කියලා. කවුරුත් විරුද්ධත්වයක් නැනේ. මම සංශෝධිත යෝජනාව ඉදිරිපත් කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, සංශෝධනය මම කියවලා ඉන්නම්. මේකේ තියෙන්නේ මැදපෙරදිග ඇති වී තිබෙන යුධ තත්ත්වය හේතුකොටගෙන මොරටුව ජනතාව දැඩි පීඩාවට පත්ව ඇත. විශේෂයෙන්ම වඩු කර්මාන්තයේ යෙදී සිටින ජනතාවට ඔවුන්ගේ වඩු කර්මාන්තය පවත්වාගෙන යාම ඉතාම අපහසු ගැටලු සහගත තත්ත්වයක් වී ඇත මේ පිළිබඳව මේ සම්බන්ධයෙන් විශේෂ සැලකිල්ලට ලක් කර වඩු කර්මාන්තයේ යෙදී සිටින සහ ධීවර කර්මාන්ත යෙදී සිටින අයහට විශේෂ ඉන්ධන සහනයක් ලබා දෙන ලෙස යෝජනා කර සිටිනවා. ගරු නගරාධිපතිතුමනි අපි කවුරුත් දන්නවා මේ වෙලාවේ මැද පෙරදිග ඇතිවී තිබෙන යුද තත්ත්ව මුළු ලෝකයම ඉතාම බරපතල විදිහේ බලපෑමකට ලක් කරලා තියෙනවා. මේ යුද තත්ත්වය ඇතිවීමේ හේතුව වෙන එකක් මේක මේ සාධාරණ වුවමනාවක් හැටියට ඇතිවෙච්ච එකක් නෙමෙයි. ඇමෙරිකා එක්සත් ජනපදයට වුවමනා කරනවා ඒ අයගේ ඩොලර් එක දිගට වැටෙනවා වෙනත් මුදල් ඒකක ඉස්සෙනවා විශේෂයෙන්ම චීනය සහ රුසියාව, ඒ නිසා චීනය සහ රුසියාව වැටීමේ අරමුණින් ඒගොල්ලෝ තමන්ගේ ඒ අධිපතිවාදී ක්‍රියාමාර්ග මෙහෙයවමින් තියෙනවා. ඒකෙ එක පියවරක් ලෙස තමයි වෙනිසියුලාව ජනාධිපති සහ භාර්යාව නීති විරෝධී ලෙස පැහැරගෙන යාම. චීනයට වැඩිපුර තෙල් සපයන රටක් වෙනිසියුලාව, අනිත් රට ඉරානය දැන් ඉරානයට ගහන්නෙත් ඒ සැපයුම හරහා චීන ආර්ථිකය වට්ටන්න. එතකොට මේ මුක්ත බල අරමුණු වෙනුවෙන් අද මහත් මුළු ලෝකවාසී ජනතාව එහි වන්දි ගෙවන්නන් බවට පත්වෙලා තිබෙනවා. දැන් එහි කොටසක් ලෙස අපේ රටේත් ජනතාව ගොදුරු බවට පත්වෙලා තිබෙනවා. අපි දන්නවා මෙවැනි අවස්ථා නිර්මාණය වෙච්ච ලොකේ පළවෙනි අවස්ථාව මෙය නෙමෙයි. අපි දන්නවා කොරෝනා ආවා, යුක්රේන රුසියන් යුද්ධය ආවා, නැවත ඉරාන ඊශ්‍රායල් යුද්ධය ආවා එතකොට සැළකිවයුතු ලෙස තෙල් අර්බුධ, මිල වැඩිවීම් සිදුවුණා. අපිට තිබෙන විවේජනය තමයි දැන් මේ ඔබතුමන්ලාගේ වර්තමාන ආණ්ඩුව මීට කලින් තිබුණ ආණ්ඩුවලට කරපු විවේජනය තමයි පෙර සුදානම් නැති වුනේ ඇයි, ලොක වෙළඳ පොළ තෙල් මිල වැඩි වෙද්දි මෙහෙත් තෙල් මිල වැඩි කරනවනම් ආණ්ඩුවක් මොකටද, පිටකොටුවේ හතරවන හරස් විදියේ වෙළෙන්දෙකුට මේක දුන්නනම් හරිනේ ඇයි මේකට ජනාධිපති කෙනෙක්, ඇයි මේකට ආණ්ඩුවක් විදේශ රටවල් වලින් යමක් සිදුවෙනකොට මෙහෙත් මෙහෙම වැඩි කරන්න ඇයි ආණ්ඩුවක් කියලා විශාල විදිහෙ තමුන්නාන්සේලා විපක්ෂයේ ඉන්නකොට ලොකු කතා නිර්මාණය කරා. දැන් තමුන්නාන්සේලාගේ ආණ්ඩුවත් ඒ කතාවම තමයි කියන්නේ. හැබැයි අපිට කියන්න තියෙන කාරණාව තමයි මේ තෙල් මිල යම් කිසි විදිහකට අඩුකර ගැනීම සහ මැද පෙරදිග දිහා බලාගෙන තෙල් ලබා ගැනීම වෙනුවට ඉතාම රත්තරන් වගේ වටිනා අදහසක් ඉදිරිපත් වුණා වර්තමාන ජනාධිපතිතුමා ජනාධිපති වෙච්ච අවධියේම. ඒ තමයි රුසියානු ජනාධිපති, පුටින් ජනාධිපතිතුමා එතුමාගේ අත් අකුරින්ම ලියපු ලියුම එච්චා අත්සන් කරලා මේ ලංකාවේ විදේශිය තනාතිපතිතුමා අතේ එන්න අපිත් එක්ක බ්‍රික්ස් කියන සංවිධානයට සම්බන්ධ වෙන්න කියලා. එහෙම එවුවේ ඔබතුමන්ලාගේ ආණ්ඩුව රතු කොඩි

අරගෙන, දැකැත්තයි මිටියයි අරගෙන සමාජවාදී කියලා ඉස්සරහට අරගෙන එයි කියලා විශ්වාස කරා රුසියාවත්, චීනයත් ඒ නිසා එහෙම එච්චා. නමුත් ඔබතුමන්ලා එකට එකතු වුනේ නැහැ. චීනයේ තිබ්බා ෂැංහයි කෝපරේෂන් කියලා සමූළුවක් එකට ගියේ නැහැ. චීනයත් සමඟ අර්බුධයක ඉන්න ඉන්දියාවේ අගමැති මෝදිත් ගියා නමුත් මෙහෙන් ගියේ නැහැ. එහෙම ගියානම් චීනය රුසියාව මිතුරු පර්ශවයක් ලෙස තමයි ලංකාව දකින්නේ අද ලෝකයේ මේ තෙල් අර්බුධය එනකොට විශේෂයෙන්ම රුසියාවේ තෙල් තියෙනවා, ගෑස් තියෙනවා, ගල් අඟුරු තියෙනවා රුසියන් තනාතිපතිතුමා ප්‍රකාශ කළා ඔයගොල්ලන්ට හිතාගන්න බැරි මිලට අපි ගල් අඟුරු ලබා දෙන්නම් කියලා න්‍යෂ්ටික විදුලි කුඩා ප්‍රමාණයේ විදුලි බලාගාරයක් සතපහක්වත් අපි වියදම් නොකර ඒගොල්ලොම දෙන්නම් කියලා මේ මාස 3න 4කට කලින් කිවුවා රුසියන් තනාතිපති ඇහුවේ නැහැ. ඇයි ඒ රතු කොඩිය දාගෙන ආවාට ඇමරිකන් ගැතිවෙච්ච නිසා ඇමරිකාව තරහා වෙයි කියන බය නිසා. දැනුත් රුසියාවෙන් තෙල් දෙන්න රුසියන් නියෝජ්‍ය ඇමතිවරයෙක් ආවා ගිවිසුමක් තියෙනවා. දැන් මේ අර්බුධය නිසා ට්‍රම්ප්ට ඇති වෙන පීඩනය නිසා රුසියාවට තෙල් ගන්න සහනයක් දුන්නා ඒ කියන්නේ ඒ අයට සම්බාධක ඉවත් කරා මාසයක්. අන්න ඒ නිසා දැන් රුසියාව පැත්තට හැරුනා. රුසියාව කිවුවේ අවුරුද්දක් අවම තෙල් ගිවිසුම තියන්න ඕන කියලා. නමුත් මාසෙන් හදිසියේ මේ සම්බාධක ඉවත් වුනොත් මේ ඇමරිකන් ගැති ආණ්ඩුවට සිද්ධ වෙනවා රුසියාවෙන් තෙල් ගන්න එක නතර කරන්න මොකද මේ මාසයක් ඇතුළතදී නැවත සම්බාධක එනවා. අපි විශ්වාස කරන්නේ නැහැ මේ ජනතාව වෙනුවෙන් රුසියාවත් එක්ක හිටගනී කියලා මේ ආණ්ඩුව අන්න ඒ මගහැරීම කරපු නිසා තමයි ආසියාවේ වැඩිම තෙල් මිල ඉහළ යාමේ අභාග්‍ය සම්පන්න ඉරණමට මුහුණ දෙන්න මේ රටේ ජනතාවට සිදුවෙලා තිබෙන්නේ. එදා ඒ බ්‍රික්ස් සමුළුවට සහභාගී වෙලා රුසියාවත් සමග ඒ මිතුරු රටවල් සමග එකතු වුණානම් අද අපි මේ තෙල් අර්බුදයට මේ විදිහට මුහුණ දෙන්නෙ නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, දැන් මෙතුමා මේ යෝජනාව දෙන්නේ සහනයක් දෙන්න කියලනේ නමුත් මෙතන දේශපාලන කාරණාවක් මෙතුමා කතා කරනවා අපිත් ඒකට පිළිතුරක් දෙන්න සූදානම් වෙලා ඉන්නේ ඒ නිසා අපිට ඒ අවස්ථාව ලබා දෙන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, කාටත් මේ යෝජනාවේ තම තමන්ගේ අදහස් ඉදිරිපත් කරන්න පුළුවන් ඒ වගේම තවත් කාරණාවක් තියෙනවා කියන්න. මම මේ කියන්නේ තෙල් අර්බුදය වැඩිවීම නිසා ජනතාවට සහන දෙන එක වෙනම දෙයක් මේ අර්බුදයට ලක්වෙන්න හේතු වුනේ මේ අධූරදර්ශී ආණ්ඩුව ගත්තු ක්‍රියාමාර්ගය. ඒක අපි තේරුම් ගන්න ඕනේ ඒ වගේම අනිත් කාරණාව තමයි මේ වෙනකොට අපි කවුරුත් දන්නවා විදුලි අර්බුදයක් නිර්මාණය වෙලා තියෙනවා මෙම අර්බුදය නිර්මාණය වීමේ දී දවසකට ලක්ෂ අටක් බාල ගල් අඟුරු ගෙනල්ලා, ඒකෙන් ගසා කාලා ඒ හොරා කෑම නිසා දවසකට ලක්ෂ 8 ඩීසල් අද විදුලිය නිපදවන්න ලබාදීලා තිබෙනවා. එතකොට ඒකත් මේ තෙල් මිල වැඩිවීමට බලපාල තියෙනවා. මේ අය ආවේ මහින්ද හොරා කෑවා, රනිල් හොරා කෑවා.

- සභා ඝෝෂා -

ගරු නගරාධිපතිතුමනි, මෙයාලා ආවේ 76 වසරක් හොරා කාපු නිසා ජනතාවට සහන නැති වුණා ජනතාව දුප්පත් වුනා අපි ආපු ගමන් හොරා කෑම නතර කරනවා කියලා තමයි කිවුවේ. දැන් ජනාධිපතිතුමා කියනවා ගල් අඟුරු බාලයි ඒ නිසා ඉන්දියන් සමාගමට දඩ ගහනවා ඒ නිසා ගැටළුවක් නැහැ කියලා. රටේ ජනාධිපති කියන කතාවක්ද මේ, ඊට පස්සේ බිමල්

රත්නායක ඇමතිතුමා කියනවා ගල් අඟුරු බාලයි අපිට දඩ ගහන්න බැහැ දඩ ගැහුවොත් ඉන්දියන් සමාගම තරහා වෙනවා ඒ නිසා දඩ ගහන්න බැහැ කියලා. අද නිර්ලැජ්ජිතව ඉන්දියන් සමාගමට කඩේ යනවා. මේ රටේ මිනිස්සු අද ඉන්නේ ජීවත් වෙන්න බැරුව, අද වඩු කාර්මිකයන්ට ඔවුන්ගේ නිශ්පාදනයන් වැඩියෙන් විකිණීමට හැකි කාලය ඒ කාලයේ මේ විදිහට ඉන්ධන ලබා දීම සීමා කරලා. මේ විදිහට මිල වැඩි වුනාම තමන්ගේ නිශ්පාදන අලෙවිකර ගන්න බැරි වෙනවා. ධිවර කර්මිකයන්ටත් ඒ විදිහට වෙනවා. නිශ්පාදන මිල ඉහළ යනවා ඒ නිසයි අපි මේ සහන දෙන්න කියලා ඉල්ලන්නේ. මේ විදිහට තෙල් මිල, විදුලි මිල වැඩි වීම ජනතාව පිට පැටෙව්වේ මේ දූෂිත ක්‍රමය නිසා.

- සභා සෝෂා -

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, මේ අරමුණ පැහැදිලිනේ මෙතන තියෙන්නේ දේශපාලන අරමුණක් විතරයි. යෝජනාවක් කලා යෝජනාවේ අන්තර්ගතය පැහැදිලි, සංශෝධනයක් ඉල්ලුවා එකටත් අවස්ථාව දුන්නා. දැන් මේ යෝජනාව පදනම් කරගෙන වෙනත් දේශපාලන ප්‍රහාරයක් එල්ල කරනවා. දැන් තමන්ට යෝජනාවක් ඉදිරිපත් කරන්න ඕන කිවුවම ඒ සඳහා අවස්ථාව දෙනවා. දැන් සුපුරුදු ලෙස සහන ඉල්ලලා යෝජනාවක් ගෙනල්ලා දැන් වෙන පාරක යනවා එකෙන් සභාවේ සම්පූර්ණ කටයුතු අඩපණ වෙනවා. අවංකවම ජනතාවගේ ප්‍රශ්නයනම් නියෝජනය කරන්නේ මම කියන්නේ ඔය හැසිරීම වැරදි. මේක ලොකු විවාදයකට ගෙනියන්න එපා. ඔබ සහන ඉල්ලනවනම් ඒ සහන ඉල්ලීමට අදාල යෝජනාවනම් අපි සාකච්ඡා කරන්නේ එක කරමු එත් ඔබ එන්නේ අර පරණ පාරේනම් එක හොඳ නැහැ. යෝජනාවට අපි එකඟයි, සංශෝසනයට එකඟයි, අර්බුධයක් තියෙනවා එය පැහැදිලි කරා හරි. එකට වෙනම දේශපාලන ප්‍රහාරයක් එල්ල කර ගන්න ඕනිනම් එකට වෙනම ආණ්ඩුවට විරෝධී යෝජනාවක් ඉදිරිපත් කරන්න ගන්නම්. සහන යෝජනාවක් ගෙනල්ලා වෙන මොකද්ද එකක් කරනවනේ දැන්. මේ සභාව පවත්වාගෙන යන්න උදව් කරන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ යෝජනාවේ හරයත් එක්ක තමයි මේ යෝජනාව කරන්නේ. තමුන්නාන්සේලාට දේශපාලනිකව වදින්න පුළුවන් එකට අපිට කරන්න දේයක් නැහැ.

- සභා සෝෂා -

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීවරුනි, විපක්ෂය අද විරෝධය පළ කරා මොකද්ද තිබුණ ප්‍රශ්නය, කිසි ප්‍රශ්නයක් නැහැ අපි එකඟයි එක ප්‍රජාතන්ත්‍රවාදය. මම කියන්නේ සහන ගන්න යෝජනාවක් ගෙනල්ලා මේක ගන්නේ ඇයි එතනට. ඔබ එකට වෙනම යෝජනාවක් ගෙන්න ආණ්ඩුවට විරෝධය පාලා, මෙහෙම කරන්න එපා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, යෝජනාවක් ගෙනාවම එක විවාදයට ලක් කරන්න පුළුවන්.

- සභා සෝෂා -

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ යෝජනාව සම්බන්ධයෙන් සමානය යෝජනාවක් සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කරනකොට ඔබතුමා හොඳටම දන්නවා. මේක වඩු කර්මාන්තයට, ධීවර කර්මාන්තයට විතරක් එල්බගෙන ඉදිරිපත් කරන්න පුළුවන් යෝජනාවක් නෙමෙයි. මේක පුළුල් පාරාසයක් තියෙන යෝජනාවක් ඒ නිසා ඔබතුමන්ලාගේ ආණ්ඩු පක්ෂයේ ඉන්න කථිකයින්ට පුළුවන් මෙතුමා කියන කරුණු පිළිගන්නේ නැත්තම් ආණ්ඩු පක්ෂයේ කථිකයින්ට පුළුවන් ඒ තර්ක බිඳින්න මේක විවාදයකට යන්න මේක යෝජනාවක්, යෝජනාව විවාදයක් තියෙනවා ඒ නිසා කිසිම තහනමක් නැහැ. මේ කියක කාරණාව පිළිගන්නේ නැත්නම් ඊට එරෙහිව කතා කිරීමේ අයිතිය ඔබේ කණ්ඩායම සතුව තියෙනවා. නමුත් ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරයෙක් යෝජනාවක් ගෙනාවම මේක තමයි සීමාවන් කියලා සීමාවන් ඉදිරිපත් කරන්න, ඔබතුමා දන්නවා අවුරුදු 29 මෙහි හිටපු මන්ත්‍රීවරයෙක් හැටියට එහෙම සීමාවන් ඉදිරිපත් කරන්න බැහැ. ඒ නිසා එතුමාගේ කතාව එතුමාට කරගෙන යන්න එතුමාට ඉඩ දෙන්න. එකට පිළිතුරු කතාවට ඔබතුමාලාගේ පැත්තෙන් පිළිතුරු දෙන්න එක ප්‍රශ්නයක් නැහැ.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මම එතුමට අදහසක් ඉදිරිපත් කරේ. බැහැ කියන එකක් නෙමෙයි කිවුවේ. අපි අපේ දේශපාලන වුවමනා වෙනුවෙන් මේ දේවල් කරන්න අවශ්‍ය නැහැ කියලා මම පැහැදිලි කරේ. මත ගැටුම් අපි අතර තියෙනවා. හැබැයි ඔබ ඉදිරිපත් කළ යෝජනාව සංශෝධන ඉල්ලුවම එකත් දුන්නහම මම කියන්නේ ඒ යෝජනාවට අනර්ථයක් වෙනවා මේකෙන්. ඒ සහන ලබා දීම සඳහා මම කියන්නේ අපි මෙතනින් සීමා නොකර කොහොමද අපි එක උඩට කතා කරන්නේ, හැබැයි මේ යෝජනාවේ ඇත්ත එක යට යනවා වෙනත් ආණ්ඩු විරෝධී ප්‍රහාරයක් උඩ එනවා. මම කියන්නේ ඒක මේ වෙලාවේ කරන්න එපා මොකද අපි කාලයක් එක කළා. මෙයයි මායි ඒක හොඳටම කළා. න්‍යාය පත්‍රයට භාරගත්තේ නැතිවුනාම අපි වෙනම විදියකට ගියා. මම කියන්නේ දැන් එහෙම ප්‍රශ්නයක් නැහැ. දැන් අපි අවංකවම ඇත්ත තත්ත්වය තේරුම් අරගෙන ඉන්නවා. ඔබතුමා කිවුවා හරි අපිත් සූදානම් වෙන්න ඕන විවාද වලට, අපිත් කැමති විවාද වලට මම කියන්නේ සභාව පවත්ව ගන්න අපි සහයෝගයෙන් මේක කරමු කියලා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා මත් කියන දේ පිළිගන්නවා කියලා මත් දන්නවා. මේකේ එහෙම තහංචි දාන්න බැහැ. මම කියන්නේ මේ කාරණා මට ඔබතුමන්ලාව නිවැරදි කරන්නවත් මේ අයව නිවැරදි කරන්නවත් අවශ්‍ය නැහැ. මේක ඇතුලේ අඳුරු කුටිය තුළ දොරගුළුලාගෙන ගයන ගීතිකා වගේ කතා කරපු යුගය දැන් ඉවරයි. ඒ නිසා තමයි අපි විපක්ෂයක් විදිහට එළියට බැස්සේ මේ සටන අපි කරන එක වෙනම එකක්. මත් මේ කතා කරා කියලා නිශාන්ත ප්‍රදීනාන්දු හෙට මාලිමාවෙන් අයින් වෙන්නේ නැහැ, අපිට එහෙම අයින් කරන්න වුවමනාවකුත් නැහැ. මේක ඇති වෙච්ච හේතුව යම්කිසි තාර්කික පදනමක් ගොඩනඟන්න තමයි මම මේ අදහස ඉදිරිපත් කරේ. ඔබතුමාලා බලයට එන්න කලින් සහ බලය අත්පත් කරගත්තට පස්සේ තමුන්නාන්සේලාට තියෙන ප්‍රතිවිරෝධය මම මෙතන කියන්න ඕනේ නැහැ මුළු රටම එක දන්නවා. ඒ නිසා අවසානයේ මම කියන්නේ මේ ප්‍රශ්නය තමුන්නාන්සේලත් ප්‍රශ්නයක් නියෝජනය කරනවා, අපිත් පක්ෂයක් නියෝජනය කරනවා. අපි මේක පක්ෂ පැත්තකින් මේක බලන්නේ නැතුව රටේ ජනතාවගේ පැත්තෙන් බලුවොත් කොයි මට්ටමේ උනත් අද මේ ජනතාව ගිණි ගොඩක ඉන්නේ. අමාරුවෙන් ජීවත් වෙන්නේ එදිනෙදා ජීවත් වෙන මිනිහා හාන්සි එතකොට මේවාවල වගකීමක් තමුන්නාන්සේලාට තියෙනවා. වෙන අය එදා පාලනය කරද්දි තමුන්නාන්සේලා ඔය විදිහට නෙමෙයි හැසිරුනේ.

අද මේ විදිහට රාජපක්ෂගේ හරි රනිල්ගේ හරි ආණ්ඩුවක් තිබුණානම් අද තමුන්නාන්සේලා ඉන්නේ මෙහෙම නෙමෙයි. ඒ නිසා අපි විශ්වාස කරනවා මේ විවේජනය දරාගන්න පුළුවන් කියලා මිනිස්සු වෙනුවෙන්. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ ඇමතිවරයෙක් සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා එතුමා ප්‍රවෘත්ති සාකච්ඡාවක් කරලා කිව්වා සතියක තියෙන ඇඳුම් එක දවසකට හොඳන්න අනවසර විදුලි ලාම්පු නිවන්න. මේ රටේ ජනතාවට පටි තද කරගන්න කියලා එතුමා කිවුවා. හැබැයි මේ තියෙන තමුන්නාන්සේලාගේ භාවිතාවේ තියෙන අවුල එහෙම පටි තද කරගන්න කියලා එතුමා යනවා V8 එකේ. ඔබතුමත් දන්නවා මමත් දන්නවා අපිට එක ඉගැන්නුවෙත් වෙන කවුරුත් නෙවෙයි ටිල්වින් සිල්වා සහෝදරයා, ඒ කියුබාවට සම්බාදක පනවපු අවස්ථාවේ කියුබාවේ ජනාධිපති පිදෙල් කැස්ත්‍රෝ තෙල් නැති වුනා රුසියාව කා වැටිච්ච නිසා. ඒ වේලාවේ ඔහු කිවුවේ සමාජවාදය නැත්නම් මරණය කියලා. ඒ වයසක මිනිහා බයිසිකලේ ගත්තා. මුළු රටේ ජනතාව බයසිකලය ගත්තා. තමුන්නාන්සේලා කියනවා රටේ ජනතාවට පටි තද කර ගනිල්ලා අපි යනවා V8 එකේ කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, යෝජනාව එනකොටම මම නම් හිතුවා එන්නේ මොකාටද කියලා. මේ යෝජනාවට අපි කවුරුත් විරුද්ධ නැහැ, සහන දෙන්න එපැයි මේ වෙනකොටත් ප්‍රදේශීය ලේකම් කාර්යාලය මැදිහත්වෙලා ධීවර අමාත්‍යාංශය මැදිහත් වෙලා ඒ අදාල කාර්මික ක්ෂේත්‍රයේ සියලු දෙනාට අවශ්‍ය ඉන්ධන ප්‍රමාණය ලබාදීමට වැඩපිළිවෙළ සකස් කළ ක්‍රියාත්මක වෙනවා. ඒකෙ කිසි ගැටළුවක් නැහැ. ඉන්ධන සහන දෙන ප්‍රමාණ වැඩි කිරීමක් කරලා තියෙන්නේ. සහන දෙනවා බයවෙන්න එපා. මේ යෝජනාවෙන් උත්සහ කරන්නේ මොකද්ද කියලා අපි දන්නවා. මොකද පුද්ගලයාව දන්නවනේ කටාත් වඩා හොඳට මම. ඒ නිසා මේ යෝජනාව එනකොටම මම තේරුම් ගත්තා. මම ඊට පස්සේ තවත් හොයලා බැලුවා වැඩේ යනවා සහන දෙනවා. ධීවරයන්ටත් එක ක්‍රියාත්මකයි මම මේ දැනුත් ලේකම්තුමාට කතා කරා ඒවා ක්‍රියාත්මකයි එවට අදාල වැඩපිළිවෙල සකස් කරලා තියෙනවා. අපි පිළිගන්නවා ජනතාවට අමාරුයි එක මේ අපි කාටත් පොදු එකක් මේක මේ ලෝක අර්බුධයක් නිසා ඇති වුණ දෙයක් කියලා මුළු රටම දන්නවා. එදා තෙල් පෝලිම් හැදුනේ සුද්දේ නිසා අද යුද්දේ නිසා. දැන් මේ බාල ගල් අඟුරු කතන්දරයක් අල්ලගෙන මේක මහා ලොකු දෙයක් කියලා කතන්දරයක් ගොනු කරන්න හදනවා. මේක වාද කරලා වැඩක් නැහැ මොකද මේ උද්ඝෝෂනයට හිටියේ 15 ක් වගේ. එතන ජනතාව නැහැ ජනතාව දන්නවා මේක. ජනතාව මේ ඇත්ත දන්නවා. හඳුන්නෙත්ති සහෝදරයා ගියේ ඔහුට තියෙන V8 එකෙන්ද වෙන මොහොකෙන්ද කියන එක ජනතාව දන්නවා. මේවා මේ ෆෝටෝ ගහලා වීඩියෝ දාලා මෙන්න මෙහෙමයි කියලා කියනවා. ඊයේ පෙරේදා ලාල්කාන්ත සහෝදරයාගේ ගෙදර ගැනත් කියෙවුවා. දැන් මේ අපි ඉන්න ඕනි හිඟන්නෝ වගේද එක මාර වැඩක්නේ, ඒ නිසා මම කියන්නේ මේ දේශපාලන අවස්ථාව මේ රටේ පවතින අවස්ථාව ලෝකයේ පවතින අවස්ථාව ඉතාම බරපතල තත්ත්වයක් නමුත් අපි ඉන්ධන කළමනාකරණය කරලා තියෙනවා, මේ වෙනකොට අපේ රටේ පෝලිම් නැහැ ඒක ඉතාම හොඳින් කළමනාකරණය කරලා තියෙනවා. විදුලිය අරපිරිමැස්මෙන් පාවිච්චි කරන්න ඕන මොකද විශාල නියඟයක් ඇවිල්ලා තියෙනවා. ජලය පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා. ඒක කාලෙන් කාලෙට එනවා හැම රජයක්ම එවට අදාල ක්‍රියාමාර්ග ගන්නවා. විදුලිය අරපිරිමැස්මෙන් පාවිච්චි කරන්න කියලා කියනවා. එවා හැල්ලුවට ලක් කරමින් ඉන්නවා. මේ අය දිගින් දිගටම හොරා කලා නඩු වැටෙමින් ඉන්නකොට එයාලා උත්සහ කරනවා අපි හොරු කියලා කියන්න. මහත්තයෝ යන්න අල්ලස් එකට ගිහින් පැමිණිලි කරන්න. මේ සහන දෙනවට අපි අත් දෙකම උස්සලා ඉන්නේ, අපේ ආණ්ඩුවනේ සහන දෙන්නේ එවට අදාල වැඩපිළිවෙල ක්‍රියාත්මකයි ඒ නිසා නිකන් මේවා පදනම් කරගෙන නිකන් බොරු දේශපාලන මතයක් හදලා නිකන් ආණ්ඩුවට ප්‍රහාරයක් එල්ල

කරයි කියලා මේ රටේ ජනතාව එක ගණන් ගන්නේ නැහැ. මොකද ඔය කියවන බොහෝ අය ලඟදීම වැලිකඩ යනවා.  මේ ආණ්ඩුව රකින්නේ නැහැ අපි කවුරුත් වැරදි කරොත්, නගරාධිපති නෙමේ කවුරු උනත් වැරදි කරොත් එකට නීතිය ක්‍රියාත්මක වෙයි. කුමාර ජයකොඩි නෙමෙයි අනුර කුමාර වැරදි කරත් නීතිය ක්‍රියාත්මක වෙයි. එහෙම නීතියක් අපි හදන්නේ. දැන් තියෙන්නේ මේ යන්න සූදානමේ බය එකයි දැන් මේ දඟලන්නේ. වැඩිය කතා කරන්න ඕනෑ අපි මේ යෝජනාවට පක්ෂයි. සහන දීලා නැත්නම් ඒ සහන ලබා දෙන්න ඕන, තව සහන වැඩි කරන්න ඕන, එවට අපි එකඟයි. සහන මුවාවෙන් ඉතාමත් මජර තමන්ගේ කැත දේශපාලන උවමනාව ඉෂ්ඨ කරගන්න හදනවනම් එකට අපි විරුද්ධයි.

**<u>මහා නගර සභා මන්ත්‍රී  -  එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපේ සුරේෂ් ඉන්දික ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තිබෙන 05 (2) යෝජනාව සම්බන්ධව කතා කරනකොට, සුදේශ් මන්ත්‍රීතුමා කිව්වා අපි හිඟන්නෝ වගේ ඉන්න ඕනේද කියලා. හැබැයි මහත්තයෝ හිටියේ හිඟන්නෝ වගේ තමයි. දැන් නම් ඉතින් හිඟන්නෝ වගේ පේන්නෙ නැහැ. දැන් අර හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා ගත්තම පේනවා අර තැඹිලි ගෙඩියක් ගිලපු එක්කෙනෙක් වගේ තමයි අද බඩ දැක්කම පේන්නේ. ලැජ්ජ වෙන්න දවසක් එනවා.

\- සභා සෝෂා -

තමුන්නාන්සේලාගේ තියෙන්නේ තනිකර කුහක දේශපාලනයක්. කවුද කියලා කියන්න දෙයක් නෑ මුළු රටම දන්නවා හිඟන්නො වගේ හිටියේ කවුද කියලා. මේ නියෝජ්‍ය නගරාධිපතිතුමිය ඇයි වීදුරු කළු කරගෙන යන්නේ, මොකද යන්න බැහැ ලැජ්ජයි.

\- සභා සෝෂා -

**<u>ගරු නගරාධිපති  -  කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මේක මේ අලුත් තත්ත්වයක් නෙමෙයි මේ රට දීර්ඝකාලයක් පාලනය කරපු ඒ පක්ෂ වලට අදාල අයනේ මේ කතා කරන්නේ. ඔබට ඕන තරම් කරුණු තියෙනවනේ කතා කරන්න දෙන්න.ඊ එළිවෙනකන් හරි මේක පවත්වනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී  -  එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, සුරේෂ් මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තියෙන යෝජනාවට අනුව තමයි අපි කතා කරන්නේ පොඩ්ඩක් ඇහුම්කන් දෙන්න වැඩිවෙලා කතා කරන්නේ නැහැ. එතුමා මේ යෝජනාවෙන් අදහස් කරන්නේ මේ මැදපෙරදිග ඇති වෙලා තියෙන යුදමය තත්ත්වය නිසා එක රටට වගේම මොරටුව වඩු කර්මාන්ත හිමියටත්, වඩු කාර්මිකයටත්, ධීවර ජනතාවටත් එකී නොකී හැම කෙනාටම මෙය බලපාලා විදිහ ගැන. එතුමාට අපි ඇත්තටම අපි ස්තුතිවන්ත වෙනවා සියළුම වෘතිකයින් මේ ඉන්ධන වැඩි වීමත් සමඟ අසරණ වෙලා තියෙනවා. මේ ඉන්ධන මිල වැඩි වීම තුළින් කම්බි ඇණයේ ඉදලා හැම දේම මිල ඉහළ ගිහින් තියෙනවා. අද ඔවුන් අන්ත අසරණ තත්ත්වයට පත්වෙලා තියෙනවා. ඊයේ දවසේ අපි බලනකොට ඊයේ දිනයේ ඉඳලා විදුලි බිලත් වැඩිවෙනකොට මේ කුෂන් වැඩ සඳහා ගන්න හැම මීටරයකින්ම රුපියල් 250ක් 300ක් මීටරයකින් වැඩි වෙලා තිබෙනවා, කොට්ට සෙට් එකක් වැඩිවෙලා තිබෙනවා, ගම් ටික වැඩිවෙලා තිබෙනවා, ඇණ වැඩිවෙලා තිබෙනවා. මෝලේ ලී ඉරන ගාණ පවා වැඩිවෙලා තියෙනවා. අද එක නිසා ලී බඩුවක් නිමකරාට පස්සේ ඒ ලී බඩුව රුපියල් 1500කින් පමණ වැඩි වෙලා තියෙනවා. මම දන්නේ නැහැ මෙතුමා මේ ඉන්ධන සහනයක් දෙන්න කියන එක මොන අදහසකින් කිවුවද කියන එක. මේ වෙනකොට වඩු කර්මාන්තය වගේම මේ දෛනිකව වැඩ කරන රියදුරා අසරණ වෙලා තියෙනවා. මොකද

ඔවුන්ට තෙල් කෝටා එක දෙන්නේ ලීටර් 15යි. ත්‍රිවිල් රථ රියදුරෙකුට දිනකට තෙල් ලීටර් 5ක් 6ක් අවශය වෙනවා මොකද කුලී සේවයේ යොදවන්නේ මේගොල්ලෝ. ඉතින් අපි කියන්නේ මේ කිසිදෙයක් ප්‍රමාණවත් නැහැ. මේකට විසඳුමක් ලෙස අපි කියන්නේ තමුන්නාන්සේලා බලයට පත්වෙනකොට තමුන්නාන්සේලාගේ අතිගරු ජනාධිපතිතුමා අනුර කුමාර දිසානායක ජනාධිපතිතුමා මේ ජනතාවට ලොකු බලාපොරොත්තු දුන්නා. දහසක් පොරොන්දු දීලා තමයි තමුන්නාන්සේලා බලයට ආවේ, අද ඒ කිසිම පොරොන්දුවක් ඉටුකරගන්න බැරි තත්ත්වයකට පත්වෙලා තියෙනවා. තමුන්නාන්සේලාගේ ජනාධිපතිතුමා කිව්වේ මොකක්ද, විදුලි බිල 12000 තියෙන කෙනාට 9000 කිව්වා, 9000 තියෙන කෙනාට 6000යි කිව්වා, 6000 තියෙන කෙනාට 2000යි කිව්වා, 3000ක් ආපු කෙනාට 1000යි කිව්වා ඉතිම කෙටි කාලයකින් අපි මේ තත්ත්වයට ගේනවා කිව්වා. හැබැයි 12000 තිබුණ කෙනාට අද 18000 වෙලා, 9000 තිබුණ කෙනොට 12000 වෙලා, මේ වගේ හැම කෙනාටම මේ වගේ ලොකු වැඩි වීමක් වෙලා තියෙනවා. සහනය හැටියට අපි හිතන්නේ අද ඔස්ට්‍රේලියාව කියන්නේ සමාජවාදී රටක් නෙමෙයි. නමුත් ඒ අය මේ තත්ත්වය තේරුම් අරගෙන ඒ බර ජනතාවට දෙන්නේ නැතුව රජයක් විදිහට ඔවුන් ඒ බර අරගෙන තියෙනවා. අද ඒ ජනතාවට සහනයක් දීලා තියෙනවා. මගී ප්‍රවාහන සේවය සම්පූර්ණ නොමිලේ කරලා තියෙනවා. ඩීසල් වලට ගහන බද්ධ 100% අයින් කරලා තියෙනවා. අනිත් තෙල් වලට හරි අඩකින් අඩුකරලා තියෙනවා. අපි කියන්නේ මේකට සහනයක් විදිහටත්, ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ වෙනුවටත් අපි කියන්නේ මේ රජය ලබා ගන්න බදු අයින් කිරීම තමයි මේ ප්‍රශ්නය විසඳෙනකන් කරන්න තියෙන හොඳම දේ. මේ බද්ධ ඉවත් කිරීම තුළින් තමයි ලංකාවේ ඉන්න අපේ රටේ ඉන්න සියලුම වෘත්තිකයන්ට වගේ ජීවත්වෙන සියලු දෙනාට සහනයක් ලැබෙන්නේ නැත්නම් මේක වැඩිවීම තුලින් සියලුම දේවල් වැඩි වෙනවා. ඔබතුමන්ලාගේ රජයට කියලා මේ ජනතාව ගැන හිතලා දෙයක් කරන්න. අද ඔබතුමාලගේ ආණ්ඩුවේ මොන ඇමතිවරයා කතා කරත්, අතිගරු ජනාධිපතිවරයා කතා කරත් ට්‍රිලියන ගණන් මහා භාණ්ඩාගාරයේ සල්ලි තියෙනවා කියලා කියනවා. මේ සල්ලි තියන් ඉන්නේ ජනතාවට කරදරයක් වෙච්ච වේලාවට සහන දෙන්න. මේ ට්‍රිලියන ගණන් මුදල් පාවිච්චි කරලා මේ රටේ ඉන්න ජනතාවට සහ දෙන්න කියන ඉල්ලීම අපි පක්ෂයක් හැටියටත් මහජන නියෝජීතයෙක් හැටියටත් විශ්වාස කරන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපේ සුරේෂ් ඉන්දික මන්ත්‍රීතුමාට ඇත්ත වශයෙන්ම ස්තුතිවන්ත වෙනවා මේ කාලෝචිත යෝජනාව මේ අවස්ථාවේදී ඉදිරිපත් කරාට. රට පුරාම මේ අවස්ථාවේ මේ ලෝකයේ ඇතිවෙලා තිබෙන තත්ත්වය එක්ක අපේ රටට එය විශාල ලෙස බලපාල තියෙනවා. රටේ හැම කර්මාන්තකරුවෙකුටම මෙය බලපාලා තියෙනවා. මේ සහනය ආණ්ඩුවක් වශයෙන් හැමකෙනාටම දියයුතුයි. මම විශ්වාස කරන්නේ නැහැ ආණ්ඩුවක් වශයෙන් මේක කරයි කියලා. මේ යෝජනාවට අපි හැමකෙනාම කතා කරලා නිකන් පිටු පුරවනවා එච්චර තමයි මේකෙන් වෙන්නේ. මේ A4 බන්ඩල් එකක් රුපියල් 3000ක් වෙනවා. මේ වාර්ථාවන් ඔක්කොම හදන්න මම හිතන්නේ සභාවට යනවා රුපියල් ලක්ෂයක් විතර යනවා. ඉතින් අපි හැමෝම කරන්නෙත් අපරාදයක් මේ වේලාවේ. ඒ නිසා ඕනැවට වඩා කතා කරනවට වඩා මම යෝජනා කරනවා අපි දන්නවා අපේ සුදේශ් මන්ත්‍රීතුමා කිවුවා සහන මට්ටමේ යනවා කියලා සහන ලබාදෙන්න. අපිට පුළුවන්නම් අපේ සභාවේ හැමදෙනාම එකතු වෙලා ඌ වගන්තිය යටතට හරි මේ යෝජනාව ගෙනල්ලා මොරටුවේ වඩු කර්මාන්ත කරුවට සහ ධීවර කර්මාන්ත කරුවට අපේ අවශ්‍යම නොවන සංවර්ධන කටයුතු ටිකක් නතර කරලා සභා අරමුදලින් ඔවුන්ට සහනයක් දෙන්න අවශ්‍ය කටයුතු සුදානම් කරමු. කරන්න පුළුවන්නම් මේ වගේ දේවල් තමයි ප්‍රයෝගික ක්‍රියා. මේ යෝජනා ගෙනවට එවා ක්‍රියාත්මක කරන්න

අමාරුයි මොකද අපිට සහන දෙන්න පුළුවන් කමක් නැහැනේ. මේවා අපිට ආණ්ඩුවට කියන්න විතරයි පුළුවන් ඒ නිසා අපි පුළුවන්නම් මොරටුවේ ජනතාවගේ වරිපනම් බදු මුදල් වලින් ඔවුන්ට සහනයක් දෙමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මෙම යෝජනාව සම්බන්ධයෙන් දීර්ඝව කතා කරන්නේ නැහැ. හැබැයි ඉතාම කලෝචිත යෝජනාවක් මේකට පදනම් වෙලා තියෙන්නේ ධීවර කර්මාන්තය සහ වඩු කර්මාන්තය විතරයි හැබැයි ගරු නගරාධිපතිතුමනි මොරටුව ගත්තහම මොරටුවේ මේ ඉන්ධන උපයෝගී කරගෙන ව්‍යාපාර කටයුතු කරන තවත් ව්‍යාපාර රාශියක් තියෙනවා. එතකොට මේ ධීවර කර්මාන්තය සහ වඩු කර්මාන්තය හැර තවත් උදාහරණයක් තමයි අපේ එගොඩඋයන ප්‍රදේශයේ බහුතරයක් කරන්නේ පලතුරු අලෙවි කිරීමේ වෘත්තිය. එතකොට ලංකාව පුරාම යනවා තමන්ගේ වෘත්තිය සඳහා සමහර වෙලාවට ඉතාම දුර බැහැරට ගිහිල්ලා තමයි පළතුරු අරගෙන එන්නේ. එතකොට මෙන්න මේ පළතුරු අරගෙන එනකොට එවට යන්නවත් ඉන්ධන කොටාව ප්‍රමාණවත් නැහැ. උදාහරණයක් තමයි ඩිමෝබට්ටෙකුට සමානයෙන් දෙන්නේ පෙට්රල් ලීටර් 20යි. එතකොට සතියකට පෙට්රල් ලීටර් 20කින් එ මිනිස්සුන්ට හැරෙන්නවත් මදි මේ ව්‍යාපාරය කර ගන්න. ඒ නිසා විශාල දුෂ්කරතාවයන්ට මුහුණ දෙනවා මේ වෘත්තීන් වල යෙදෙන පිරිස්. ඒ නිසා අපි ඒ සම්බන්ධයෙන් ඔබේ අවදානය යොමු කරනවා. එක මන්ත්‍රීවරයෙක් ප්‍රකාශ කරා මේ වෙනකොටත් ඉන්ධන සහනයක් ලබා දෙමින් පවතිනවා කියලා. ඒ කියන්නේ මොන රටේද දන්නේ නැහැ මේ ඉන්ධන සහනය ලබා දෙන්නේ. මොකද හේතුව අපිනම් දන්නේ නෑ ඉන්ධන සහනයක් කාට හෝ මේ ලංකාවේ මේ වෙනකොට දෙනවා කියලා, මේ ඉන්ධන වැඩිවීමෙන් පස්සේ. ඒ නිසා ඉන්ධන සහනය කියලා කියන්නේ ඉන්ධන සහනය කියලා කියන්නේ කෝටාව වැඩි කරලා දෙන එක නෙමෙයි, සහනය කියලා මෙතන බලාපොරොත්තු වෙන්නේ අහස උසට ඉන්ධන මිල වැඩිවෙලා තියනවා, තවදුරටත් වැඩිවෙන්න තියෙන බව පේන්න තියෙනවා. එම නිසා මේ වෘත්තීන් කඩා වැටෙන්න පටන් අරන් තියෙනවා ඒ නිසා මේ වෘත්තීන් කඩා ඒ ඉන්ධන මිල යම්කිසි සංශෝධනයක් කරලා යම්කිසි සහනයක් දෙන්න කියන එක තමයි මේ යෝජනාවෙන් සුරේෂ් මන්ත්‍රීතුමා බලාපොරොත්තු වෙන්නේ. ඒ නිසා අපි පැහැදිලිව කියනවා මේ යෝජනාව ඉතාම කාලෝචිත යෝජනාවක්, අපිට මේක ගැන කතා කරන්න විශාල වපසරියක් තියෙනවා. ඉන්ධන මිල වැඩි වෙන්නේ කොහොමද, යුද්ධය නිසාද නැතිනම් මේ ආණ්ඩුවේ තියෙන අකාර්යක්ෂමතාවය නිසාද විදුලි බිල වැඩි වෙන්නේ කොහොමද, විදුලි බිල වැඩි වීම තුළින් මේ ව්‍යාපාර වලට විශාල බලපෑමක් වෙලා තියෙනවා. ව්‍යාපාර කඩන් වැටෙන්න පටන් අරන් තියෙනවා. වඩු කර්මාන්තය ගත්තහම විදුලිය කියන එක නැතුව වඩු කර්මාන්තය සිදු කරන්න බැහැ. වර්තමානයේ මැෂින් තමයි මේ සඳහා යොදා ගන්නේ. මේ විදුලි බිල වැඩි වීම තුළින් වඩු කර්මාන්තයට විශාල ප්‍රහාරයක් එල්ල වෙලා තියෙනවා. ඒ නිසා මේ ඉන්ධන සහ විදුලිය වැඩි වීම තුළින් මොරටුවේ ඉන්න මිනිස්සු විශාල වශයෙන් ලොකු අපහසුතාවයකට, අවදානමකට මුහුණ දීලා තියෙනවා. මේ කර්මාන්තයන් බිඳ වැටීම සම්බන්ධයෙන් මේ සඳහා අවධානය යොමු කරලා මේ මොරටුවේ ඉන්න ජනතාවගේ වෘත්තීන් ආරක්ෂා කරන්න නගර සභාවේ මහජන නියෝජිතයින් හැටියට අපි යම් ක්‍රියාමාර්ගයක් ගමු ඔබතුමලා යම් ක්‍රියාමාර්ගයක් ගන්නවනම් අපි එකට උපරිම සහයෝගය ලබා දෙනවා. මේ යෝජනාවට අපගේ උපරිම පක්ෂපාතිත්වය දක්වනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, ඇත්තටම මේ යෝජනාව ඉතාමත් හොඳ යෝජනාවක් සහ කාලෝචිත යෝජනාවක්. මම හිතන්නේ ඔබතුමා මේ පැත්තෙ හිටියනම් ඔබතුමත් මේ විදිහට තමයි ඒ අදාල විදිහට රටේ වත්මන් තත්ත්වය පිලිබඳ අදහස් දක්වන්නේ. මොකද හොඳ දේට

හොඳයි කියන්න ඕන. අපි හැමෝම රටේ තත්ත්වෙත් එක්ක ජනතාව ඉතාම අපහසුතාවයෙන් තමයි දැන් කල් ගෙවන්නේ මේ යන විදිහත් එක්ක. ඉතින් ඒවට අදාල ඔබතුමා තමයි දැන් නිසි බලධාරියා මෙතන ඉන්න. මොරටුවේ ජනතාවගේ ප්‍රශ්න කතා කරන්න තමයි අපි මෙතනට එන්නේ ඉතින් ඒ ප්‍රශ්න කතා කරන්න ආවම ඒ ප්‍රශ්න වලට ඇහුම්කන් දීලා අදාල විසඳුම් සොයන්න තමයි අපි හැමෝම එකතුවෙලා කටයුතු කළ යුත්තේ. ඉතින් මේ වගේ අවස්ථාවක මම හිතන්නේ පීඩනයට පත්වෙලා ඉන්නේ ජනතාව. හැම අංශයකම රැකියා තත්ත්වයන් ඉතාම භයානක තත්ත්වයකට, අඩාල තත්ත්වයකට පත්වෙමින් තියෙනවා. විශේෂයෙන්ම ත්‍රීරෝද රථ රියදුරන්ට ලැබෙන ඉන්ධන ප්‍රමාණය සම්බන්ධයෙන් ඔවුන් සතුටට පත්වෙන්නේ නැහැ. මම කොළඹ හයර් එකක් ගිහිල්ලා පැය එකහාමාරක් විතර හිටියා ඔත්තේ ඉරට්ටේ ප්‍රශ්නය මත ඔහුට තෙල් ලැබුනේ නැහැ. ඉතින් ඒ වගේ මිනිස්සු පත්වෙලා ඉනින තත්ත්වය දකින්න ඔබ බිමට බහින්න ඕන, ඔබ ඇහුම්කන් දෙන්න ඕනා, ඔබ ක්‍රියාත්මක වෙන්න ඕන. මේක මගහරින්නවත් කාටවත් කැගහලා විසඳුම් හොයන්නේ නැතුව නිශ්ශබ්දව ඉන්න පුළුවන් වෙලාවක් නෙවෙයි මේක. ඉතින් අපි විපක්ෂයක් විදිහට අපි හැමෝම ඔබතුමාට කියන්නේ මොරටුවේ ජනතාව පමණක් නෙමෙයි මුළු රටේම ජනතාව මේ අවස්ථාවේ විශාල පීඩාවකින් ඉන්නේ. මිනිස්සුන්ගේ දැවෙන ප්‍රශ්න තියෙනවා. ඔබ මේ පැත්තේ ඉන්නකොට කතා කරපු ආකාරය අපිට හොඳට මතකයි. ඉතින් මේ වෙනුවෙන් ජනතාව වෙනුවෙන් මොරටුවේ ප්‍රධාන පුරවැසියා විදියට ඔබේ අවධානය යොමු කරන්න කියලා කියන ගමන්ම සුරේශ් ඉන්දික මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා මෙවැනි යෝජනාවක් ගෙන ඒම සම්බන්ධයෙන්.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, විවාදාත්මක භාවයක් නැහැ. යෝජනාවට සියලු දෙනා පක්ෂයි එතකොට අපේ මොකක්ද විවාදය. ඒවගේම සමන්ත මන්ත්‍රීතුමාට ගොඩාක් ස්තුතිවන්ත වෙනවා මොකද යෝජනාවේ අරමුණට හානි කර තත්ත්වයක් ඇති වෙමින් තිබ්බව එක සමන්ත මන්ත්‍රීතුමා මේක හරි තැනකට ගෙනාවා. එනිසා එතුමාට ගොඩක් ස්තුතියි ඒක තවදුරටත් සුජීත් මන්ත්‍රීතුමා ඇත්තටම විය යුතු දේ පැහැදිලි කරා. ඇත්තටම ඔබ අපි දන්නවා මේ අර්බුදය ආණ්ඩුවක් නිර්මාණය කරපු අර්බුදයක් නෙමෙයි. මේ අර්බුදය අපි කැමති ද, අකමැතිද කියන තැනින් සාකච්ඡා කළ යුතු එකක් නෙවෙයි කැමති උනත් අකමැති වුණත් මුහුණ දෙන්න වෙලා තියෙනවා. එහෙමනම් අපට ජාතික මට්ටමෙත්, ප්‍රදේශිය මට්ටමෙත් අපි කවුරුත් පක්ෂ විපක්ෂ බෙදයකින් තොරව මේ තත්ත්වෙට කොහොමද අපි මුහුණ දෙන්නේ? අපි හැමෝම සාකච්ඡා කරන්න ඕන අපි කොහොමද මේ තත්ත්වය කළමනාකරණය කර ගන්නේ, ඒවගේ විවිධ දුර්වලකම් තියෙයි, අඩුපාඩුකම් තියෙයි, අතපසු වීම් තියෙයි. අපිට මතකයි අපි ආණ්ඩු වලට විවේචන එල්ල කළත් බොහෝ අර්බුද වලදී මැදිහත් වෙලා වැඩ කළා, උපරිමයෙන් වැඩ කළා එය වැඩ කරන ගමන් විවේචනය කළා. ඒ නිසා මම එවා දීර්ඝ කාලයක් අරගෙන කියන්න යන්නේ නැහැ. ඔබත් අපිත් දන්නවා රට තිබ්බව තත්ත්වය ඒ තත්ත්වයෙන් යම් මට්ටමකට වෙනසක් කර ගන්න හදනකොට ස්වාභාවික විපතයි ඊළඟට මේ ජාත්‍යන්තරයේ ඇතිවෙච්ච තත්ත්වය. එවට වෙන වෙන විග්‍රහා තියෙයි ඒක කළමනාකරණය කරගෙන යනකොට පාලනය පැත්තෙ සමහර සමහර අඩුපාඩුකම් දුර්වලතාවයන් තියෙයි. හැබැයි මම කියන්නේ ඔබේ අවංකවම අරමුණ මේ තත්ත්වයෙන් මොරටුවේ ජනතාව පීඩාවට පත්වීම වළක්වා ගැනීම නම් මුහුණ දිය යුතුයි අපි ඒ මුහුන දීමේදී ඒ බල ශක්ති පැත්තේ තියෙන ගැටළුව අපි කළමනාකරණය කර ගනිද්දි භූමි මට්ටමෙන් අපි කොහොමද මේ කළමනාකරණය කරන්නේ, මේ ධීවරයාට හරි වඩුවට හරි, අපේ ත්‍රීවිල් රථවලට හරි අනෙකුත් පොදු ජනතාවට හරි යම් සහනයක් දෙන්න නම් අප යම් කැප කිරීමකට යන්න වෙනවා මේ විදුලි බලය කොහොමද ප්‍රමාණාත්මක අඩු කිරීමකට

යන්නේ. ඒ සංවාදය මේ යෝජනාව ඇතුලේ ගත්තට කමක් නැහැ. නමුත් මේක දේශපාලන පැත්තකට ගියොත් එය හනිකරයි යෝජනාවට. මොකද අපි කිසිසේත්ම මේ යෝජනාවට විරුද්ධ නැහැ. වෙනත් දේශපාලන විවේජන කරගන්නවනම් අපි වෙනත් යෝජවක් ගෙනල්ලා ආණ්ඩුවට විරෝධය පළ කිරීම හරි එහෙම එකක් කරමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පිරීස් මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, සුරේෂ් මන්ත්‍රීතුමා මේ ඉදිරිපත් කරලා තියෙන යෝජනාව අපිට වැදගත් වෙන්නේ වර්තමානයේදී පැන නැගලා තියෙන විදුලි අර්බුදය වගේම, අනිත් පැත්තෙන් තෙල් අර්බුදය වගේම, අනිත් පැත්තෙන් භාණ්ඩ මිල වැඩිවීම වගේම, අනාගතයේදී එන්න තියෙන ප්‍රශ්න විශාල රාශියක් තියෙනවා. ඒ නිසා මම හිතන්නේ ආණ්ඩුවක් විදියටත් එවගේම නගර සභාවක් විදියටත් අපිට අනාගතයේ තියෙන ගැටලු අවදානම් කළමනාකරණය සහ අපදා කළමණාකරනය පිලිබඳ මිල පෙර කතා කරා. මේ විශය ක්ෂ්ත්‍රයන් වලට අනුව විද්‍යාත්මකව යම් විසඳුමක් ලබාදුන්නේ නැත්නම් ඒ විද්‍යාත්මකවත්, දේශපාලන විද්‍යාවට අනුවත් සත්‍ය විද්‍යාවට අනුවත්, ගුප්ත විද්‍යාවට අනුවත්, ජෝතිෂ්‍ය විද්‍යාවට අනුවත් අපිට මේ යන අඳුරුගමන නවත්වන්න බැරිවෙනවා. විශේෂයෙන්ම අපිට මේ ප්‍රශ්නත් එක්ක ගනිද්දී ආණ්ඩුවට ඒවගේම පාලක පක්ෂය හැටියට ඔබතුමාලටත් යම් විද්‍යානුකූල ක්‍රමවේද වලට යා යුතුව තිබුණා. හැබැයි ඒ විද්‍යානුකූල ක්‍රමවේද තියාගෙන අපි අර දම්මික පැණිය වගේ කටයුතු වලදී ඒ සම්බන්ධව ගියා කියන තර්කය මතයි මේ ප්‍රශ්නය උග්‍ර වෙන්නේ. පිලිගන්නවා ලෝක යුද්ධයක් තියෙනවා මිට පෙරත් එහෙම ඇවිලලා තියෙනවා ඒ අර්බුදයත් එක්ක අපට යම් දේශපාලනික වශයෙන් ලෝක යුද්ධය පැත්තෙන් ගත්තම නැත්නම් දේශීය වශයෙන් ගත්තම ඒ පිළිබඳ ප්‍රශ්න ඇතිවෙලා තියෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මේ පිළිබඳ තත්ත්වයක් ඇතිවුණාට පස්සේ සාපේක්ෂ සහ නිරපේක්ෂ වාසිය පිළිබඳ රොබට් ඩී කප්ලාන් තමන්ගේ මොන්සූන් කියන පොතෙන් 2013 ඉදිරිපත් කරලා තියෙනවා. ඒ නිසා විතැන් භාවය ඉස්සර පැසිෆික් සාගරයට තිබ්බ ඒ වාසිය ඉන්දිය සාගරයට අත්පත් වීම හරහා මේ ප්‍රශ්නය අපිට බලපානවා කියන එක බොහොම පැහැදිලි. ඒ නිසා මේ රටේ තිබුන ආණ්ඩු ඒ විද්‍යාත්මකව හඳුනගෙන එවාට ක්‍රම සහ විධි නගර සභා හරහා යෝජනා ඉදිරිපත් කරලා තියෙනවා. ඇයි ඒක ක්‍රියාත්මක නොකරන්නේ කියන ප්‍රශ්නය තියෙනවා. ඒ නිසා මම කියන්නේ මේ ප්‍රශ්නයට පමණක් නෙමෙයි අනාගතයේ එන ප්‍රශ්න වලට හරියට ආණ්ඩුවත් නගර සභාවත් ශෝට් ඇනසිලස් එකක් කරන්න ඕන. ඒ තමයි අපිට තියෙන මොනවද දූර්වලතා මේ එන ප්‍රශ්න වලට අපිට මොනවද තියෙන විසිඳුම් කියලා බලන්න ඕන. හැබැයි ආණ්ඩුවක් විදිහට මම හිතනවා තමාත් ඔබතුමාලා එතනට ගිහිල්ලා නැහැ. නගර සභාවක් විදිහට අපි එතනට යා යුතුයි. එතකොට තමයි විද්‍යාත්මකව මෙයට මුහුණ දෙන්න පුළුවන් වෙන්නේ.

ගරු නගරාධිපතිතුමනි, එහෙම නැත්නම් වඩු කර්මාන්තයෙන් වඩුවා වඩුවැඩෙන් දිවි රකින බොහො දුකින් කල් ගෙවන දුප්පතයෙකි මන් කියලා කිවුවේ. හැබැයි ඒ විදුලි බිලෙන් කරන්ට් වැදිච්ච, තෙල් මිලෙන් වාහනය නැවතිච්ච, ඒ වගේම බඩු මිලෙන් බිම වැටිච්ච ඩවුවෙක් අපිට උරුම වෙනවා. ඒ විතරක් නෙමෙයි අනිත් පැත්තෙන් අපි කියනවා " වෙරළ කොණක හිඳ බලා හිදින්නම් ඔබ එන මහ මා පවන් සැලි කියලා" ඇත්තටම බොට්ටුවේ ගිය ධිවරයට යන්න බැරි වුනොත් ඔවුන්ට වෙන්නේ පරණ මතක අවාර්ජණය කරන්න විතරයි.

ගරු නගරාධිපතිතුමනි, මීළඟ ප්‍රශ්නය මොකද්ද මේ විදුලි අර්බුදය එක්ක අද වෙනකොට අපේ විදුලි ඉල්ලුම කොච්චරද කියලා ආණ්ඩු පාර්ශවයෙන්වත් තවම අර්ථකතනයක් නැහැ. අපි දන්නවද මේ වර්සයේ අපේ විදුලි ඉල්ලුම කොච්චරක්ද කියලා. මම මහජන උපයෝගීතා කොමිෂන් සභාවට ගිහිල්ලා අපේ අදහස් ඉදිරිපත් කරද්දි විශේෂයෙන් මම කිවුවා මේ අවුරුද්දේ අපේ විදුලි ඉල්ලුම බිලියන 8.4 ක් එකෙන් 4.2 ක් නිෂ්පාදය වෙන්නේ ගල් අඟුරු වලින් එක බිඳ වැටුනොත් අපිට විශේෂයෙන් නොරොච්චෝලේ බලාගාරයේ තියෙන ප්‍රධාන

යන්ත්‍ර එකක් බිඳ වැටුනොත් ඒක යාතාවත් කරන්න සමානයෙන් දවස් 3 ක් 4 ක් යනවා. ඒ වගේම යම් විදිහකින් ගල් අඟුරු හරියට බා ගන්න බැරි උනොත් එහෙම මේ මෝසම් සුළන් එක්ක අපිට දින 7ක් 8ක් මේ ප්‍රශ්නය එනවා. මේ ප්‍රශ්නය තවම හරියට අවබෝධ කරගෙන නැහැ. ඒ වගේම අපේ මොරටුව පැත්ත ගත්තහම වඩුවට, ධිවරයාට, පළතුරු වෙළෙන්දට, මේසන් බාස් වගේම අපේ මොරටුව මෝදර, එගොඩඋයනේ තමයි අනිත් පැත්තෙන් ඉන්නේ කොන්ක්‍රීට් වලට සැලැබ් ගහන මිනිස්සු අද බැලුවොත් සිමෙන්ති කොට්ටයක මිල තිබුනේ 1900යි. එක 2150ක් වුනා, හෙට අනිද්දා තව රුපියල් 150කින් වැඩි වෙනවා. ඒ නිසා ගෙයක් හදන මනුස්සයෙක් රුපියල් 37500යි 75000යි එකතු කරලා වැඩිපුර සිමෙන්ති විකට දෙන්න වෙලා තියෙනවා. අනිත් පැත්තෙන් මේ විදුලිය බ්ලොක් වෙච්ච ගමන් මම කිවුවා ඔබතුමා මේ කටයුත්ත ආරම්භ කරනකොට මන් කිවුවා විද්‍යාත්මක තීන්දු තීරණ ගත්තේ නැත්තම් අපිට වෙන බලපෑම. මට පෙනිච්ච එක මම කිව්වා. මම මේ මන්ත්‍රීවරුන්ට කිවුවා මෙහෙම ගියොත් එහෙම අනාගතයේදී ගෑස් පෝලිමක් එනවා කියලා. විශේෂයෙන් ඕමාන් ට්‍රේනින් එකෙන් තමයි අපිට ගෑස් සැපයෙන්නේ. මේ වරදක් කියනා නෙමෙයි එහෙම ගෑස් සැපයුවහම ඕමාන් ට්‍රේනින් එකට තිබුණා නැව් 4ක් ඒ වගේම ඔහුට තිබුණා නළ පද්ධති සහ ඔවුන්ට සම්පත් තිබුණා. හැබැයි අපේ බ්‍රිඩ් එක කාටද දුන්නේ, එක ඕමාන් ට්‍රේනින් එකෙන් නැතුව තමන්ගේ ආයතනයක්වත් නැති එහෙම ආයතනයකට තමයි මේ ගෑස් දුන්නේ. එ නිසා අද ගෑස් අර්බුදයක් ආවේ. ඒනිසා ඒ ගෑස් එක යම් විදියකින් ලාෆ් සමාගමත් යම් අවතීරණ වීමක් තාම වෙලා නැහැ. ලිට්රෝ සමාගමත් එහෙමයි. ඒ නිසා විශේෂයෙන් මුදිත පීරිස් අපේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා ඉන්න කාලේ එතුමට විරුද්ධ වුනා. විශේෂයෙන් ඒ මුදිත පීරිස් හරහා ගෙනිච්ච ක්‍රමවේදය ඉතාම වැදගත්. එ නිසා මම හිතන්නේ එවැනි මිනිස්සු මෙවට සම්බන්ධ කර ගැනීම වැදගත්. ඒ වෙනකොට සංචිත ප්‍රමාණයක් භාණ්ඩාගාරයෙන් අරගෙන ඒ භාණ්ඩාගාරයේ ණය පියවන්න ඔහු සමත්වුනා. ඒ වගේම තමන්ට හම්බවුන වාහනය පාවිච්චි කරනවා තියා තමන්ගේ වැටුපවත් ඔවුන් ගත්තේ නැහැ. ඒ නිසා අද අපිට එහෙම පිරිසක් අපිට අවශ්‍යයි. ඒ නිසා මේ ගෑස් ප්‍රශ්නයත් එක්ක වෙන්න පුළුවන් කියලා මම මාස ගණනකට කලින් කිවුවා. ඒ වගේම ඉන්ධන පොලිමක් එනවා කියලා කිවුවා එක ආවා. මේ අපදාවන්ට මුහුණ දීම රජයක් විසින් කළ යුතු දෙයක්. ඊට පස්සේ මේක හරියට වෙන්න බැරි වුනොත් අනිවාර්යයෙන්ම මේ අවුරුද්ද මේ අපිට තියෙන නොරොච්චෝලේ ගල් සැපයුම බැරි වුනොත් ඒවගේම අපිට මෝසම් සුළං ඇති වුනොත් එනිසා විශේෂයෙන් මේ අවුරුද්දත් අපට රට අනුරට සුභ නැකත කිව්වට අපට අඳුරේ තමයි මේක පවත්වන්න වෙන්නේ. ඒ නිසා මම ජනාධිපතිතුමාට කියනවා රට අඳුරට යන්නේ නැති වෙන්න මේ වැඩේ එකතු වෙලා කරමු කියලා. මම මීට පසුව කිව්වා මේකත් එක්ක ඇතිවෙනවා කියලා, ඒ තමයි හදිස්සියේවත් විදුලි සැපයීම අඩුවුණොත් එහෙම ඊළඟට එන ප්‍රශ්නේ තමයි ලබුගම සහ කලටුවාවෙන් අනෙත් පැත්තෙන් කළු ගඟේ ජලය අඩු වෙනවා. මේ අසන්න පිළියන්දල තියෙන නගර කිහිපයකට මේක බලපාලා තියෙනවා. ඒ නිසා ළිං පෝලිමක් එනවා. ඒ නිසා මම ඉලහට ඔබතුමාට කියනවා අවදානම් අපදා කළමනාකරණය යටතේ ජුනි මාසේ වෙනකොට අපේ වැටුප් ප්‍රතිපූර්ණය අපිට හම්බවෙන ප්‍රමාණය අපිට දැන් හම්බවෙන්නේ 40% යි ඉතුරු 60% හම්බෙන්නනම් එක කතා කරලා කරගන්න, අපිට සිංහාසනේ තියලා දෙන්නේ කියලා එදා මේ මන්ත්‍රීතුමා කිවුවා. එහෙම දීපු මිනිස්සුම තමයි දවසක දෙන්නම්කෝ ලොක්කා ඉදිමෙන්නට බොක්කා කියලා දෙන්නේ ඒ නිසා හදිස්සියේවත් මේක කළමනාකරණය කරගත්තේ නැති වුනොත්. ඉලඟ අවදානම තමයි මම දකින්නේ මෙතන නගර සභා 334ක් තියෙනවා එවා වල මම දකින විදිහට ආයතන 13ක විතරයි බ්‍රේක්ඉවෙන්ට් එකෙන් උඩ තියෙන්නේ. ඉතුරු 320කට අසාන්න ප්‍රමාණයකට වැටුප් ගෙවාගන්න බැරි වෙනවා. ඒ නිසා ඒ ප්‍රශ්නය එනවා ඊට පස්සේ ඒ වැටුප් පෝලිමත් එක්ක අපිට එක කළමනාකරණය කර ගන්න බැරි වුනොත් ඊලඟට මහජන පීඩාව නතර වෙන්නේ මේ මන්ත්‍රීවරුන්ගේ ගෙවල් ලඟ. හිටපු නගරාධිපති සමන්ලාල් ප්‍රනාන්දු මහතා මට කිවුවා සජිත් මල්ලි අවුරුදු 20කටවත් ගෝඨාභය මහත්තයා දෙන්නේ නැහැ කියලා. මම එතකොට කිවුවා ලබන අගෝස්තු වෙනකොට මම උඩට එන්නම් එතකොට ඔයා ඔතන නෙමෙයි ඉන්නේ වෙන තැනක තමයි කාර්යාලය තියෙන්නේ කියලා. ඒ නිසා මම කියන්නේ එක ආවොත් අපේ මන්ත්‍රීවරුන්ව අපි ආරක්ෂා කරගන්න ඕන. නැත්නම් ඉලහට අස්වීම් සහතිකය දෙන්න වෙන්නේ ඉලඟ අරගලය ගෝල්ෆේස් එකේ නෙමෙයි විශේෂයෙන්ම අපේ ගෙවල් අවට. එතකොට මන්ත්‍රීවරුන්ට ඉල්ලා අස්වීම් දෙන්න වෙනකොට පාර්ලිමේන්තුවත් සමහර විට තව මාස කිහිපයකින් සීයාම

ආයි අත්පත් කරගන්න පුළුවන්. ඉලහට අපිට ආහාර ප්‍රශ්නය, පොහොර ප්‍රශ්නය එන්න පුළුවන් මේ ප්‍රශ්නත් එක්ක අපි හරියට පිලිතුරු හෙව්වේ නැත්නම්. අනුර කුමාර මහත්තයා වගේ අපිට බොරු කියන්න බැරි වුනානේ, විදුලි බිල අඩු කරනවා කිව්වා, අපි එහෙම බොරු කිව්වේ නැහැ නගරාධිපතිතුමා එකයි අපිට එන්න බැරි වුනේ. අපි කිව්වේ නැහ V8 වල යන්නේ නැහැ කියලා නමුත් අපි ප්‍රයෝගිකව ඔප්පු කරලා තියෙනවා තියෙන දේවල් නැති කරගෙන කොහොමද කරන්නේ කියලා. බොරු කියන්න බැරි වෙච්ච නිසා අපි විපක්ෂයේ ඉන්නවා ඇත්ත කියන්න බැරි වෙච්ච හින්දා ඔබතුමන්ලා ඔතන ඉන්නවා. දවසක් එනවා මේ ඉල්ලා අස්වෙන් මන්ත්‍රීවරුන්ගෙන් සංඛ්‍යාපූර්ණය සම්පූර්ණ කරන්න බැරි වුනොත් මේ නගර සභාව නැතව වතාවක් කොමසාරිස් පාලනයකට යන්නත් පුළුවන්. ඒ නිසා එසේ නොවන විදිහට මේ කටයුතු ඉදිරියට කරගෙන කම්කරුවගේ මේ ප්‍රශ්න ටික විසදලා ඔවුනට සහනය දෙන්න කියලා ඉල්ලනවා.

- සභා ඝෝෂා -

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, අපි කවුරුත් කරන්නේ දේශපාලනය මොකද ඔබතුමා බබෙක් නෙමෙයිනේ, ඔබතුමත් ලොකු දේශපාලන අවබෝධයක් තියෙන කෙනෙක්. ඔබතුමා හොඳට දන්නවා යෝජනාව න්‍යාය පත්‍රයට ඇතුළත් වෙනකොට යම්කිසි දේශපාලන ප්‍රහාරයක් එල්ල වෙනවා කියන එක. එහෙම නොදන්න කෙනෙක් නෙමෙයි ඔබතුමා. නමුත් මට කියන්න ඕනකම තියෙන්නේ මේ සභාව පටන් ගත්තු දවසේ ඉඳලා ඒ කියන්නේ ඔබතුමා නගරාධිපති ධූරය දරන්න පටන්ගත්තු දවසේ ඉඳලා මගේ කතාවන් හැම දෙයක්ම මම කේන්ද්‍රගත කලේ පුද්ගලිකව නෙමෙයි. මන් කාටවත් පුද්ගලිකව මේකේ මඩ ගහලා නැහැ, ඔබතුමාගේ ඉඳලා කාටවත් පුද්ගලිකව විවේචන කරල නැහැ. මම කරපු හැම කතාවක් ඇතුලෙම තියෙන්නේ ඉතා බැරෑරුම් දේශපාලන කතාවක්, දේශපාලන කාරණාවක්, දේශපාලන විවේචනයක් මම අද කරෙත් එක. මෙතන වෙන ආන්ඩුවක් හිටියනම් මම මේ විවේචනය කරන්නේ නැහැ. නමුත් රනිල් වික්‍රමසිංහ මහත්මයා කියනවා එයා හිටියනම් එයා යන්නෙත් බික්ස් එකට කියලා. එවා නොකරපු එකේ පාපය තමයි මේ අද ගෙවන්නේ කියන එක තමයි මම කිව්වේ. මම මේ ලඟදි ඔබතුමාව හම්බවෙන්න ඔබතුමාගේ කාර්යාලය සොයිසාපුර ක්‍රීඩාංගනය ගැන කතා කරන්න එතනට යනකොට ඇත්තටම දැන් වෙනද එහෙම යනකොට බොහොම සුවපහසුයි ඒසී එක තියෙනවා. මම යනකොට මෙතුමා ඉන්නවා එක ජනේලයක් ඇරගෙන මොකද ඒ නගරාධිපති කාර්යාලයේ කොහෙන්වත් හුලන් එන්නේ නැහැ. ඒක හදලා තියෙන්නේ තනිකර ඒසී වලින් විතරක් ඉන්න හුළන් එහෙම එන්නේ නැතිවෙන්න. මෙතුමා දාහඩිය දාගෙන එක ජනේලයක් ඇරගෙන ඉන්නවා. මන් විනාඩි 5යි හිටියේ මටත් ඉන්න අමාරු වුනා. එතතුමා දවසම ඉන්නේ කොහොමද කියලා හිතාගන්න බැහැ. හැබැයි ඒ එක් කැපකිරීම ඒ පරිත්‍යාගය මට දුක ගරු නගරාධිපතිතුමනි මම අර පරණ ජේවීපී කාරයා තවමත් ඔබතුමාගෙන් දකිනවා ඒ ගෞරවය මන් ඔබතුමාට දෙනවා. ඒත් මට තියෙන දුක ඔබතුමා ඉන්න පක්ෂයේ ඉහළ නායකයන් එහෙම නැහැ. ඉහළ නායකයොත් ඔබතුමා වගේ ආදර්ශමත් වුනානම් සමහර විට මේ රටේ ජනතාව මේ තරම් දුක් විදින එකකුත් නැහැ. ඒක කියන්නයි මට ඕනකම තියෙන්නේ. අවසානයේදී කෝසොල් රජතුමා දුටුව ඒ හීන හතෙන් හතරවෙනි හීනය විතරක් කියලා මන් නවත්තන්නම්, “මහා බර ගැලක් ළපටි ගොනුන් කිහිපදෙනෙක් අදිනු බව එතුමා දුටුවා”

05(02) යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**05(03)** **මහා නගර සභා මන්ත්‍රී, පී.එම්. ෂෙයාන් දූලිප් තිසේරා මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී,**

එගොඩඋයන ජයන්ති මාවත ගාලු පාරේ සිට මීටර් 250 – 200 අතර කොටසක් අළුත්වැඩියා කිරීමට ඇත. මෙම පාර එගොඩඋයන ජනතාව බොහෝ සෙයින් ගමන් කරනා පාරකි. එදිනෙදා පාසල් දරුවන් ද ගමන් ගන්නා පාරකි. එම නිසා මෙම මාර්ගය අළුත්වැඩියා කර දෙන මෙන් මෙම ගරු සභාවට යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

**<u>මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දූලිප් තිසේරා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මීට පෙරත් මම මේ යෝජනාව ඉදිරිපත් කරා. එය කර්මාන්ත කමිටුවට දාලා ඔබතුමා කිව්වා ඉක්මනට වැඩේ කරන්න ගන්න කියලා. ඔක්කොම වැඩේ කරගෙන ආවට පස්සේ ඔබතුමා ටෙන්ඩර් පටිපාටියට දැම්මේ නැහැ. ඒ නිසා මෙය ඉක්මනින් කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

05(03) යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 05(03) යෝජනාව ඉදිරි කටයුතු සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(04)** **මහා නගර සභා මන්ත්‍රී, ඒ.එච්. සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී,**

මොරටුව මහා නගර සභාවේ 2025 වර්ෂයේ සිට මේ දක්වා විවිධ දෙපාර්තමේන්තුවල සේවකයන් විශාල ප්‍රමාණයක් විශ්‍රාම ගොස් ඇත. විශේෂයෙන් සෞඛ්‍ය කම්කරු සහ වැඩ ක්ෂේත්‍ර කම්කරු පත්වීම් ලැබ සිටි 20 ට අධික පිරිසක් විශ්‍රාම ගොස් ඇත. ඒ වෙනුවට පුරප්පාඩු පිරවීමට අනුමැතියක් මෙතෙක් ලැබී නොමැත. මෙය සභාවේ සේවාවන් පවත්වාගෙන යාමට විශාල බාධාවක් වන බැවින්, මේ වසරේ ශ්‍රම මිලදී ගැනීමට අදාළ ගිවිසුම්ගත වී ඇති ආයතනය මගින්ම තවත් සේවකයන් 15 දෙනෙක් ලබා ගැනීමට කටයුතු කරන මෙන් මෙම සභාවට යෝජනා කර සිටින්නීය.

මහා නගර සභා මන්ත්‍රී ඩබ්. රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

05(04) යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 05(04) යෝජනාව ඉදිරි කටයුතු සඳහා ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(05)** **මහා නගර සභා මන්ත්‍රී, ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා විසින් කල් දී ඇති යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී,**

මොරටුව මහා නගර සභාව මගින් සේවකයින් සඳහා පොරොත්තු ලේඛනයෙන් බැහැරව ආපදා ණය ලබාදීමේදී අසනීප තත්ත්වය සඳහා දැනට ලබා දෙන රු. 50,000/- ආපදා ණය මුදල රු. 100,000/- දක්වා වැඩි කළ යුතු බවට හා මරණයකදී ලබා දෙන රු. 75,000/- ක ණය මුදල රු. 125,000/- දක්වා වැඩි කළ යුතු යැයි යෝජනා කරන්නීය.

මහා නගර සභා මන්ත්‍රී, පී.එම්. ෂෙයාන් දූලිප් තිසේරා මහතා විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, 2004 රවිනාත් ගුණසේකර මහතා ඉන්න කාලයේ 11700/-ක මූලික වැටුප තියෙන කාලයේත් රුපියල් 50000/- ක අපදා මුදලක් සේවකයින්ට ලබා දීලා තියෙනවා. මේ වෙනකොටත් රුපියල් 50000/- ක අපදා ණය මුදලක් තමයි ගෙවන්නේ. මෙය ලබා දෙන්නේ නැවත අය කර ගැනීම සඳහා, ඉතින් මේ මුදල මේ වෙනකොට ඉතා සුළු මුදලක් මෙය අවම ලක්ෂ 2ක් වත් විය යුතුයි. පුළුවන්නම් ඒ අය ඉල්ලා සිටින්නේ මේ රුපියල් 50000/- ක මුදල රුපියල් 100,000/- කරලා දෙන්න කියලා. ඒ වගේම මරණයකදී ගෙවන්නේ රුපියල් 75000/-ක මුදලක් මේ මුලදට මේ කාලයේ පෙට්ටියවත් ගන්න බැහැ. ඒ නිසා ඔවුන්ගේ ඉල්ලීම තියෙන්නේ ඒ මුදල රුපියල් 125,000/- ක් දක්වා වැඩිකර දෙන්න කියලා. මේ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා. මුදල් නැහැ මේක බජට් එකට දැම්මේ නැහැ කියලා ලිස්සලා යන්න හදන්නේ නැතුව මේ සඳහා මැදිහත් වෙන්න කියලා ඉල්ලා සිටිනවා.

05(05) යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, 05(05) යෝජනාව ඉදිරි කටයුතු සඳහා මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවට යොමු කරනවා.

**05(06) ගරු නගරාධිපති කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා විසින් යෝජනාව සභාවට ඉදිරිපත් කරන ලදී,**

දූප්පත්කම තුරන් කිරීමේ රජයේ ප්‍රතිපත්තිමය වැඩසටහන සාර්ථක කර ගැනීම සඳහා මොරටුව මහා නගර සභාවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයත් එක්ව ග්‍රාම සේවා වසම් මට්ටමින් ක්‍රියාත්මක කරන ප්‍රජා ශක්ති නමින් ගොඩනගා ඇති සංවිධාන සඳහා සෑම වසමකම පොදු මධ්‍යස්ථානයක් පිහිටුවිය යුතු බව මෙම සභාව පිළිගනී. ඒ අනුව, මොරටුව මහා නගර සභාව සතු දැනට කිසිදු සේවාවක් පවත්වාගෙන නොයන ස්ථාන මෙන්ම තවදුරටත් භෞතිකව සංවර්ධනය කළ යුතු ස්ථාන හඳුනාගෙන එම ස්ථාන සංවර්ධනය කොට මහා නගර සභාවේ අයිතිය ආරක්ෂා කර ගනිමින් දිළිඳුකම තුරන් කිරීමේ රජයේ වැඩපිළිවෙල සාර්ථක කර ගැනීම සඳහා ප්‍රජාශක්ති මධ්‍යස්ථාන ගොඩනැඟිය යුතු යැයි මෙම සභාව යෝජනා කර සිටින්නීය.

ගරු නියෝජ්‍ය නගරාධිපති, ඩබ්.පී. ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය විසින් යෝජනාව ස්ථිර කරන ලදී.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ යෝජනාවේ තියෙන්නේ ප්‍රජා ශක්ති නමින් මධ්‍යස්ථානයක් පිහිටුවන්න. මේ ඔබතුමාගේ ආණ්ඩුවේ සිදුවෙන වැඩපිළිවෙලමද නැත්නම් වෙනත් එකක්ද, එකට ප්‍රදේශිය ලේකම් කාර්යාලයත් ග්‍රාමසේවා මට්ටමෙන් එකතු වෙලා මේ දූප්පත්කම තුරන් කිරීම වෙනුවෙන් කරනවා කියලා ඔබතුමා කිවුවට. මම හිතන්නේ ගමේ දේශපාලනය කරන්න තැනක් ඔබතුමන්ලා හොයනවා කියලා තමයි මගේ පෞද්ගලික මතය. අපිත් වැඩකරන නිසා අපි දකිනවා. හැම ගමකම ප්‍රජා ශක්ති නමින් මධ්‍යස්ථානයක් පිහිටවගෙන, එකෙන් තමයි පොලිස් සහතික ගන්නත් ඕන. ඒ සංවිධානයෙන් තමයි හැමදේම කරන්නත් ඕන. මේක මන් හිතන්නේ ඔබතුමාලාගේ දේශපාලන යාන්ත්‍රනය ශක්තිමත් කිරීමේ වැඩසටහනක් කියලා. මේ මැතක උසාවි නියෝගයක් දුන්නා ඔබතුමාලාගේ ටිල්වින් සිල්වා මහතා ගිහින් අල්ලගෙන පෙරටුගාමී කාර්යාලයක් අල්ලගෙන නැවත වතාවක් එක

පෙරටුගාමීන්ට දෙන්න වුනා. ඒ වගේ මධ්‍යස්ථානයක්නම් අපි පොදුජන පෙරමුණ විදිහට විරුද්ධ වෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා මේ ඉදිරිපත් කරලා තිබෙන යෝජනාව හරි සරලයි මෙය දේශපාලන සංවිධානයක් කියලා අපි දන්නවා. මොකද ගහ දන්න අපිට කොළ කඩන්න අවශ්‍යතාවයක් නැහැ. මතුපිට තියෙන්නේ බුදු සරණයි කියලා වහානයේ ඇතුලේ තියෙන්නේ මොනවද කියලා අපි දන්නවා. මෙහි සියළු අභ්‍යන්තරය මන් හොඳින් දන්නවා. එවා අපිට අදාල නැහැ ඔබතුමන්ලත් දේශපාලනය කරන්න ඕන. ඔබතුමන්ලත් මෙතනට ඇවිල්ලා මරණාදාර සමිතියක් නෙමෙයිනේ කරන්නේ. ඒ නිසා උගුරට හොරා බෙහෙත් බොන්න ඕන නැහැ. එම නිසා මේ සභාවේ දේපල ඒ වගේ දේකට ලබා දීම සම්බන්ධයෙන් අපේ විරුද්ධත්වය ප්‍රකාශ කර සිටිනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්. ලිහිණි ප්‍රනාන්දු</u>**

ගරු නගරාධිපතිතුමනි, සභාවේ දේපලක් යම් දෙයකට පවරනවනම් දේපල පැවරීමේ ක්‍රමයක් තියෙනවා. අපි දන්නවා සභාවේ කඩ කාමර තියෙනවා එවා ලබා දෙනවනම් එක්කේ බදු ගිවිසුමක් අත්සන් කරලා දෙන්න ඕන. එතකොට ප්‍රජා ශක්ති කියන එක නෛතික රාමුවක් නැති එකක්, එවිට මෙයට නෛතිකව ඇග්‍රිමන්ට් එකකට ඒමේ හැකියාවක් නැහැ. එතකොට ඒ අයට ගෙවීමක් කිරීමේ හැකියාවක් නැහැ. මේක පිහිටවන්නේ ගැසට් එකකින් නෙමෙයි. ඔබතුමන්ලාගේ නිර්නායක අනුව මේ ප්‍රජෙක්ට් එක එක ආකෘතියක්, එතකොට ඒ ආකෘතිය නගර සභාවේ නෛතික පදනමකින් තියෙන ස්ථානයක් ලබා දීම නෛතිකව වැරදි. එතකොට දැන් වෙනකොට සමෘද්ධි නියාමක ඉන්නවා, ග්‍රාමසේවකලා ඉන්නවා, විවිධ වු කමිටු තියෙනවා රජයෙන් අස්වැසුම වැනි විවිධ වු කටයුතු, කමිටු පිහිටවනවා විවිධ රජයන් එනකොට. ග්‍රාමසේවකටත් එහෙනම් අපි දෙන්න ඕන නගර සභාවේ භූමිවල කාර්යාලයක්, ඔවුන්ට කාර්යාල නැහැ ඔවුන් පන්සල්ක හරි පොදු ස්ථානයක වැඩ කරනවා. මේ වගේ තැනක් දුන්නම අපි දන්නවා මේ තැන් වල ඉන්නේ කවුද ඒ හැම දේම, ඊට පස්සේ මෙවා අත්පත් කරගන්න අපිට උසාවි යන්න වෙනවා. මේ නගර ෂබාවේ තිබෙන ප්‍රජා ශාලා ජනතාවගේ අභිවෘද්ධිය සඳහා යෙදවීම තමයි විය යුත්තේ. මම හිතනවා මෙය ප්‍රදේශිය ලේකම් කාර්යාලය හරහා සිදු කිරීමට පුළුවන් ඒ නිසා මේ වැඩසහටන ඒ හරහා සිදු කරන්න මම හිතනවා එය තමයි සුදුසු කියලා. එ නිසා මේ සම්බන්ධයෙන් අපි විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඞී.සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, අපි මේ ඔබතුමාගේ යෝජනාවකට විරුද්ධව නෙමෙයි ඇත්තටම. අපි දන්නවා පැහැදිලිවම පසුගිය වකවානුවේ මේ ආණ්ඩුව පත්වුණායින් පසුව විවිධ සමාජ කටයුතු කරන සමිති සමාගම් වල බලය ලබා ගැනීමේ වැඩිපෙළක් තිබුණා. එතනදි ආණ්ඩු පක්ෂයක් වශයෙන් ඒ පසුගිය වකවානුවල උනා වගේම මේ ආකාරයෙන් මේ ආණ්ඩුව තුළත් ඒ දේ සිද්ධවුනා කියන එක අපි හිතට එකඟව කියන්න ඕනා. විශේෂයෙන්ම ආරක්ෂක කමිටුව ගත්තොත් එය ආරක්ෂක කමිටුවේ සමහර නිලධාරීන් දන්නෑ ආරක්ෂක කමිටුව තියන දිනයවත්. ඒවගේ බලය අල්ලා ගැනීමක් ඒ ග්‍රාමීය මට්ටමෙන් සිද්ධ වුණා. ඊළඟට ග්‍රාම සංවර්ධන සමිතිය ගත්තත් ඒ ආකාරයෙන් සිද්ධ වුණා. ඒක බලය ලබා ගත්ත ආණ්ඩුව විසින් යම් යම් ආකාරයෙන් විවිධ ප්‍රමාණයන් තුළින් කරපු අවස්ථාවන් තියෙනවා. මේ ආණ්ඩුවත් අපි විශ්වාස කරන පැහැදිලිම එහෙම දෙයක් වුණා. හිතට එකගව කතා කරනවා නම් මේක ප්‍රජා ශක්ති කියන වැඩසටහන ඒ සියලු දෙනා එකතු වෙලා එක තැනකට ගොනුවෙන තැනක් බවට පත්වෙනවා.එහෙමනම් ගරු නගරාධිපතිතුමනි එතන දේශපාලනික තත්ත්වයක් තියෙනවා. පැහැදිලිවම මේ කටයුත්ත සඳහා අපේ සහයෝගය සහ මේ යෝජනාවට

එකඟවීමට අපිට හැකියාවක් නෑ සර්ව ජන බලය වශයෙන්. අපි කියනවා ඒ තුළින් යම් හොඳ වැඩකටයුත්තක් වෙනවානම් ඒකට අදාළ දේශපාලනික වශයෙන් ස්ථානයක් හොයා ගත්තානම් හොඳයි. සභාවේ දේවල් මේ ආකාරයෙන් ලබාගැනීම ප්‍රායෝගික නැති බවත් සඳහන් කරමින් මේ යෝජනාවට විරුද්ධ වෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, 5(6) යෝජනාව සම්බන්ධයෙන් පොඩි අදහසක් දක්වන්න කැමති. ඇත්තටම දිළිඳුකම තුරන් කිරීම කියන මාතෘකාව ඉතාමත් වැදගත් මාතෘකාවක් නමුත් ගරු නගරාධිපතිතුමනි, අපිත් ප්‍රජා ශක්ති වගේ විශාල වැඩසටහන් කළා ඒ දවස්වල, ඒවා කෙරේ හැබැයි පොදු ස්ථාන යොදා ගනිමින් මොකද ජනතාවගේ ප්‍රශ්නවලදි මම හිතන්නේ පොදු ස්ථානයක් යොදා ගන්නවා නම් තමයි ඒ අදාළ හැම ජන කොටසකටම සාධාරණයක් ඉටුවෙන්නේ ගරු නගරාධිපතිතුමනි. අනික අපි නගර සභාවේ ස්ථානයක කිරීම අනිවාර්යය කාරණාවක් නෙමෙයි. ඒක බොහෝවිට මම දකිනවා කඩලාන ක්ලිනික් එක ගත්තොත් සමහරක් වෙලාවට ඔබතුමාලගේ පක්ෂයේ ක්‍රියාකාරීන්ගේ තිප්පොලක් බවට පත්වෙමින් තිබෙනවා. මම ඒක සාක්ෂි සහිතව තමයි අද කියන්නේ. ඒවගේ ගරු නගරාධිපතිතුමනි, දේශපාලනය තමයි අපි හැමෝම කරන්නේ නමුත් අපි මහජන නියෝජිතයෝ විදිහට රාජ්‍ය බලය තිබ්බ පලියට එහෙම ක්‍රියාත්මක වීම සුදුසු නැහැ කියලා තමයි හිතන්නේ. විශේෂයෙන්ම පොදු ස්ථාන තියනවා ගම්වල හැම ගමකම පන්සලක් පල්ලියක් දේවස්ථානයක් ඕනෑම ප්‍රජා කටයුත්තක් සඳහා විවෘතයි ගරු නගරාධිපතිතුමනි. මම හිතන්නේ මෙතුමිය නීතිඥවරියක් විදිහට කිව්වා වගේම, නීතිමය ප්‍රතිපාදන නොමැති කාර්යයක් කිරීම සම්බන්ධයෙන් අපෙත් පොඩි අසතුටක් තියෙනවා. විශේෂයෙන්ම අපි අවධාරණය කරන්නේ අපිත් කළා කලින් ලොකු ලොකු ව්‍යාපෘති, අපි කළේ සියලු ව්‍යාපෘති පන්සල් පල්ලිවල. ව්‍යාපෘතිවලට අපි සම්බන්ධ වුණා එතනින් එහාට අපි නිලධාරීන් පත්කළා, අදාළ පොදු කටයුතු ඒ විදිහට තමයි ක්‍රියාත්මක වුණේ. ගරු ඔබතුමාගෙනුත් ඉල්ලා සිටිනවා පොදු කටයුතු පොදුවේ ජනතාව අතර සිදුකරන්න කියන ඉල්ලීම කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ යෝජනාව සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම අපි අපගේ විරෝධය පළ කරනවා. මේ යෝජනාව දැක්කම අපට තව පොඩි ප්‍රශ්නයක් පැන නැගුනා අපි දැක්කා සොයිසාපුර ප්‍රදේශයට අපි යනකොට සොයිසාපුර ප්‍රදේශයේ ග්‍රවුන්ඩ් එකේ පොලිස් මුර පොලක් දාලා තියෙනවා. පොලිස් මුරපොළක් දාන්නේ කොහොමද සොයිසාපුර ග්‍රවුන්ඩ් එකේ. කවුද මේකට අවසර දුන්නේ, කාගේ වුවමනාවට මේක දැම්මේ, මේ නගර සභාවේ දේපළ එක එක්කෙනාට ඕන ඕන විදිහට තමන්ට හිතුමනාපෙට පාවිච්චි කරන්න හැකියාවක් නෑ, අඟුලානේ පොලිස් මුරපොළකට දුන්නේ, අඟුලානේ මහා නගර සභාවේ දේපළක්. ඊට පස්සේ ඒක ක්‍රමක්‍රමයෙන් ක්‍රමක්‍රමයෙන් වර්ධනය වෙලා පොලීසියක් බවට පත්වෙලා තියෙනවා. හැබැයි අද වෙනකම් එකදු රුපියලක්වත් මහ නගර සභාවට ලැබෙන්නෙත් නෑ ඊට අමතරව දැන් අපිට එළවගන්නත් බෑ. දැන් සියල්ල බලෙන්ම අයිති කරගෙන ඉන්නේ. ඒ වගේ කියන්න උදාහරණ ඕනතරම් තියනවා යම් යම් තැන්වලට දීලා අපට, නගර සභාවට අහිමි වෙච්ච ඒවා. අපි කියලා කියන්නේ මෙතන ඉන්න මන්ත්‍රීවරු පනස් දෙක නෙවෙයි මොරටුව ජනතාවගේ මුදල් මේවා. මොරටුව ජනතාවට අපි පරිස්සම් කරලා දෙන්න ඕනි. අපි මේ තාවකාලිකව මෙතනට ඇවිල්ලා ඉන්නේ. ඒනිසා සොයිසාපුර ග්‍රවුන්ඩ් එක කියලා කියන්නේ සුවිශේෂී තැනක්. එතන කිරිහළක් තිබ්බා මම හිතන්නේ පශු සම්පත් එකෙන් කරපු කිරිහලක් ඒක අයින් කරලා, එතන දාලා පොලිස් මුරපොළක්. එතන කිරිහල මගින් විශාල සේවාවක් සොයිසාපුර ප්‍රදේශයේ ජනතාවට, ඒ ග්‍රවුන්ඩ් එකට සෙල්ලම් කරන්න එන පිරිස් වලට සිදුවුණා. දැන් පොලිස් මුරපොලක් දාලා, පොලිස් මුරපොළ දැම්මට අපිට ප්‍රශ්නයක් නෑ

හැබැයි දාපු තැනයි අපට ප්‍රශ්ණේ තියෙන්නේ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අපේ විරෝධය පළ කරනවා. ඒවගේම ඒ යෝජනාවේ ප්‍රජාශක්ති නමින් සංවිධානයක් ගොඩනගලා තියෙනවා. ප්‍රජාශක්ති සංවිධානය ගොඩ නැගුවේ ජාතික ජල බලවේගයේ දේශපාලනික අරමුණින්. දේශපාලනය ගම තුළ ව්‍යාප්ත කිරීමට, ගම තුළ ක්‍රියාත්මක කිරීමට තමයි මේ ප්‍රජා ශක්ති කියලා රාජ්‍ය අනුග්‍රහය ඇතිව මේ වැඩසටහන් ක්‍රියාත්මක කළේ. ආයතන කමිටුවේදි අපි දැක්කා ග්‍රාම නිලධාරීන් ඉල්ලා තියෙනවා සමහර තැන්වලින් ග්‍රාමලධාරීන්ට කාර්යාලයක් කරගෙන යන්න අවස්ථාව දෙන්න කියලා. හැබැයි අපි ඒවා ප්‍රතික්ෂේප කළා. අපිත් ඒකට සහයෝගය දුන්නා. මේ ඊයේ පෙරේදත් ඉල්ලලා තිබුනා. මොකද හේතුව, සභාවේ දේපල අපිට ඕන විදිහට එහෙම දෙන්න බෑ. ඒ නිසා මේවා කවදාහරි දවසක නීත්‍යානුකූල ප්‍රශ්ණවෙලා අපට ඒවට උත්තර දෙන්න වෙනවා. මේ සභාව ඒවට බැඳිලා තියෙනවා. ඒ නිසා කරුණාකරලා මම ඉල්ලීමක් කරනවා මෙම යෝජනාව ඉල්ලා අස්කරගන්න කියලා. මොකද හේතුව මේ යෝජනාවේ තියෙන කරුණු මේ මන්ත්‍රීවරුන්ට සර්වාර්ජ් එකක් එන කරුණු තමයි මේ යෝජනාවේ තියෙන්නේ. ඒනිසා අපි පැහැදිලිව කියනවා මේක අල්ලස් එකට ගියොත් දූෂණය කියන වරද මෙතන තියෙනවා. ඒනිසා කරුණාකරලා අපි කියනවා, මේ යෝජනාව ඔබතුමා දැම්මේ මොන අදහසකින්ද කියලා අපි දන්නෙ නෑ. දිළිඳුකම තුරන්කිරීම ඉතාමත්ම හොඳ සත්චේතනාවක් හැබැයි ඉතින් මේක ඇතුළේ තියෙන්නේ දේශපාලනේ, ඒනිසා මේකට සම්පූර්ණයෙන්ම අපේ විරෝධතාවය පළකරමින්, මේ යෝජනාව ඉල්ලා අස්කරගන්න කියන ගෞරවනීය ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, නිවැරදි කිරීමක් අවශ්‍යයි. සොයිසාපුර සම්බන්ධයෙන් මතුවෙච්ච නිසා. ඔබතුමත් අපිත් දන්නවා සොයිසාපුර පොලිස් මුරපොළ මේ ස්ථානයේ ඉදිකරන්න සභා අනුමැතියක් අපි දීලා තියෙනවා. මේ ඔක්කොම පක්ෂ වුණා. ඒ යෝජනවා මම සභාවට ඉදිරිපත් කරපු එකක්. සභාවේ අනුමැතියක් සහිතව තමයි එම ස්ථානයේ අපේ අයිතිය මහජනතාවගේ ඉල්ලීම හා ඒ ප්‍රදේශයේ ආරක්ෂාව වෙනුවෙන් මුරපොළ ඉදිකළේ. ඒක කවුරුත් අනවසරෙන් ඉදිකරපු එකක් නෙමෙයි. ඒක වැරදියි ඒ අදහස. සභාවේ අනුමැතියක් එක්ක යන්නේ.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මෙම යෝජනාව සම්බන්ධව විවිධ සැක සංකා මතු කළා. මෙම යෝජනාව සම්බන්ධව සමහර නිශ්චිත අදහස් ඉදිරිපත් කළා උපකල්පන ලෙස. හැබැයි අපි හැමදෙනාම දන්නවා මේ මහජනයාගේ දේපල, මොරටුව මහා නගර සභාව මිනිස්සුන්ට අයිති එකක්. මහ මහජනතාවට අයිතියි. ඒ මහජනතාවට අයිති මහා නගර සභාව සතු විශාල දේපළ ප්‍රමාණයක් වල් බිහි වෙමින් යනවා. විනාශ වෙමින් යනවා. ඒ ගොඩනැගිලි මහජනතාවගේ සේවාවන් සඳහා යොදා ගන්නේ ඉතාම අඩුවෙන්. ඒ තැන් වලට ගියාම ඔබට මට සැහෙන දුක හිතෙනවා වෙලා තියෙන විනාශයන්ට. විශාල ලෙස ඒවා ගරා වැටෙනවා. සමහර ඒවා වෙන පුද්ගලයින්ගේ අත්පත් කිරීම් වලට ලක් වෙනවා. ඉතාම පැහැදිලියි, අපි කාටත් මේවා කිසිවෙකුට දෙන්න බෑ. මේ සභාව සතු දේපළ. මේ යෝජනාවෙනුත් එක තැනක කියනවා මේ සභාවේ අයිතිය ආරක්ෂා කරගෙන, හැබැයි ඒවා එහෙම වල් බිහිවෙලා ජනතාවට ජනතාවගේ කාර්යයන් කරන්න පොදු ස්ථාන නෑ, අපේ ස්ථානයක් තියෙනවා අභාවයට පත්වෙලා. දැන් ඊයේ පෙරේදත් විවිධ විවිධ තොරතුරු එනවා මෝදර තිබ්ච්ච පෙර පාසලක් දැන් වහලා දාලා තියෙනවා ඒවයේ ජනෙල් ගලවගෙන යනවා, උළුවහු ගලවගෙන යනවා, මේ අභාවයට යමින් තිබෙනවා. දැන් ඒ ජනතාවගේ යහපත වෙනුවෙන් ගමේ ජනතාවගේ දිළිඳුකම තුරන් කිරීම වෙනුවෙන් රජයේ මූලික ප්‍රතිපත්තිමය වැඩසටහනක්, ඒ වැඩසටහන ක්‍රියාත්මක වෙනවා.

**මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා**

ගරු නගරාධිපතිතුමනි, පොඩි පැහැදිලි කරගැනීමක් විතරයි. මීට පෙරත් ගරු නගරාධිපතිතුමනි, මොරටුව මහා නගර සභාවේ තියෙන ස්ථාන, ප්‍රාදේශීය ලේකම්තුමා ඉල්ලීමක් කළා අපේ සමෘද්ධි නිළධාරින් හා විශේෂයෙන් ග්‍රාම නිලධාරින්ට දෙන්න කියලා.ඒ වෙලාවේදි අපි කටයුතු කළ පදනම තමයි සභාව සතු දේවල් අපට දෙන්න හැකියාවක් නෑ කියලා. යම් කෙනෙක් අනාගතයේදී මේ ප්‍රශ්ණයත් එක්ක තර්කයක් මතු කළොත් එදා දෙන්න බැරිවෙච්ච දේ අද දෙන්නේ පුලුවන් වුණේ ඇයි කියලා. එතකොට එතනදි යම් අපහසුතාවයකට පත්වෙනවා ඔබතුමා.

**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා, ජනතාව මේ පාලනය වෙනස් කළානේ. තිබ්ච්ච පාලනය වෙනස් කළා. මේ වගේ මතුවෙන ඕනෑම වරදක් ඒ වගකීම් දරන එක දෙවුර මත තබාගෙන මේ කරන්නේ. මේ ප්‍රකාශනය ඇතුළේ තිබෙන්නේ කිසිදු ලෙසක පුද්ගලික වුවමනාවක් නොවෙයි. දේශපාලන අරමුණකුත් නෑ මාලිමාවේ අයට වැඩ පෙන්නන්න. ඒනිසා මම කියන්නේ මේවා ඉතාම හොඳ තැනකට ගතයුතුයි. ඒ වෙනුවෙන් රජයේ නියෝජිතයා ලෙස ප්‍රාදේශීය ලේකම් අවශ්‍යයි. නගර සභාව අවශ්‍යයි.  අනෙකුත් රාජ්‍ය ආයතන අවශ්‍යයි. මේ හැමදෙනාම එක තැනකට ගේන්න ඕන. මේ ප්‍රජා ශක්තිවල ඉන්නේ රජයේ නිලධාරින්. සමෘද්ධි නියාමක ඉන්නවා, ග්‍රාම සේවක ඉන්නවා. මේකේ ප්‍රධාන රාජ්‍ය නිලධාරිනුත් සහිතව මේ වැඩේ යන්නේ. අපට මේ ගමේ අවශ්‍ය කරන තොරතුරු දත්ත හරියට අරගෙන කොහොමද අපි ඒ දිළිඳුකම තුරන් කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන්නේ කියන පුළුල් සැලැස්මකට මේක ගමන් කරනවා. තවදුරටත් මේවා වල් බිහිවෙන්න දීලා එක එක්කෙනාට පුද්ගලිකව අයිති වෙන්න දෙනවද, එහෙම නැත්තම් මේවයින් ජනතාවගේ ඇත්ත අවශ්‍යතාවය වෙනුවෙන් කටයුතු කරනවද. ඒ කටයුතු කරන්න යද්දි යම් වරදක් වුණා කියලා කවුරු හරි අපිව නීතියෙන් වරදකරුවක් කළොත් ඒකට කමක් නෑ. මිනිස්සු වෙනුවෙන් වැඩක් කරද්දි නීතිමය ගැටලුවක් ඉස්සරහා වැරදිකරුවෙක් වීම සතුටක්. මම කියන්නේ මේ දේපළ අන්සතු කරන්න නෑ, අන් සතු කරන්න බෑ. නෛතිකව සියල්ල බේරගෙන යනවා. නෛතික ගැටලුවක් මෙතන එන්නේ නෑ. හරි ඒක නගර සභාවේ තියෙන නීතිමයේ අණ පනත් කියවා ගනිමින් ඒ අණ පනත් වලින් දීලා තියෙන ප්‍රතිපාදන සැලකිල්ලට අරගෙන ඔබ හැම කෙනාගෙම අදහස් එක්ක යනවා විනා, දැන් මේ යෝජනාවක් සම්මත වෙච්ච පමණින් මොකක්වත් දෙන්නෑ. දැන් අපි තෝරගත්තු අපේ ස්ථාන තියෙනවා ප්‍රාදේශීය ලේකම්ට අයිති භූමි හා ගොඩනැගිලි තිබෙනවා. ඒවා හොඳින් හඳුනගෙන ඒවා භූමියේ ජනතාවගේ අවශ්‍යතාවය. ඒ භූමියේ ජනතාවගේ උවමනාව. ඒ වෙනුවෙන් අපට යන්න තියෙන තත්ත්වය තවදුරටත් සැලකිල්ලට ලක්කරගෙන, මේ අරමුණු මම කියන්නේ ඉතාම පැහැදිලියි. ඒ අරමුණ ඇතුළේ තියෙනවා නම් ගැටලු ඉස්සරහට

**මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමනි, මේ ප්‍රජා ශක්ති වැඩපිළිවෙළේ ඒ කමිටුවේ සභාපතිවරයා වෙන්නේ කවුද ?

**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා, සභාපතිවරයා වෙනවා ඇමතිවරයා පත්කරන නියෝජිතයා. හැබැයි මේ කමිටුව ක්‍රියාත්මක කරන්නේ අදාළ ග්‍රාම සේවකවරයා. ප්‍රධාන DO වෙන්නේ එයා. ඒක කාටවත් සභාපතිවරයෙකුට තමන්ට ඕන විදිහට පිට ගෙනියන්න බෑ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, එහෙම පිට ගෙනියමු තැන් තියෙනවා. අපේ ඔය ලුනාව කළපු ව්‍යාපෘතියේ සභාව හැදුවා, පිහිටෙව්වා.ග්‍රාම නිලධාරි ඉන්නෙත් එතන, සමෘද්ධි නිලධාරි ඉන්නෙත් එතන. ඒ ඉන්න අවස්ථාවේදි ඒක විවෘත කිරීමකුත් කළා.ඒ වුනාට ශිරෝමි මන්ත්‍රීතුමිය කිව්වා වගේ තිප්පොළක් වෙලා. දැන් ඒ කණ්ඩායම තමයි ඉන්නේ. අපිට ආරාධනාවක්වත් කළේ නෑ. මන්ත්‍රීවරයෙකු වශයෙන් අපට කිව්වේ වත් නෑ. අපි තවමක්වත් දන්නෑ. දැන් මෑතක තමයි අපි දන්නේ මේ කට්ටිය මෙතන වැඩ කරන්නේ කියලා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ඒ දේපළ ප්‍රාදේශීය ලේකම්තුමාට අයිති එකක් නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, ඒ වුනට මේ වැඩසටහන ක්‍රියාත්මක වෙනවනේ එතන.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, ගමේ ජනතාවගේ වැඩසටහන තමයි එතන ක්‍රියාත්මක වෙන්නේ. මාලිමාවේ කතන්දරයක් නෑ වරද්ද ගන්න එපා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, එතන එයාලට කියලා තියෙනවා අපිට කියන්න එපා කියලා. මන්ත්‍රීවරු තව දෙනනෙක් ඉන්නවා වසමේ. ඒ දෙන්නට කිව්වේ නෑ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, දැන් ඔබතුමා කියපු ප්‍රශ්නෙ,මම ඉස්සෙල්ලා මතු කරපු තර්කේ ආවේ ගිය ආණ්ඩුවට නෙමෙයි. මේ ආණ්ඩුවේ ඔබතුමාගේ පාලන කාලේ තමයි මේ යෝජනාව එව්වේ ප්‍රාදේශීය ලේකම්තුමාගෙන් ග්‍රාම සේවකවරුනට ඔෆිස් නෑ දාගන්න, ඊනිසා පොඩි පොඩි ඉඩකඩ දෙන්න කියලා. එතුමත් හිත නොහොද වෙන්න ඇති, එතුමා දක්ෂ නිලධාරියෙක්. ඊනිසා අපිට එදා දෙන්න බැරිවුනා කියන එක ඔබතුමාගේ මාලිමා ආණ්ඩු කාලේ ආව යෝජනාවක් තමයි. හැබැයි අපිට ඒක එහෙම දෙන්න බෑ කියලා කවුරුහරි ඇහුවොත් එහෙම මාලිමාවේ ආණ්ඩුව කාලේ ආව යෝජනාවක් මෙම යෝජනාවට අනුමැතිය දුන්නේ මොන පදනමින්ද කියන එකටයි මම ඒකටයි උත්තර නැහැ කියලා කියන්නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා, අද මේ යෝජනාවට විපක්ෂේ අපි විරුද්ධ වුණා. ඔබතුමන්ලා පක්ෂ වෙලා ඔබතුමා මේක ක්‍රියාත්මක කරලා දැන් නගර සභාවේ දේපළ මේ ස්ථානවල ප්‍රජා ශක්ති වැඩසටහන කරගෙන යන්න අවසර දුන්නහොත් ඒ තැන කවුද ඉන්නේ, කවුද ඕවා පාවිච්චි කරන්නේ, කාගේ යටතෙද මේවා තියෙන්නේ, ඒ සම්බන්ධයෙන් ඔබතුමා ක්‍රියාත්මක කරනවා නම් මේ සභාවට දැනුම් දෙන්න ඕනා ඒවා ලිඛිතව. කවුද ඒ ඉඩමේ කවුද වගකීම ගන්නේ, ඒක ඔබතුමන්ලාගේ කොට්ඨාස භාර නියෝජිතයෝ ද එතන ඉන්නේ, කොහොමද මේක වෙන්නේ, අපි විරුද්ධ වුණා කියලා ඔබතුමා නගරාධිපතිතුමා ඔබතුමා ඕනේ නම් ඕවා කරයි. එහෙමනේ හැමදාම වෙලා තියෙන්නේ. ඒක කරනවා නම් කරන විදිහ කියන්න., මේ දේපළ වල සම්පූර්ණ වගකීම තියෙන්නේ ඔබතුමාට. ඕක කරනවා ඔබතුමා මේ සභාවත් එක්ක අපි ක්‍රියාත්මක විය යුතු ආකාරය සහ ඔබතුමා ඇග්‍රිමන්ට් එකට අත්සන් කරන්ඩ ඕන. ඔබතුමා අපිට විරුද්ධව ක්‍රියාත්මක වෙන්වා නම් අපිත් ඔබතුමාට යම්කිසි කොන්දේසි මාලාවක් පනවනවා මේ සම්බන්ධයෙන්. ඒකට ඔබතුමා අත්සන් කළ යුතුයි. ඔබතුමාගේ ධූර

කාලයෙන් ඔබතුමා ගියායින් පස්සෙත් ඔබතුමා ඒකට වගකීමෙන් බැදෙන විදිහට ඔබතුමා කටයුතු කළ යුතුයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මේ යෝජනාව ක්‍රියාත්මක කරන්න ඔබතුමාලගේ ඔලු ගෙඩි ගාන වැඩි නිසා ඔබතුමාලට පුළුවන් මේ යෝජනාව සම්මත කරන්න. හැබැයි මම අවධාරණය කරන්නට ඕන මේ යෝජනාව මහා නගර සභා ආඥා පණත අනුව නගර සභාවේ සියලු දේපළ වල හිමිකාරීත්වය තියෙන්නේ නාගරික කොමසාරිස්වරිය යටතේ. නාගරික කොමසාරිස්වරිය තමයි මේකේ වගකීමෙන් බැදෙන්නේ. මේ දේපළ ලබාදීම සම්බන්ධව. ඒ නිසා අපි නිලධාරීන්ටත් කියනවා මේ වගේ යෝජනාවක් වැඩි ඡන්දයෙන් මේ ඔලු ගෙඩි ගාණ වැඩි එකට සම්මත වුණාට මේක ක්‍රියාත්මක කරන්න ගිහිල්ලා අවසානයේ අමාරුවේ වැටෙන්නේ නාගරික කොමසාරිස් ඇතුළු නිලධාරීන්. ඒ ගැනත් අවධානය යොමු කරන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මේ වගේ යෝජනාවක් ඔබතුමා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අපි ඇත්තටම පුදුමයට පත්වෙනවා. ඔබතුමා මේ පැත්තේ හිටියා නම් අද ඔබතුමා හැසිරෙන්නේ ඔය විදිහට නෙමෙයි. ඉතාම කෙටියෙන්ම කියනවා නම් මේ සංවිධානය ඇත්තටම ස්වාධීන සංවිධානයක් නෙවෙයි. මේකේ ඉන්නේ සංවිධානයේ  සාමාජිකයෝ අපි දන්න විදිහට ඔක්කොම ඉන්නේ මාලිමාවේ අය. අඩුම තරමේ  ගමේ ඉන්න නාගරික මන්ත්‍රීවරයාටවත් මේකට ආරාධනා කළේ නෑ. ඉතින් මේක ස්වාධීන සංවිධානයක් නෙමෙයි. ඒ නිසා කරුණාවෙන් ඉල්ලා සිටිනවා එක්සත් ජාතික පක්ෂය හැටියට මේ යෝජනාව ඉවත් කරගන්න කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මොරටුව මහා නගර සභාව සතු දේපළවල ආරක්ෂාව, නඩත්තුව සහ ඒ රැකවරණය සම්පූර්ණ නිසි බලධාරියා හැටියට ඉන්නේ ඔබතුමා. එතකොට නගර සභාව සතු දේපළක් යම් පාර්ශවයක් අතට පත් කරන්නේ මොන පදනමින්ද, මහා නගර සභා ආඥා පණතේ කවර ප්‍රතිපාදනයක් යටතේද කියන එක මේ සභාව දැනගන්න ඕන. මොරටුව මහා නගර සභාවයි ප්‍රාදේශීය ලේකම් එකතුවෙලා ග්‍රාම සංවර්ධන ශක්ති කියලා හදපු මේ සංවිධානය කොහොම හැදුවද කියලා.ඒක ගැන මේ සභාවක් හැටියට අපි දන්නෙත් නෑ. එහෙම හැදුවේ කොහොමද කියලා මේ සභාවට කියන්න.ඊළඟට දේපළක් ඔබතුමා ඒ විදිහට ග්‍රාම සංවර්ධන සමිතියකට ලබා දෙනවා නම් ඒ ලබා දෙන මේ ග්‍රාම සංවර්ධන සමිතියේ තියෙන නෛතික ව්‍යුහය මොකක්ද, මේක නීතියෙන් පිහිටවලා තියෙන ආකාරය මොකක්ද, මේවට තියෙන නීතිමය රැකවරණය මොකක්ද, මේකට තියෙන නෛතික රාමුව මොකක්ද, ඒ රාමුව මුකුත් අපි දන්නේ නෑ. දන්නැති ආයතනයකට අපි කියනවා මොරටුව මහා නගර සභාව සතු දේපළක් ලබා දෙනවා කියලා. ඔබතුමා දන්නවා අගුලාන පොලීසිය, ඒ අගුලාන පොලීසිය මොරටුව මහා නගර සභාවට අයිති දේපළක්. ඒකට අපි බදු මුදලක් අය කරනවා. අපි රටේ නීතිය හා සාමය ආරක්ෂා කරන්න තියෙන ආයතනයකට ගොඩනැගිල්ලක් දීලා ඒකට බදු මුදලක් අය කරනවා. ඒවගේම තවත් ගොඩනැගිලි අපි දීලා තියෙනවා රජයේ ආයතනවලටට.ඒවායෙන් අපි යම් මුදලක් මේ නගර සභාවට අයකර ගන්නවා. එතකොට අපි දන්නවා නගර සභාවේ මේ මෑත කාලයේදී ඇතිවුණු සිද්ධීන්, ග්‍රාම සංවර්ධන සමිතියකට ටෙන්ඩර් දුන්නා කියලා අල්ලස් හා දූෂණ කොමිෂමට ගිහිල්ලා ඒක විශාල ප්‍රශ්ණයක් වෙලා හිටපු නගරාධිපතිවරයා  අද සැකකරුවෙක් හැටියට අධිකරණ නීති කෘත්‍යයක් ඉදිරියේ පෙනී සිටිනවා. එවැනි තත්ත්වයක්. ඒනිසා නගර සභාව සතු දේපළක් යම් පාර්ශවයකට

භාරදෙනවනම් ඒ භාරදිය යුතු නෛතික රාමුව තියෙනවා.පිළිපැදිය යුතු නීතිමය විධාන තියෙනවා. ඒවා අනුගමනය නොකර යම් දේපළක් දීලා මේ දැනට ලංකාවෙ වලංගුව පවතින දූෂණය නමැති වරදට අපට හවුල් වෙන්න වෙනවා. ඒනිසා අපි කියන්නේ මේ දේපළ වෙනත් පාර්ශයක් අතට පත්කරනවා නම් නීතියේ රාමුව තුළ අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය කරුණාකරලා අනුගමනය කරන්න. එහෙම නැතුව යම් ආකාරයකින් ලබාදීලා වෙච්ච දේවල ඔබතුමා දන්නවා. ඔබතුමා දන්නවා කඩලාන ඉඩමක් කාලෙකට කලින් ලබාදීලා තිබුණා යම් සමෘද්ධි සංවර්ධන බැංකුවකට. ඒක ඊට පස්සේ ප්‍රාදේශීය ලේකම් හරහා සමෘද්ධි සංවර්ධන බැංකුවට දීලා එකෙන් ඔවුන් ඉවත්වෙලා ගියාට පස්සේ අද නැවත ඒ දේපළේ භුක්තිය ලබාගන්න අපි නඩුවකට පැටලිලා තියෙනවා. ඒනිසා මේ මොරටුවේ ජනතාවට අයිති මොරටුව මහා නගර සභාවේ දේපළ යම් පාර්ශයක් අතට පත්කරනවා නම් ඒ පත්කිරීම නීතියේ රාමුව තුළ කරන්න. මෙවැනි යෝජනා තුළින් සිදුවෙන්නේ, ඇත්ත වශයෙන්ම ඔබතුමා ඒ සියලු දේවල් නොසලකා කටයුතු කරනවා නම් ඒ වගකීමත් මේ පවතින නීතිමය රාමුව තුළ ඔබතුමාලට දරාගන්න වෙනවා කියන එක අපි පෙන්වා දෙන්න කැමති. ඒනිසා මේ යෝජනාවට අපි තරයේ විරුද්ධයි කියන ස්ථාවරය සමගි ජන බලවේගය හැටියට ඉදිරිපත් කරනවා.

**05(06) යෝජනාව සඳහා පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී.තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සරෝජනී මැන්දිස් මහත්මිය |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |

**05(06) යෝජනාව සඳහා විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - මෙරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
12. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
14. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටල්කාන්ත මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
21. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය
23. මහා නගර සභා මන්ත්‍රී - ඕ. දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය

05(06) යෝජනාව සභා සම්මත විය.

## 06. 2026 මාර්තු මස ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශන් සළකා බැලීම.

**06 (01) 2026.03.06 වන දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**2026.03.06 වන දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන් සුජීව මහතා

7. මහා නගර සභා මන්ත්‍රී - එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී. ලීලාරත්න හේවාවිතරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**2026.03.06 වන දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ජේ.එච්. සුරේෂ් ඉන්දික මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - මෙරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටිල්කාන්ත මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
17. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය

**2026.03.06 වන දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන්ට පක්ෂව හෝ විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය දීමෙන් වැළකී සිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**2026.03.06 වන දින පැවති ඉඩම් හා නගර සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - ඕ.දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය)

**06 (02) 2026.03.06 වන දින පැවති මහජන උපයෝගිතාව, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතුමනි, මට විශේෂ ස්තුතියක් කරන්න තියෙනවා 2026 තුන්වෙනි මාසේ පස්වෙනි දින ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව මොරටුව මහා නගර සභාව විසින් අපි දන්නා පරිදි ඒ ආකාරයේ උත්සවයක් සංවිධානය කරපු පළවෙනි අවස්ථාව විදිහට කාන්තා දින සැමරුමක් සිදු කළා. ඒකෙදි මං විශේෂයෙන්ම මහජන උපයෝගීතා, කාන්තා හා ප්‍රජා සංවර්ධන කමිටුවේ සභාපතිතුමිය වශයෙන් ගරු නගරාධිපතිතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා අපට අවශ්‍ය කරන ඒ සියලු පහසුකම් ඔබතුමා සපයා දීම සම්බන්ධයෙන්. ඒ වගේම නියෝජ්‍ය නගරාධිපතිතුමිය අදාළ සම්පත් දායකත්වයන් සහ මඟපෙන්වීම අපිට සිදුකළා. ඒවගේම නාගරික කොමසාරිස්තුමිය, නාගරික ලේකම්තුමා,ඒවගේම ඉන්දිරා කැන්සර් ට්‍රස්ට් ආයතනය සම්බන්ධිකරණය සිදු කරපු ලිහිණි ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය, ඒවගේම අපේ සියලු දෙපාර්තමේන්තු ප්‍රධානීන්, විශේෂයෙන්ම තව කියන්න ඕන කාරණයක් තමයි අපේ IT අංශය, ඒවගේම තමයි දවසක් දෙකක් ඇතුළත ලොකු අභියෝගයක් භාරදුන්නා අපේ සම්පත් දායක මහත්මයා අපේ නගර සභවේ ගායන කණ්ඩායමට. ඉතින් ඒ අභියෝගය භාර අරගෙන ඒ කටයුත්ත ඉහලින්ම සිදුකළා අපේ නගර සභාවේ ගායක කණ්ඩායමට මම ස්තුතිවන්න වෙනවා. අවසාන වශයෙන් කියන්න ඕනේ මොරටුව මහ නගර සභාවේ ප්‍රජා සංවර්ධන අංශයේ ඉතාම දක්ෂ තුල්සිකා මල්ලවආරච්චි මහත්මිය ප්‍රමුඛ ඒ ප්‍රජා සංවර්ධන අංශයේ කාර්ය මණ්ඩලයේ සියලු දෙනාට මහජන උපයෝගීතා කමිටුවේ සියලුම මන්ත්‍රීවරු වශයෙන් මම ස්තුතිය පුද කර සිටිනවා. ඕනෑම භාරදෙන අභියෝගයක් ඉතාම ලස්සනට ඒ කටයුත්ත නිම කරලා අපි බලාපොරොත්තු වුණාටත් වඩා වැඩියෙන් ඒකට සාධාරණයක් ඉෂ්ට කිරීම සම්බන්ධයෙන් මහජන උපයෝගිතා කමිටුව වෙනුවෙන් මගේ ස්තුතිය පුද කර සිටිනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමා, දැන් සෙව්වන්දි මන්ත්‍රීතුමිය කියපු වැඩසටහන ඉතාම හොඳ වැඩසටහනක් වෙන්න ඇති. ඒ ගැන අපිට විරුද්ධත්වයක්වත් තර්කයක්වත් නෑ. වැඩසටහන කරපු එක හොඳයි. හැබැයි මොකක් හරි වැඩසටහනක් නගර සභාවේ කරා කියලා නගර සභාව වහන්න බෑනේ. හැබැයි එදා දවස නගර සභාව වහලා තිබ්බේ. මිනිස්සු ඇවිල්ලා ඔබතුමාට දොස් කිය කියා හැරිලා ගියා. ඒනිසා ගරු නගරාධිපතිතුමා මේ වැඩසටහන හොඳයි

ඒකේ තර්කයක් නෑ. ඒකට අපි අත් දෙකම උස්සනවා, වැඩේ හොඳයි. හැබැයි මේ නගර සභාව වහලා කරන වැඩවලට අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. ඒනිසා ජනතාව විශාල වශයෙන් අපහසුතාවයට පත්වුණා එදා දවසේ. ඒ සම්බන්ධයෙන් වහාම පරීක්ෂණයක් කරන්න කියල ඉල්ලීම ඔබතුමාගෙන් කරනවා. මේකට සම්පූර්ණයෙන්ම වගකියන්න ඕනේ නාගරික කොමසාරිස්. කොමසාරිස්වරයා සම්පූර්ණයෙන් වගකියන්න ඕනා ඒ නිසා ඒකට පරීක්ෂණයක් කරන්න. මීට පස්සෙවත් ඒවගේ දේවල් වෙන්න ඉඩ තියන්න එපා කියන කාරුණික ඉල්ලීම කරනවා.

**2026.03.06 වන දින පැවති මහජන උපයෝගිතා, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා
2. නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය
3. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන් සුජීව මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය
11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**2026.03.06 වන දින පැවති මහජන උපයෝගිතා, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**2026.03.06 වන දින පැවති මහජන උපයෝගිතා, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය දීමෙන් වැළකී සිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
16. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය

**2026.03.06 වන දින පැවති මහජන උපයෝගිතා, කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඕ.දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය)

**06(03) 2026.03.09 වන දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ආයතන කමිටුවේ අංක 03, එන්.පී.එස්.චමින්ද ප්‍රේමතිලක සම්බන්ධ කමිටු නිර්දේශය පැහැදිලි නෑ. මේකේ කියනවා චමින්ද තිලකරත්න මහත්තයා සෙනසුරාදා දින රාජකාරී කටයුතුවල නියැලෙමින් අමිල සේවාවක් ඉටු කරන බැවින් මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කර සෞඛ්‍ය කම්කරු එන්.පී.එස්. චමින්ද ප්‍රේමතිලක මහතාට පැය අසූවක අතිකාල දීමනාවක් නිදේශ කර ගැනීම සඳහා ආයතන කමිටුවට යොමු කරමි කියලා තියෙන්නේ. නිර්දේශය තියෙනවා නාගරික ගබඩාවේ සේවයේ නියුතු කණිෂ්ඨ සේවක මණ්ඩලය සඳහා පැය 60ක මාසික අතිකාල සීමාව පැය 80ක අතිකාල සීමාව දක්වා වැඩිකර දීමට නිර්දේශ කරන ලදී. ඒ කියන්නේ ඉන්න ඔක්කෝටම වැඩිකරනවද මෙයාට විතරක් දෙනවද, මොකක්ද මේ නිර්දේශය.

<u>**නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමා, මෙම කාරණය අපිට එන්නේ ගණකාධිකාරි තුමියගෙන්, එතකොට මේ කාරණය ඉදිරිපත් කරනකොට චමින්ද ප්‍රේමතිලක සහ තව එක්කෙනෙක් විතරයි ගබඩාවේ සේවය කරන්නේ එතකොට අපිට පුද්ගලයෙක්ට අතිකාල දීමනා වැඩිකරන්න බැරි නිසා ඒ අදාළ සේවයේ නියුතු වෙන ඒ සේවකයන්ට අතිකාල 80 දක්වා වැඩිකරන්න තීරණය කළා පැය 60 ඉදන් පැය 80 දක්වා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, මේකෙම උඩ තියෙනවා ගබඩාවේ වැඩ ගොඩක් තියනවලු ඒ වැඩ ගොඩත් එක්කම අනිත් එක්කෙනා සෙනසුරාදා වැඩට එන්නේ නැලු. එහෙම කරුණු කාරණා ගොඩක් කියලා මේ චමින්ද ප්‍රේමතිලක විතරක් වැඩ කරනවා කියලා කියන්නේ. ඉතින් ඒ නිසා මේ අතිකාල සීමාව එක්කෙනෙකුට වැඩි කරන්න බෑ කියලා එහෙම එකක් නෑ. කොහෙද තියෙන්නේ එහෙම එකක්. එහෙම එකක් නෑ. ඒනිසා මේ කමිටු තීන්දුව සම්බන්ධයෙන් නැවත සලකා බලන්න කියන ඉල්ලීම කරනවා. ඒත් එක්කම අංක 04 කෙරෙහි අවධානය යොමු කරනවා. අංක 04 ආරම්භ කරනවා කියපු ඒ රාත්‍රි හතේ සිට දහය දක්වා, ඒකට අතිකාල පැය 90ක් ලබාදීම නිර්දේශ කරනවා කියලා තියෙනවා. ඒක පටන් ගත්තද කියලා දැනගන්න අවශ්‍යතාවයක් තියෙනවා. රාත්‍රියේ ඉඳුල් අදින කටයුත්ත පටන් ගත්තද?

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, මම එයට පිලිතුරු දෙන්නම්, අපි ඒක පටන් ගත්තේ නෑ. ඒක වෙනත් ආකාරයකින් ඒක දවල් වරුවට අරගෙන වෙන ආකාරයකින් ක්‍රියාත්මක කරන තියෙන නිසා අපිට ඒ යෝජනාව අපිට ඉවත් කරන්න පුළුවන්.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, මේ යෝජනාව නැවත ආයතන කමිටුවට අරගෙන ඉවත් කරන්න. සභාවේ අද අනුමත කරන්නේ නැතුව නැවත ආයතන කමිටුවේදී මෙම කරුණ ගන්නකොට වේලාසනින් මේගැන කියන්න.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, මේක දැන් වුනත් අයින් කරන්න පුලුවන්, මේ යෝජනාව ඉවත් කරන්න යෝජනා කරනවා කියලා කිව්වා නම් අයින් කරන්න පුලුවන්. ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයේ සේවක මහතුන් හට අමතර අතිකාල පැය 190 ක් ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීම ඉදිරිපත් කරමි. මෙම ඉල්ලීම සම්බන්ධයෙන් අපේ සේවක මහතුන් ඉදිරිපත් කරපු ලියුම මම දැක්කා ඇමුණුමක් හැටියට තියෙනවා. ඒක ඇමුණුම් අංක 03, එකේ මෙහෙම සඳහන් වෙනවා, අතිකාල ප්‍රමාණය ලබාගැනීම, 2026 පළවැනි මස ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානයේ සේවක මහතුන් හට අතිකාල අනුමැතිය පැය 190ක් ලෙස දෙන බවට ගරු නගරාධිපතිතුමා සහ නාගරික කොමසාරිස්තුමිය, ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක තුමන් පොරොන්දු විය. එබැවින් අප සියලු සේවක මහතුන් හට අනුමැතිය ලබාදුන් එම අතිකාල මුදල ලබාදෙන ලෙස ඉල්ලමි කියලා ලියුමක් දීලා තියෙනවා. ඒකේ කමිටු නිර්දේශයේ තියෙනවා මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බව නිර්දේශ කරන ලදි. කාත් එක්කද සාකච්ඡා කරන්නේ මේක. තුන්දෙනාම පොරොන්දුවෙලා තියෙනවා නම්, තුන් දෙනා ගිහිල්ලා කතා කරලා තියෙනවා නම් ප්‍රධානියෝ තුන්දෙනා තව සාකච්ඡා කරන්නේ කාත් එක්කද. නගරාධිපතිට වඩා උඩ කෙනෙක් ඉන්නවද සාකච්ඡා කරන්න කොහොමද මේක. මේ සම්බන්ධයෙන් අපිට කරුණාකලා පැහැදිලි කරන්න අංක 05 .

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මේ අදාළ කමිටුවේ ඉන්න සාමාජිකයෝ අතර ඉන්න සාමාජිකයෙකු තමයි සුජිත් පුෂ්පකුමාර මන්ත්‍රීතුමා, මේ මෙදින පැවති කමිටුවේ සාමාජිකයෙක්. ඒ කමිටුවේ සාමාජිකයෝ විසින් තමයි මේ නිර්දේශ සභාවට එවන්නේ. දැන් එහෙම එවන නිර්දේශ පෙරළා සභාවේ ප්‍රශ්ණ කරනවා, අපි වෙනම අරගත්තු ඒවා මොකුත් නෑ. කමිටුවේ නිර්දේශයක් සභාවට එවනවා කමිටුවේ සාමාජිකයින්.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මේ කමිටුවේ එකත් කියන්න ඕන, ඔබතුමා ඒ කියපු කතාව හරි වැදගත්, මේ කමිටුව මෙතෙක් කල් බොහොම හොඳින් ගියා අපි දැක්කා. හැබැයි එදා දවස කමිටුව නිකම්ම නිකං ජෝක් එකක් යන විදිහට තමයි මේ කමිටුව ගියේ අපි දැක්කේ. ඒ කියන්නේ මේ කමිටුව තීන්දු තීරණ ගන්නේ කමිටු සාමාජිකයෝ නෙවෙයි, මේ කමිටුවේ තීන්දු තීරණ ගන්නේ නිලධාරින්, නාගරික කොමසාරිස්වරිය, නාගරික ලේකම්වරයා ඇතුළු නිලධාරීන් කතා කර කර තමයි තීන්දුව කියන්නේ. ඒනිසා කරුණාකරලා ආයතන කමිටුව කියලා කියන්නේ මේ කමිටු අතර ගත්තම ඉතාම වැදගත්ම කමිටුව. ඒනිසා මේක මීට වඩා වගකීමෙන් කරන්න මම ඒක කියන්නේ හිටියේ,  ඔබතුමාම කියපු එක හොඳයි. ඇත්ත, මම කමිටු සාමාජිකයෙක්, මම කමිටුව සහභාගී වෙලත් ඉන්නවා. හැබැයි මම මෙතන කමිටු නිර්දේශය ගැන කතා කරනකොට ඒක ප්‍රශ්ණයක්. හැබැයි මම මේ කමිටු නිර්දේශය ඉවර වුනාට පස්සේ තමයි එතනට ආවේ. හැබැයි මම ආපු වෙලාවේ ඉඳලා මම නිරීක්ෂණය කරපු දේ තමයි කමිටුව වෙනදා යනවා වගේ නෙමෙයි ගියේ මේක අමුතුම ස්වභාවයකට කමිටුව ගියේ. ඒනිසා මේ සම්බන්ධයෙන් ඔබතුමා මට උත්තරය ලැබුන්නෑ මේකේ සාකච්ඡාව කාත් එක්කද කරන්නේ.

**<u>නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමා, මේ ලියුමට අදාළව මෙම කරුණ සාකච්ඡා කරන වෙලාවේ නගරාධිපතිතුමාවත්, සෞඛ්‍ය කමිටු සභාපතිතුමාවත් එතන හිටියේ නෑ. ඒනිසා කමිටුව විදිහට අපි සාකච්ඡා කරා මේ කරුණ අපි සභාවට සාකච්ඡාවට යොමු කරලා නැවත තීන්දුවක් ගමු කියන කාරණය. එතකොට මේ කියන චෝදනාව මම ප්‍රතික්ෂේප කරනවා. කමිටුව විදිහට අපි තමයි මේ කරුණ මෙතන සාකච්ඡා කරලා තීන්දුවක් ගමු කියන තීරණය දුන්නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මේක නැවත වරක් ඔබතුමාගේ අවධානය යොමු කරනවා මේ නිර්දේශය ගැන. උක්ත කරුණ සලකා බැලූ කමිටුව මේ සම්බන්ධව සාකච්ඡා කර තීරණයක් ගැනීම සුදුසු බව නිර්දේශ කරන ලදී. මේකේ කියලා නෑ මහා සභාවේ සාකච්ඡා කරනවා කියලා. මේකේ කරලා තියෙන්නේ සාකච්ඡා කරලා තීන්දුවක්, කවුරුත් එක්ක සාකච්ඡා කරලා, මේ ලියුමේ තියෙන්නේ ගරු නගරාධිපතිතුමා, නගරාධිපතිවරයා, නාගරික කොමසාරිස්වරයා, ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක, මේ ද්‍රව්‍ය ප්‍රතිසාධන මධ්‍යස්ථානය භාරව නගරාධිපතිවරයා එක්ක කතා කළා කිව්වම, නාගරික කොමසාරිස්වරයා එක්ක කතා කළා කිව්වම වෙන කාත් එක්කද කතා කරන්න තියෙන්නේ. නගරාධිපතිවරයාට එහා ගිය කෙනෙක් ඉන්න විදිහක් නෑනේ මේකේ. ඒනිසා අපි අහන්නේ ඔබතුමාගෙන්, මේක බලන්න ඕනේ නගරාධිපතිතුමා මේ ලිපියේ මේ සඳහන් වෙලා තියෙන දේ හරිද වැරදිද කියලා හොයලා බැලුවානම් හරි. ඒක ප්‍රශ්ණයක් නෑ. ඔබතුමා පොරොන්දුවක් දීලා තියෙනවද, නාගරික කොමසාරිස් එහෙම පොරොන්දුවක් දීලා තියෙනවද කියලා හෙව්වනම් ඒත් ගැටලුවක් නෑ.

**නියෝජ්‍ය නගරාධිපති - ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය**

ගරු නගරාධිපතිතුමා මේ ලිපිය ඉදිරිපත් කරන්නේ අදාළ සේවකයෝ. ඒ සේවකයෝ කියූ පමණින් මේක නගරාධිපතිතුමා කිව්වා, කොමසාරිස්තුමිය කිව්වා, සභාපතිතුමා කිව්වා කියලා අපිට එහෙම තීන්දු ගන්න බෑ. අපි ඔබතුමාලා එක්ක මේ පිළිබඳව සාකච්ඡා කරන්න ඕන. අපිට සේවකයෝ කිව්ව පමණින් නගරාධිපතිතුමා දෙන්නම් කිව්වා, සභාපතිතුමා දෙන්නම් කිව්වා, නාගරික කොමසාරිස්තුමිය දෙන්නම් කිව්වා කියලා අපි කොහොමද එහෙම තීන්දු කරන්නේ.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, සභාපතිතුමාගේ කතාවක් නෑ මෙතන නගරාධිපතිතුමා. ඔබතුමා ඊට පස්සේ ආයතන කමිටුවට ආවා.ආයතන කමිටුවේ සමහර දේවල් ගැන කරුණු ගැන ඔබතුමා ආවට පස්සේ නැවත වරක් අවධානය යොමු කළා. යොමු කරලා ඔබතුමාගෙන් ඇහුවා ඒවා. මම ඒක දැක්කා. මේ ආයතන කමිටුවට මුල ඉඳලා ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක සහභාගී වෙලා හිටියා. අනික ඔබතුමාගෙන් අහලා දැනගන්න ඕනේ නම් මේකේ නිර්දේශය වෙන්නේ ඕනේ මේක නෙමෙයිනේ. ගරු නගරාධිපතිතුමාගෙන් මේ සම්බන්ධයෙන් විමසා තීන්දුවක් ගැනීමට කමිටුව නිර්දේශ කළා. අනික නාගරික කොමසාරිස් කමිටුවේ ඉන්නවා, තව මොකක්ද දැන ගන්න තියෙන්නේ. ඔබතුමා පැය භාගයක් විතර ගියාට පස්සේ කමිටුව එනවා. ඒ නිසා නගරාධිපතිතුමා වැඩේ වැරදුනාට පස්සේ බොරුවට දේවල් කියන්නේ නැතුව මේක වැරදි නම් වැරදී කියලා පිලිගත්තා මේ නිර්දේශය වැරදි,

**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා, හැමදෙයක්ම මේ තමන් හිතන පැත්තෙන්නේ සාකච්ඡා කරන්න උත්සහ කරන්නේ. හැබැයි අපි හොඳටම දන්නවා ඒ ලිපියෙන් නගරාධිපතිතුමා හා තව කිහිප දෙනෙක් පොරොන්දු වුණා කියලා කියන්නේ සේවකයෝ. එතකොට පොරොන්දු වුණා කියන එක වැරදි සාකච්ඡා කළා. ඔවුන්ට සාකච්ඡා කළා ඔවුන්ගේ අවශ්‍යා අතිකාල ප්‍රමාණය කොහොමද අපි දෙන්නේ. අතිකාල ලබාදීම කියන කාරණාවේදි අපිට මුහුණ දෙන්න වෙන ගැටලුවක් තමයි අතිකාල කියන්නේ සේවා කාලයෙන් අමතර කාලය හැබැයි ඒ අමතර කාලේ එකතු කරාට පස්සේ දෛනිකව ඒගොල්ලෝ ඉන්න ඕන රෑ 08 විතර වෙනකන්. හැබැයි රෑ අට වෙනකන් ඒක ඇරලා තියෙන්නේ නෑ. මම කියන්නේ එක පැත්තකින් නෛතික ගැටලු වෙන්නෙ නැති වෙන්නත් අනික් පැත්තෙන් ඔවුන්ගේ සේවය ඇගැයීමක් ලෙස සේවය ඉතාම වටිනා අමාරු සේවයක්, ඒනිසා ඔවුන්ට ඒ අදාළ ලබාදීම කළ යුතුයි. ඒ ගැන මට අදහසක් තියෙන නිසා සාකච්ඡාව අරගත්තා. සභාවට ගිහිල්ලා සභාවේ අනුමැතිය ගමු. දැන් ඒගොල්ලෝ කියන එක සාකච්ඡා කළා ආයතන කමිටුවෙත් කතා කළා ඒ කියන්නේ මේක ඇතුලේ මොකකටත් ප්‍රතිවිරෝධයක් නැනේ, කවුරුත් විරුද්ධ නැනේ.ඒ සේවකයින්ට ලබා දිය යුතුයි. එය ලබා දෙද්දි කමිටුවටම පමණක් බෑ කමිටුව නිර්දේශයක් සභාවට දීලා සභාව තමයි මේක අනුමත කළ යුත්තේ.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමා, ඔබතුමා කියන එක හරි. හැබැයි මේ වෙලාවේ නාගරික කොමසාරිස්වරිය ඉන්නවා කමිටුවේ, මේ වෙලාවේ මහජන සෞඛ්‍ය පරීක්ෂක ඉන්නවා, එවලේ දැන ගන්න තිබ්බා මේ ලියුමේ මෙන්න මෙහෙම පොරොන්දුවක් දීලා තියෙනවා, නාගරික කොමසාරිස්ගෙන් අහන්න තිබුනා ඔගොල්ලෝ මෙන්න මෙහෙම කිව්වද කියලා, ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකගෙන් අහන්න තිබ්බා. ඒනිසා මේ නිර්දේශය වැරදි නම් මේක වැරදි නිර්දේශය අපි නිවැරදි කරමු කියලා කිව්වා නම් ඉවරයිනේ.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**
ගරු මන්ත්‍රීතුමා, ඒක නිවැරදි කරමු.

**<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා</u>**
ගරු නගරාධිපතිතුමා, පොඩි ඉල්ලීමක් කරන්න ඕන. මේ ආයතන කමිටු වාර්තාවේ ඇමුණුම් අංක 05, 06, 07 කියලා තියෙනවා , ඒක අපේ තොරතුරු තාක්ෂණ නිලධාරියා ලේකම්තුමා මගින් ඉදිරිපත් කරපු යෝජනාවලියක් තියෙන්නේ. ඒකේ යෝජනාවල් 05ක් තියෙනවා. ඇමුණුම් 03 ක් වුනාට යෝජනාවල් 05ක් තියෙනවා. Email එක ගැන, බැකප් එකක් කරන්න, එතකොට UPS එකක් පාවිච්චි කරන්න ඒ වගේ ඉතාම පිලිගත හැකි යෝජනාවල් ගොඩක් තියෙනවා එතන. ඒකේ ලොකු යෝජනාවක් තියෙනවා බැක්අප් සිස්ටම් එක. ඒ බැක්අප් සිස්ටම් එකේ එයා යෝජනා කරලා තියෙන ඒ වාසිවලට අමතරව එයා නොදැකපු දෙයකුත් තියෙනවා, මොකද ඩිසාස්ටර් මැනේජ්මන්ට් ප්‍රොගෑම් එකකුත් තියෙනවා ඒකේ. ඒ කියන්නේ දවසක මේ ආයතනය කඩා වැටුනහොත් ඊට පස්සේ ඉදලා වැඩ පටන් ගන්න පුලුවන් ක්‍රමයකුත් තියෙනවා ඒකේ. ඒකේ ඉන් බිල්ඩ් සිස්ටම් එකක් තියෙනවා. ඒනිසා මම ඔබතුමාට ඉල්ලීමක් කරන්න කැමති අපිට මුදල් කමිටුවේදි මේ අංශවල ප්‍රධානින් අපට හම්බවෙනවා, යාන්ත්‍රික හරි, කර්මාන්ත හරි, මුදල් හරි හැමෝම හම්බ වෙනවා. නමුත් අපිට IT එකේ කවුරුත් හම්බ වෙන්නේ නෑ. IT එකේ ප්‍රශ්ණ තියෙනවා අපිට අහන්න, අපිට තියෙනවා දේවල් දැනගන්න. මේවට අපිට IT එකේ කවුරුත් නෑ. මම ඉල්ලීමක් කරනවා අඩුම ගානේ මුදල් කමිටුවට මේ නිලධාරියා ඇත්තටම ආයතනයට යම් හැගීමක් තියෙන නිසයි මේ වගේ යෝජනාවක් කරලා තියෙන්නේ. ඇත්තටම මේක අගය කරන්න ඕන සහ මේ වගේ නිලධාරියෙක්ව අපි මුදල් කමිටුවට කැඳවන්න සහ මුදල් කමිටුවේ ශිර්ෂයක් ඕපන් කරන්න තොරතුරු තාක්ෂණය කියලා. අපිට එතකොට එකෙන් ඩිවලොප් කරගන්න පුලුවන්.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**
ගරු මන්ත්‍රීතුමා, අපි මුදල් කමිටුවට ගෙන්නමු එතුමව.

**2026.03.09 වන දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී.තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |

17. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**2026.03.09 වන දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**2026.03.09 වන දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය දීමෙන් වැළකි සිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
9. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
10. මහා නගර සභා මන්ත්‍රී - එස්. චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටල්කාන්ත මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
16. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය

**2026.03.09 වන දින පැවති ආයතන හා නීතිය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඕ.දිනුෂි කෞශල්‍යා පෙරේරා මහත්මිය)

**06(04) 2026.03.10 වන දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, 02(1) කරුණ කෙරෙහි අවධානය යොමු කරවනවා. ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් කමිටුවට ඉදිරිපත් කරන ලද මහා නගර සභාවට අයත් ගලි රථ පිළිබඳ සලකා බැලීම. මේකේ තියෙනවා ගලී රථ සේවා ලබාගැනීමට පැමිණෙන්නන්ගේ පහසුව සහ ගලි රථ සේවාව කාර්යක්ෂම කිරීම වෙනුවෙන් ගලී සේවාව ලබාගැනීමට අදාළ අයදුම්පත්‍ර කළාප කාර්යාල මගින් ලබාගැනීමේ පහසුකම් ඇති කිරීමටත්, ඒක හොඳයි. ගලි සේවාව ලබාදීම සඳහා ගලි රථය අදාළ ස්ථානයට යාමට පෙර ගලි වල පරීක්ෂා කර ගලි සේවාව ලබාදිය හැකි මට්ටමේ පවතින ස්ථානයක් ද යන්න කඩිනමින් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට දැනුම්දීම කළාප භාර සෞඛ්‍ය පරිපාලකවරුන් වෙත පැවරීමට නිර්දේශ කරන ලදී. ඒ කියන්නේ කළාප වල ඉන්න පරිපාලක මහත්වරුන් වෙන වැඩක් නැතිවෙනවා. ගලි ඇර ඇර බල බල ඉන්න වෙනවා ගිහිල්ලා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මේක සාකච්ඡාවේදි ආපු යෝජනාවක්. ඇත්තටම ඔබතුමාලගේ පැත්තෙන් තමයි යෝජනාව ආවේ. එතකොට ඒක අපි ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න යද්දී ඔය පරිපාලක ගැටලුවක් මතුවෙනවා. පොඩ්ඩක් නැවත එය සාකච්ඡා කරලා වෙනස් කරගමු කියන අදහසක ඉන්නේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, ඒකේ ප්‍රායෝගික ප්‍රශ්ණයක් මතුවෙනවා. නමුත් අපි ඒක ගෙනාවේ ගරු මන්ත්‍රීතුමා වෙන දෙයක් හේතු කරගෙන නෙමෙයි. සමහරක් වෙලාවට අපිට සර්විස් එක දෙන්න බැරි තැන් තියෙනවනේ මුදල් ගෙව්වට පස්සේ.අපිට එතකොට සම්පූර්ණ මුදල ගෙවන්න බැරිකමක් වෙනවා. ඒක නිසා අපි තීරණයකට ගත්තා ඒ අයගෙන් පොඩි විමසීමක් කරලා එක්කෝ අපේ පාරිපාලක වරයෙක් හරි දාලා බලලා ඉවරවෙලා එතකොට අපිට ඒ ස්ථානය යන්න පුලුවන්කම ලැබෙන හින්දා තමයි එහෙම කළේ. මොකද සමහරක් වෙලාවට 100% මුදල් ගෙවන්න බැරිවුනාම ඒ මිනිස්සු නැවත අපිට චෝදනා කරනවා ඇයි මුදල් 100% ගෙවන්න බැරි කියලා. ඒ හේතුවට විසඳුමක් හැටියට තමයි අපි ඒක කළේ. හැබැයි හැම කෙනාටම නෙමෙයි මේක. මගේ වත්තට ගලි සර්විස් එක ඕනේ නම්, මම පැහැදිලිව කියනවා නම් කිසි ගැටලුවක් නෑ කවුරුත් ඕනේ නෑ චෙක් කරන්න මම මුදල් ගෙවනවා ඇවිල්ලා දෙන්න කියලා, එතකොට අපි සර්විස් දෙන්න ගියාම ගරු මන්ත්‍රීතුමා එතනදි මොකක් හරි ප්‍රශ්ණයක් වුනොත් පස් වෙලා හරි කියලා එතකොට එතනදි මුදලින් කීයක් හරි අඩු කරගන්න එක තමයි මෙතන තියෙන්නේ. නැතුව වෙන හේතුවෙක් නිසා මේක කළා නෙමෙයි. සාකච්ඡා කරලා හොඳ තැනකට අපි ආවා. ප්‍රායෝගිකව කරන්න පුලුවන් ගැටලු තියෙනවා, අපි ගැටලු බේරගෙන යමු. නමුත් මට සර්විස් එක ඕනේ නම් මම කියනවා නම් කිසි ගැටලුවක් නෑ පස් වෙලා නෑ මේකට සර්විස් එක දෙන්න කියලා එහෙම අයට ප්‍රශ්ණ නෑ, පරිපාලකවරයකුත් බලන්න යන්න ඕනෙත් නෑ.එහෙම නැති වුනොත් තමයි ඒකට වුට්ටක් අවධානය යොමු කරන්න වෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මම කියන්නේ ඒක බලන එක හොඳයි. හැබැයි මේ කලාප වල ඉන්න පරිපාලක මහත්වරු මේකට දාන එක ප්‍රායෝගික නෑ.ඒ මිනිස්සුන්ට වැඩ තියෙනවා ඕන තරම් කරන්න. ඒ මිනිස්සුන්වම මේකට මරාගෙන කන එක.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමා, අපි ඒක තවදුරටත් සාකච්ඡා කරමු.

සභා සෝෂා

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>
ගරු නගරාධිපතිතුමා, 02(4) කරුණ සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා. ප්‍රධාන මහජන සෞඛ්‍ය පරික්ෂක විසින් කමිටුවට ඉදිරිපත් කරන ලද ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ විශේෂ ව්‍යාපෘතියේ විකුණුම් විස්තරය පිළිබඳ සලකා බැලීම. මේක භාරව ඉන්නේ කවුද විකුණුම් සම්බන්ධයෙන්.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>
මන්ත්‍රීතුමා, මේ සම්බන්ධව ෆයිල් එක කරන නිලධාරියෙක් ඉන්නවා, පී.එච්.අයි.නදීන් මහතා තමයි දැනට බේල් එක අධීක්ෂණ කටයුතු භාරව ඉන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>
ගරු නගරාධිපතිතුමා, එතකොට මේකේ අධීක්ෂණ කටයුතු කළේ විජේසිරිවර්ධන පී.එච්.අයි. එතකොට එයාව අයින් කළේ මොකක් හරි ප්‍රශ්ණයක් නිසාද, නැත්තම් එයා අයින් වුණාද,

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>
ගරු නගරාධිපතිතුමා, එයාගේ පැත්තෙන්ම ආවා, අපි දැනුණා ඒ ක්‍රියාකාරීත්වය, කාර්යක්ෂමතාවය අපිට දැනෙන්නේ නෑ. එයාගේ පැත්තෙනුත් ආවා ඒක කරගන්න බැරිවෙයි කියලා. ඒනිසා අපි තීරණයක් ගත්තා නදීන් මහත්තයා එතුමා ඒක භාරගත්තා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>
ගරු නගරාධිපතිතුමා, 02 (09) කරුණ සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා. 02(9) කරුණ ඉවත් කරන්න තීන්දු කරලා තියෙනවා. ඉවත් කරන්න තීන්දු කළේ කරුණු 11කින් සමන්විත සේවකයන් වෙනුවෙන් දාලා තියෙන මේ කරුණු ටික කරලා ඉවරද,

<u>මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා</u>
මන්ත්‍රීතුමා, බොහොමයක් කරුණු කරලා තියෙන්නේ. නමුත් ඔය සමහර කරුණු තියෙනවා එතුමාගේ පැත්තෙන්ම ආපු ඒවා.ඒවා ටිකක් ක්‍රියාත්මක කරන්න ගියාම ප්‍රායෝගික ගැටලු මතුවෙන නිසා අපි ඒක නැවත ගොනුවකින් පවත්වාගෙන ගිහිල්ලා අවශ්‍ය කටයුතු කරමු කියන අදහසට ආවේ. දැන් ඒක දීර්ඝ කාලයක් යන හින්දා. කාලයක් ගත වෙන හින්දා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>
ගරු නගරාධිපතිතුමා, මේකේ තව ප්‍රධාන ප්‍රශ්ණයක් තියෙනවා ඇමුනුම් අංක 12, ප්‍රධාන කරුණ 05, මළ සිරුරු හා මළ සිරුරු කොටස් භූමිදානය කිරීම සම්බන්ධව. මොරටුව විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අධ්‍යයනය කටයුතුවලින් පසු ඉවත් කරන මළසිරුරු හා මළ සිරුරු කොටස් භූමිදානය කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලා මොරටුව විශ්ව විද්‍යාලය වෙතින් ලිපියක් යොමු කර ඇත. එම අපද්‍රව්‍ය බැහැර කිරීමට ඔවුන් විසින් තෝරා ගන්නා ලද මල් ශාලාවකට පවරනු ලබන බවද වැඩිදුරටත් සඳහන් කර ඇත. ආසන්න පළාත් පාලන ආයතන මගින් සඳහන් කර ඇති ආකාරයට මළ සිරුරු කොටස් භූමිදානය කිරීම සඳහා ගාස්තු අය කරනු ලබයි. මේ අනුව මළ සිරුරු හා මළ සිරුරු කොටස් භූමිදානය කිරීම සම්බන්ධව අවසර ලබාදීම හා ඒ සඳහා අවසර ලබාදෙන්නේ නම් ගාස්තු අයකිරීම සම්බන්ධව නිර්දේශයන් සහ සභා අනුමැතිය ලබාගැනීමට කාරුණිකව ඉදිරිපත් කරමි. දැන් මේකේ සභා අනුමැතියට ඉදිරිපත් කරලා තියෙන්නේ. මේකේ ප්‍රශ්නෙ තියෙන්නේ එක නෙමෙයි. දැන් මේ

මළ සිරුරු කොටස් ගේන්නේ කොයිහරි මල් ශාලාවකින්. එතකොට පළවෙනි කරුණ තමයි ඒ මල්ශාලාව ගේන සියලු අපද්‍රව්‍ය අපි භාරගන්නවද, මේක විශ්ව විද්‍යාලයෙන් ගේන අපද්‍රව්‍ය කියලා හඳුනා ගන්නේ කොහොමද, එහෙම හඳුනාගැනීම විශේෂ ක්‍රමවේදයක් තියෙනවාද, එහෙම නැත්තම් මල් ශාලාව මගින් ගේන ඔක්කෝම අපද්‍රව්‍ය ටික අපි භාරගන්නවද, ඒක පළවෙනි කරුණ. දෙවැනි කරුණ තමයි මොරටුවේ මියැදෙන මනුෂ්‍යයෙක් භූමිදානය කරන්නවත් අද වෙනකොට අපිට මේකේ ඉඩ නෑ. එතකොට මේ ගේන මළසිරුරු කොටස් භූමිදානය කරන්න අපිට ඉඩක් වෙන් කරන්න වෙනවා. එතකොට ඒ ඉඩ සොයා ගන්නේ කොහොමද, ඒක මොරටුව අපේ තියෙන සුසාන භූමිවල තදබදයට බලපෑමක් වෙන්නේ නැද්ද සහ මේකට යම් මුදලක් අය කරනවා නම් ඒ මුදල් අය කරන්න තීන්දු කරන්නේ කොහොමද, වෙන නගර සභාවල් අයකරන විදිහටද නැත්නම් වෙනත් ක්‍රමයකටද ඒ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් අවශ්‍ය වෙනවා. මොකද හේතුව මේක සභාවට තමයි මේ තීන්දුව ගන්න කියලා තියෙන්නේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**</u>

මන්ත්‍රීතුමා,  ඒක පළවෙනි කාරණය. මොරටුව විශ්වවිද්‍යාලයේ තියෙන අලුත් මෙඩිකල් ෆැකල්ටි එකට තමයි ඉල්ලීම කරලා තියෙන්නේ. එතකොට අපිට ලැබිච්ච අවබෝධය සහ හොයා ගත්ත තොරතුරු ගත්තම අපි කමිටුවේ සාකච්ඡා කළාම ඔය මළසිරුරු කොටස් විශාල ප්‍රමාණයක් දෛනිකව හෝ  සතිපතා එන එකක් නෙමෙයි කියන එක තමයි අදහස තිබුණේ. බෙහොම කාලයක් ඒගොල්ලො පාවිච්චි කරනවා. ඒක නිසා තමයි අපි ඒකට එකඟතාවය පළවුණේ එක. ඊළඟට මල්ශාලාවෙන් එන එක සම්බන්ධයෙන් ගත්තොත් ඒ ගොල්ලන්ගේ සහතිකයක් සහිතව, ඒ කියන්නේ විශ්වවිද්‍යාලය සහතිකය අපිට අවශ්‍යයි. මල් ශාලාව නිකං උස්සන් එන එක අපි භාරගන්නේ නෑ. ඒක අරන් එනකොට අහවල් විශ්ව විද්‍යාලයෙන් අරන් එන්නේ කියන සහතිකය අවශ්‍යයි. ඒක තමයි අපි භාරගන්නේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

මන්ත්‍රීතුමා, ඒක සඳහන් වෙන්නේ නෑනේ මේ කමිටු තීන්දුවේ.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, අපිට බැරිද එතුමා මතු කරපු ඒ තත්වෙත් එක්ක භූමිදානය නෙමෙයි ආදාහනය වගේ එහෙකට මේක කරන්න.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, මමත් ඒක තමයි ඇහුවේ. මේක ආදාහනය කරන්න පුලුවන්නම් ඒ යන මුදල විශ්ව විද්‍යාලයෙන් අරගෙන මේ ප්‍රශ්ණේ අපට ගොඩක් දුර විසඳගන්න පුළුවන්.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**</u>

ගරු නගරාධිපත්තුමනී,ඒක හොඳයි. සාකච්ඡාව ඇතුලේ එන අදහස් එක්කනේ අපි ගන්නේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා**</u>

සභාපතිතුමා, මන්ත්‍රීතුමා කිව්වා වගේ මේ විවිධ අක්‍රමිකතා ඇතිවෙන්නෙත් ඔය මල් ශාලාවලින් ගේන වෙනස් කොටස් නිසා තමයි. නැවත ඕක වැඩි වෙන්න පුළුවන් ඒ මාර්ගෙන් එන්න පුලුවන්.ආදාහනාය කරා නම් ඇත්තටම හොදයි.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, අපි නිර්දේශය වෙනස් කරමු.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, ගැටලුවක් නෑ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, ඔය නිර්දේශය වෙනස් කළා නම් සංශෝධනය කළා නම් මේක ආදාහනය කියලා ඊළඟ කමිටුවේදි හරි නැවත වරක් කමිටුවට දාලා ඒ කමිටුවේදි හරි සංශෝධනය කර ගත්තම් හොඳයි කියන එක තමයි අපේ අදහස.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, ඒ සංශෝධනයේදි හැබැයි ගාණත් සංශෝධනය වෙයි.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, සාමාන්‍යයෙන් අපි ආදාහනයක් කරන්න යන ගාණ ගන්න වෙනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, අපි කමිටුවේ නැවත කතා කරලා තීරණයක් ගමු.

**2026.03.10 වන දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී.තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සරෝජනී මැන්දිස් මහත්මිය |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |
| 26. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 27. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 28. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 29. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා |

**2026.03.10 වන දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා

**2026.03.10 වන දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව හෝ විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය දීමෙන් වැළකි සිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - මෙරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
5. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
6. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
7. මහා නගර සභා මන්ත්‍රී - එස්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
12. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය

**2026.03.10 වන දින පැවති පරිසර, සෞඛ්‍ය හා සනීපාරක්ෂාව පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඕ.දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය)

**06(05) 2026.03.10 වන දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - එස්. වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමා, 2(6) ප්‍රශ්ණේ 17 වන කොටස පොඩ්ඩක් බලන්න. ඒකේ තියෙනවා ද සොයිසා ක්‍රීඩාංගණයේ VIP ගොඩනැගිල්ලේ වහලය අලුත්වැඩියා කරගැනීම කියලා. ඒකේ ගරු නගරාධිපතිතුමනි තිබ්බේ සොයිසා ක්‍රීඩාංගණයේ වහලේ ඉස්සරහ සීට් අලුතෙන්ම දැම්මා කියලා. ඒක අපි නිරීක්ෂණය කළා හැබැයි එකේ අලුතින් දාපු පාටක් නම් පේන්නේ නෑ මොකද ඒ ශීට්වල හිල් තිබ්බා දාර කැඩිලා තිබ්බා. දාපු අමුද්‍රව්‍ය පිළිබඳවවත් කිසිම දැනීමක් නෑ. ඒ හදපු වාර්තාවක් කමිටුවට හරි ඉදිරිපත් කරනවා නම් ඉතාමත්ම හොඳයි මොකද ඒ ගැන අපිට දැනගැනීමට. මොකද මේක යෝජනාව කරලා ඉවර වෙලා තමයි දාලා තියෙන්නේ. ඒ

පිළිබඳව කමිටු සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා ඒ පිළිබඳව වාර්තාවක් කමිටුව වෙත ලබා දෙන්න කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා</u>

ගරු නගරාධිපතිතුමනී, මන්ත්‍රීතුමා 17 කියන්නේ VIP ගොඩනැගිල්ල, ඒක අලුත්වැඩියා කිරීම් කළා අලුතින් ශීට් දැම්මා.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, ඒ කටයුතු සම්බන්ධ වාර්තාවක් තමයි ඉල්ලන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, සඳහන් කරන්නට ඕන පහුගිය දවසක පහුගිය මාසේ වේල්ස් කුමර විද්‍යාලයත් ශාන්ත සෙබස්තියන් විද්‍යාලයත් අතර තිබ්බ තරගය සඳහා ප්‍රවේශ පත්‍ර , ආරාධනා පත්‍ර ලබාදෙනවට වඩා හොඳයි ඒක නොගෙන ඉන්න එක. මොකද මන්ත්‍රීවරුන්ව බාල්දුවට හැල්ලුවට ලක් කරලා තිබ්බ පළවෙනි අවස්ථාව මම මේ දැක්කේ. මන්ත්‍රීවරුන්ට සුදුසු තැනක් නෑ. ස්කෝ බෝඩ් එක කෙළවරක දාලා එතනින් එහාට පෙන්නෙත් නෑ වැටවල් ගහලා. කවදාක්වත් එතෙන්ට සාමාන්‍ය කෙනෙකුට, වගකීමක් තියෙන මහජන නියෝජිතයෝ ඒවගේ තැන්වලට නොගියට කමක් නෑ. මොකද අපි ඒ තත්ත්වය තියාගෙන තත්ත්වය හැල්ලු නොකර ඉන්න ඕන. මොකද අපි ගමේ මහජන නියෝජිතයින් විදිහට එතෙන්ට ගිහිල්ලා අපි හැල්ලුවෙනවට වඩා හොඳයි නොගිහින් ඉන්න එක. ඔබතුමාගෙන් අවධානය යොමු කරනවා, වෙනදට ඇතුල්වන තැන පැවිලියන් එකේ ඉස්සරහ කැල්ල දුන්නේ. එතන හිටියේ මට මතකයි. සාමාන්‍යයෙන් අපට එහෙම අවශ්‍යතාවයක් නෑ. එහෙම ගියාම ඒ විදුහල්පතිවරු සමහර වෙලාවට දිවා ආහාරයටත් ආරාධනා කරන වෙලාවල් තියෙනවා. එහෙම අවශ්‍යතාවයක් නෑ. අඩුම තරමින් මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය ආරක්ෂා වෙන විදිහට ආපහු ඒවගේ තැනක් නම් ලබා ගන්න එපා. ලැබෙනවා නම් ඒ ගරුත්වය ආරක්ෂා වෙන විදිහට තැනක් පමණක් ලබාදෙන්න. සම්පූර්ණ ආධිපත්‍ය ඒ ක්‍රීඩා සාමාජවල ඒ අය විතරයි කළේ, මන්ත්‍රීවරුන්ට මම හිතන්නේ ප්‍රශ්නයකුත් ඇතිවුණා. මන්ත්‍රීවරුනි එහෙම තැනකට යන්න එපා. ගරු නගරාධිපතිතුමා ඔබතුමාටත් වගකීමක් තියෙනවා පළවෙනි පුරවැසියා විදිහට හා මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය පිළිබඳ ඔබතුමාට වගකීමක් තියෙනවා ඒක ආරක්ෂා කර ගන්න. ඒ අනුව කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා එදා දැක්ක සිද්ධියක් උඩ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, මට හිතෙන්නේ මේ ක්‍රීඩා කමිටුවට අරගෙන මේක සාකච්ඡා කරන්න වෙයි. මොකද නීතිමය තත්ත්වයක් නෙමෙයි. ග්‍රවුන්ඩ් එක අපෙන් මිලදී ගත්තම ඒ ගත්තු අය තමයි තමන්ට මොන මොන විදිහට ද අවශ්‍ය කියලා කටයුතු කරන්නේ. කොහෙවත් නීතිමය ප්‍රතිපාදනයක් සපයලා නෑ මන්ත්‍රීවරයාට මන්ත්‍රීවරයාගේ ගෞරවය ආරක්ෂා වෙන විදිහට මෙහෙම මෙහෙම තැනක්, එහෙම එකක් නෑ. නමුත් දීර්ඝ කාලයක් අපි හදාගත්තු විදිහක් ඇතුළේ මේ ආයතනයට මේ මැච් එක ගහනකොට අපිට ආරාධනා පත්‍ර ටිකක් දෙනවා. ඒ දෙන එකට ආදාළව අපට අදාළ ගෞරවය රැකෙන විදිහට මෙතන ක්‍රමවේදයක් හදලා තියෙනවා. එතකොට මේ අවස්ථාවේ අපි කියලා කරලා නෙමෙයි, මේ අවස්ථාවේ එතන ඒගොල්ලෝ ඒක ඒ ආකාරයට කළේ නෑ. එතකොට ඒ වේලාවේ අපිට මැදිහත් වෙලා නෑ අපේ ගෞරවය රැකෙන විදිහට අපිට මෙහෙම ඕනා කියලා ඒ මොහොතේ එහෙම කියාගන්න එක්ක එච්චර හොඳ දෙයක් නෙමෙයි. හැබැයි අපි පුලුවන්නම් සාකච්ඡා කරලා අපි තීන්දුවකට එන්න ඕන අති බහුතරයක් සෙබස්තියන් එකේ වේල්ස් එකේ ඉගෙන ගත්තු මොකක් හරි යම් අයිතියක් තියෙන මන්ත්‍රීවරු ගොඩක් ඉන්නවා. මහජන නියෝජිතයෝ ලෙස මේ මැච් එක තමයි අපි වැඩිපුරම බලන්න යන්නේ. මොරටු විද්‍යාලයේ තිබුනා කියලා

එහෙම එකක් අපිට එන්නෙත් නෑ. පාස් එන්නෙත් නෑ තියෙනවද නැද්ද කියලා දැනුම් දෙන්නෙත් නෑ ග්‍රවුන්ඩ් එක බුක් කරනවා වැඩේ යනවා. මේක අපේ හුගක් අය බලන්න යන මැච් එක. ඒනිසා සභාව විදිහට ඕනේ නම් අපි ක්‍රීඩා කමිටුවේ කතා කරලා එහෙම තීන්දුවකට එමු.

**මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමා, එතනදි කථා කලේ ඇත්තටම විශාල මුදලක් නගර සභාවෙන් වියදම් කරලා පහුගිය කාලේ ප්‍රතිසංස්කරණය කළේ. දැන් ඔය කතාව හැමෝටම අදාළයි. කලින් සභාවටත් අදාළයි ඔබතුමා කියපු කථාව. හැබැයි ඒ සභාවල ගරුත්වය ආරක්ෂා වෙන විදිහට කටයුතු කළා. ඒනිසා මම කියන්නේ අපි ඒක දෙනකොටම ඉල්ලීමක් කරන්න මුලින්ම එගොල්ලන්ගෙන් ඒ කොටස වෙන් කරලා දෙන්න ඕන ආසන කිහිපයක් හරි. මම හිතන්නේ කලින් සමන්ලාල් නගරාධිපතිතුමත් එතුමත් ඒක මෙය අනුමත කරන්නේ නෑ, නමුත් ඒ ගරුත්වය මන්ත්‍රීවරුන්ට ආරක්ෂා වෙන විදිහට කටයුතු යොදලා තිබ්බා. අන්න ඒ විදිහේ ක්‍රියාමාර්ගයක් අනුගමනය කරන්න. ඔබතුමා මින් ඉදිරියට කටයුතු කරන්න කියලා ඉල්ලීම කරන්න. ක්‍රීඩා කමිටුවට දාලා හරි කමක් නෑ භාරදෙන කොට ඒ තීරණය ගමු .

**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා, එහෙම කරමු.

**මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා**

ගරු නගරාධිපතිතුමා,විශේෂයෙන්ම මේ අවස්ථාව වැදගත් මොකද මේ අවස්ථාවේ අපි විශාල වශයෙන් අලුත්වැඩියා කටයුතු කරලයි ඒ අයට භාරදුන්නේ. ඒකට භාරදුන්නට පස්සේ අපිට වගකීමක් නැතත් අපිට කතා කරන්න අවස්ථාව තිබ්බා කියන හැඟීම මට තියෙනවා. ඒ එක්කම නගරාධිපතිතුමා අනෙක් කාරණාව පහුගිය කාලේ ඉල්ලා සිටියා කටුබැද්ද ඇවිදින මංතීරුවේ ප්‍රශ්නයක් සම්බන්ධව කථා කළා දිගින් දිගටම. මම ස්තුතිවන්ත වෙනවා තාරක මහත්මයා තමන්නාන්සේ යොමු කලා. එතුමා මැදිහත් වෙලා ඒ බංකු ටික ඉදිරියට දැම්මේ. නමුත් මේක පාලනය වන ආරක්ෂක අංශය පිළිබඳ මගේ අප්‍රසාදයක් තියෙනවා.ඒ අවස්ථාවේදි මම පැහැදිලිව ගිහිල්ලා කිව්වා, බලන් ඉන්න බැරි අවස්ථාවේ ගිහිල්ලා කව්වම, ඒ නිලධාරි, සම්පත් කියලා පුද්ගලයෙක් හිටියේ නැගිටලාවත් යන්නේ නෑ, බොහොම කම්මැලි. ත්‍රිවිල් එකෙන් එනවා ඒ ත්‍රිවිල් එකෙන්ම එහෙට මෙහෙට යනවා, යූනිෆෝම් එක්වත් ගහගෙන නෙමෙයි ඉන්නේ දවස තිස්සේ ටෙලිෆෝන් එකේ විතරයි ඉන්නේ.එහෙට මෙහෙට ගමන් වාරයක්වත් යැවෙන් නෑ.මේකෙන් පස්සේ නම් එක පාරක් ගිහිල්ලා තියෙනවා. මේ වගේ නිලධාරින් නම් අවශ්‍ය වෙන්නේ නෑ. එහෙම නම් මේ සිකියුරිටි සර්විස් එක වෙනස් කරලා වෙන සිකියුරිටි සර්විස් එහෙකටවත් දෙන්න ඕන. ඒ වගේ නිලධාරියෙන් ඉන්නවා නම් ඒ වගේ අය මාරු කරලා හොඳ නිලධාරින් ඉන්නවා. මම හිතන්නේ එතනම හිටියා අමිල කියලා පුද්ගලයෙක් ඒ පුද්ගලයා නම් මාරු කරලා තියෙනවා. මොනවා උනත් ඒ පුද්ගලයා වට ගිහිල්ලා ඉවරවෙලා උනන්දුවක් ගන්නවා එහෙම පුද්ගලයෝ මාරු කරලා මේකට වැඩකට නැති කම්මැලි පුද්ගලයෝ දාලා තියන්න එපා කියන ඉල්ලීම තමුන්නාන්සේගෙන් ඉල්ලනවා.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමා, සේනක දමයන්ත මන්ත්‍රීතුමා කියපු කරුණ සම්බන්ධයෙන් මටත් යම් දෙයක් කියන්න ඕනේ. උදැසන මම ඔය මැච් එක නරඹන්න ගියා. ගියාම ඉරිච්ච ටෙන්ට් එකක් තමයි ස්කෝ බෝඩ් එක ගාව කොළපාට අඩි දහය දහයේ ටෙන්ට් එකක් කැඩිච්ච පුටු ටිකක් තියලා ඒ කියන්නේ දුර්වර්ණ වෙච්ච පුටු ටිකක් තියලා තමයි මන්ත්‍රීවරුන්ට තිබ්බේ පළවෙනි ටෙස්ට් මැච් එක. එතකොට ඕවර්ස් මැච් එකට ගියාම සේනක දමයන්ත මන්ත්‍රීතුමත් ආවා මමත් ගියා ඊටත් වඩා අස්සකට වෙන්න තමයි ඒ ටෙක්ට් එකත් ගහලා තිබ්බේ

හිතාගන්න බැරි විදිහට. ඒ නිසා මේකෙදි අපිට පුලුවන් පළවෙනි දේ තමයි මම ඉල්ලීමක් කරනවා මේ සම්බන්ධයෙන් අපේ කණිස්සල්ල පළකරලා ලිපියක් යොමු කරන්න කියන ඉල්ලීම කරනවා අදාළ පාසල් දෙකටම මේ සම්බන්ධයෙන් ඒ අවධානය යොමු නොකිරීම සම්බන්ධයෙන්. මොකද හේතුව අපි මොරටුවේ ජනතාව නියෝජනය කරන මහජන නියෝජිතයෝ සහා ඔබතුමා කිව්වා වගේ මේකේ වැඩිපුර ආදි ශිෂ්‍යයන් හා දෙමාපියන් තමයි ඉන්නේ. අපේ දරුවෝ ගියෙත් ඔය ඉස්කොලෙට. අපිට පොඩි හැඟීමක් තියෙනවා ඒ පාසල් ගැන. අනිත් එක තමයි ඒ පාසල්වලට දෙන්නේ ඉතා සහනදායික මුදලකට තමයි නගර සභාව මේ දෙන්නේ. ඒ නිසා අර තර්කේ ගේන්න බෑ අපි දුන්නයි පස්සේ ඔක්කොම හරි කියලා. ඒකනිසා මීට පස්සෙ කන්ඩිෂන් එකක් දාලා ඒක කමිටුවටම ගෙනල්ලා යෝජනාවක් ලෙස සම්මත කරගත්ත නම්, මීට පස්සෙ ගවුන්ඩ් එක දෙනකොට ඒ මන්ත්‍රීවරුන්ට ආසන ප්‍රමාණයක් සැලකිය යුතු තැනකින් වෙන් කරගන්න.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, අපි කමිටුවේදි කතා කරලා ලියුම හදලා අත්සන් කරලා යවමු. දැනට අපි කණිස්සල්ල පළකරනවා ඇති වෙච්ච තත්ත්වය පිළිබඳව.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මගේ පෞද්ගලික අදහසක් ඉදිරිපත් කරන්න කැමති, සේනක මන්ත්‍රීතුමයි, අපේ සුජිත් මන්ත්‍රීතුමයි අපට ගෞරවනීය විදිහට ඉඩ දුන්නේ නැති එක ගැන. ඇත්තටම මම ඒ මැච් එක බලන්න නම් ගියේ නෑ. ඒක හින්දා මම දන්නෑ මොන ආකාරයෙන්ද අපට ගෞරවය නැති වෙන විදිහට උනේ කියලා. මට පොඩි මගේ අදහසක් කියන්න තියෙනවා ගරු නගරාධිපතිතුමනි, ගරුත්වය කියන්නේ අපි වාඩිවෙන තැන නෙමෙයි මම හිතන්නේ ගෞරවය කියන එක තියෙන්නේ අපේ මන්ත්‍රීවරුන්ගේ. අඩුපාඩුවක් වෙලා තියෙනවා නම් ඒක කියක එක හරි. මම හිතන්නේ එතුමන්ලට ඒක ටිකක් වැඩිපුර දැනෙන්නත් අපේ මන්ත්‍රී කණ්ඩායමට එහෙම ලොකුවට නොදැනෙනත් හේතුව සමහරවිට අපේම දේශපාලනය වෙන්න පුලුවන්.

සභා ඝෝෂා

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමනි, මට කතා කරන්න ඉඩ දෙන්න. අපේ දේශපාලනය, අපි මෙතනට ඇවිල්ලා තියෙන්නේ අපිට ඕවා නෙමෙයි ගෞරවය.අපි අපේ හැසිරීමෙන්, අපේ පැවැත්මෙන් අපේ ගෞරවය තියෙන්නේ.ඒක නිසා ඔබතුමන්ලට දැනෙන්න ඇති අපිට දැනෙන්න නැතුව ඇති එකට මොකක් හරි ක්‍රියාවක් යොදන්න.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>

මන්ත්‍රීතුමිය, මම නොකියා කිව්වේ ගරුත්වය සම්බන්ධව. ඒක කිව්වොත් එහෙම ලැජ්ජ වෙන්නේ අපි නෙමෙයි ඔගොල්ලෝ.නොකියා කිව්වේ. අපි එතන්ට ගිහිල්ලා එළියට බැහැලා කැකෝ ගහන්න ගියේ නෑ අපේ ගරුත්වය නැති කරගන්න.අපි වැදගත්කමට එතනින් නැගිටලා ආවේ. මන්ත්‍රීතුමිය ලැජ්ජයි මෙහෙම කියන්න ඒ ගරුත්වය නැති වුණේ තමුන්නාන්සේලා නිසා. තමුන්නාන්සේලාගේ ටිකට් අරන් ගිහිල්ලා තියෙන්නේ වෙන වෙන පුද්ගලයෝ. අන්න එතනයි ගරුත්වය නැති වුණේ.

සභා ඝෝෂා

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මන්ත්‍රීතුමා වැරදි කතාවක් කිව්වා, අපේ ටිකට් අරන් කිසිකෙනෙක් ගියේ නෑ. වගකීමෙන් කියනවා සභාපති වශයෙන්. මම දවස් හතරම හිටියා බොරු කියන්න එපා.මම උදේ ඉඳන් හවස් වෙනකම් ඉඳලා ප්‍රයිස් ගිවින් එකෙන් පස්සේ මම ගියේ හැමදාම. ඒක වැරදි කථනයක්.

-සභා ඝෝෂා -

**<u>මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා</u>**

ශාන්ත සෙබස්තියන් විද්‍යාලය පාලනය කරන ඔවුන් තමයි කිව්වේ මෙන්න මෙහෙම මන්ත්‍රීවරු ආවා ඒ නිසා තමයි නැගිටෙව්වේ කියලා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, චාමර පියතුමා සමඟ මම පුද්ගලිකව කතා කළා ඔය ගැන

සභා ඝෝෂා

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනි, මෙතෙක් පැවතිච්ච තත්ත්වයේ වෙනසක් සිද්ද වෙච්ච එකේනේ මේ ගැටලුව තියෙන්නේ. එතෙක් පැවතිච්ච තත්ත්වය නීත්‍යානුකූල ක්‍රමවේදයක් ඇතුලේ තහවුරු කරපු දෙයක් නෙමෙයි. අපෙන් ඇවිල්ලා ගවුන්ඩ් එක මිලදී ගත්තම ගවුන්ඩ් එක පාලනය කරන මේ අදාළ පාසල් දෙක ඒගොල්ලන්ට පැවරෙනවා මෙතෙක් පැවතිච්ච තත්ත්වය පවත්වාගෙන යන්න මන්ත්‍රීවරුන්ට, අපට පාස් එක එව්වා නම් , අපේ මන්ත්‍රීවරු කිසිකෙනෙක් වැඩිපුර ප්‍රමාණයක් ගත්තේ නෑ. මැච් බලන්නේ නැති එක වෙනම එකක්. ඒනිසා මම කියන්නේ ගැටලුව තියෙන්නේ එතන. එහෙනම් අපි ඒක එතනට දැනුම් දෙන්න ඕන. මන්ත්‍රීවරුන්ට පාස් එවන්නේ මොකක් ගෞරවයක් හින්දනේ. ඊට ගැලපෙන ලෙස තැන සූදානම් නොකිරීම ඔවුන්ගේ ප්‍රශ්ණයක්.ඒවේලාවේ අපේ බලය අයුතු ලෙස පාවිච්චි කරලා එතනත් එක්ක ගැටුම්කාරී ස්වභාවයක් හදාගන්න බෑ. එතන ඒ අය කරපු දේ ගැන අපට දෝෂාරෝපණයක්, විවේචනයක් තියෙනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔෂඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මට තේරුණා මන්ත්‍රීවරුන්ට මේ විදිහට තමයි තියෙන්නේ කියලා මම සුසන්තට කථා කළා, සුදේශ් අයියට කථා කලා, ඔබතුමාට කථා කළා . ඔබතුමා බොහෝ සේ තර්ක කලා, කතා කළා ෆාදර්ස්ලත් එක්ක හිටියේම නෑ. ඒ වුනාට නගරාධිපතිතුමා, ග්‍රවුන්ඩ් එක තියෙනවා සල්ලි දීලා ගන්න කියලා අපි කියමු. අපි උඩ දාගෙන හදන්න ඕනේ නෑ නගරාධිපතිතුමා. ඒගොල්ලෝ කියනවා නම් අපි සල්ලි දීලා ගත්තේ ඒ හින්දා අපි දෙන්නේ නෑ කියලා, ඇයි එහෙනම් අපිට පාස් එව්වේ. අපිට පාස් එව්වනම් මන්ත්‍රීවරුන්ට ගරුත්වයක් තියෙන්න ඕනනේ නගරාධිපතිතුමා. නගරාධිපතිතුමා ෆයිට් කළා මම දැක්කා, රෑත් කතා කලා වැඩක් වුණේ නෑ. අපි ලිඛිතව ලියලා යවමු ඉස්කෝල දෙකටම අපිට මේ අවස්ථාව ලබා දෙන්න කියලා.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, අපි එහෙම නැත්තම් මොකක් හරි අඩුකිරීමක් යටතේ නම් දෙන්නේ ඒක නවත්තමු. මේ සභාව නියෝජනය කරන වැඩිපුර මන්ත්‍රීවරුන් සෙබස්තියන්ගේ වේල්ස් එකේ ආදි ශිෂ්‍යයෝ නම්, ඒ ශිෂ්‍ය සමිති සමාගම්වල හිටපු අය ඉතිහාසයේ වැඩිපුරම දැනුත් ඉන්නවා, ඔවුන්ටත් වගකීමක් තියෙනවා මේ කතන්දරේ අදාළ ආදි ශිෂ්‍ය සංගම්වලදි කතා

කරන්න. දැන් සම්පූර්ණයෙන්ම මේ වේලාවේ මට දැනිච්ච දේ තමයි තනි එක්කෙනකුට දෙන්නෙකුට ඕන විදිහට මේක ගියා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, මම 2(2) කරුණ සම්බන්ධයෙන්, ගෘහස්ථ ක්‍රීඩාංගණයේ අබලන් තත්ත්වය පිළිබඳව පසුගිය දිනවල සමාජ මාධ්‍යවල විශාල වශයෙන් අප කීර්තියට ලක්වෙලා තියෙනවා.හැමෝම ඒක කරන්නැ කියලා ඉල්ලීමක් කළා. ක්‍රිකට් පාලක මණ්ඩලයේ සභාපතිතුමාටත් ලිපියක් යවලා තියෙනවා කියලා මෙතන නිර්දේශය දීලා තියෙනවා. මම අහන්නේ අපේ ඒ දෙකම වෙන්නැති තත්ත්වයක්නේ තියෙන්නේ. මොකක්ද අපි ගන්න තීන්දුව. මේක මොරටුවේ වැදගත් වටිනා කියන ක්‍රීඩාංගණයක්, මම හිතන්නේ වසර ගාණක් තිස්සේ මේ ප්‍රශ්ණය තියෙනවා.  සභාවක් වශයෙන් මොකක්ද ඔබතුමා අදහස් කරන්නේ.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, අදහස තමයි මේ සම්බන්ධයෙන් සාකච්ඡා කිහිපයක් කරලා තියෙනවා ඒ සාකච්ඡා ඇතුළේ අපි ඉන්න තැන තමයි අපේ නගර සභා අයිතිය අපි සතුව තියාගෙන බාහිර ආයතනයක් හරහා මේක පුලුවන් නම් අපිට යම් සාකච්ඡාවක් ඇතුළේ එකඟතාවයක් අරගෙන ඔවුන්ට දෙන්න, මම හිතන්නේ ලක්ෂ 70ක 80ක වියදමක් යනවා කියන අදහසේ තමයි මම ඉන්නේ. කොහොම වුනත් අපිට ඒ කටයුත්ත ඉක්මනටම කරගන්න බැරි වුනොත් දැනට පාර්ශව කිහිපයක් මේක ඉල්ලනවා. හැබැයි මේ ඉල්ලන අය යම් එකඟතාවයන්ට අරගනිමින් ඕනා. මොකද එගොල්ලනගේ අරමුණු වෙන්න පුලුවන් වෙන එකක්.ඒනිසා හරි පරිස්සමින් මේ කටයුත්ත බොහොම ඉක්මණින් කරනවා. ඇත්තටම ඔය කියන විවේචන පිළිගන්නවා. හරි අපරාධයක්, එකක් සභාවට ආදායමක් , එකක් මොරටුවේ විශාල ක්‍රීඩකයෝ බිහිවෙන්න බලපාපු තෝතැන්න මේ. මේක ඉක්මනටම හැදිය යුතුයි. බාහිරින් බැරිනම් සභා අරමුදල් වලින් ඒක ඉක්මනටම කරන්න ඕනා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, මම දැක්කා ලංකාදීම පත්තරෙත් තිබුනා යූටියුබ් එහෙකත් මේක යනවා මේක හදලා දෙන්නම් කිව්වා කියලා. මං දැක්කා දෙතුන් දෙනෙක් කතත් කරනවා. ඉතින් ගරු නගරාධිපතිතුමා, මේ ඔබතුමාගේ පාලන කාලේ, අපිත් යමක් කළා මොනවා හරි කරලා. අපි සභාව විසින් හදලා හොඳ ආදායමක් ගන්න පුලුවන් තැනක්. දවසට රුපියල් විසි තිස් දහක් ගන්න පුලුවන් තැනක්. ඒනිසා අපිම අරන් කළානම් හොඳයි නැත්තම් අර කට්ටිය කරන්නේ සල්ලි හම්බ කරගන්න වැඩේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, සංශෝධනයක් කරන්න ඕනා 2(1) මොරටුවැල්ල පොල්වත්ත ක්‍රීඩාංගණය කියලා තියෙන්නේ. ඇත්තටම මෙම ක්‍රීඩාංගණය අපි පාලනය කරන කාලේ විමධ්‍යගත ප්‍රතිපාදන තුලින් සහා අරමුදල් වලින් විශාල වැඩ කොටසක් කළා. පැවිලියන් එකම හැදුවේ මම ඉල්ලීම කරලා එම ප්‍රතිපාදන වලින් තමයි හැදුවේ. පොල්වත්ත ක්‍රීඩා පිටියට මැටි දාලා ඒ ග්‍රවුන්ඩ් එක හදලා අපි ක්‍රමානුකූලව මේක හදාගෙන යන්න ආවා. නමුත්  දැන් නිවාස කිහිපයකුත් හදාගෙන යනවා. වෙරළ උද්‍යානයක් වශයෙන් ලස්සනට හදාගෙන යන්න තමයි අපි ප්ලෑන් කළේ. නමුත් දැන් ඒක ටික ටික ක්‍රමානුකූලව එක්කෙනා දෙන්නා නිවාස ගහගෙන යනවා. මේකටත් පියවර ගන්න. ඒවගේම සංශෝධයක් කරන්න ඕන මොරටුවැල්ල පොල්වත්ත ක්‍රීඩාංගණය, මේක මොරටුවැල්ල ග්‍රාම නිලධාරි වසමට අයිති වෙන්නේ නෑ. ඒනිසා කොරළවැල්ල පොල්වත්ත ක්‍රීඩාංගණය වශයෙන් සංශෝධනය වෙන්න ඕන.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මේකේ දැනට නිවාස හදාගෙන යනවා නෙමෙයි හදපු නිවාස තියෙන්නේ. හැබැයි මේවා අනවසරෙන්. මේ ග්‍රවුන්ඩ් එකට අයිති කොටසක් විශාල වශයෙන් ඇල්ලීමක් අල්ලලා තියෙනවා මෙහා පැත්තේ කොණේ කෙනා. අපිට පිටි පස්සේ ඉන්න අය අතහැරියත් මෙයාව අත්හරින්න බෑ. මේක ඉතා වැරදි ලෙස මේ අත්පත් කර ගැනීමක්

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මේ ප්‍රදේශයට මේ වගේ තැනක් තියෙන්න ඕනේ. අපි දන්නවා ඇත්තටම මත්ද්‍රව්‍ය වලට විවිධ දේවල්වලට ඇබ්බැහි වෙන පිරිස වැඩි. මේ අයට මේ වගේ තැනක් තිබුනා නම් ඒගොල්ලෝ ඒ සඳහා යොමුවන ප්‍රවණතාවය අඩුයි. පුලුවන්නම් නගරාධිපතිතුමා මේ වෙන කොටස නිවාස යෝජනාවක් සිද්ධ වෙනවා තෙලවල ප්‍රදේශයේ මොනවා හරි එහෙම දේකින් හරි මේවගේ දේවල්වලට ප්‍රමුඛතාවය දීලා කිහිපය අයින් කරලා හරි ක්‍රීඩාංගණය සංවර්ධනය කරන්න කියන ඉල්ලීම කරනවා. අපිට දේශපාලනය වශයෙන් කේසේ වෙතත් මෙය සිදුවිය යුතු දෙයක්.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, 2(8) යෝජනාවට එන්න කලින් ස්තුතිවන්ත වෙන්න ඕනේ ඔබතුමාටත් කොට්ඨාශ මන්ත්‍රීවරයාටත් කොරළවැල්ල බෝධි මාවත ඉදිරිපිට සහ එම්.ඊ.පෙරේරා මාවතට යාබඳ නගර සභාවට අයිති ඉඩමේ බැඩ්මින්ටන් කෝට් එකක් හදලා තියෙනවා. ගොඩක් කොල්ලෝ මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙන්නේ එයාලට කරන්න දෙයක් නැති නිසා. එයාලට පුලුවන් උදේ ඉදන් රෑ වෙනකම් බැට්මින්ටන් ගහන්න. ගරු නගරාධිපතිතුමා වැඩේ හොඳයි ඇත්තටම අවංකවම ස්තුතිවන්න වෙනවා හැබැයි ප්‍රශ්ණ කිහිපයක් තියෙනවා මේකට පුලුවන්නම් ක්‍රීඩා කමිටු සභාපතිතුමා හෝ කොට්ඨාශ මන්ත්‍රීවරයා පිලිතුරු දෙන්න. නගර සභාවේ ඉඩමක් සංවර්ධනය කරලා තියෙන්නේ යෝජනාවක් මොකක් හරි කමිටුවට ඇවිල්ලා තියෙනවද කොහොමද දන්නෑ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා</u>**

යෝජනාව තුලින් තමයි මන්ත්‍රීතුමා ඒක කළේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා</u>**

මොකක්ද යෝජනාව, මොකෙන්ද ආවේ, කොහොන්ද ආවේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා</u>**

මීට පෙර ක්‍රීඩා කමිටුවකට මාස දෙහෙකට කලින් තමයි ආවේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා</u>**

ක්‍රීඩා කමිටු සියල්ලම තියෙනවා මා ලඟ මේ යෝජනාව ආවේ. සමහරවිට මට වරදින්නත් පුලුවන්. පුලුවන්නම් පොඩ්ඩක් පෙන්නුවොත් ඇති.

**<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මන්ත්‍රීතුමා, මේකට මම උත්තර දෙන්නම්. ඇත්තටම මේ ඉඩම් කැල්ල පිළිබඳව විවිධ ප්‍රශ්ණ පැන නැග්ගානේ. කාලයක් මේ ඉඩම් කැල්ල නිකන් අත්හැරලා තිබුනා. ඉතාම වටිනා ඉඩම් කොටසක් ලොකු කාලයක් ජනතාවගේ ඇත්ත අවශ්‍යතා වෙනුවෙන් බොහොම කටයුතු වෙච්ච තැනක්. සමිති සමාගම් යටතේ තමයි මේක තිබුනේ. පස්සේ කාලේ මෙම ඉඩම සභාවට පවරා ගැනීමක් කළා. ඒක ඒ අය පරිත්‍යාගයක් ලෙස කළා. නමුත් මේ වෙනකොට ඒ ඉඩමේ මුල් අයිතිකරුවන්ගේ මොකක් හරි සම්බන්ධ කෙනෙක් දැන් නැවත මෙම ඉඩමට අයිතිවාසිකම් කියන්න පටන් අරගෙන තිබෙනවා. එතකොට අපි කල්පනා කළා

මේ ඉඩම පොදු ජනතාවගේ ඇත්ත අවශ්‍යතාවයක් මත යොදා ගැනීමට යෝජනා ගෙනල්ලා අපට කල්යයි, එතකං අපි ළමයින්ට තාවකාලික ලෙස තමයි මේ කටයුත්ත මෙතන දාලා තියෙන්නේ එහෙම නැත්නම් ස්ථිර බැඩ්මින්ටන් කෝට් එකක් ලෙස ගොඩනගපු එකක් නෙවෙයි. අපි සභා මුදල් මොකක්වත් මේකට යොදවලා නෑ.

__මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටිල්කාන්ත මහතා__

ඒක හරි. ගරු නගරාධිපතිතුමා අනිත් ප්‍රශ්ණය තමයි.

__මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා__

මන්ත්‍රීතුමා විනාඩියක් දෙන්න. ගරු නගරාධිපතිතුමා, ඔබතුමා කියන එක හරි මේක ස්ථිරව ගොඩනැගිල්ලක් හදන්න නම් අවසර ගන්න ඕනේ නගර සභාවේ ඉඩම් කමිටුවට දාලා මේක පිළිවෙලකට යන්න ඕනේ. හැබැයි දැන් මේක කරලා තියෙන්නේ තාවකාලිකව හදලා තියෙන්නේ ළමයින්ට සෙල්ලම් කරන්න. තාවකාලිකව හැදුවානම් ඇයි  මේ කමිටුවලට දාන්නේ. කමිටුවලට දාන්න ඕන ස්ථිරව හදනවානම් නේ. මේ තාවකාලිකව කරන දෙයක් නම් ප්‍රශ්ණයක් නෑ එතන සෙල්ලම් කරන එක හොඳයි. ඔබතුමා කිව්වා වගේ අපතේ යන ඉඩමක් නම් එතන නිකන් සෙල්ලම් කරන එක හොඳයි. ළමයින්ට ප්‍රදේශයේ මන්ත්‍රීවරයා සම්බන්ධ වෙලා මොනවා හරි හදලා දෙනවා නම් ප්‍රශ්ණයක් නෑ. අපි කරේ තියන් ඉන්නේ නෑනේ.  හැබැයි අපි අහන්නේ ඇයි මේ ක්‍රීඩා කමිටුවට දාලා මේක නීත්‍යානුකූල කරන්න හදන්නේ ඇයි. නීතියානුකූල කරනවා නම්  මේක නීත්‍යානුකූලවම යන්න ඕන. ඒනිසා මේක කරලා තියෙන ක්‍රමවේදය වැරදි ඒකයි තියෙන ප්‍රශ්නේ.

__ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා__

ගරු මන්ත්‍රීතුමා, අඩුපාඩුකම් නම් තියෙනවා. නමුත් අපට මේ ඉඩම ආරක්ෂා කරගන්න ඕන පොදුවේ ජනතාවගේ අවශ්‍යතාවය වෙනුවෙන් මේක. තවදුරටත් මේකට වෙන වෙන බාහිර බලපෑම් එල්ලවෙමින් තිබෙනවා ඒනිසා දැනට නගර සභාව මැදිහත් වෙලා මේ ප්‍රදේශයේ දරුවන්ට සෙල්ලම් කරන්න තාවකාලික විදිහට මේ කටයුත්ත කරනවා. එතකොට අපිට මේක පවත්වාගෙන යනකොට විදුලිය ඕනේ නම් සභාවේ පොඩී හරි එකඟතාවයකින් මේක අරගෙන යන්න වෙනවනේ. අපේ දේපලට දැන් ගැටළුවක් එමින් තියෙනවා එතකොට ඒකට මුහුණ දෙන්නත් පුලුවන් අපි අපේම අවශ්‍යතාවයක් සපුරා ගැනීම වෙනුවෙන් මේක දැන් පාවිච්චි කරගනමින් ඉන්නවා.

__මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටිල්කාන්ත මහතා__

ගරු නගරාධිපතිතුමා, එතකොට මේ බැඩ්මින්ටන් කෝට් එකේ වියදම් ටික සභා අරමුදලින් ද නැත්තම්

__ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා__

ගරු මන්ත්‍රීතුමා, මොකක්වත් අපි සභා වියදම් දැරුවේ නෑ.

__මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටිල්කාන්ත මහතා__

ගරු නගරාධිපතිතුමා, අපි හිතපු බැඩ්මින්ටන් කෝට් එක නගර සභාවේ ඉඩමක් ඒ බැඩ්මින්ටන් කෝට් එකට ගිය වියදම පිළිබඳ  විස්තරයක් සභාවට ඇවිල්ලා තියෙනවාද.මොකක් හරි මුදල් කමිටුවකට හරි.

__ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා__

ගරු මන්ත්‍රීතුමා, මම කිව්වේ අපි සභාවේ මොකක්වත් වියහියදම් දරලා නෑ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්වල්කාන්ත මහතා</u>
ගරු නගරාධිපතිතුමා, එතන දැන් ක්‍රීඩා කරනවනේ තරුණ තරුණියෝ ඒගොල්ලන්ව ලියාපදිංචි කරන්න නගර සභාවේ මොකක් හරි සැලැස්මක් තියෙනවද

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමා, ඔබට මොකක් හරි අදහසක් තියෙනවා නම් ඉදිරිපත් කරන්න සාකච්ඡා කරලා ඒ කටයුත්ත කරමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්වල්කාන්ත මහතා</u>
ගරු නගරාධිපතිතුමා, ජනවාරි 26 මුහුණු පොතේ පුද්ගලයෙක් පෝස්ට් එකක් දානවා දැඩි ලෙස වල් බිහිවී තිබූ බෝධි මාවත අසළ කළුනදී භූමිය. එහෙම නමක් තියෙනවද ඒ ඉඩමට.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමා, මම කියන්නේ උසාවියක ප්‍රශ්ණ කරනවා වගේ උත්තර දෙන්න බෑ. ඔයා ඔයාගේ අදහස ඉදිරිපත් කරන්න මන්ත්‍රීතුමා. ඔයා පක්ෂද විපක්ෂ ද කියලා කියන්න ඔච්චරයි.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්වල්කාන්ත මහතා</u>
ගරු නගරාධිපතිතුමා, කළුනදී භූමිය ප්‍රදේශයේ තරුණ තරුණියන්ගේ යහපත සඳහාම එකතු වී බැඩ්මින්ටන් ක්‍රීඩාව කිරීම සඳහා පිටිය නිර්මාණය කරන අයුරුයි. මෙහි ඉදිරි වැඩකටයුතු කරගැනීම සඳහා ඔබගේ සහයෝගය ලබාදෙන ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිමි. ගරු නගරාධිපතිතුමා, පුද්ගලයන් තුන්දෙනෙක්ගේ දුරකතන අංක දාලා තියෙනවා. සහයෝගයත් ඉල්ලලා තියෙනවා. හැබැයි අපි දන්නෑ තුන් දෙනෙක්ගේ නම් එක්ක තියෙනවා මේගොල්ලන්ට මුදල් හම්බවුණාද කොහොමද හම්බවුණේ, භාණ්ඩ හම්බවුණාද කොහොමද හම්බවුණේ කියලා. මේක නගර සභාවේ ඉඩමක්.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමා, මේක ක්‍රීඩා කමිටුවට දාලා කතා කරන්න. ඔබට ප්‍රශ්ණ තියෙනවා නම් ඒ ටික ක්‍රීඩා කමිටුවට අරගෙන සාකච්ඡා කරලා එකඟතාවයක් හදාගමු.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජීත් පුෂ්පකුමාර මහතා</u>
ගරු නගරාධිපතිතුමා, මේකෙදි මන්ත්‍රීතුමා පෙන්වන කරුණ සම්බන්ධයෙන් අපිට එහෙම බැහැ කරන්න පුලුවන් කරුණක් නෙමෙයි. මුහුණු පොතේ දාලා යම් දෙයක් එකතු කරනවා නම් ඒක අනීතික ක්‍රියාවක්. මොකද නගර සභාවේ දේපළක්. නගර සභාවේ දේපළක මුහුණු පොතේ දාලා සල්ලි එකතු කළානම් ඒක දූෂණයක්. ඒක වංචාවක් ඒක කරන්න බෑ. කරුණාකරලා අපි ඉල්ලීමක් කරනවා ඔබතුමාගෙන් ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න. පරික්ෂණයක් කරලා ඒ අවශ්‍ය නීතිමය පියවර ගන්න සභාව වෙනුවෙන්. නැත්තම් මේක සභාවටයි හොඳ නැත්තේ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමා, අපි ඒ පිළිබඳව ඒ කියන්නේ මුහුණු පොතේ දාලා මුදල්මය සම්බන්ධ එකතු කිරීමක් කරනවා නම් ඒක වරදක්නේ. ඒකට අදාළ යම් ක්‍රියාමාර්ගයක් ගමු. හැබැයි මුහුණු පොතේ තියෙන ඔක්කොම දේවල් අරන් ඇවිල්ලා, මුහුණු පොත ගත්තොතින් විවිධ විවිධ දේවල් තියෙනවනේ. හැබැයි ඔබ කියනවා නම් මුදල් එකතු කිරීමක් පිළිබඳව තොරතුරු තියෙනවා කියලා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔෂද හර්ෂණ අබේකෝන් මහතා</u>
ගරු නගරාධිපතිතුමා, බ්‍රෙන්ඩන් මන්ත්‍රීතුමා කියන්නේ අපේ ලැන්ඩ් එක බැඩ්මින්ටන් කෝට් එකක් හදනවා ඔබතුමා නගර සභාවේ සල්ලි වියදම් කළෙත් නැලු. එතකොට නගරාධිපතිතුමා

වටෙන්ම සල්ලි එකතු කරලා මොන පුද්ගලයද සල්ලි එකතු කරන්නේ කියලා බ්‍රෙන්ඩන් මන්ත්‍රීතුමා අහන්නේ. කොට්ඨාශ මන්ත්‍රීවරයෙක් හැටියට එයාටත් ප්‍රශ්නයක් ඒකේ තියෙනවා. ඒ නිසා ඔබතුමා පොඩ්ඩක් සොයා බලන්න ඕනේ ඒ ගැන පරීක්ෂණයක් කරන්න ඕනේ අනිවාර්යයෙන්ම බැඩ්මින්ටන් කෝට් එකක් හැදුවේ කොහොමද සල්ලි කොහෙන්ද ගියේ කීයක් ඇස්ටිමේට් කරලා තියෙනවද කියලා බලන්න ඕනේ. ඇස්ටිමේට් එක අපිට ඕනේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාංෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා</u>

අනිත් එක ගරු නගරාධිපතිතුමා, පෝස්ටරයක් ගහලා තියෙනවා කොට්ඨාශය පුරාම බැඩ්මින්ටන් ක්‍රීඩා කරන්න 2026.03.29 සවස 04.00ට එම්.ඊ.පෙරේරා මාවත අසළ ක්‍රීඩා පිටියට, ක්‍රීඩා පිටියේ ලියාපදිංචි වන්න. ජාතික ජන බලවේගය, බටහිර කොරළවැල්ල. මම පෝස්ටරේ ෆොටෝ එක ගත්තේ මහා විදාන මාවතෙන්. මෙතන ලොකු කුණු ගොඩකුත් තියෙනවා. ඒ පොස්ටරේ ගහපු මන්ත්‍රීතුමා කුණු ගොඩ දැකලා නෑ. මම ලිපියකුත් දුන්නා මේ කුණු ගොඩ පොඩ්ඩක් වහාම ඉවත් කරලා දෙන්න කියලා. මම නැවතත් මතක් කරනවා පුලුවන්නම් කුණු ගොඩ වහාම ඉවත් කරලා දෙන්න. මම ආයෙත් කියනවා නගරාධිපතිතුමා මේක නගර සභාවේ ඉඩමක් ඉතින් නගර සභාවේ ඉඩමක හදපු බැඩ්මින්ටන් කෝට් එකේ ලියාපදිංචි වෙන්න කියලා ජාතික ජන බලවේගය බටහිර කොරළවැල්ල කාර්යාලයකට යන්න ද කියන්නේ. මේක තමයි ප්‍රජාශක්ති තුලින් එන්න හදන්නේ. ඉතින් ඒක නිසා ගරු නගරාධිපතිතුමා විනිවිදභාවයකින් වැඩ කරන්න. පැලවත්තෙන් ආපු ඉඩමකට මෙහෙම පෝස්ටරයක් ගැහුවනම් කමක් නෑ, කොට්ඨාශේ මන්ත්‍රීවරයගේ ඉඩමක් නම් ප්‍රශ්ණයක් නෑ. මේක නගර සභාවේ දේපළ පොදු දේපළ. අවසාන වශයෙන් කියනවා මේ පොදු දේපළ අවභාවිතා කරන්න එපා. මොකද අපි දන්නවා හිටපු නගරාධිපතිතුමා, එතුමව දොර ඇරලා දැම්මේ හිරගෙදරට. ඔබතුමාලට යන්න වෙන්නේ දොරවල් ඇරගෙන. ඒක නිසා මේ සම්බන්ධයෙන් පොඩ්ඩක් සලකා බලන්න කියමින් කතාව අවසන් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, තව එක පොඩි ප්‍රශ්ණයක්. නගර සභාවේ දේපල ආරක්ෂා කරන්න සෙකියුරිටි ෆර්මිස් ගෙනල්ලා තියනවනේ එතකොට මේකත් නගර සභාවේ දේපලක්නේ එතකොට ඒ දේපළට ඇතුල්වෙලා සංවර්ධනය කරන්න අවසර දුන්නේ කවුද. ඒක අයුතු ඇතුල් වීමක්, නගර සභාවේ දේපලකට ඇතුල් වෙලා සංවර්ධනය කරන්ඩ ඔබතුමාගේ දැනුවත් භාවයෙන් කළේ. යෝජනාවක් නැති එක්ස්ටර්නල් පාටියක් ඇවිල්ලා ෆන්ඩ් කරලා නගර සභාවේ දේපළක් සංවර්ධනය කරනකොට ඔබතුමා මොනවද කළේ. නගරාධිපතිතුමා නිකන් දේවල කරන එක හපන් කමක් නෙමෙයි. මේක පරිපාලනයක් මේක ඇඩ්මින්ස්ට්‍රේෂන් එකක් ඔබතුමන්ලගේ හදවත හොඳ වෙන්න පුළුවන් හදවත හොඳ උනා කියලා හැමදෙයක්ම හොඳ හදවතින් හැමදෙයක්ම කරනවා හරි නෑ. මේක රටක්, මේක ගවනර්ස් ස්ටක්චර් එකක් තියනවා, නීතියක් තියෙනවා, පනතක් තියෙනවා, රෙගියුලේෂන් තියනවා, බයිලෝස් තියෙනවා නීතිය ඇතුලේ වැඩ කරන්න. පුද්ගලයෝ ස්වේච්ඡාවෙන් ගෙනල්ලා උදව් කරනවනම් ඒකත් නීතිමය ඇතුලට ගෙනල්ලා ස්වේච්ඡාවෙන් කරවගන්න. මෙතන යෝජනාවක් දාලා ෆන්ඩර් කෙනෙක් ඉන්නවනම් කොටේෂන් කෝල් කරලා ඒක ස්වේච්ඡාවෙන් කරන විදි තියෙනවා. හිතුමතේට ප්‍රොපටි එකට දාලා මනුෂ්‍යයෙක්ව ඇතුල්ට කරලා සංවර්ධනය කරන්න දෙන්න බෑ. සෙකියුරිටි දාලා මොනවටද සභාවේ දේපළ ආරක්ෂා කරන්නේ. සමාවෙන්න නගරාධිපතිතුමා

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමිය, ඔබට පුලුවන් ඔබේ අදහස් පළකරන්න විරුද්ධත්වය පළකරන්න ඒක ඔබේ අයිතිය.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>
ගරු නගරාධිපතිතුමා, අපිට ඔබතුමන්ලා පිළිබඳ දේශපාලනය විවේචනයක් තියෙනවා. අපි ඒ කාලෙත් කිව්වේ අත්දැකීම් තිබීමයි අත්දැකීම් නොමැතිකමයි අතර මෙන්න මේ හොඳ උදාහරණයක්.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමිය, අත්දැකීම් තියෙන අයත් දේපල ගොඩක් අල්ලගෙන ඉන්නේ තාම හොදේ. අත්දැකීම් තියෙන අයගේ පාලනය ඇතුළේ නගර සභා දේපළවලට වෙච්ච දේ ඔවුන්ගේ කාලේ. මේකේ අඩුපාඩුකම් තියෙනවා නම් ඒවා නිවැරදි කරමු.මේක හැම තිස්සේම දේශපාලන ප්‍රහාරයක් නේ. මේ ගොඩනැගිලි අදත් අල්ලගෙන ඉන්නවා වෙනත් දේශපාලනඥයෝ. අදත් මේ ආයතනයට අයිති ගොඩනැගිලි කිසිම ගිවිසුමකින් තොරව අල්ලගෙන ඉන්නවා. ප්‍රදේශයේ දරුවන්ට සෙල්ලම් කරන්න අපේ ඉඩම ඒ අය එකතු වෙලා අපේ මුදල් ගන්නේ නැතුව, අපේ ඉඩමට අයිතිවාසිකම් කියන්න තව කෙනෙක් උත්සාහ කරන වෙලාවේ පොදු කටයුත්තක් කරනවා. මේ ආයතනයට අයිති බොහෝ දේපළ වල දරුවෝ සෙල්ලම් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා</u>
ගරු නගරාධිපතිතුමා, ඔබතුමා මේ කරපු දේ හරී කියලද කියන්නේ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමා, හරි කියනවා නෙමෙයි, ඔය කරපු ආකාරයේ අඩුපාඩු තියෙයි. ඒවා නිවැරදි කිරීම් කරන්න ඕනා. වැඩ කරනවා වරදිනවා, ඔබ ඒවා විවේචනය කරනවා, ඒවා දිහා බලනවා, ඒවායේ සාධනීය ලක්ෂණ තේරුම් ගන්නවා, ඒවා වෙනස් කරනවා. ඔහොමනේ මේ ගමන යන්නේ. මේ ගමන අංග සම්පූර්ණ සීයට සීයක් එකවර හරිම දේ එන්නේ නෑ. එහෙම කවුරුහරි හිතනවනම් ඒක බොරුනේ. වැඩ කරනවා කරන්නේ ජනතාව වෙනුවෙන්. එතකොට අඩුපාඩුකම් එනවා. අඩුපාඩුකම් එනකොට ඒවා ඔබ පෙන්නලා දෙනවා පක්ෂ විපක්ෂ භේදයක් නෑ. ඒක පිලිගන්නවා ඒවා නිවැරදි කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔෂද හර්ෂණ අබේකෝන් මහතා</u>
ගරු නගරාධිපතිතුමා, ඔබතුමාගේ වැඩ ඔක්කොම හොඳයි. බැනර් ගහලා කරපු දේ හරි කැත වැඩක්නේ නගරාධිපතිතුමා දේශපාලනිකරණය කරපු එක.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මන්ත්‍රීතුමා, ඒක එගොල්ලෝ කල්පනා කරපු විදිහ. මේවා බය වෙන්න එපා. නීතියට පොඩ්ඩක්වත් බය නෑ හරි දේ නම් කරන්නේ.සත්භාවයෙන් කරන දේකට දඩුවම් වින්දටත් කමක් නෑ. ආවේ ජනතාවට වැඩ කරන්න, ආවේ මේක වෙනස් කරන්න, ඒ වෙනස් කිරීමට අදාළව යන ගමනේ බොහෝ අඩුපාඩුකම් තියෙයි. අත්දැකීම් තියන අය කරපු දේවල් ඔගොල්ලෝ අත්වින්දා. දැන් අඩුවක් පෙන්නලා දීපුවම හොඳින් ඇහුම්කන් දෙනවා. ඒක හෙට වෙනස් කරනවා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා</u>
ගරු නගරාධිපතිතුමා, ඒකේ කිසිම විරුද්ධත්වයක් නෑ. බැඩ්මින්ටන් කෝට් එක හදපු එක හරි හොඳයි තරුණ තරුණියෝ එතනට ගිහිල්ලා සෙල්ලම් කරන්න ඕන ඒකේ කිසිම ගැටලුවක් නෑ. හැබැයි ඊට පස්සේ මම අවසාන වශයෙන් මම කියන්නම් ඕපන් එක දවසේ බැඩ්මින්ටන් කෝට් එකේ උත්සවයක් තිබ්බා, නගර සභාවේ සේවකයෙක්ම තමයි නිවේදන කටයුතු කළේ. මේ සේවකයා කියනවා මා ළඟ වීඩියෝ එක ඕනේ නම් තියෙනවා දෙන්න පුලුවන්. බැට්මින්ටන් කෝට් එක හදන්න ගත්තේ එන්පීපී කොට්ඨාස සභාව තුළින් ගත්ත තීරණයක්

කියලා. මට දැන් ඕනේ නම් වීඩියෝ එක දෙන්න පුලුවන්. එතකොට නගරාධිපතිතුමා, මේක නගර සභාවේ දේපළක්නේ. එතන තනිකරම දේශපාලනයක් කරන්නේ. එතන ගිහිල්ලා නගර සභාවේ සේවකයෙක්ම කියනවානම් එන්පීපී කොට්ඨාස සභාව ගත්ත තීරණයක් නම් කරන්නේ මේකට සභාවක් අවශ්‍ය වෙන්නෙත් නෑ. ඉතින් ඒක නිසා ගරු නගරාධිපතිතුමා, ඉදිරියේදී ඔබතුමන්ලා මේ ගැන බලලා ඉදිරියේදිවත් මේ අඩුපාඩු ටික හදාගෙන යමු.

**<u>මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, මට වචනයක් අවශ්‍යයි කතා කරන්න. මොරටුව ද සොයිසා ක්‍රීඩාංගණයේ ගෘහස්ථ ක්‍රීඩාංගණය, අපි දැක්කා මුද්‍රිත මාධ්‍යයේ වගේම සමාජ මාධ්‍යවලත් මේකේ තියෙන අඩුපාඩු දැඩි ලෙස පෙන්වලා දුන්නා. අපි දන්නවා 1941 ද සොයිසා පවුල දුන්නේ ඉතාම පවිත්‍ර චේතනාවක් ඇතිව. ඒ ඔප්පුවේම කොන්දේසි 05 ක් තියෙනවා ඔබතුමා ඒ ගැන හොඳට දන්නවා. එතකොට මේ ක්‍රීඩාංගණය අද තියෙන තත්ත්වය 1978 දී දිවන්ගත ටිරෝන් ප්‍රනාන්දු මහතා ජාත්‍යන්තර ක්‍රීඩාංගණයක් කරලා මේක යම් තැනකට ගෙනාවා. ඒ ජාත්‍යන්තර මට්ටම අද ගිලිහිලා අද දේශීය තරඟ, පාසල් තරඟ පවත්වන තැනකට ඇවිල්ලා තියෙනවා. අපිට ඉස්සරහ තියෙන්නේ මේ ක්‍රීඩාංගණය, තණ තීරුව, භෞතික සම්පත් ඒවගේම යටිතල පහසුකම් මේවා දියුණු කරලා මේ ක්‍රීඩාංගණය කොහොමද නැවත ජාත්‍යන්තර තත්ත්වයට ගේන්නේ , ප්‍රමිතියට ගේන්නේ කියන එක තමයි අපි ඉදිරියේ තියෙන සැබෑ අභියෝගය. මම දන්නෑ මොරටුව මහා නගර සභාව හැටියට ඔබතුමා මේ වැඩපිළිවෙලට අතගහන්නේ කවදද කියලා. අපි ගාව නිසි වැඩපිළිවෙලක් විධිමත් සැලසුම්සගත වැඩපිළිවෙලක් නැත්තම් මේ ක්‍රීඩාංගණය ගොඩගන්න බෑ.ඒනිසා මේ ක්‍රීඩාංගණය නැවත ජාත්‍යන්තර තත්ත්වයට එන දවස තමයි ඉතා වැදගත් වෙන්නේ මේ ක්‍රීඩාංගණය දවසින් දවස මේකේ තියෙන භෞතික සම්පත් වෙන්න පුලුවන් යටිතල පහසුකම් වෙන්න පුලුවන් මේක දිගින් දිගටම පල්ලෙහාට ගිහිල්ලා මේ ක්‍රීඩාංගණය ආගාධයට යන එක අපිට දකින්න ලැබෙනවා. ඒනිසා ගෘහස්ථ ක්‍රීඩාංගණය ගැන විශේෂයෙන්ම මම කියන්න කැමති ඇස්බැස්ටස් ශීට් ගැලවිලා ගිහිල්ලා තිබ්බා, මාධ්‍ය වල වාර්තා වෙලා තිබ්බා. මේ මොරටුවේ ඉන්න පුංචි දරුවන්ට ක්‍රිකට් අත්පොත් තබන්න තියෙන ස්ථානය, මේකෙන් ඉදිරියට එන්න තියෙන ස්ථානයක් මේ ආකාරයට අභාවයට යන එක ඉතාම කණගාටුදායක තත්ත්වයක්. වහාම මේ ගෘහස්ථ ක්‍රීඩාංගණය පිළිසකර කරලා එය ක්‍රීඩාංගණයට සුදුසු ආකාරයට පත්කරන්න කියලා ඉල්ලීමක් කරනවා. ඒවගේම මේ සභාව තුළ ගරු නගරාධිපතිතුමා යම්කිසි ආකාරයක සිද්ධියක් වෙනවා නම් ඒ සිද්ධිය නීතියට පටහැනි වෙනවා කියලා මේ සභාවේ මන්ත්‍රීවරු පෙන්වා දෙනවා නම් ඒක අතීතයේදි වුනත් ඒ අතීතයේදි වෙලා ද නැද්ද කියලා ඇඟිල්ල දික්කරලා ඒකට මුවාවෙලා තියෙන වරද යටපත් කරන්න කටයුතු කරන්න එපා කියන ඉල්ලීමත් ඔබතුමාගෙන් කරනවා. විශේෂයෙන්ම එහෙම කටයුතු කරලා උද්දච්ච විදිහට කටයුතු කරලා කටයුතු කරපු අයට වෙච්ච සිදුවීමුත් අපි දකිනවා. ඒනිසා නගර සභාවේ සියලු දේපළ පොදු දේපළ ඒවා මොරටුවේ ජනතාවට අයිති දේපළ. මන්ත්‍රීවරයෙක් පෙන්වා දුන්න ආකාරයට දේශපාලන අරමුණු පෙරදැඩි කරගෙන සේවකයෝ යොදවලා තියෙනවා නම් යම් කාර්යයකට යොදා ගෙන තියෙනවා නම් ඒක නීත්‍යානුකූල නෑ. ඒක නීතියට පටහැනි. ඒනිසා ඔබතුමා කියනවා නම් නෑ ඒක සත්භාවයෙන් ජනතාවගේ සේවය වෙනුවෙන් තමයි යොදවලා තියෙන්නේ ඒ සේවය වෙනුවෙන් ලැබෙන ඕනම දඬුවමකට යටත්වෙන්න ලැයිස්ති කියලා මේ වේලාවේ එහෙම කියන්න පුලුවන් නමුත් නීතිය ඉදිරියේ ඒක වරදක් වුනොත් ඒක ආදීනවත් මේ සභාවේ එයට අනුබල දෙන සියලු දෙනාට දරන්න වෙනවා කියන කාරණාවත් මම කියන්න කැමතියි. එමෙන්ම මොරටුවේ මේ පුංචි දරුවන්ගේ අනාගතය වෙනුවෙන් මේ ගෘහස්ථ ක්‍රීඩාංගණය වහා පිළිසකර කරලා ජනතාවට පවරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා**

ගරු මන්ත්‍රීතුමා, අවුරුදු 15කින් ඔය සෙන්ටර් විකට් හදලා තිබ්බෙ නෑ වන්දන මන්ත්‍රීතුමා. මම ආවට පස්සේ තමයි හදන්න ගත්තේ. හදලා අපි ජාත්‍යාන්තරයට දැනට ඇවිල්ලා තියෙන්නේ. මොකද ඔබතුමා වේල්ස් කුමර විද්‍යාලයේ සිසුවෙක්. ඔබතුමාට මතක ඇති බිග් බැච් එහෙක කවදාවත් 50 ඒවා 05 ක් ගහලා නෑ ඔය සෙන්ටර් විකට් එකේ කවදාවත් ඉතිහාසෙට. ඒවගේම සුමංගල විද්‍යාලය මොරටු විද්‍යාලය අතර 100 ඒවා 04ක් වැදුනා. ඒ කියන්නේ ඒතරම් හොඳ තත්ත්වයක විකට් දැනට පවතිනවා. අපි ඒ ලෙවල් එකට තියාගන්නවා. ඉදිරියේදී මේ අවුරුද්ද ඉවර වෙන්න ඉස්සෙල්ලා ජාත්‍යන්තර තරගයක් අනිවාර්යයෙන් පවත්වන විදිහට අපි හදනවා කියන එක විශ්වාසයෙන් කියනවා.

**මහා නගර සභා මන්ත්‍රී - එස්.වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා**

ගරු නගරාධිපතිතුමා, 02(3) ප්‍රශ්නේ ඩික්සන් පීරිස් ක්‍රීඩාංගනය පිළිබඳව. ඒකේ දාලා තියෙන්නේ පිලිසියන් මන්ත්‍රීතුමා අද නෑ එතුමා අසනීප තත්ත්වයක් නිසා. එතුමා දැන් මම හිතන්නේ මෙම යෝජනාව දාලා අවුරුද්දකට ඉතාමත් කිට්ටුයි. නගරාධිපතිතුමා මට දැනගන්න පුලුවන්ද මේ ක්‍රීඩාංගණය සම්බන්ධයෙන් දාලා තියෙන යෝජනාව ක්‍රියාත්මක කරන්න පුලුවන්ද අපේ සභාවේ අරමුදල් වලින් කියලා. මොකද නගරාධිපතිතුමා මේකේ දාලා තියෙන්නේ නම් කඩලාන, මොරටුමුල්ල, රාවතාවත්ත, ඉඩම ග්‍රාම සේවා වසම්වල වෙසෙන දරුවන්ට තරුණ තරුණියන්ට ක්‍රීඩා කිරීමට බාහිර ක්‍රියාකාරකම් ඇති එකම පොදු ස්ථානයයි. ඒ වුනාට මෙතන දැන් ඒවා නම් කරන්නේ නෑ. මෙතන දැන් වෙන්නේ එක එක අයගේ වෙන වෙන ව්‍යාපාරික වැඩ කටයුතු තමයි. ඔබතුමා ගිහිල්ලා බැලුවොත් හවසට එක එක අය ලොරි ගහලා ඒවලට මේ පැත්තෙන් ඒ පැත්තට පටවනවා ඒ පැත්තෙන් මේ පැත්තට පටවනවා. අපි ඒ ක්‍රීඩාංගනය පිළිබඳව අපි කතා කළා ගේට්ටුව, කමිටුවේ අනන්තවත් කථා කළා ගේට්ටුව ඉස්සෙල්ලා සවිකරන්න කියලා. අද වෙනතුරු මේ ගේට්ටුව හදලා තියෙනවා මෙතන ගේට්ටුව සවිකරගන්න එක බාස් කෙනෙක් නැතුව ඉන්නවා. ඒක අපි කමිටුවේදි කථා කරලා කිව්වේ පිටින් හරි බාස් කෙනෙක් අරගෙන අපි මේ ගේට්ටුව දාමු. ගේට්ටුව දැම්මම ක්‍රීඩාංගණයේ ඇතුළත වෙන හානි හරි අවමයිනේ. මේකේ ලොරි ගිහිල්ලා ක්‍රීඩාංගණය හැරිලා ළමයින්ට සෙල්ලම් කරන්න නම් තත්ත්වයක් ඉතුරු වෙන්නේ නෑ හිතන විදිහ ඉස්සරහට. නගරාධිපතිතුමා මේ පිළිබඳව ඉක්මනට අවධානය යොමු කරලා එක්කෝ හදන්න පුලුවන්නම් මේ යෝජනාව තියලා අයින්ට කරලා හරි ඉක්මනට මේ ගේට්ටුව සවිකරලා හදලා දෙන්න කියලා තමයි ඉල්ලා සිටින්නේ.

**2026.03.10 වන දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |

11. මහා නගර සභා මන්ත්‍රී - එල්.ඩී.තිලක් විජේතුංග මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය
13. මහා නගර සභා මන්ත්‍රී - ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා
14. මහා නගර සභා මන්ත්‍රී - ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා
16. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා
17. මහා නගර සභා මන්ත්‍රී - එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා
18. මහා නගර සභා මන්ත්‍රී - ජීවන්ත සෙනෙවිරත්න මහතා
19. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**2026.03.10 වන දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - මෙරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
6. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - එස්. චඳුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
14. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය

**2026.03.10 වන දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන්ට පක්ෂව හෝ විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය දීමෙන් වැළකී සිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**2026.03.10 වන දින පැවති ක්‍රීඩා කටයුතු හා පොදු විනෝද කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඕ.දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය)

**06(6) 2026.03.10 වන දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්ව මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මේකත් නිලධාරීන්ගේ ප්‍රශ්ණයක්. මේ වාර්තාවේ ඇමුණුම 06 මට අදාළ නෑ බදු දෙන ආයතනය මොකක්ද කියලා හැබැයි බදු දීමක් තියෙන්නේ.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, අයිතමය මොකක්ද, දෙකේ කීයද

<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්ව මහතා</u>

ගරු නගරාධිපතිතුමා, මම කියන්නම් විස්තරේ. බස් ස්ටෑන්ඩ් එකේ තියෙන ටොයිල්ට් එක ලීස් එකට දෙන්න තියෙන්නේ. කාටහරි ලීස් කරන්න හදන්නේ. මේ ඇමුණුමේ 06 තියෙනවා කොන්දේසි ගොඩක්.

<u>ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

අංක 04 කාරණාව, මොරටුව බස් නැවතුම්පොළේ පොදු වැසිකිළිය

<u>මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්ව මහතා</u>

ගරු නගරාධිපතිතුමා, ඒකේ දැනට දීලා තියෙන ප්‍රශ්ණ වැලක් තියෙනවා ඒ ඇමුණුම 06. ඇත්තටම ඒවා සාධනීය ප්‍රශ්ණ ඇතුළත් කරන්න ඕන. හැබැයි මම අවධානය ඉල්ලනවා මුදල් කමිටුවේ ඇමුණුම 24 ඒකේ තියෙනවා පේළි හතරකින් හදපු බදු ගිවිසුමක්. ඇමුණුම 06 ඒකට සම්බන්ධ හින්දයි කියන්නේ. ඒකේ තියෙනවා සරළ ගිවිසුමක්. පේළි හතරකින් හදපු සරළ ගිවිසුමක්. එක්කෝ මිශ්‍ර ආදායම් එකේ හරි නීති නිලධාරීගේ හරි කථාවක් නැතිකම හින්දා නගර සභාව ඇත්තටම විශාල ප්‍රශ්ණවලට මැදිහත් වෙලා තියෙනවා මේ ගිවිසුම් සම්බන්ධව. අපි කවුරුත් දන්නැතුව මුදල් කමිටුවේ 24 තියෙන ගිවිසුම අත්සන් කළොත් එහෙම මේ ප්‍රශ්ණ ටික ඔක්කෝම මතුවෙනවා. ඇයි මේගොල්ලන්ට කථා කරලා එක ගිවිසුමක් හදන්න බැරි. මේක අපි දැක්කහම කියනවා මං මේක ඇත්තටම මෙතන කිව්වේ මෙතන අපිට අදාළ ප්‍රශ්නයක් නෙවෙයි හැබැයි මේකෙන් ප්‍රශ්නයක් ඇති වෙන්නේ කවදා මේ නගර සභාවට.ඒකයි මේ නිලධාරීන්ට කියලා දෙන්න ඕනේ මේ වගේ දෙයක් කරනකොට හැන්ඩ්ල් කරන ඩිපාර්ට්මන්ට් එක දන්නේ නෑ නීතිය මොකක්ද කරන්න කියලා. මේවායින් තමයි මේ ගිවිසුම්වල අපි මාර පරිප්පුවක් කන්නේ.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>

ගරු නගරාධිපතිතුමා, නෛතිකව වැරදි බදු ගිවිසුම් ගහන්න බෑ මේවා . මේකේ දැන් වොෂ්රූම් එක දීලා, එතකොට ඒකෙන් එයා මුදලක් උපයනවා එතකොට ඒක බදු ගිවිසුමක් නෙමෙයි. මේකේ සර්විස් එක මේන්ටේන් කරන සර්විස් ඇග්‍රිමන්ට් එකක්. තුන්වන පාර්ශවයකින් ගහන සර්විස් ඇග්‍රීමන්ට් එකක්. වැසිකිළි පද්ධතිය මැනේජ් කරලා යම්කිසි

මුදලක් ගෙවලා. ඇග්‍රිමන්ට් එකේ කොන්සෙප්ට් එකේ ඉඳලා වැරදි. බදු ගිවිසුමත් විහිලුවක්. නගර සභාවේ බස් හෝල්ට් එකේ වොෂ්රුම් එක බද්දට දෙන්න බෑ. මේකේ නීතිය වැරදි. මේක කරන්න ඕනේ වොෂ්රුම් එක මැනේජ් කරන්ඩ වෙන පාර්ශවයකට දෙනවා. ඒක සර්විස් ප්‍රොවයිඩර් ඇග්‍රිමන්ට් එකක්. සේවා සැපයුම්කරුවන්ගේ ඇග්‍රිමන්ට් එකක්. ඒක මැනේජ් කරනවට මාසිකව අපිට යම්කිසි මුදලක් ගෙවනවා. මේක නිකන් හරියට බදු ගිවිසුම ඇතුළේ අතුරු බදු දෙනවා වගේ. මේක සර්විස් ඇග්‍රිමන්ට් එකක්.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මහා නගර සභා මන්ත්‍රිවරුනි, එතුමිය කියන එක හරි. නාගරික ගණකාධිකාරිනේ මේක ඉදිරිපත් කරන්නේ. මේක කාලයක් තිස්සේ පවතින එකක් හොදේ. ඒක දැන් වුනත් අපිට ගියෝතින් එහෙම හිතෙයි ගිවිසුමකටම යන්න ඕනා කියලා. මොකද එතන බාත්රූම් එකක් නෙමෙයි එතන වෙන එකක් තියෙන්නේ. එතන බියුටි සැලූන් එකක්. ගිහිල්ලා ඒක බලපුවම හිතෙනවා බදු ගිවිසුමකට තමයි යන්න ඕනේ කියලා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්ව මහතා**</u>

හැබැයි මේකේ තව ප්‍රශ්ණයක් තියෙනවා ගරු නගරාධිපතිතුමා, මේක හදලා තියන ඩිසයින් ඒක කවුරු කළාද මම දන්නේ නෑ. හැබැයි ඒක ඇතුළේ අර තියෙන ගඳ ඇතුළේ ඉතුරු වෙනවා ඒක වෙන්ටිලේට් වෙන්නේ නෑ. වෙන්ටිලේෂන් නැතුව අපේ සැලසුම් කමිටුව පොඩි කක්කුස්සි කාමරයක් පාස් කරන්නේ නෑ.හැබැයි තමුන් හදපු එකේ වෙන්ටිලේට් වෙන්නෑ එයාර් එක ට්‍රැප් වෙනවා වීදුරු දාලා තියෙන්නේ.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, තව කල් තියෙනවා එයාට තව පොඩි කාලයක් තියෙනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමා, ඇයි මේක බැරි නගර සභාවෙන් අරගෙන නඩත්තු කරලා මැනේජ් කරන්න.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, මම දැන් කතා කරලා තියෙන්නේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමා, නගර සභාවෙන්ම පුලුවන්නේ එතකොට ඒ ගන්න ආදායම නගර සභාවටනේ. රුපියල් කීයයක් හරි 20ක් හරි වොෂ්රුම් එක පාවිච්චි කරනවට.

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමිය, මම සේවකයෙන් එකක් කථා කළා එයා එකහයි. එහෙම වුනොත් මේක අපි සභාවට අරගෙන සභාව විසින් පාවිච්චි කරමු. දැනට ඇත්තටම තියෙන්නෙත් මේකේ මිල ගණන්වල ප්‍රශ්ණ නිසා ඔය ඩ්‍රයිවර්ස්ලා කොන්දොස්තරලා සෑහෙන ප්‍රමාණයක් යනවනනේ. කී සැරයකට මේක ගෙවන්නද, දවසෙන් හම්බ වෙන එකෙන් භාගයක් ඉවරයි මේකට ගෙවන්න ගියාම. ඒනිසා වෙන ක්‍රමයක් හදලා දෙන්න ඕනේ නැත්තම් මේ අය යන්නේ හැමතිස්සෙම අර එළියටනේ. ඒනිසා මේක නැවත කමිටුවට අරගෙන කමිටුවේ සාකච්ඡා කරලා, මේ ගිවිසුම් කතාව හරියන්නෑ,

<u>**මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔෂඳ හර්ෂණ අබේකෝන් මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, ජේ.සී.බී. තත්ත්වය පොඩ්ඩක් කියන්නකෝ.ජේ.සී.බී. එක වැඩද,සල්ලි දුන්නද

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, මුදල් ගෙව්වේ නෑ, දෙකක් වැඩ

<u>**මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔෂද හර්ෂණ අබේකෝන් මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, භෞතික සම්පත් යටතේ කතා කරන්න තියෙන එකක්. දැන් මේ ජේ.සී.බී. හැම තිස්සේම කැඩෙනවනේ, කැඩුනම මට ආරංචියක් ආවා අනෙක් ජේ.සී.බී.එකේ කෑල්ලක් අරන් මේකට දාලා කියලා.ඒක ඇත්තද

<u>**මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්ව මහතා**</u>

මන්ත්‍රීතුමා, ස්ටාර් කරලා මෙතනට ගන්න විතරයි ඒක කළේ, ආයේ දැම්මා

<u>**ගරු නගරාධිපති - කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, සාමාන්‍යයෙන් අපේ ඉංජිනේරුවා මේවා හරියට එහෙම කරනවා බලනවා මොකද අරකෙන් කෑල්ලක් අරන් එකට දාලා ඒක දුවවලා, එක සභාවට පාඩුවක් හානියක් නෙමෙයි.

<u>**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමා, මෙතන මේ ඇමුණුමට අංකයක් නැහැ. සමාවෙන්න 05, පළාත් පාලන චක්‍රලේඛයක් ඉදිරිපත් කර තිබෙනවා පළාත් පාලන ආයතන ගොඩනැගිලි ඉඩම් බදු දීම සම්බන්ධව චක්‍රලේඛයක්. මේකේ කරුණු ගණනාවක් තියෙනවා බදු කාලසීමාව අවුරුදු තුනකට වැඩිනම් මේකෙ අවසර ගන්න ඕන. මේ කරුණු මත පදනම් කරගෙන අපි අත්සන් කරලා තියෙන බදු ගිවිසුම් යාවත්කාලීන කරන්ඩ ඕන. එතකොට මම යෝජනා කරන්න කැමති මේ ආයතන කමිටුවට වෙනම අයිතමයක් හැටියට දාලා ඔක්කොම බදු ගිවිසුම් ටික එතෙන්ට මේවා කරලා ඒ ටික ඔක්කොම රිව්ව් කරන්න මේ කඩන්ඩිෂන්ස් යටතේ.

**2026.03.10 වන දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදීනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී.තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |

19. මහා නගර සභා මන්ත්‍රී - කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා
20. මහා නගර සභා මන්ත්‍රී - තුසිත් ද සිල්වා මහතා
21. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**2026.03.10 වන දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - මේරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
6. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
7. මහා නගර සභා මන්ත්‍රී - එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටල්කාන්ත මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
14. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය

**2026.03.10 වන දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන්ට පක්ෂව හෝ විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය දීමෙන් වැළකී සිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**2026.03.10 වන දින පැවති ව්‍යාපෘති හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඕ.දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය)

**06(7) 2026.03.11 වන දින පැවති ඵලදායිතාව හා මුදල් උත්පාදනය පිළිබඳ කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**2026.03.11 වන දින පැවති ඵලදායිතාව හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පි.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.බී.සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී.තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ලීලාරත්න හේවාවිතාරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සරෝජනී මැන්දිස් මහත්මිය |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |

**2026.03.11 වන දින පැවති ඵලදායිතාව හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජයලාල් ද සිල්වා මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | මෙරින් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්. චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |

9. මහා නගර සභා මන්ත්‍රී - එල්. දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්. ෂෙයාන් දුලිප් තිසේරා මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ට්ල්කාන්ත මහතා
13. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනවිය
14. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
15. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී. රංජලා එස්. ජයතුංග මහත්මිය

**2026.03.11 වන දින පැවති ඵලදායිතාව හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන්ට පක්ෂව හෝ විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය දීමෙන් වැළකි සිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**2026.03.11 වන දින පැවති ඵලදායිතාව හා මුදල් උත්පාදනය පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්. තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - බී.සජිත් දුමින්ද පීරිස් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඒ.එච්. සුරේෂ් ඉන්දික මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ. සුදත් ක්‍රිශාන්ත පෙරේරා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - ඕ.දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය)

**06(8) 2026.03.11 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ කටයුතු පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සලකා බැලීම.**

**<u>මහා නගර සභා මන්ත්‍රී - එල්.ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, සැලසුම් කමිටුව සම්බන්ධව මම කතා කරන්න යන්නේ. මේක කාටවත් ගහනවා කරනවා නෙමෙයි. කිසිම දෙයක් අදින්නේ නෑ. මම කියන්නේ නගරාධිපතිතුමා සැලසුම් කමිටුව මෙහෙය වන්න ඕනා නාගරික ඉංජිනේරුතුමා හෝ කර්මාන්ත අධිකාරිවරයයි. ඔබතුමා මූලාසනයේ තියාගෙන. එතකොට ගරු නගරාධිපතිතුමනී, අපිට යූඩී එකෙන් නිළධාරියෙක් ගේන්නේ එයා ගන්න තීරණ ක්‍රියාත්මක කරන්න අපිට බැහැ. ඒකට මොරටුව මහා නගර සභාවේ ගරු නගරාධිපතිතුමා ඉන්නවා, නාගරික ඉංජිනේරුතුමා ඉන්නවා අපේ කට්ටිය ඉන්නවා. එයාව ගේන්නේ නාගරික සංවර්ධන රෙගුලාසි අපිට දීලා තියෙනවා ගැසට් එකක්. ඒකෙන් දීලා තියෙනවා 2021 ජුලි මස 05 වන දින නියෝග රෙගුලාසි තියෙනවා. ඒ නියෝග රෙගුලාසි අනුව තමයි කෙනෙක්ව ගෙනල්ල තියෙන්නේ. මේ අපේ සැලසුම් කමිටුවට වෙලා තියෙන්නේ මේ යූඩී එකේ නිලධාරියා එයාට ඕනේ ෆයිල් ටික ගන්නවා. එයාට ඕනේ තීන්දු තීරණ ගන්නවා. එයාට ඕන දේ ක්‍රියාත්මක කරනවා. එහෙම බැලුවොත් නගරාධිපති කෙනෙක් අවශ්‍ය වෙන්නේ නැහැ. මේ මොරටුවේ ජනතාව පව් ඒ කරන අසාධාරණයට. ගරු නගරාධිපතිතුමනි, දැන් ප්ලෑන් එකක් ගත්තම මම මොකුත් අංක කියන්නේ නැහැ. ප්ලෑන් එකක් දැම්මහම එයාට හිතුනොත් මේක යූඩී යන්න ඕන මේක එකෙන් පාස් කරගෙන එන්න ඕන. මේ කන්ඩිෂන් අරන් එන්න ඕන. ගරු නගරාධිපතිතුමනි,

මහා නගර සභාවට ගොඩනැඟිලි මානක සැලසුම් ඉදිරිපත් කරනු ලබන්නේ ඒහා අදාළ නාගරික සංවර්ධන අධිකාරියේ පනතට අනුව සකසන ලද අයදුම් පත්‍රයක් සකස් කරලා තියෙනවා පිටු දහයක පහළොවක ඉස්සර තිබුණේ පිටු දෙකයි තුනයි. එහි අදාළ කරුණු වල නිවැරදිතාවය අදාළ සැලසුම් ශිල්පීය හා ව්‍යුහාත්මක ශිල්පීය හා මානක සැලසුම් ශිල්පියා, මිනින්දෝරුවරයෙකු විසින් පමණක් මෙය ඉදිරිපත් කරන්න පුළුවන්. අපි පිළිගන්නවානේ මානක සැලසුම අනිවාර්යෙන්ම සර්වයර් සීල් කරලා තියෙනවානම් අපිට සෙටිෆයි සර්වයස්ලා ඉන්නේ අපි මෙය භාර ගන්නවා. මේ භාර ගන්නත් ගියාම නගරාධිපතිතුමා, මේ නිලධාරීන් භාරගෙන ආර්අයි ඔක්කොම ප්ලෑන් ටික හරි කියලා භාර ගන්නවා. එහෙම භාර ගත්තාට පස්සේ අපේ එස්. ඩබ්ලිව් කෙනෙක් යනවා ඒ සයිට් එක බලන්න. ඒ බලන්න ගියාම එස්. ඩබ්ලිව් ඕකේ එක දුන්නයින් පස්සේ ආයේ මොකටද නගරාධිපතිතුමා යූඩී එකට යන්නේ ආයේ මොකටද ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රිපෝට් ගන්නේ. දැන් අපි සල්ලි ගෙවනවා ඔබතුමා ගාණක් තීරණය කරලා තියෙනවා අපි ඒ ගාණ ගෙවනවා. අපි ඒ ගාස්තු ගෙවලා ඔයගොල්ලන් භාර ගත්තාට පස්සේ සැලසුම් කමිටුවට ගියාට පස්සේ නැවත අර යූඩී නිලධාරියා කිවුවාම යූඩී එකට යන්න කියලා ආයේ විසිතිස්දහසක් යනවා ඒ මිනිස්සුන්ට. එහෙම යන්න අවශ්‍ය නැහැ. ඒ නිලධාරියා ආයේ එවනවා මෙතැනට කන්ඩිෂන් ටිකක් දාලා, ඊට පස්සේ එයා කියනවා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිර්දේශය ලබාගත යුතුයි කියලා. ආයේ ඒ මින්ස්සු යනවා නගරාධිපතිතුමා. ඒක නිසා ගරු නගරාධිපතිතුමනි, අපිට දාලා තියෙනවා ගිය අවුරුද්දට ඔබතුමාගේ පාලන කාලෙට ප්ලෑන් දාලා තියෙනවා ප්ලෑන් අයදුම් පත් ගණන 1503ක්, එයින් 705ක් රිජෙක්ට් වෙලා තියෙනවා. 39ක් ගෙනෙල්ලා තියෙනවා නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසි වලට ගන්න කියලා. මේ 39 මම හිතන්නේ නගරාධිපතිතුමා එකක්වත් නැහැ එහෙම යන්න ඕන. මම අවශ්‍යනම් විස්තර ටික කියන්නම්. ඒ ගියාම බලනවා කාවද අල්ලන්න ඕන, ඒ මොරටුව යූඩී එකේ නිලධාරියා කවුද, එයාව ගිහිල්ලා හම්බවෙනවා. පුදුම රස්තියාදුවක්. ඒ නිසා මම ඔබතුමාට පැහැදිලිව කියන්නේ ගරු නගරාධිපතිතුමනි, මම හිතනවා ඔබතුමා දැන් වටහාගෙන ඇති කියලා කාරණාව. ඒක නිසා මෙහි තීන්දු තීරණ ගන්නේ මොරටුව මහා නගර සභාවේ නගරාධිපතිවරයා. ඔබතුමා තීන්දු කරන්න මේ ජනතාව පත්කලේ ඔබතුමාව. ඒ නිසා යූඩී එකේ නිලධාරීන්ට අවශ්‍ය විදියට තීන්දු තීරණ ගන්න එපා නගරාධිපතිතුමා. අපේ මිනිස්සු දැන් එයාව හම්බවෙන්න ගිහිල්ලා. එයාට ෆයිල් නම්බර් එක දුන්නට පස්සේ මේවදිවර ෆයිල් තිබුණත් නගරාධිපතිතුමා යූඩී නිලධාරියා තමයි හොයලා උඩට ගන්නේ. ඒක තමයි බලන්නේ. ගොඩක් දූෂණ වෙනවා ගොඩක් අකර්මන්‍ය වැඩ වෙනවා. මේ මිනිස්සු රස්තියාදු වෙලා බැන බැන යනවා නගරාධිපතිතුමා. ඒ නිසා ඔබතුමාට වගකීමක් තියෙනවා ඔබගේ ආණ්ඩු පක්ෂයට වගකීමක් තියෙනවා මෙය නිවැරදි කරලා දෙන්න. යූඩී නිලධාරියා කියන්නේ එයාගේ කිසිම තීරණයක් ගන්න එපා. තීරණය කරන්නේ ඔබතුමයි නාගරික ඉංජිනේරුතුමයි. ගරු නගරාධිපතිතුමනි, අපේ තුසිත් මන්ත්‍රීතුමත් ගියා සභාවේදීත් යෝජනාවක් කළා ඩෝ ක්ලෝසරයක් දාලා දෙන්න කියලා. මාසයක් ගියා මම දකිනවා එතැන ලොක් වෙනවා එන්න විදියක් නැහැ. ඔබතුමාගෙන් ඒ ඩෝ ක්ලෝසරය දාලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී. සමන්ත සිල්වා මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, 02(13) කරුණ අඟුලාන කොට්ඨාසයේ සභාව සතු ළිං සකස් කිරීම. ඒ කියන්නේ 1, 2 කියන දෙකම ළිං දෙකක්. නමුත් එකම ඇස්තමේන්තුව ඇවිත් තියෙන්නේ. දෙකම එක සමානවද? වෙනස් වෙන්නේ නැද්ද? සාමාන්‍යයෙන් ප්‍රමාණය? කවුද මේක ඇස්තමේන්තු කළේ කියලා දැනගන්න කැමතියි. පොඩ්ඩක්වත් වෙනස් වෙන්නේ නැතුව එකම ආකාරයෙන් ඇස්තමේන්තුවක් දාන්නේ කොහොමද? මම හිතන්නේ ගෙදර ඉඳලා හැදුවද දන්නේ නැහැ පොඩ්ඩක් බලන්න නගරාධිපතිතුමා.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, කර්මාන්ත කමිටුවේ 02(2) කරුණ සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා. මේ අළු කුටි සම්බන්ධයෙන් තියෙන කරුණ විශේෂයෙන්ම ඔබතුමා කලින් කිවුවා ඒ අළු කුටි සම්බන්ධයෙන්. මෙහි තියෙන්නේ අළුකුටි සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න අපි කල්පනා කලේ මේ සුදේශ් මන්ත්‍රීතමා ඉදිරිපත් කරලා තියෙන මොරටුව මහා නගර සභාව යටතේ ක්‍රියාත්මක සුසාන භූමි හතර රාවතාවත්ත, කොරළවැල්ල, අඟුලාන, එගොඩඋයන සුසාන භූමිවල අබලන් තත්ත්වයට පිලියම් යෙදීමේ අරමුණින් ගෙනෙල්ලා තියෙන යෝජනාව. ඒ නිසා නැවත වරක් මතක් කරනවා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කඩිනමින් කරන්න කියලා.

ගරු නගරාධිපතිතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කරනවා මම හැමදාම කියනවා ලේකම් අංශයට මෙහි තියෙනවා 02(16) කරුණේ කමිටු නිර්දේශයට උක්ත කරුණ සලකා බැලූ කමිටුව 2026.02.11 දින පැවති කමිටු නිර්දේශය පරිදි ඉදිරි කටයුතු ලිපිගොනුවෙන් සිදුකිරීමට යටත්ව මෙම කරුණ වාර්තාවෙන් ඉවත් කිරීමට නිර්දේශ කරන ලදි. එතකොට මෙහි මේ කමිටු නිර්දේශය මොකක්ද කියලවත් සඳහනක් නැහැ. එතකොට අපි පෙර වාර්තාව බලලා තමයි එය තීන්දු කරන්න ඕන. මේක සාමාන්‍ය වාර්තාවක් බලාගෙන යනකොට පෙර කමිටු වාර්තා ළඟ තියාගෙන මන්ත්‍රීවරු බලන්නේ නැහැ. එහෙම වුණාම ලොකු ප්‍රශ්ණයක්. ඒ නිසා අපි නැවත වරක් අවධානය යොමු කරනවා මේ පෙර දාලා තියෙන ඒවා සාරාංශගත කරලා හරි මේවා ඇතුලත් කරන්න. එතකොට අපි දන්නවා, මෙන්න මේකේ මෙන්න මෙහෙම තීන්දුවක් තමයි අරගෙන තියෙන්නේ. මෙන්න මෙහෙම දෙයක් තමයි වෙලා තියෙන්නේ කියලා. මෙහි එකපාරටම දිනයක් දාලා අදාළ කමිටු නිර්දේශය අනුව ක්‍රියාත්මක කරනවා කියලා කිවුවාම අපි උඩුයටිකුරු වෙනවා මොකද, අපි හොයාගෙන යන්න ඕන කමිටු වාර්තාව. 02(17) කරුණත් එහෙමයි. උක්ත කරුණ සලකා බැලූ කමිටුව 2026.02.11 දින පැවති කමිටු නිර්දේශය පරිදි අදාළ සැලසුම ඇමුණුම් අංක 03 ලෙස ඉදිරිපත් විය. එකී සැලැස්ම අනුමත කිරීමට නිර්දේශ කරන ලදි. දැන් අපි යන්න ඕන ඇමුණුම් අංක තුනේ තියෙන සැලැස්ම හොයාගෙන. එතකොට මෙහි කිසිදු සඳහනක් නැහැ අපි ලොකු අමාරුවක වැටෙනවා මේ වාර්තා කියවගෙන යනකොට. ඒවගේම 02(22) සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා. ඒ ශෙයාන් දූලිප් තිසේරා මන්ත්‍රීතුමා ගෙනෙල්ලා තියෙන යෝජනාවේ එහි තාක්ෂණ නිලධාරීගේ වාර්තාවේ තියෙනවා එගොඩඋයන ධීවරපුර නිවාස සංකීර්ණයේ ප්‍රජාශාලාව සභාව සතු දේපලක් හෝ පරිශ්‍රයක් නොවන බව වාර්තා කරමි කියලා. මම අහන්න කැමතියි මෙහි පහුගිය දවස් වල මෙහි වැසිකිළි වළ සභාවෙන් හැඳුවේ. වැසිකිළි වළේ මෝටරයේ ප්‍රශ්ණයක් වෙලා ඒක සභාවෙන් හැඳුවේ. එතකොට ඡන්දයට ඉස්සරවෙලා වැසිකිළි වළේ මෝටරයේ ප්‍රශ්ණයක් වෙලා ඔබතුමයි කොමසාරිස්තුමියයි ගිහිල්ලා ඒක සභාවෙන් තමයි අළුත්වැඩියා කළේ ඔබතුමා පොරොන්දු වෙලා. ඔබතුමා එතකොට නගරාධිපතිත් නෙවෙයි. එතකොට එහෙම කරපු තැන දැන් කියනවා, එගොඩඋයන ධීවරපුර නිවාස සංකීර්ණයේ ප්‍රජාශාලාව සභාව සතු දේපලක් නොවේ. ඉහත වාර්තාව මහා සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කිරීමට නිර්දේශ කරන ලදි කියලා තියෙනවා. ඒ නිසා ප්‍රජාශාලාව භාවිතා කරන්නේ මොරටුවේ මිනිස්සු. ඒ නිසා මෙය සභාව සතුද නැද්ද කියන එක අදාළ නැහැ. මොරටුවේ මිනිස්සු මේක භාවිතා කරන්නේ. ඒ නිසා කරුණාකරලා මේ දරුවන්ට මේක පාවිච්චි කරන්න පුළුවන් විදියට මේක මැදිහත් වෙලා හදලා දෙන්න. ඒ යෝජනාව ක්‍රියාත්මක කරන්න කියන ඉල්ලීම කරනවා. ඊට පස්සේ තියෙනවා 02(24) මේ ටීඕ වාර්තාවක් දාලා තියෙනවා ස්ට්‍රක්චර් එකක් දාලා තියෙනවා මේක සම්බන්ධයෙන් අපිට පැහැදිලි අවබෝධයක් නැහැ. මේක සාමාන්‍යයෙන් මීට වඩා දැන් මේ ටීඕ දෙන වාර්තාව ඇමුණුමක් විදියට මේකට එන්න ඕන. එහෙම ඇමුණුමක් විදියට නැහැ. ටීඕ දෙන වාර්තාව

රූප සටහනක් හැටියට තියෙනවා. මේ රූප සටහන බලලා මේක තේරුම් ගැනීමට ටීඕ එක්කගෙන එන්න ඕන අපි. ඉතින් ඒ නිසා කරුණාකරලා මෙහෙම වාර්තා හදන්න එපා. මෙහෙම හැඳුවාම මන්ත්‍රීවරුන්ට මේක කියවන්නේ නැතුව ඉන්නවානම් ප්‍රශ්ණයක් නැහැ. හැබැයි මේක කියවනවානම් මන්ත්‍රීවරුන්ට ප්‍රශ්ණයක් තියෙනවා මේක කොහොමද මේක තේරුම් ගන්නේ කියලා. ඉතින් ඒ නිසා කරුණාකරලා ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියන ගෞරවනීය ඉල්ලීම කරනවා. ඒකම තමයි තියෙන්නේ 02(25) කරුණටත්. පැහැදිලි නැහැ ටීඕ වාර්තාව. ඒ සම්බන්යෙන් කරුණාකරලා පැහැදිලි කිරීමක් කරන්න. ඊට පස්සේ තියෙනවා 02(30) කරුණ. මෙම කාර්යය සෘජු ශ්‍රමිකව ඉටුකළ හැකි කාර්යයක් වන අතර, මෙම කර්මාන්තය ඉටුකළ යුතු කර්මාන්ත පිළිබඳව ලේඛනයට ඇතුලත් කර ඉදිරි කටයුතු සිදුකිරීමට සුදුසු බව නිර්දේශ කරමි. මේක කවුද නිර්දේශ කරලා තියෙන්නේ? තාක්ෂණ නිලධාරි විසින් තමයි මේක කියන්නේ. එතකොට අපි අහන්නේ තාක්ෂණ නිලධාරියාට පුළුවන්ද අපේ මේ කර්මාන්ත පිළිබඳ ලේඛනයට ඇතුලත් කරන්න කියලා තාක්ෂණ නිලධාරීට කියන්න පුළුවන්ද? ඒක කමිටුවෙන් නෙවෙයිද ගන්න ඕන තීන්දුව. තාක්ෂණ නිලධාරී කොහොමද එහෙම කියන්නේ මේක මේ ලේඛනයට දාන්න කියලා. ඉතින් ඒක නිසා තාක්ෂණ නිලධාරීන් වාර්තා දෙනකොට, දැන් අද වෙනකොට තාක්ෂණ නිලධාරීන්ගේ වාර්තා කමිටු තීන්දු වලට පත්වෙලා තියෙනවා. එතකොට ඒ වාර්තාම තමයි කමිටුවේ තීන්දුව වෙලා තියෙන්නේ. එතකොට අපි අහන්නේ තාක්ෂණ නිලධාරීට බලයක් තියෙනවාද එහෙම කමිටුවට ඒ ලිස්ට් එකට දාන්න කියලා කියන්න.

ගරු නගරාධිපතිතුමනි, 02(33) කරුණේ කියනවා පෙර අවස්ථාවක මෙම යෝජනාව ඉදිරිපත්ව තිබූ අතර, අදාළ වාර්තාව දකුණු කලාපයේ වැසි ජල ව්‍යාපෘතියට අදාළ ගොනුවට ඇතුලත්ව පවතී. ඉහත තාක්ෂණ නිලධාරී වාර්තාවට අනුව ඇස්තමේන්තු සකස් කිරීමට නිර්දේශ කරමි. ඒ කියන්නේ මෙහි පැහැදිලිව කියනවා දකුණු කලාපයේ වැසි ජල ව්‍යාපෘති කියලා ඔබතුමන්ලාගේ මොකක්හරි ව්‍යාපෘතියක් ඇති. ඒ ගොනුවට ඇතුලත් කරලා තියෙනවා කියලා නමුත්, කමිටුව නිර්දේශ කරනවා මෙයට ඇස්තමේන්තු හදන්න කියලා. හැබැයි ඒ වාර්තාවේම තියෙන සමහර කරුණු වලට ඉටුකළ යුතු කාර්යයන් සඳහා තියෙන වාර්තාවට දාන්න කියලත් තියෙනවා. 02(37) මාර්ගයේ ඉතිරි කොටස ඉහත තාක්ෂණ නිලධාරී වාර්තාව අනුව, මෙම කරුණ නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ පවත්වාගෙන යන, ඒකෙත් කමිටු නිර්දේශය පිළිබඳව සැලකිලිමත් වෙන්න කියන ඉල්ලීම කරනවා. මොකද මම මේ කරුණම කතා කරන්නේ නැහැ. තව එකක් තියෙනවා 02(39) කරුණ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. කර්මාන්ත කමිටුවට බලයක් තියෙනවාද අනුකමිටු පත් කරන්න? ගරු නගරාධිපතිතුමාගෙන් මම දැනගන්න කැමති. මෙන්න මේ අනුකමිටුවක් පත්කරලා තියෙනවා කර්මාන්ත කමිටුව විසින්. එතකොට කර්මාන්ත කමිටුව අනුකමිටු පත් කළාම ඒක නීත්‍යානුකූලද? සාමාන්‍යයෙන් අපි දන්න විදියටනම් මහා නගර සභා ආඥා පනතේ තියෙන්නේ අනුකමිටුවක් පත් කරන්න පුළුවන් වෙන්නේ මහා සභාවට පමණයි. මේ අනුකමිටු පත් කරන්න ස්ථාවර කමිටු වලට බැහැ. ඒක නීත්‍යානුකූල නැහැ. නමුත් මේ කර්මාන්ත කමිටුව අනුකමිටුවක් පත්කරලා තියෙනවා. ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා. 02(40) කරුණෙත් මම පෙර සඳහන් කරපු දෙයම තියෙනවා. සෘජු ශ්‍රමිකව ඉටුකළ යුතු ඉටුකළ නොහැකි කාර්යයක් වන අතර මෙම කර්මාන්තය ඉටුකළ යුතු කර්මාන්ත පිළිබඳව ලේඛනයට ඇතුලත් කර ඉදිරි කටයුතු සිදුකිරීමට සුදුසු බව නිර්දේශ කරමි. ඉතින් ඒකම තමයි කමිටු නිර්දේශය දීලා තියෙන්නේ. 02(41) කරුණත් එහෙමයි. ඉහත තාක්ෂණ නිලධාරී වාර්තාව අනුව තාක්ෂණ නිලධාරී වාර්තාව දීලා තියෙනවා එහි කියලා තියෙන්නේ අර ගොනුවට ඇතුලත් කරන්න කියලා. දැන් මේ තාක්ෂණ නිලධාරීන් පුදුම වාර්තා දෙන්නේ. 02(52) කරුණට අවධානය යොමු කරනවා.

විජිත මාවත සම්පූර්ණයෙන් කාපට් කිරීම හෝ ගල් අතුරා සංවර්ධනය කළයුතු බව වාර්තා කරමි. මේ විජිත මාවත අබලන් වෙලා තියෙනවා කියලා තාක්ෂණ නිලධාරී කියනවා මේක අන්තර් සම්බන්ධිත කුට්ටි ගල් අල්ලා සංවර්ධනය කරන්න ඕනෑ කියලා. කමිටු නිර්දේශයේ කියනවා ඉහත වාර්තාව අනුව මෙම කරුණ නාගරික ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ පවත්වාගෙන යන ඉටුකළ යුතු කර්මාන්ත පිළිබඳ ලේඛනයට ඇතුලත් කර ඉදිරි කටයුතු සිදුකිරීමට කමිටුව නිර්දේශ කරමි කියලා. රංජලා මන්ත්‍රීතුමියගේ යෝජනාවක්. ඉතින් ඒ රංජලා මන්ත්‍රීතුමියගේ නිසාද දන්නේ නැහැ තාක්ෂණ නිලධාරී වාර්තාව මේක කඩිනමින් කරන්න කිවුවට මේක අර නොකෙරෙන ලිස්ට් එකට දාලා තියෙන්නේ. මීළඟට 09 ගල් රෝලක් ගැනීම සම්බන්ධයෙන් වූ කරුණට අවධානය යොමු කරනවා. සභාව සතු ගල් රෝලට සමාන පිරිවිතරයන්ගෙන් යුත් ගල් රෝලක් අවශ්‍ය අවස්ථාවන් සඳහා පමණක් සපයා ගැනීමට යටත්ව කුලී පදනම යටතේ සපයා ගැනීමට සුදුසු තීරණයක් ගැනීම සඳහා කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුව වෙත ඉදිරිපත් කරමි, කියලා තියෙනවා. උක්ත කරුණ සලකා බැලූ කමිටුව ඉහත සඳහන් පරිදි සභාව සතු ගල් රෝලට සමාන පිරිවිතරයන්ගෙන් යුත් ගල් රෝලක් අවශ්‍ය අවස්ථාවන් සඳහා පමණක් කුලී පදනම යටතේ සපයා ගැනීමට අනුමත කිරීමට නිර්දේශ කරන ලදි. සාමාන්‍යයෙන් අපි දන්න විදියටනම් මේ වගේ විෂයක් එන්න ඕන මුදල් කමිටුවට නමුත් ඇවිල්ලා තියෙන්නේ කර්මාන්ත කමිටුවට.

**2026.03.11 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී.තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්.සදුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |
| 21. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා |
| 22. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 23. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.සරෝජනී මැන්දිස් මහත්මිය |
| 24. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා |
| 25. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා |

**2026.03.11 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කළහ.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.සජිත් දුමින්ද පීරිස් මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.අනුරසිරි ජේ.ද සිල්වා මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | සිත්ති මසීනා බක්කර් මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටල්කාන්ත මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී.රංජලා එස්.ජයතුංග මහත්මිය |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඕ.දිනූෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය |

**2026.03.11 වන දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු පක්ෂව හෝ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියහ.**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.සමන්ත සිල්වා මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා |

**2026.03.11 දින පැවති කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

| | | | |
|---|---|---|---|
| 1. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා |
| 2. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | එස්.වදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා) |

**06(9) 2026.03.17 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ නිර්දේශයන් සළකා බැලීම.**

<u>**මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**</u>

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටු වාර්තාවේ අංක 04 මට මේ සඳහා පොඩි පැහැදිලි කිරීමක් අවශ්‍ය වෙනවා ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගෙන්. කසල අවසන් බැහැරලීම වෙනුවෙන් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියට අපි මිලියන 3.8 ක් ගෙවනවා. එහි තියෙනවා කණ්ඩායම් හතරකට වෙන්කරලා අපි මේ කසල වෙන්කිරීම් කරලා ඉවත් කරන්නේ. එහි කෙටි කාලීන දිරන අපද්‍රව්‍ය ඒක ගෘහස්ථ විතරක්ද, නැතිනම් වානිජ ආයතනත් එක්ක තියෙන කසල ද මේ ටොන් 1300ක් තියෙන්නේ?

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

මන්ත්‍රීතුමිය, ඔබතුමිය මුදල් කමිටුවේ සාමාජිකයෙක්. මෙය මුදල් කමිටුවට එනවා. මම කියන්නේ හරිම අසාධාණයි මේ කාරණාව. මෙතැන කමිටු සාමාජිකයින්ට තියෙන්නේ කමිටුවේ සාකච්ඡා කරලා මහා සභාවට වාර්තා කරන්න. මම කියන්නේ එතැන මේ සියල්ල බේරා ගතයුතුයි. හැබැයි එතැන බේරගන්න තියෙන සාමාජිකයා සභාවට ඇවිත් මේක අහනවා. මම කියන්නේ සාධාරණ නැහැ. මම ඒකෙන් කියන්නේ එපා කියන එක නෙවෙයි. මුදල් කමිටුවට පත්වෙලා ඉන්නේ මුදල් කමිටුවේදි මේවා හොඳින් සාකච්ඡා කරලා වඩාත් නිවැරදි නිර්දේශයක් සභාවට ගේන්න. ඔබේ අයිතිය තමයි ඔබ එතැන කරන ප්‍රශ්ණ කිරීම් වාර්තා කරන්න කියලා. මෙහි දැන් සිදු වන්නේ කමිටුවේ ඉඳගෙන කමිටුවට සමහර වෙලාවට මැදිහත් වෙනවා කමිටුවේ දි නිහඩයි, ඒකහයි. මම කියන්නේ කමක් නැහැ වෙන කමිටුවක කෙනෙක් මෙය ප්‍රශ්ණ කරනවාට.

**<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මම හොඳටම දන්නවා මම මුදල් කමිටුව නියෝජනය කරන සාමාජිකාවක්. නමුත් හැම කරුණක්ම අපිට එතැන පැහැදිලි කිරීමක් ලැබෙන්නේ නැහැ. එතකොට ඔබතුමත් එන්නේ හදිස්සියෙන්. ඔහොම යමු ඒක හරි ඒක හරි ඔහොම යනවා. මම අවශ්‍යතාවය තියෙන ඒවාට කතා කරනවා. මම අවශ්‍යතාවය තියෙන වෙලාවට කතා කරනවා. එහෙනම් අනෙක් කමිටු වල සාමාජිකයින්ටත් එහෙම කතා කරන්න අවස්ථාවක් නැහැනේ. කමිටුවේ හිටියත් සමහරක් ඒවා අපිට පැහැදිලි කිරීමක් අවශ්‍ය වෙනවා. මුළු සභාවම එන්නේ නැහැනේ මුදල් කමිටුවට. මේ කෙටි කාලීන දිරන අපද්‍රව්‍ය ගෘහස්ථ විතරක්ද, නැතිනම් වානිජ ආයතනත් එක්ක ද මේ ටොන් 1300ක් තියෙන්නේ? මේ දෙකේම එකතුව. එහෙමනම් මේ වානිජ ආයතන සියලු දෙනාම අපිට මුදල් ගෙවලාද මේ ඔබතුමා මිලියන 3.8ක් ගෙවලා තියෙන්නේ. අපිට ගෘහස්ථනම් කියන්න පුළුවන් වරිපනම් ගාස්තු මෙහේ ගෙවනවා කියලා. මේ වානිජ ආයතන සම්පූර්ණයෙන්ම ගෙවලද? ඒක තමයි තියෙන ගැටලුව. ඒ සියල්ලම අහන්න ලැබෙන්නේ නැහැ.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

මේක නිකන් උසාවිය වගේ එකින් එක ප්‍රශ්ණ කරලා විරුද්ධයි කියනවා. ඔබතුමිය විරුද්ධ වෙන්න. උසාවියක වගේ ප්‍රශ්ණෙන් ප්‍රශ්ණේ අහන්න එපා. පැහැදිලි කිරීමක් ඉල්ලුවාම එතුමා පැහැදිලි කිරීමක් කරයි. ඒක පිළිගන්නවාද නැද්ද ඔබ විරුද්ධ ද පක්ෂ ද කියන්න. කමිටුවට වලංගු අපිට අවශ්‍ය මන්ත්‍රීවරයා පක්ෂ ද විරුද්ධ ද? මම කියන්නේ මුළු කමිටුවම මන්ත්‍රීතුමිය සාධාරණයිද කියන්නේ එකින් එක ප්‍රශ්ණ කරන එක නිලධාරීන්ගෙන්. ඒ ප්‍රශ්ණ කරලා අවසානයේ ඔබතුමිය පක්ෂ වෙනවාද කියන්න. අපිට අදාළ අවශ්‍ය මන්ත්‍රීවරයා මේ පාලනයේ අදාළ මුදල් කමිටුවේ අයිතමයට පක්ෂ ද විරුද්ධ ද එතකොට ඔබට පැහැදිලි කිරීමක් තියෙනවා. අපි ගත්ත ක්‍රියාමර්ග වල මේ මේ අඩුපාඩු තියෙනවා. ඒ නිසා විරුද්ධයි. කමිටුවේ දී නිලධාරීන්ගෙන් අහන්න.

**<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

එතකොට දැන් අපි මේ සභාවට ඇවිල්ලා නිකන් ඉඳන් ඉදලා යන එකයි තියෙන්නේ. ඔබතුමා කතා කරන්න දෙන්නේ නැහැනේ. මුදල් කමිටුවේ කතා කරපු ඉතුරු ටික මෙහි අහන්න පුළුවන්නේ. පක්ෂවද විරුද්ධවද කියන්න මෙතැනට එන්න ඕන නැහැනේ. ඔබතුමාට මෙතන තියෙන ගැටලුව කාලය.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

මන්ත්‍රීතුමිය, පක්ෂද විපක්ෂ ද කියලා අපි අහපුවාම කියන්න. ඔබ අපිට මේ අයිතමයේ අපි අරගෙන තියෙන සමහර ක්‍රියාමර්ග වලට විරුද්ධනම් ඒ විරුද්ධ තත්ත්වයට අදාළව අදහස් එල කරන්න ඕනනම් ඔබ ඇති තරමට ඒ අදහස් එල කරන්න. එය ඔබේ අයිතිය.

**<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයයන්ත ද සිල්වා මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, මෙතැන අපි වේලාව දිහා බලලා නෙවෙයි කතා කරන්න ඕන. මේක වැදගත් මූල්‍ය ප්‍රකාශයකටයි අපි අත ඔසවන්නේ. අපි තමුන්නාන්සේලාට පහුගිය වතාවෙත් අපි අපේ සාධනීය පැත්තෙන් අපි සාධනීය තත්ත්වයක් දැක්වූවා මේ සභාවේදී. ඒ කියන්නේ යම් යම් කරුණු පැහැදිලි කරගෙන අපි ඒ සම්බන්ධයෙන් සහයෝගය ලබා දුන්නා. එතුමිය ඉල්ලන අවස්ථාව එතුමියට ලබා දෙන්න මේක වේලාව දිහා බලලා කටයුතු කරන්න එපා කියන ඉල්ලීම කරනවා.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

මහා නගර සභා මන්ත්‍රීවරුනී, මම කියන්නේ විපක්ෂ නායකතුමා මම මෙතරම් අවස්ථාව දීලා තියෙනවා කිසිම මේක ඇතුලේ වෙනම දේශපාලනික වශයෙන් බෙදීමක් හදාගෙන නැහැ. මුදල් කමිටු සාමාජිකාවක් මේ වාර්තාවට වග කියනවා සභාවට නිර්දේශයන් එවන්නේ එතැනින් සාකච්ඡා කරලා. එතකොට ගැටලුව තියෙනවානම් ඒ ගැටලුව එතැනදි කතා කරලා නිලධාරීන්ගෙන් විමසනවා. තමන් ඒ ඉල්ලන එක දෙන්නේ නැතිනම් මෙහි වාර්තා කරන්න කියනවා මම මේ මේ තොරතුරු ටික ඉල්ලනවා දෙන්නේ නැහැ වාර්තා කරන්න.

**<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, හරි මම ඒ කමිටුවේදි පුලුවන් ටික අහන්නම් බැරි ටික මම මෙතැන ගොළුවෙක් වගේ වාඩිවෙලා ඉන්නම්. වෙන මුකුත් අහන්නේ නැහැ. විරුද්ධ ද එකඟ ද කියලා විතරක් කියන්නම්. අනෙක් කරුණට යනවා. අද ඔබතුමා මෙතැන හිටියානම් ඔබතුමා මලු ටික බැදගෙන සභාවෙන් පිටවෙලා යනවා. ඔබතුමාට එතැන ආතතියක්නම් ඉන්න එක මෙතැනට ඇවිල්ලා වාඩිවෙන්න අපිත් එක්ක.

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

අපි දන්නවානේ ඒ කාලේ මෙතැන හිටපු කෙනා මොනතරම් කතා කරන්න දුන්නාද නැද්ද අවසානයේදී ඔක්කෝම වහලාම දැම්මනේ. කමිටු වල කතා කරන්න කියලා ඉඩක් දුන්නේම නැහැනේ. මම කියන්නේ ඒ තත්ත්වයයි මේ තත්ත්වයයි වෙනස් කියලා මම හිතනවා. ඔබ කවුරු ආවත් ඒ අවශ්‍ය පිලිගැනීම් කරනවා. ඔබ ඉදිරිපත් කරන කරුණු අහනවා. කරන්න පුලුවන් ටික කරනවා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, පුද්ගලිකව කිසිදු ගැටලුවක් නැහැ. මට අවශ්‍ය මේ සභාවට අයිති දේවල් අද අපි මාසයක් තිස්සේ ඉදලා අද එන්නේ අපේ ගැටලු ටික නිරාකරණය කර ගන්න. සෑම සාමාජිකයෙකුටම අවස්ථාවක් තියෙනවා මෙය දැනගන්න මොකක්ද මෙහි වෙන්නේ කියන එක. අංක 05 ඔසඳ මන්ත්‍රීතුමා කිවුවා වගේම සැලසුම් කමිටුව ජනවාරි මාසේ අපි ෆයිල් 62ක් රිජෙක්ට් කරලා තියෙනවා. මේ මාසෙට ෆයිල් 74ක් රිජෙක්ට් කරලා තියෙනවා. ඒ රිජේක්ට් වෙන ෆයිල්ස් දැන් ජනවාරි රිජෙක්ට් වෙන ෆයිල් කීයක් අපි පෙබරවාරි මාසෙට ආවද? එතකොට ඒ ෆයිල් කොපමනක් අපි අනුමත කරලා තියෙනවාද? මේවා රිජෙක්ට් වෙනවයි ඒකඟ වෙනවායි කියලා විතරයිනේ මෙහි තියෙන්නේ. ඒවා සම්බන්ධවත් වාර්තාවක් මුදල් කමිටුවට ඉදිරිපත් කරන්න මෙතැන කතා කරන්නේ නැහැ මම.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

අන්න අර සැලසුම් කමිටුවට ඉදිරිපත් වුණ ෆයිල් මිටියම අරගෙන එන්න. ඇවිල්ලා කියන්න අර මෙතැන අහන එකෙන් එක ඒ රිජෙක්ට් වෙච්ච ෆයිල් එක දැන් අනුමත ද මොකක්ද මේ අහන කතා. ඔබ මන්ත්‍රීතුමිය මන්ත්‍රීවරියක් හැටියට ඔබ හොඳයිනේ ප්‍රශ්ණ කිරීම. ඔබ යන්න කර්මාන්ත අංශයට මෙන්න මෙහෙම රිජෙක්ට් වෙලා තියෙනවා මේච්චර ප්‍රමාණයක්. දැන් වෙනකොට ඒකෙන් කොච්චර අනුමත වෙලා තියෙනවාද නැද්ද. කරුණු ගන්න. ෆයිල් බලන්න ඔබට අයිතියක් තියෙනවා. මේ සභාව ඒකට පාවිච්චි කරනවා වෙනුවට ඔබ අවංකවමනම් ඔබට බලයක් තියෙනවා මේ හැම ෆයිල් එකක්ම ඇරලා බලන්න.

**මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, මේ ඔබතුමා සභාපති. මුදල් කමිටුවේ අයිතිකරු. මට හැම ෆයිල් එකක්ම ඇරලා බලන්න වුවමනාවක් නැහැ. නමුත් ඔබතුමා ඒ වැරැද්ද නිවැරදි කරන්න දෙන්නේ නැහැනේ නිලධාරීන්ට. ඒ අයට දෙන්න මේ වාර්තාවල් දෙනකොට දෙන්න කියන්න මෙච්චර ෆයිල් ආවා මේවා පොඩි වාර්තාවක් දෙන්න පුලුවන්නේ. ඒක හදන්න. මට කාටවත් වෙන්න අවශ්‍ය නැහැ. මම වෙන්නේ මම. 10 වෙනි කරුණ වෙන් කළ කසල සම්බන්ධව සේවකයන්ට දිරි දීමනාව ගෙවනවා. ඒකට අපි ජනවාරි මාසේ හාරලක්ෂ හතලිස් දාහක් ගෙවලා තියෙනවා. පෙබරවාරි මාසෙට පන්ලක්ෂ අසූපන්දාහක් ගෙවලා තියෙනවා. එතකොට මේවා නිකන් ගෙවීම් විතරයි මේකේ ලැයිස්තුවක් නැද්ද? නම්, ගම් නැද්ද? මේ කාටද ගෙවන්නේ කියලා. සාමාන්‍යයෙන් ඉස්සර අපිට ලිස්ට් එකක් එනවා. කොච්චර කිව්වත් ඒවා නිවැරදි කරන්නේ නැහැනේ. මේවා මුදල් ගෙවීම් තියෙන්නේ. එතකොට මෙහි වගකීමක් තියෙන්න ඕන කාටද ගෙවන්නේ. අපි කියනවා මේ මාසේ 130ක් ඉන්නවා කියලා ගිය මාසේ 109ක් ඉන්නවා කියනවා කෝ විස්තර. අපි මුදල් ගෙවන්නේ මේ මිනිස්සුන්ට අපි විරුද්ධ නැහැ අපේ සේවකයින්ට ගෙවීම් කරන එකට, නමුත් නීත්‍යානුකූල වෙන්න එපැයි.

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

මන්ත්‍රීතුමිය, මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවෙන් පස්සේද මේ කරුණ ආවේ. අනේ මන්ත්‍රීතුමිය ආදරයෙන් කියන්නේ ඒ වෙලාවේ ඔය ප්‍රශ්ණය කතා කරලා ඉල්ල ගන්නකෝ මේ ගෙවීම කරලා තියෙන්නේ කාටද ඒ ලැයිස්තුව ඉල්ලගන්නකෝ ගේන්න කියලා.

**මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය**

ගරු විපක්ෂ නායකතුමනි, මම මෙතැනින් නවතිනවා මුදල් කමිටුව පිළිබඳ සාකච්ඡා කරන්නේ නැහැ. මගේ විරෝධය.

**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, මෙහි කෙටි ප්‍රශ්ණයක් අයිතම අංක 24 ශ්‍රේෂ්ඨාධිකරණ නඩුවෙන් පස්සේ ඔලිවර් ප්‍රනාන්දුට ඉඩම පැවරීම කරනවාද?

**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මෙය හොඳින් අධ්‍යනය කළා. ඔහුට මෙය දෙනවා හැර වෙනත් විකල්පයක් නැහැ කියලා තමයි මම විශ්වාස කරන්නේ. නඩු තීන්දුවේ ඉතාම පැහැදිලිව නොකියා කියනවා අනෙක් අයට දීපු විදියටම ඒ පදනමින්ම මෙතුමාටත් සලකන්න.

**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, ඒ නඩු තීන්දුව සභාගත කරන්න පුලුවන් ද? එය අපි දැකලා නැහැ. එතකොට මෙය පවරනකොට ඒ පැවරීමේදී මුද්දර ගාස්තු ගෙවනවානේ. අපි ගෙවන්න අවශ්‍ය නැහැ. ඒගොල්ලන්ට ගෙවන්න කියන්න. මෙහි තක්සේරු කිරීම ගැන දාලා තියෙනවා. හිඟ

වරිපනම් ගෙවීම සහ මුද්දර ගාස්තු යනවානේ පවරනකොට. ඒ පවරනකොට ඒ පුද්ගලයා ගෙවනවා, අපි ගෙවන්න අවශ්‍යතාවයක් නැහැ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
මේකේ මන්ත්‍රීතුමිය උදවු කරන්න. මුකුත් සැගවීම් නැහැ. දේශපාලනික පටුවීම් නැහැ. මට තේරුණා දැන් මේක මේ ආකාරයට නිලධාරීන් තවදුරටත් මේ ආකාරයෙන් කටයුතු කළොත් අපි තව අමාරුවක වැටෙනවා. මේ මිනිහා මට දැන් ඇවිල්ලා කියලා ගියා මට විරුද්ධව නඩුවක් යනවා මේ වෙනුවෙන්.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>
ගරු නගරාධිපතිතුමනි, ඔබතුමා දන්නවාද කවදාද මේ නඩු තීන්දුව දුන්නේ කියලා. නගරාධිපතිතුමනි, එයා ඇවිල්ලා කිවුවොත් කියන්න මේක සභාවට දැම්මා කියලා. මුදල් කමිටුවට දැම්මා කියලා. සභාවෙන් කිවුවා කියලා නඩු තීන්දුව සභාගත කරන්න කියලා සභාවට බලන්න ඕන කියලා සභාගත කරලා සභාවේ සාකච්ඡා කරලා දැනුම් දෙන්න. එතකන් එයාට සභාවේ අනුමැතිය එන්න එපැයිනේ. නැතිනම් නගර සභාවට එරෙහිව අපහස නඩුවක් දැම්මොත් ඒක තවත් ලොකු ප්‍රශ්ණයක් වෙනවා. ඉතින් මේක පවරන ක්‍රමවේදයක් තියෙනවානේ. සභාවට දැනුම් දියයුතුයි සභාවට පස්සේ. ඒකට යම්කිසි කාලයක් අවශ්‍යයි කියන්න.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, දැන් මේ එහෙම ලබා දෙන ඉඩම් පිළිබඳව චක්‍රලේඛනයක් නිකුත් වෙලා තියෙනවා. ඊට අනුව ආණ්ඩුකාරතුමාගේ අනුමැතියක් ඕන වගේ කතාවක් කියනවානේ. නමුත් මම කියන්නේ ඒකට යන්න ඕන නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>
ගරු නගරාධිපතිතුමනි, නැහැ පවරන්න එපා කියන්නේ නැහැනේ. අධිකරණයෙන් කියලා තියෙනවානේ පවරන්න කියලා. අපිට නඩු තීන්දුවක් නමුත් සභාව දැනගත යුතුයි හේතුව නඩුවක් ඔවර් රයිට් කරන්න බැහැ. නමුත් සභාව දැනගත යුතුයි හේතුව නඩුවක් ගිහිල්ලා තියෙනවා සභාවේ මුදල් වියදම් කරලා තියෙනවා එතකොට සභාවට අධිකරණයෙන් යම්කිසි නියෝගයක් කරලා තියෙනවානම් සභාගත කරලා සභාව හරහා කතා කරලා සභාව හරහා සිද්ධ වියයුතුයි. පවරන්න එපා කියන්නේ නැහැ. වැරදි අර්ථකථන කියන්න එපා. සභාවේ මන්ත්‍රීවරයෙක් විසින් ඉල්ලීමක් කළොත් එය සලකා බැලිය යුතුයි.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, සභාවේ අනුමත වෙනවා අවශ්‍ය කරුණු කාරණා ටික මොනවාද කියලා බලලා අපි, වරදක් නොවන විදියට.

<u>මහා නගර සභා මන්ත්‍රී - යූ. එල්. සේනක දමයන්ත ද සිල්වා මහතා</u>
ගරු නගරාධිපතිතුමනි, ඒ තීන්දුව සඳහන් වෙනවාද දන්නේ නැහැ නගර සභා නිලධාරීන් සම්බන්ධවත් මොනවාහරි වැරදි සම්බන්ධ තත්ත්වයක් තියෙනවාද දන්නේ නැහැ. ඒ නිසා නඩු වාර්තාව ඉදිරිපත් කළොත් හොඳයි කියන ඉල්ලීම කරනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>
ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, නීති නිලධාරිනිය අවශ්‍ය වාර්තා මෙයට දැම්මා දැනට අවශ්‍ය වාර්තා දාලා තියෙනවා.

**මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය**

ගරු නගරාධිපතිතුමනි, ලේකම්තුමා ලබන සභාවට පෙර නීති නිලධාරීනියට කියන්න තීන්දුව එවන්න කියලා. එතකොට අපිට ඒක කියවලා බලලා එතකොට ඉක්මනට කටයුතු කරන්න පුළුවන්.

**මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**

ගරු නගරාධිපතිතුමනි, මුදල් කමිටු වාර්තාවේ 02(1) සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා. උක්ත කරුණ සලකා බැලූ කමිටුව සියලුම මහා නගර සභා මන්ත්‍රීවරුන් ඇතුළු කාර්යාල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් භාණ්ඩ, වැඩ හා උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2024 පළාත් පාලන ආයතන සඳහා අදාළ කර ගැනීම පිළිබඳව පුහුණු වැඩමුළුවක් පැවැත්වීමට නිර්දේශ කළ අතර, ඒකී පුහුණු වැඩමුළුව පැවැත්වීමෙන් පසු 2026.01.19 දිනැති කමිටුවේ පත් කරන ලද අනුකමිටුව රැස්වීමට නිර්දේශ කරන ලදි. මෙහි 02(1) සඳහන් කරුණ තමයි ප්‍රධාන නාගරික ගණකාධිකාරී විසින් ඉදිරිපත් කරන ලද භාණ්ඩ, වැඩ හා උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2024 පළාත් පාලන ආයතන සඳහා අදාළ කර ගැනීම පිළිබඳ ලිපිය. 2025.10.19 දිනැතිව මුදල් කමිටු වාර්තාවේ ඇමුණුම් අංක 11 ලෙස ඉදිරිපත් කර ඇත. සලකා බැලීම කියලා කියලා තියෙනවා. මේක මේ අපභ්‍රංසය අපිට තේරෙන්නේ නැත. එක්කෝ මේ වගේ දේවල් ඔබතුමාගේ තර්කය අනුව මම මුදල් කමිටුවේ ද සිටියේ ද නැත. ඒ නිසා ඔබතුමා මේ දාලා තියෙන 02(1) කරුණ බැලුවහම මොකක්ද මේ නිර්දේශය මොකක්ද මේ කරුණු කියන එක පිළිබඳව අපිට අවබෝධයක් නැහැ. 2025.10.19 දිනැති මුදල් කමිටු වාර්තාවේ ඇමුණුම් අංක 11 ලෙස 2025.10.19 මුදල් කමිටුව හොයාගෙන යන්න ඕන අපි. මේ හැම මන්ත්‍රීවරයා ළඟම හැම මුදල් කමිටුවක්ම නැහැ. එතකොට ඒවා අපි හොයාගෙන යන්න ඕන. කරුණාකරලා මේ ලේකම් අංශයෙ නටන නාඩගම නවත්තන්න ඕන. මේවා මේ අපිට හිතන්න තියෙන්නේ මේවා වුවමනාවෙන් කරන වංචා සහගත දේවල් හැටියට තමයි අපිට දකින්න වෙන්නේ මේක. මොකද හේතුව මම අහන්නේ අපේ මේ ආණ්ඩු පක්සයේ ඉන්න මන්ත්‍රීතුමන්ලාගෙන්, මේ නිර්දේශය දැක්කම මේ නිර්දේශය අනුව මොකක්හරි හිතෙනවාද? මොකද්ද කරුණ කියලාවත් දන්නවාද? මේ නිර්දේශයේ පැහැදිලි වෙනවාද මොකක්වත්? එහෙම මුකුත්ම නැහැ. ඒ නිසා කරුණාකරලා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා. ඊට පස්සේ 05 වන කරුණ සම්බන්ධයෙන් අපේ මන්ත්‍රීතුමියත් කතා කළා. 2026 පෙබරවාරි මස පැවැත්වූ සැලසුම් කමිටු වාර ගණන 06යි. ඉදිරිපත් කළ ලිපිගොනු සංඛ්‍යාව 142යි. අනුමත කළ ලිපිගොනු සංඛ්‍යාව 68යි. ලිපිගොනු 74ක් අනුමත වෙලා නැහැ. සාමාන්‍යයෙන් අපේ තර්කය තමයි ලිපිගොනුවක් කමිටුවකට දාන්නේ ටීඕ හෝ එස් ඩබ්ලිව් බලලා. ඒ සම්බන්ධයෙන් කරුණු අධ්‍යනය කරලා. ඒක හරි කියලා හිතෙනවානම් විතරයි කමිටුවට දාන්නේ. එතකොට ඒ දාන ඒවායින් 50%කට හෝ ඊට ආසන්න ගාණක් ප්‍රතික්ෂේප වෙනවානම් ඒ කමිටුවේ කුමන හෝ ප්‍රශ්ණයක් තියෙනවා. ඒ නිසා කරුණාකරලා අපි කියන දේ ගැන උරන වෙන්නේ නැතුව ඒ සම්බන්ධයෙන් බලන්න. මොකද අපිට කියන්න පුළුවන් ඕනනම් ගමට ගිහිල්ලා ඕක හරියන්නේ නැහැයි කියලා. හැබැයි එහෙම නෙවෙයි මේ ප්ලෑන් අනුමත කරන්න දාන්නේ මොරටුවේ මිනිස්සු. ඒ මිනිස්සුයි මේ අපහසුතාවයට පත්වෙලා තියෙන්නේ කාගේ හෝ වරදකින්. ඒ නිසා අපි කියන්නේ කරුණාකරලා මෙය නිවැරදි කරගන්න නැතිනම් එහෙම ලොකු ප්‍රශ්ණයක්. ඊට පස්සේ අංක 06 සම්බන්ධයෙන් මේ කවුද දන්නේ නැහැ මේක දාලා තියෙන නාගරික ගණකාධිකාරී. නාගරික ගණකාධිකාරී හිතන් ඉන්නේ මේක මොකක් කියලද දන්නේ නැහැ මේ පාර. නාගරික ගණකාධිකාරිගේ නිර්දේශයේ තියෙන්නේ පුරන්අප්පු රඨගාලේ වෙළඳ කුටියක් දිනකට රු. 500 යි. පුරන්අප්පු රඨගාල කියලා කියන්නේ හිසට සෙවනක් තියෙනවා එතැන වෙනම ඇතුලේ කරන එකක්.

පරණ ගාලු පාර, නව ගාලු පාර, දුම්රියපොළ පාර වෙළඳ කුටියකට දිනකට රු. 1000 යි ප්ලස් වැට්. හත්වලාමේ මේ ගණකාධිකාරී කොහෙද දන්නේ නැහැ ජීවත් වෙන්නේ. උක්ත කරුණ සලකා බැලූ කමිටුව ඉහත සඳහන් ස්ථාන වල වෙළඳ කුටියක් හයයි හය ප්‍රමාණයේ දිනකට රු. 500 ක් අයකර 2026 මාර්තු 31 දින සිට අප්‍රේල් 12 දක්වා වෙනකර ලබා දීමට නිර්දේශ කරන ලදි. මෙය සංශෝධනය වුණා කියලා කිවුවා. ගරු නගරාධිපතිතුමනි, අපිට දැනගන්න ඕන මෙහි ගාණ සංශෝධනය වුණාද? ප්‍රමාණය සංශෝධනය වුණාද? කොහොමද වුණේ කියන එක පිළිබඳව දැනගන්න කැමතියි.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, අපි මේ නත්තල් එකට දීපු එක තිබුණානේ නත්තල් කාලෙට අදාළව. ඊළඟට මේ ආව කතන්දරයත් එක්ක දහයේ දහයේ බැහැ එතකොට පාරට එනවා. පාර ආරක්ෂා වෙන්නත් ඕන ඒ නිසා දිග හතයි පළල හයයි. ගාණ වැඩි කළේ නැහැ සංශෝධනයක් ඕන කියලා කිවුවා තවම එහෙම තීන්දුවක් ගත්තේ නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, ඒ කියන්නේ දැන් මේක මේ කරුණ සංශෝධනය වෙන්න ඕනනේ. මෙහි තියෙන්නේ හයයි හය කියලානේ. එහෙනම් ඔබතුමා සභාපතිතුමා හැටියට මේ කරුණ අටයි හය විදියට සංශෝධනය කරන්න ඕන මේ කරුණ. නැතිනම් මෙහෙමනේ අනුමත වෙන්නේ සභාවේ. අනෙක් එක මම කමිටුවට ස්තූතිවන්ත වෙනවා එකවුන්ටන් දාහක් කියලා දැම්මත් පන්සීයට මේක අනුමත කිරීම සම්බන්ධයෙන් අපේ ස්තූතිය පුදකරනවා මොකද මිනිස්සු ගැන හිතලා. අංක 08 මට මතකයි කටුබැද්ද සුපර් සිටි වෙළඳපොල ප්‍රවේශ මුදල කපා හරින්න ඔබතුමා යෝජනාවක් ගෙනෙල්ලා ඔබතුමා තීන්දුවක් ගත්තා. දැන් ඒ යෝජනාවට මාස 06ක්වත් යන්නට මත්තෙන් අට වෙනි කරුණ හැටියට කටුබැද්ද සුපර් සිටි සුභ සාධක වෙළඳ සංගමය විසින් ගරු නගරාධිපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදුව ගරු නගරාධිපතිතුමා විසින් මුදල් කමිටුවට යොමු කරන ලද ලිපිය සලකා බැලීම කියලා කරුණක් තියෙනවා. එහි ඇමුණුම කියෙවුවාම තියෙන්නේ ඒගොල්ලන් ඉල්ලීමක් කරනවා ප්‍රවේශ මුදල් කපා හරින්න කියලා. එතකොට ඒගොල්ලන් කියනවා ගෙවූ ප්‍රවේශ මුදල් අපිට එපා මේක කපා හරින්න කියලා. ඒකනේ තියෙන්නේ මෙහි. එතකොට උක්ත කරුණ සලකා බැලූ කමිටුව මේ සම්බන්ධයෙන් ආණ්ඩුකාරතුමා වෙත ලිපියක් යොමු කිරීමට නිර්දේශ කරන ලදි. අපිට දැනගන්න අවශ්‍යතාවය තියෙන්නේ මෙය පැහැදිලි නැහැ. අපි දැනගන්න ඕන දේ දැනගන්න ඕනනේ. අපි කලින් ගත්ත තීන්දුවක් තිබුණා සභාවේ. අපි එපා කියද්දි කලින් තීන්දුවක් ගත්තා ප්‍රවේශ මුදල් කපා හරින්න. එතකොට ඒ තීන්දුව ක්‍රියාත්මක වුණේ නැද්ද? ප්‍රවේශ මුදල් කපා හැරීමක් සිදුකළේ නැද්ද? මේ අය මේ ආපහු ඉල්ලලා තියෙන්නේ ඒකද? අපේ කමිටු සභාපතිතුමා හැටියට ඔබතුමාගෙන් අහන්නේ එතකොට කලින් මේ තීන්දුවක් අරගෙන, මාස හයක් යන්නත් ඉස්සෙල්ලා අපි ආපහු මෙහි තීන්දුවක් ගන්නවා ආණ්ඩුකාරතුමාට යවන්න. එතකොට අපි අර ගත්ත තීන්දුව ඒ කියන්නේ සභාව ගත්ත තීන්දුව ක්‍රියාත්මක වීම අත්හිටුවලාද තිබුණේ?

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, දැන් මේක ක්‍රියාත්මක වෙමින් තියෙන තත්ත්වය ඇතුලේ මතු වුණ ගැටලු ප්‍රවේශ මුදල් ඉවත් කළ යුතුයි කියලා අපි යෝජනාවක් දාලා ඒක අනුමත කරගෙන ඒක ක්‍රියාත්මක කරනකොට ගැටලු ප්‍රමාණයක් එනවා. ඒ ගැටලු අතර තියෙන ප්‍රධාන එකක් තමයි මේක මේ නිකන්ම නිකන් යෝජනාවක් ගෙනාවා නෙවෙයි ප්‍රවේශ ගාස්තු කියන එකත් ප්‍රශ්ණ කළාම ප්‍රවේශ ගාස්තු කියන එක අය කිරීමට පදනම්ව කිසිම පිළිගත හැකි කරුණු ඉදිරිපත් වුණේ නැහැ. ඊළඟට මෙය අහෝසි කිරීම සඳහා අපි යම් තැනකට මේ

යෝජනාව ගෙනෙල්ලා ක්‍රියාත්මක කරනකොට ආව ප්‍රධාන කාරණාවක් තමයි අපි මුහුණ දීපු ඒ අයගේ භාගයක් ප්‍රවේශ ගාස්තු ගෙවලා තිබුණා. ඒක ටිකක් ලොකු මුදලක්. දැන් එහෙම මුදලක් නැවත අහෝසි කිරීමත් එක්ක ඒගොල්ලන්ට නිදහස් කිරීමේ ප්‍රශ්නය එනවා. ඒ නිසා ඒ පිළිබඳව සාකච්ඡා කරපුවාම ඒගොල්ලන්ගේ අදහස වුණේ අපිට ඒ ගෙවපු මුදල් එපා. ඒගොල්ලන් සමිතියක් ලෙස දුන්නා, මම කිවුවා සමිතියක් ලෙස නෙවෙයි ඔබතුමන්ලා එකිනෙකා තනි තනිව දිවුරුම් ප්‍රකාශන මඟින් ඒ මුදල් එපා කියලා සභාවට දෙන්න. ඒ අතර වාරයේ තමයි දැන් මේ පිළිබඳව ආණ්ඩුකාරවරයාගේ අනුමැතියක් ඕන කියන අදහස එන්නේ. එතකොට ආණ්ඩුකාරතුමාට මේක යවනවා අදත් මේ කඩ ටෙන්ඩර් වෙනවා ප්‍රවේශ ගාස්තු කියන එක හැරිලා තියෙනවා ටෙන්ඩර් ගාස්තු විදියට අර මුදලම තමයි. දැන් ඒ ටෙන්ඩර් කරපු කඩවල ගත්තොත් මූලික මුදල ලක්ෂ 13, 14යි ගත්තු මිනිස්සුන්ට ඒ ගාණට ගන්න බැහැ. එකපාර ගෙවන්න බැහැ. මොකද ඔබ දන්නවා මේ කඩ දීර්ඝ කාලයක් වහලා තියෙන්නේ. අපේ ආදායම් මාර්ග අපිට අහිමි වෙලා. හැබැයි දෙන්න යම් තැනකට කටයුතු කරනකොට විවිධ බාධා එමින් තවදුරටත් මේ කඩ ටික වහලම තියන්න ගන්න උත්සහායක්ද කියලා හිතෙනවා. ඉතින් ඒකත් නිලධාරීන්ගේ පැත්තෙන් මෙන්න මෙහෙම ප්‍රශ්ණ බාධා කිරීම් එනවා. ඒක නිසා මේක තමයි දැනට තියෙන තත්ත්වය.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, 09(1) කරුණ සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා. විෂය වරිපනම් බදු මුදල් කපා හැරීම, නාගරික ගණකාධිකාරී විසින් ඉදිරිපත් කරලා තියෙන්නේ. මේක ලේඛනයෙන් සම්පූර්ණයෙන් ඉවත් කළ යුතු බවට ප්‍රධාන තක්සේරු නිලධාරී විසින් 2023.09.06 දින නිර්දේශ ලබා දී ඇත. එතකොට මෙහි තක්සේරු නිලධාරී නිර්දේශය ලබා දෙන්නේ 2023.09.06 මුදල් කමිටුව වෙත ඉදිරිපත් කිරීම සඳහා නාගරික ගණකාධිකාරී නිර්දේශ කරන්නේ 2026.02.04 අවුරුදු 03කට පස්සේ. ඒ කියන්නේ තක්සේරු නිලධාරීගේ නිර්දේශයෙන් අවුරුදු 03කට පස්සේ. මුදල් කමිටුව වෙත ඉදිරිපත් කිරීම සඳහා නාගරික කොමසාරිස් අනුමැතිය 2026.02.27 එතකොට අපි අහන්නේ 2023.09.06 ඉඳලා 2026.02.27 වෙනකන් මේක කොහේද ගිහිල්ලා තිබුණේ? දැන් කමිටුවේ සභාපතිවරයා හැටියට ඔබතුමා බැලුවේ නැද්ද මේකේ එනකොට මේ මොකක්ද වෙලා තියෙන්නේ කියලා. ඇයි මේ තක්සේරු නිලධාරී වාර්තාව දීලා මෙතරම් කාලයක් ගියේ මේක කමිටුවට එන්න.

ගරු නගරාධිපතිතුමනි, අනෙක් එක තමයි මම දිගටම කියන කතාවක් තමයි ඔබතුමාලා කොච්චර කිවුවත් අහන්නෙ නැති කතාවක් තමයි 252(3) වගන්තිය කරුණාකරලා ඒ වගන්තිය කියවලා බලන්න මේ මහා නගර සභා ආඥා පනතේ 252(3) වගන්තිය කියලා මේගොල්ලන් මේ දාන එක වැරදියි. එහෙම කපාහරින්න බැහැ බදු. මෙයට වෙන මොකක්හරි හොයාගන්න කියලා පැහැදිලිව කිවුවා. හැබැයි මේකේ මේ 252(3) වගන්තියෙන් කපා හරින්නම බැරි දෙයක් තමයි තමයි මේ කරන්නේ. බොරුවට මේකේ ඉන්න මන්ත්‍රීවරුන්ව වෘෂභට අන්දලා දාන ආඥා පනතේ වගන්තියක් තමයි මේ දාලා තියෙන්නේ. ඒකට ගණකාධිකාරීවරිය වග කියන්න ඕන.

ගරු නගරාධිපතිතුමනි, 09(2) කරුණ සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා. මේක වෙලා තියෙන්නේ කාර්තු සීමාව දැන් මේ කතා කරනකොට ඔබතුමා පොඩ්ඩක් අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා මේවා නිකන් නෙවෙයි අපි කියන්නේ. කාර්තු සීමාව 2008 පළවෙනි කාර්තුවේ සිට 2026 දෙවන කාර්තුව දක්වා ප්‍රධාන තක්සේරුගේ නිර්දේශය 2026.01.28, 2026.02.08, 2026.02.28 එතකොට අපි අහන්නේ 2008 වෙච්ච වරදක් 2026 දීද දැක්කේ. අවුරුදු කීයකට පස්සේද මේ. එතකොට මේ 2008 සිදු වූ වරදට පස්සේ වරිපනම් තක්සේරු කිරීම් තව දෙකක් විතර වුණා. හැබැයි ඒ තක්සේරු කිරීම් වලදීවත් මේක නිවැරදි

වෙලා නැහැ. 2008 වෙච්ච වරද 2026 නිවැරදි කරන්නේ. මේවායේ ගාණ නෙවෙයි වැදගත් වෙන්නේ නගරාධිපතිතුමා. ගාණනම් රු. 2888යි. ගාණ වැදගත් නැහැ. නමුත් මේක බලන්න පොඩ්ඩක් ඕනම බලපු කෙනෙකුට පොඩි ළමයෙකුට හරි මේක පැහැදිලි වෙනවා මේ මිනිස්සු මේ නිලධාරීන් මොකද කරන්නේ? අපි අහන්නේ ඒකයි. මේ කැඩන්ඩරයේ තියෙන දින ගාණත් වෙනස් කරලා. ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂ නිලධාරීතුමා තමයි ඒක කරලා තියෙන්නේ. කැඩන්ඩරයේ තියෙනවා අපි දන්න විදියට මේ 2026 අවුරුද්දේ පෙබරවාරි මාසේ තිබුණේ දින 28යි. දීර්ඝ අවුරුද්දක් නම් දින 29යි. නමුත් 10 වෙනි කරුණට ඔබතුමාගේ අවධානය යොමු කරනවා. එහි තියෙනවා 2026 ජනවාරි සේවකයින් 109ක් සඳහා ගෙවන ලද මුදල රුපියල් හාරලක්ෂ හතලිස්එක්දහස් හත්සිය පනහයි දින 30ක් සඳහා ගෙවලා තියෙනවා. 2026 පෙබරවාරි කියලා 150 වැඩිකිරීම 30 මම ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමාගෙන් ඔබතුමා හරහා අහන්න තියෙන්නේ, පෙබරවාරි මාසෙට දින 30ක් තිබුණේ මොන රටේද? කුමන අවුරුද්දෙ ද? හත්වලාමේ දින 30ක් දාලා එකසියපනහා තිහෙන් වැඩිකළාම පන්ලක්ෂ අසූපන්දාහයි. ඉතින් මේවා අපි කිවුවාම අපි වැරදියි. නමුත් ඇත්ත මේක. මුදල් කමිටුවේ සභාපතිවරයා හැටියට ඔබතුමා දැක්කේ නැද්ද එකසියපනහා තිහෙන් වැඩි කරනකොට මේක වැරදියි කියලා.

ගරු නගරාධිපතිතුමනි, 11 වන කරුණ සඳහා අවධානය යොමු කරනවා. එහි තියෙනවා පුද්ගලික ආරක්ෂක සේවාව සපයා ගැනීම වෙනුවෙන් 2026 පෙබරවාරි මාසය සඳහා ගෙවීම් සිදුකිරීම කියලා, උක්ත කරුණ සලකා බැලූ කමිටුව ඉහත සඳහන් පරිදි අදාළ ආයතනය වෙත විසිදෙලක්ෂ හැත්තෑපන්දහස් හයසියයක මුදල ගෙවීමට අනුමත කිරීම කිරීමට නිර්දේශ කරන ලදී. මට දැනගනන ඕන මේ ගෙවීම කරලා ඉවර ද? නැද්ද? අපි ගනකාධිකාරතුමියගෙන් ඔබතුමා හරහා අහන්නේ මේ ගෙවීම කරලා ඉවර ද? නැද්ද? මේ ගෙවීම අනුමත කරන්න දාලා තියෙන්නේ. ගෙවීම අනුමත කිරීමට නිර්දේශ කරන ලදි.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, සභාව අනුමත කලාට,පස්සේ තමයි ගෙවීම සිදුකරන්නේ.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, හරි ඒ කියන්නේ ගෙවීම් අනුමත කරලා නැහැ.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා**</u>

එතුමා මතුකරපු පෙබරවාරි මස දින 30 කතාවට අදාළ ගෙවීම් පොහොර දීමනාව. ඒකට මොකක්හරි උත්තරයක් දෙන්නකෝ. දැන් මේ ගෙවීම කරලාද තියෙන්නේ? දැන් අපිට මේ හැම එකක්ම එකින් එක කියවෙන්නේ නැහැනේ. වහාම මේවා නිවැරදි කරන්න.

<u>**මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, 16 කරුණ සම්බන්ධව බදු නිදහස් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලැබූ CO3/21/සොයිසා/2025 ලිපිගොනුවේ කපාහැරිය යුතු බදු මුදල රු. 22320.90ක් ලෙස දක්වා ඇත. නමුත් 2026.03.03 දිනැති මොරටුව මහා නගර සභා තීරණ අංක 06(9) 22(6) ප්‍රකාරව කපා හැරිය යුතු බදු මුදල රු.23320.90ක් ලෙස නිර්දේශ කර ඇත. ඒ අනුව කපා හැරිය යුතු නිවැරදි වරිපනම් බදු මුදල විය යුත්තේ රු. 22320.90ක් වේ. මම අහන්නේ මේ වරද කවුද කරලා තියෙන්නේ? තක්සේරු දෙපාර්තමේන්තුවෙන් කරපු වරදක්ද? නැතිනම් ලේකම් දෙපාර්තමේන්තුවෙන් කරපු වරදක්ද?

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රතිනාන්දු මහතා**</u>

නාගරික ලේකම් අතින් තමයි ඒ වරද වෙලා තියෙන්නෙ.

<u>**මහ නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමා, නාගරික ලේකම් අතින් වුණත් ඒකට වගේ කියන්න ඕනෙ මොරටුවෙ ජනතාව. මේ ප්‍රින්ට් කරන එකටත් සල්ලි යන්නේ මොරටුවේ ජනතාවගේ සල්ලි. ඊළඟ කරුණ ගරු නගරාධිපතිතුමා, 17(2) ඒක ඉතාමත් වැදගත් ඔබතුමාගේ අවධානය යොමු කරනවා 2026 අයවැයෙන් වෙන් කළ මුදලින් පොත් මිලදී ගැනීම සඳහා පොත් රාක්ක මිලදී ගැනීම සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම. මෙහි තියෙනවා 2026 වර්ෂයේ සඳහා මහ නගර සභාවේ පුස්තකාල සඳහා පොත් මිලදී ගැනීම පිණිස අයවැයෙන් මුදල් වෙන් කර ඇත. එම මුදලින් පොත් මිලදී ගැනීමට අපේක්ෂා කෙරේ. අයවැයෙන් වෙන් කරලා තියෙන මුදලින් පොත් ගන්න හදනවයි කියලා කියන්නේ. පුස්තකාල වලින් ලැබී ඇති ඉල්ලීම් අනුව දැනට පවතින පොත් ගබඩා කිරීමට අවශ්‍යය පොත් රාක්ක හිඟ පවතින අතර සෑම පුස්තකාලයකින්ම පොත් රාක්ක සඳහා ඉල්ලීම් ලැබී ඇත. ඒකත් හොඳයි පොත් තියන්න පොත් රාක්ක ඕන. නැතිනම් කාවෝ කනවා. 2026 පොත් මිලදී ගැනීම සඳහා පමණක් භාවිතා කරන්නේද? එසේ නොමැති නම් එම මුදලින් පුස්තකාල වලට අත්‍යවශ්‍ය වී ඇති පොත් රාක්ක මිලදී ගැනීම සඳහා ද යම් මුදලක් වෙන්කර එය පොත් රාක්ක මිලදී ගැනීම සඳහා භාවිතා කළ හැකිද? උපදෙස් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි. උක්ත කරුණු සලකා බැලූ කමිටුව මහජන උපයෝගීතාවය කාන්තා හා ප්‍රජා සංවර්ධනය පිළිබඳ ස්ථාවර කමිටු නිර්දේශය පරිදි 2026 වර්ෂයේදී මොරටුව මහ නගර සභාවේ පුස්තකාල සඳහා පොත් මිලදී ගැනීමට වෙන්වී ඇති මුදලින් රුපියල් ලක්ෂ පහක් ඉතිරි මුදලින් පොත් රාක්ක මිලදී ගැනීම අනුමත කිරීමට නිර්දේශ කරන ලදී. නගරාධිපතිතුමා වැඩේ කැතයිනේ. පොත් කියලා කියන්නේ නගරාධිපතිතුමා අපේ ජීවය වගේ දෙයක්. පොත් මිලදී ගන්න තිබ්බ සල්ලි ටික පොත් රාක්ක මිලදී ගන්න යෙදවීම ම බොහොම අසතුටුදායක ක්‍රියාවක්. ඒ නිසා මම බොහෝම ගෞරවයෙන් ඉල්ලනවා කරුණාකරලා මේ වැඩේ කරන්න එපා. මොකද හේතුව අපේ අපේ දරුවෝ අපිට වටින්නේ මේ මොරටුවේ ඉන්න අනාගත පරම්පරාව. එක පොතකින් දරුවෝ කී දෙනෙක් ප්‍රයෝජන ගන්නවද. හැබැයි පොත් රාක්ක අපිට අරගෙන දෙන්න පුළුවන් ඕන තරම්.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, මේ තුනපහ රාක්ක නෙවෙයි. මේ පොත් රාක්ක, පොත් ආරක්ෂා කරන්නම තමයි. පොත් කබඩ් ගොඩක් දිරාපත් වෙලා. ඒවා ආරක්ෂා කරගන්න බැහැ. අපි ලක්ෂ දහයක් වෙන් කරපුවහම අපි කල්පනා කරනවා මේ තියෙන පොත් ටිකත් ආරක්ෂා කරගෙන ගන්න පොත් ටිකත් රැකගන්න නම් අපිට යන්න වෙනවා ආරක්ෂිත රාක්ක සිස්ටම් එකකට.

<u>**මහ නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා**</u>

ගරු නගරාධිපතිතුමනි, ඒකට විරුද්ධ නැහැ රාක්ක ඕනා. නමුත් අපි කියන්නේ මුදලින් ගන්න එපා. පොත් රාක්ක වලට වෙන කොහෙන් හරි සල්ලියක්, මේකෙ කොච්චර කියෙව්වොත් එහෙම ඔබතුමාටයි මටයි තර්ක කරන්න පුළුවන් ඕනතරම් අනවශ්‍ය වියදම් තියෙනවා. මම මේ ඉල්ලීමක් කරන්නේ.

<u>**ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදිනාන්දු මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, මට අවස්ථාව ලබා දෙන්න මේ මුදල ගන්නේ නැතුව මම පොත් රාක්ක ටික හදනවා.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී එම් සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමා, එහෙනම් මේකේ නිර්දේශය වෙනස් කරන්න ඔබතුමා. නිර්දේශයේ දාල තියෙන්නෙ ලක්ෂ පහක් පොත් සල්ලි වලින් දෙනවා කියලා. ඔබතුමාට ස්තුතියි ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කළාට.

**<u>මහනගර සභා මන්ත්‍රී - සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, මේ වෙනකොට අපිට පරිත්‍යාග වශයෙන් හම්බවෙච්ච පොත් තියෙනවා. ඊළඟ කතෘ ප්‍රකාශන ගන්න අනු කමිටුවක් පත් කරලා කතෘ ප්‍රකාශන ගනිමින් ඉන්නවා. හැබැයි මේ පොත් තියාගන්න දැන් පුස්තකාල පද්ධතියේ අපිට රාක්ක නැහැ. අන්න ඒ නිසා තමයි අපි මේ අවුරුද්දේ රාක්ක ටිකක් හදන්න මූලික කරුණක් විදියට ගත්තේ. මොකද මන්ත්‍රීතුමා කොච්චර පොත් හම්බුනත් වැඩක් නැහැ දැන් තව පරිත්‍යාග ගන්නත් තියෙනවා. නමුත් මේව තියාගන්න තැන් නැහැ. හැම අවුරුද්දේම මන්ත්‍රීතුමා පොත් අරගෙන තියෙන්නේ රාක්කයි පොතුයි දෙකම ඒ මුදලින්.

**<u>මහ නගර සභා මන්ත්‍රී - ඩී එම් සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, 17(9) සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ලොකු විස්තරයක් තියෙනවා මම ඒක කියවන්නේ නැහැ. උක්ත කරුණු සලකා බැලූ කමිටුව ව්‍යාපෘතිය හා භෞතික සම්පත් කළමනාකරණය පිළිබඳ ස්ථාවර කමිටුවේ නිර්දේශයේ පරිදි දැනට හිඟව පවතින කුලී මුදල වන දහසට රු. 90000 ක මුදල මාසිකව රු. 15000 බැගින් ගෙවීමටත්, මාසික කඩ කුලිය වන රු. 15000 ක මුදල නිසි පරිදි ගෙවාගෙන යාමටත් නිර්දේශ කරන ලදී කියලා තියෙනවා. ප්‍රශ්නය තියෙන්නෙ නගරාධිපතිතුමා මෙම හේතුව මත මුද්‍රා තබන ලද දිනයේ සිට 2026 පෙබරවාරි දක්වා වන රු. 90000 ක සම්පූර්ණ හිඟ කඩ කුලිය මාසිකව ගෙවීමට යටත්ව කඩ කාමරය තමාට ලබා දෙන ලෙස ඉල්ලා උක්ත බදුකරු විසින් දාලා තියෙනවා 2026.12.19. දැන් මේකේ කඩ කාමරය වහලා තිබුණ කාලයට ද මේ අය කරන්නේ නැතිනම් එයා එයාට අපි බදු දීලා එයා බදු පැහැර හැරපු කාලේ ද මේ 90000 කියන්නේ නැතිනම් මේ ඔක්කෝමද?

**<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>**

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, මෙහි ගැටලුවක් තියෙනවා. මගේ අවබෝධය අනුව මෙයා මේ කඩේ අපි ටෙන්ඩර් එකෙන් දීපු කඩයක්නේ මේ. මෙයා බදු මුදල් ගෙව්වේ නැහැ. බදු හිඟයක් තිබුණා. බදු හිඟය ගෙවන්න කිවුවාට මෙයා ගෙව්වේ නැහැ. ඒ නිසා යම් මොහොතක මේක සීල් කළා. මේ කඩේ සීල් කළා. ඒ සීල් කළාට පස්සේ මෙයා අපෙන් ඉල්ලීමක් කළා. එයා නැවත අර හිඟය ගෙවන්න සූදානම් කඩේ දෙන්න කියලා. එතකොට මේක සීල් තියලා එයාගේ බඩුත් එක්ක. ඉන් අනතුරුව වුණ දේ තමයි සීල් කළාට පස්සේ සාමාන්‍යයෙන් කඩයක් සීල් කරපුවාම එයාගේ අයිතිය එතැනින් ඉවරයි. කඩය සභාවට පවරා ගත්තා ඒ වුණත් ටෙන්ඩර් දාලා. කඩ කිහිපයක් ටෙන්ඩර් දාලා මේ කඩෙත් ටෙන්ඩර් එකට දාලා. අරයා නැවත ඉල්ලීම කරලා ලියුම එවලා. එයාට දැන් දෙන්න බැහැ දැන් ටෙන්ඩර් එකට දාලා. ටෙන්ඩර් එක අවසානයේ මේ කඩේ කාටවත් ගියේ නැහැ. දැන් එතකොට සැලකිල්ලට ලක්කළා මෙයාගේ ඉල්ලීම. නමුත් එතැන ගැටලුවක් එනවා දැන් මෙහෙන් ඉල්ලනවා අර මුළු කාලෙට, දැන් එයා ගෙවීම් කරලා තියෙන්නේ. එතකොට ඒ ගෙවීම් ඇතුලේ වරදක් වෙනවා දැන් සීල් තිබ්බා කියලා කියන්නේ එයාගේ අයිතිය සම්පූර්ණයෙන් ඉවරයි. එතැනින් එහාට අයිතියක් නැහැ. ඊළඟට දැන් නැවත එයාට කඩේ දෙනවානම් දෙන්න ඕන. දැන් මෙහෙන් කියන එක තමයි මට පැටලිල්ල. එහෙනම් එයා මුළු කාලෙටම ගෙවන්න ඕන. එතකොට ඒක අසාධාරණයි සහ නීතිමය ගැටලුවකුත් අපිට එනවා. ඒ කියන්නේ එයාට අයිති නැති

කාලෙකටත් අපි එයාගෙන් අය කරගෙන. නමුත් ඇත්තටම එයාට කඩේ දිය යුතුයි කියන එක තමයි මම ඉන්න ස්ථාවරය මොකද සැහෙන ගෙවීමක් කරලා මහන්සිත් වෙනවා කඩේ කරපු කෙනා. දැන් මම මේ නීතිමය ගැටලුව පිළිබඳව එකවුන්ටන් එක්ක කතා කළා අපි කොහොමද එයාට අයිති නැති මාස ගාණ එයාගෙන් අය කරන්නේ. 90000ක් එන්නේ ඒකත් එක්ක.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, වෙන කෙනෙක් එහෙම ගත්තානම් ඔය කඩය ඒක එයා ගෙවන්නෙ නැහැනේ. එයාට ගෙවන්න කියලා ඉල්ලන්නේ නැහැනේ අපි. එතකොට සීල් කළාට පස්සේ කඩේ නගර සභාවට පවරා ගැනීමක්නේ වෙලා තියෙන්නේ. සීල් කළාට පස්සේ එයාට ගිහිල්ලා බිස්නස් කරන්න බැහැනේ. එතකොට නගරාධිපතිතුමා, එයාට එතැනින් එහාට සීල් කරපු එකට සීල් කරපු දවසේ ඉඳලා එයාගෙන් අයකර ගැනීමක් කරනවානම් මම හිතන්නේ ඒක නීත්‍යානුකූල නැහැ. මොකද ඒක සභාව සතු දේපළක්. ඒ නිසා මේක මම දන්නේ නැහැ මෙහි නිර්දේශය කොහොමද දීලා තියෙන්නේ කියලා 90000ක් කොහොමද හැදිලා තියෙන්නේ කියලා. කොහොමහරි එයා ගෙවන්න ඕන ගාණ එයා ගෙවන්න ඕනා එහි තර්කයක් නැහැ.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, දැනටත් එයා එකඟයි ඒ කෙනා කියන්නේ මාසේ කුලියයි අරකෙන් කොටසයි. මම කියන්නේ ඒක සාධාරණ නැහැ. එයාට දැන් මාසේ කුලිය ගෙවාගෙන යන්න වගේ දෙන්න ඕන. අර මාස ගාණ එයාට අයිති නැහැ.

<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, එහෙනම් ඔබතුමාට පුලුවන්නේ මුදල් කමිටුවේ තීරණයක් ගන්න. මෙහි තියෙන්නේ තීන්දුව ගෙවාගෙන යන්න කියලා. ඒ කියන්නේ රු.15000 ගාණේ අනුදාහෙන් පහලොස්දාහයි කඩ කුලිය 15000යි ගෙවන්න කියලා තමයි කියන්නේ. ඒ තීන්දුව සංශෝධනය කරන්න වෙනවා එහෙමනම්. ගරු නගරාධිපතිතුමනි, 22 කරුණ සම්බන්ධයෙන් අවධානය යොමු කරනවා. ඒ කරුණේ අපි එදා කියපු එක සම්බන්ධයෙන් අවධානය යොමු කරලා ඒ ස්ටිකරයේ තිබුණ ඒ කරුණ වෙනස් කරලා තියෙනවා. ඒක බොහෝම හොඳයි. 24 කරුණ දෙවෙනි වතාවටත් මොරටුව මහා නගර සභාව ඔලිවර් කියන පුද්ගලයාට පැරදුනා. එයින් පැහැදිලි වෙන්නේ එකපාරක් අපි එක්කෝටි පහළොස් ලක්ෂයක් එතුමාට ගෙව්වා. දැන් ආපහු නැවත වරක් ඔලිවර් කියන මහත්මයාට මේ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවකින් නැවත වරක් නගර සභාව පැරදිලා තියෙනවා. එතකොට මේ නඩු සම්බන්ධයෙන් එහෙම එකම පුද්ගලයාට දාන නඩු, දැන් තව දානවා කියලා තර්ජනය කරනවානේ. එතකොට මේ දාන දාන නඩුව නගර සභාව පරදයි. එතකොට නගරාධිපතිතුමා හොයන්න ඕන පළවෙනියාටම මේ නගර සභාව මේ නඩු පරදින්නේ ඇයි? අපි කියන්නේ මේකේ ඇතුලේ ඉන්න පිරිස් අදාළ පුද්ගලයන්ට නඩු දාන පුද්ගලයන්ට ඒ අවශ්‍ය සහායෝගය ලබා දෙනවා නඩු දිනන්න. වගකිව යුතු සහයෝගය දක්වනවා.

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, නඩු පරාද නැහැ අපි. මේ එයා ඉල්ලපු නඩු නිෂ්ප්‍රභා කළා. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් යම් පැහැදිලි කිරීමක් කළා. ඒ කරපු එක ඇතුලේ තමයි තියෙන්නේ අර මීට පෙර දීපු අයට දුන්නා සේ මෙයාටත් දීර්ඝ කාලයක් පදිංචිය සනාථ කරනවා ඉතින් අර පදනමින්ම එයාටත් දෙන්න කියලා.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඒ කියන්නේ මම මේකෙන් උත්සහා කළේ කියන්න තව නඩු තියෙනවා. ලක්ෂ 500 ඉල්ලපු නඩු තියෙනවා. ඒ නඩුවත් මම හිතන්නේ යනවා ලාල් අමරසිංහ. ඒ නිසා ඒ නඩුත් අපිට නැවත නැවත අවධානය යොමු කරන්න වෙනවා මොකද හේතුව මේවා කවුරුත් අතින් ගෙවන්නේ නැහැ නගර සභාවේ මහජන මුදල් වලින් තමයි ගෙවන්න වෙන්නේ මේ වන්දි. ඒ නිසා ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා. 25 කරුණ කල්දමුල්ල තුන්වන පටුමඟ අංක 48 නිවස අසල සිට ඉදිරියට වන කියලා මෙහි කරුණ තියෙනවා. යට තියෙනවා පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් අදාළ වැට් මුදල ලැබෙන තෙක්, මෙන්න මේක ප්‍රශ්ණයක්. පළාත් පාලන කොමසාරිස් කාර්යාලයෙන් අදාළ වැට් මුදල ලැබෙන තෙක් සිසිර කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත රු. 55160.18 ක වන වැට් මුදල සහා අරමුදලින් ගෙවීම් කිරීම සඳහා මුදල් පිළිබඳ ස්ථාවර කමිටුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරමි කියලා නාගරික ඉංජිනේරු විසින් ඉදිරිපත් කරලා තියෙනවා. මේ සම්පූර්ණයෙන්ම වැරදියි. එහෙම කරන්න බැහැ. පළාත් පාලන කොමසාරිස් දෙනකන් ණයට දෙන්න බැහැ නගර සභාවට. එහෙම නීතියක් නැහැ. ඒ නිසා උක්ත කරුණ සලකා බැලූ කමිටුව ඉහත සඳහන් පරිදි සිසිර කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත රු.55160.18 ක් වන වැටු මුදල සහා අරමුදලින් ගෙවීම අනුමත කිරීමට නිර්දේශ කරන ලදි. මේක ගෙවන්න බැහැ. ඉන් එහාට කතා කරන්නේ නැහැ ඒ පිළිබඳව.

**<u>මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය</u>**

ගරු නගරාධිපතිතුමනි, එතැන පොඩි ප්‍රශ්ණයක් තියෙනවා මේගොල්ලෝ වැට් රෙජිස්ටර්ඩ් අයද අපි සම්බන්ධ කරගන්නේ? ඒ අය වැට් රෙජිස්ටර්ඩ් අයනම් ඒ අය වැට් එක ගෙවන්න ඕන. ඒ අයගේ වැට් එක අපි ගෙවන්න බැහැ. අපි ඒ වැට් එක රීක්ලේම් කරනවා. එකවුන්ටන් වැට් රෙජිස්ටර් සප්ලයස්ලා නේද එතකොට ඒගොල්ලන්ගේ වැට් එක කොහොමද අපි ගෙවන්නේ? වැට් එක කියන්නේ ඒගොල්ලො ගෙවන ටැක්ස් එකනේ.

**<u>මහා නගර සභා මන්ත්‍රී - ඩී. එම්. සුජිත් පුෂ්පකුමාර මහතා</u>**

ගරු නගරාධිපතිතුමනි, ඇමුණුම් අංක 14 ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. කර්මාන්ත හා ඉදිකිරීම් පිළිබඳ ස්ථාවර කමිටුව 2026 මාර්තු කමිටුව 25(12)12 කරුණ අංක 19 සඳහා අනුකමිටු වාර්තාව අනුව ඉදිරිපත් කරමි. කොන්ත්‍රාත් ලියාපදිංචි කිරීම කියලා තියෙනවා. මෙහි අංක දෙක 2025 වර්ෂය සහා කර්මාන්ත යටතේ ඉටු කරන ලද ව්‍යාපෘති ගොනු පරීක්ෂා කර බැලූ අතර, එම ව්‍යාපෘති වලින් ව්‍යාපෘති 04ක් නියමිත කාලයට අවසන් නොකිරීම හේතුවෙන් දඩ මුදල් අයකර ඇත. එම කොන්ත්‍රාත්කරුවන්ගේ නම් සහ අයකළ දඩ මුදල් ආදි තොරතුරු ඇතුලත් ලේඛනය ඇමුණුම් අංක 01 හි වශයෙන් ඉදිරිපත් කරමි. ඇමුණුම් අංක 01 හා 04 හි සඳහන් ව්‍යාපෘති නියමිත දිනය වැඩ අවසන් කර නොමැති බැවින්, දින දීර්ඝ කළ ඇත. දීර්ඝ කළ කාලය තුළ වැඩ අවසන් කළ බව කොන්ත්‍රාත්කරු දැනුම් දී ඇතත්, තාක්ෂණ නිලධාරී පරීක්ෂාවේ දී අඩුපාඩු සහිත බව වාර්තා කර ඇත. අඩුපාඩු කඩිනමින් සම්පූර්ණ කරන ලෙස කොන්ත්‍රාත්කරු වෙත දන්වා ඇත. පහ 2025 වර්ෂයේ විමධ්‍යගත අරමුදල් යටතේ ඉටුකරන ලද ව්‍යාපෘති ගොනුද පරීක්ෂා කළ අතර, ඒවායින් 05ක් නියමිත කාලයට අවසන් කර නොමැති අතර, දඩ මුදල් අයකර ඇත. අංක 06 ඇමුණුම 02, 05 ලෙස සඳහන් ව්‍යාපෘති සිසිර කන්ස්ට්‍රක්ෂන් වෙත කොන්ත්‍රාත් ප්‍රධානය කර ඇති අතර, ගිවිසුම් කාලය තුළ වැඩ අවසන් කර නොමැත. තව දුරටත් කාලය දීර්ඝ කරන ලද නමුත් මේ වනවිට ද වැඩ අවසන් කර නොමැත. ඒ කියන්නේ මේ මොහොත වෙනකල් වැඩ අවසන් කරලා නැහැ. නියමිත දිනට වැඩ අවසන් නොවූ බැවින් 2025 වර්ෂයේ වෙන් කළ ප්‍රතිපාදන වලින් ගෙවීම් සිදු කිරීමට නොහැකි වී ඇති අතර ඉදිරියේ දී වැඩ අවසන් කරන ලද ගෙවීම් මූලාශ්‍ර

සම්බන්ධයෙන් ගැටලුවක් පැන නගින බව වාර්තා කරමි. ඒ කින්නේ දැන් වැඩ අවසන් කරත් මෙයාට මේක ගෙවන්න බැහැයි කියලයි කියන්නේ. මේක ඉතාමත්ම වැදගත්. එම කොන්ත්‍රාත්කරුගේ නම් හා අයකළ දඩ මුදල් ආදි තොරතුරු ඇතුලත් ලේඛනය ඇමුණුම 02 වශයෙන් ඉදිරිපත් කරමි. මෙම කොන්ත්‍රාත්කරුවන් ඇතුලුව 2025 වර්ෂයේ ලියාපදිංචි කොන්ත්‍රාත් ඉටු කරන ලද කිසිදු අයෙකුගේ ව්‍යාපෘති ඉටු කිරීම සම්බන්ධයෙන් කිසිදු අසතුටුදායක බවක් ගොනු වල සඳහන් වී නොමැත. ඒ අනුව ඇමුණුම 01 සහ 02 හි ඇතුලත් 2025 වර්ෂය සතුටුදායක ලෙස වැඩ නිම කළ නොමැති කොන්ත්‍රාත්කරුවන් වන ජී. ඒ. ධර්මදාස බිල්ඩින් කන්ට්‍රක්ෂන් ඇන්ඩ් චතුරංග එන්ටප්‍රයිසස්, ආනන්ද කොන්ත්‍රාත්කරුවෝ, ශ්‍රීනි එන්ටර්ප්‍රයිසස්, සිසිර කන්ට්‍රක්ෂන් යන අය සඳහා 2026 වර්ෂයට කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ දී වරකට එක් කොනත්‍රාත්තුවක් පමණක් ප්‍රදානය කර එම කාර්යය සතුටුදායක ලෙස නිම කළහොත් පමණක් නැවත කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කිරීම හා අනෙකුත් කොන්ත්‍රාත්කරුවන් සඳහා සාමාන්‍ය පරිදි කටයුතු කිරීම කොන්දේසි යටතේ කටයුතු කිරීමට නිර්දේශ කරන ලදි. මෙහි ප්‍රශ්ණය තියෙන්නේ මෙන්න මේ සිසිර කන්ස්ට්‍රක්ෂන් කියන අදාළ කාල සීමාවේ වැඩ අවසන් කරලා නැහැ ඊට පස්සේ ඉල්ලලා තියෙනවා කාලයක් ඒකත් කරලා නැහැ. දැන් කොහොමහරි සල්ලි හැරිලා ගිහිල්ලා වැඩේ කෙරෙනවා දැන් වැඩේට ගෙවන්න වෙන්නෙ නගර සභාවේ ප්‍රතිපාදන. කොහොමද ගෙවන්නේ කියන එකයි ගැටලුව තියෙන්නේ නගරාධිපතිතුමා. මේකේ තියෙනවා ප්‍රශ්ණයක් ඒක නිසා මම මුදල් කමිටුවේ සභාපතිවරයා හැටියට ඔබතුමාගේ අවධානය යොමු කරනවා මෙහි ලොකු ප්‍රශ්ණයක් තියෙනවා මේක නැවත නැවත බලලා මේ සම්බන්ධයෙන් තීන්දු ගන්න කියන එක අවධානය යොමු කරනවා.

**2026.03.17 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට පක්ෂව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කරන ලදී.**

| | | | |
|---|---|---|---|
| 1. | නගරාධිපති | - | කේ.ඩී.නිශාන්ත ප්‍රදිනාන්දු මහතා |
| 2. | නියෝජ්‍ය නගරාධිපති | - | ඩබ්.පී.ප්‍රභාෂණී වික්‍රමසිංහ මහත්මිය |
| 3. | මහා නගර සභා මන්ත්‍රී | - | ඒ.එච්.සුදේශ් ඉන්ද්‍රජිත් කුමාර මහතා |
| 4. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.රවින්ද්‍ර රංගන ප්‍රනාන්දු මහතා |
| 5. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ඉෂාන් දුමින්ද ප්‍රනාන්දු මහතා |
| 6. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.සමන් සුජීව මහතා |
| 7. | මහා නගර සභා මන්ත්‍රී | - | එම්. බී. සෙව්වන්දි නිලංගිකා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | මහා නගර සභා මන්ත්‍රී | - | බී.යෝගේෂ ප්‍රියදර්ශණ මෙන්ඩිස් මහතා |
| 9. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.සුජිත් ඩිල්රෝයි ප්‍රනාන්දු මහතා |
| 10. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී.ශාන්තිනී වල්ගම ද සිල්වා මහත්මිය |
| 11. | මහා නගර සභා මන්ත්‍රී | - | එල්.ඩී.තිලක් විජේතුංග මහතා |
| 12. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ස්වර්ණා විජේරත්න මහත්මිය |
| 13. | මහා නගර සභා මන්ත්‍රී | - | ටී.සංජීව ප්‍රියශාන්ත ප්‍රනාන්දු මහතා |
| 14. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩී. ලීලාරත්න හේවාවිතරණ මහතා |
| 15. | මහා නගර සභා මන්ත්‍රී | - | අයි.ඩී.මහින්ද පල්ලිආරච්චි මහතා |
| 16. | මහා නගර සභා මන්ත්‍රී | - | ඩබ්.ජීවන්ත සුදර්ශන කුමාර ප්‍රනාන්දු මහතා |
| 17. | මහා නගර සභා මන්ත්‍රී | - | එච්.කේ.ශ්‍රියංග මනෝජ් ප්‍රනාන්දු මහතා |
| 18. | මහා නගර සභා මන්ත්‍රී | - | ජීවන්ත සෙනෙවිරත්න මහතා |
| 19. | මහා නගර සභා මන්ත්‍රී | - | කේ.ඩබ්.සඳුන් චාමර ප්‍රනාන්දු මහතා |
| 20. | මහා නගර සභා මන්ත්‍රී | - | තුසිත් ද සිල්වා මහතා |

21. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එස්.සුසන්ත ඉරෝෂන් ප්‍රනාන්දු මහතා
22. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.දිලිප් මනෝජ් ප්‍රනාන්දු මහතා
23. මහා නගර සභා මන්ත්‍රී - බී.සරෝජනී මැන්දිස් මහත්මිය
24. මහා නගර සභා මන්ත්‍රී - එම්.චන්ද්‍රසිරි ප්‍රනාන්දු මහතා
25. මහා නගර සභා මන්ත්‍රී - එම්.ඉන්ද්‍රජිත් ප්‍රනාන්දු මහතා

**2026.03.17 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන්ට විරුද්ධව පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු ඡන්දය ප්‍රකාශ කළහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.එම්.සුජිත් පුෂ්පකුමාර මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එල්. ඔසඳ හර්ෂණ අබේකෝන් මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - යූ.අනුරසිරි ජේ.ද සිල්වා මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - යූ.එල්.සේනක දමයන්ත ද සිල්වා මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - මේරියන් ලිහිණි ප්‍රනාන්දු මහත්මිය
6. මහා නගර සභා මන්ත්‍රී - සිත්ති මසීනා බක්කර් මහත්මිය
7. මහා නගර සභා මන්ත්‍රී - එම්. ශිරෝමි ඉන්දිකා කුරේ මහත්මිය
8. මහා නගර සභා මන්ත්‍රී - එස්.චදුන් රොමේෂ් ප්‍රනාන්දු මහතා
9. මහා නගර සභා මන්ත්‍රී - එල්.දිලිප් රොෂාන් කුමාර පෙරේරා මහතා
10. මහා නගර සභා මන්ත්‍රී - පී.එම්.ෂෙයාන් දුලිප් තිසේරා මහතා
11. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සමීර ප්‍රභාත් ප්‍රනාන්දු මහතා
12. මහා නගර සභා මන්ත්‍රී - පී. සුලක්ෂිකා තිලක්ෂනී ප්‍රනාන්දු මෙනෙවිය
13. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.රංජලා එස්.ජයතුංග මහත්මිය

**2026.03.17 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ අංක 25 කරුණට විරුද්ධවත්, අනෙකුත් සියලු කමිටු නිර්දේශයන්ට පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු පක්ෂව හෝ විරුද්ධව ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටියහ.**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩී.සමන්ත සිල්වා මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.සුරේෂ් ප්‍රේමකුමාර ප්‍රනාන්දු මහතා

**2026.03.17 වන දින පැවති මුදල් පිළිබඳ ස්ථාවර කමිටු වාර්තාවේ සියලුම කමිටු නිර්දේශයන් වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.**

**(එම අවස්ථාවේ දී පහත නම් සඳහන් මහා නගර සභා මන්ත්‍රීවරු සභා ගැබෙහි නොසිටියහ**

1. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්. මැක්සි ජේ. ප්‍රනාන්දු මහතා
2. මහා නගර සභා මන්ත්‍රී - එම්.තිලකසිරි ප්‍රනාන්දු මහතා
3. මහා නගර සභා මන්ත්‍රී - පී.සජිත් දුමින්ද පීරිස් මහතා
4. මහා නගර සභා මන්ත්‍රී - ඒ. එච්. සුරේෂ් ඉන්දික මහතා
5. මහා නගර සභා මන්ත්‍රී - යූ.සුදත් ක්‍රිෂාන්ත පෙරේරා මහතා
6. මහා නගර සභා මන්ත්‍රී - හරිෂ් චන්දන පිලානවිතානගේ මහතා
7. මහා නගර සභා මන්ත්‍රී - ඩබ්.ඩී.බ්‍රෙන්ඩන් හිමාෂා ක්‍රිස්ටිල්කාන්ත මහතා
8. මහා නගර සභා මන්ත්‍රී - ඕ.දිනුෂි කෞෂල්‍යා පෙරේරා මහත්මිය)

## 07 ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශන වැඩ ප්‍රගති වාර්තාව

<u>ගරු නගරාධිපති - කේ. ඩී. නිශාන්ත ප්‍රදීන්නාදු මහතා</u>

ගරු මහා නගර සභා මන්ත්‍රීවරුනී, 2026.03.17 දිනැති මුදල් කමිටු වාර්තාවේ අංක 14 යටතේ 2026 පෙබරවාරි මාසයට අදාළ මූල්‍ය වාර්තාව ඇමුණුම 07 ලෙස ඉදිරිපත් කර තිබෙනවා.

## 08 පුද්ගලික ස්වභාවයේ කරුණු - නැත

## 09. වෙනත් කරුණු - නැත

අ.කලේ කේ.ඩී. නිශාන්ත ප්‍රදීනාන්දු,
නගරාධිපති,
මොරටුව මහා නගර සභාව,
මොරටුව.

2026.04.02 දින,
මොරටුව මහා නගර සභා කාර්යාලයේදී ය.